319 වන කාණ්ඩය - 9 වන කලාපය
தொகுதி 319 - இல. 9
Volume 319 - No. 9

2025 මැයි 23 වන සිකුරාදා
2025 மே 23, வெள்ளிக்கிழமை
Friday, 23rd May, 2025

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**
2025.05.20 දින ගරු දයාසිරි ජයසේකර මහතාගේ හැසිරීම පිළිබඳ පැමිණිල්ල විමර්ශනය කිරීම සඳහා පත් කළ කමිටුව [තීරුව 1497]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 1498]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1500-1529]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
ණය ගෙවීම සඳහා සාක්ෂාත් කරගත යුතු සාර්ව ආර්ථික ඉලක්ක [තීරුව 1530]
අලිමංකඩ ලුණු ලේවායේ ගැටලු [තීරුව 1534]

**ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 1537]

**අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර කියවා පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවට පවරන ලදී [තීරු 1537-1642]

**විදේශීය ණය (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී [තීරුව 1642]

**කල්තැබීමේ ප්‍රශ්න** [තීරු 1643-1650]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**
மாண்புமிகு தயாசிறி ஜயசேக்கர அவர்களின் 2025.05.20ஆந் திகதிய நடத்தை தொடர்பான முறைப்பாட்டினை விசாரணை செய்யும் குழு [ப: 1497]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 1498]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1500-1529]

**தனி அறிவித்தல் மூல வினா:**
கடன் செலுத்துவதற்காக பேரினப் பொருளியல் இலக்குகளை அடைதல் [ப: 1530]
ஆனையிறவு உப்பளத்தில் நிலவும் பிரச்சினைகள் [ப: 1534]

**இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1537]

**குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம் முறை மதிப்பிடப்பட்டு, முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்பட்டது [ப: 1537-1642]

**வெளிநாட்டுக் கடன்கள் (நீக்குதல்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 1642]

**ஒத்திவைப்பு வினாக்கள்** [ப: 1643-1650]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
Committee to Inquire into Complaint on Behaviour of Hon. Dayasiri Jayasekara on 20.05.2025 [Col. 1497]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1498]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1500-1529]

QUESTION BY PRIVATE NOTICE:
Macroeconomic Targets to be Achieved for Debt Payment [Col. 1530]
Issues Arisen at Elephant Pass Saltern [Col. 1534]

SRI LANKA ELECTRICITY (AMENDMENT) BILL:
Read the First time [Col. 1537]

CODE OF CRIMINAL PROCEDURE (AMENDMENT) BILL:
Read the Second time and referred to a Committee of the whole Parliament [Col.1537-1642]

FOREIGN LOANS (REPEAL) BILL:
Read a Second, and the Third time and passed [Col. 1642]

ADJOURNMENT QUESTIONS [Cols. 1643–1650]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 මැයි 23වන සිකුරාදා***
*2025 மே 23, வெள்ளிக்கிழமை*
*Friday, 23rd May, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### 2025.05.20 දින ගරු දයාසිරි ජයසේකර මහතාගේ හැසිරීම පිළිබඳ පැමිණිල්ල විමර්ශනය කිරීම සඳහා පත් කළ කමිටුව
### மாண்புமிகு தயாசிறி ஜயசேக்கர அவர்களின் 2025.05.20 ஆந் திகதிய நடத்தை தொடர்பான முறைப்பாட்டினை விசாரணை செய்யும் குழு
### COMMITTEE TO INQUIRE INTO COMPLAINT ON BEHAVIOUR OF HON. DAYASIRI JAYASEKARA, ON 20.05.2025

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 මැයි 20 දින සභා ගර්භය තුළදී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතිතිඥ දයාසිරි ජයසේකර මහතාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් මා වෙත ලද පැමිණිල්ලක් සැලකිල්ලට ගෙන, ඒ සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා ගරු නියෝජ්‍ය කාරක සභා සභාපති හේමාලි වීරසේකර මහත්මියගේ සභාපතිත්වයෙන්ද, ගරු විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය විජිත හේරත් මහතාගේ සහ ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගයන්ත කරුණාතිලක මහතාගේ සාමාජිකත්වයෙන්ද යුත් ත්‍රිපුද්ගල කමිටුවක් මා විසින් පත් කරන ලද බව මෙම සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

### II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2025 මැයි 23 සිකුරාදා, එනම් අද දින අපර භාග 1.30ට කාරක සභා කාමර අංක 2හි දී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගී වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

### III

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආංශික අධීක්ෂණ කාරක සභාවල සාමාජික මන්ත්‍රීවරයන්ගේ ප්‍රයෝජනය සඳහා "Best Practices for Undertaking Legislative Scrutiny" යන විෂයය යටතේ Max Planck Foundation for International Peace and the Rule of Lawහි සහාය ඇතිව පැවැත්වෙන සම්මන්ත්‍රණයේ අද දිනට නියමිත සැසිවාරය පස්වරු 1.30 සිට පස්වරු. 3.30 දක්වා කාරක සභා කාමර අංක 6හි දී පැවැත්වෙන අතර, ඒ සඳහා ආරාධනා ලැබී ඇති සියලු ආංශික අධීක්ෂණ කාරක සභා සාමාජික මන්ත්‍රීවරයන්හට ඒ සඳහා සහභාගි වන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Financial Statements and Operations of the Central Bank of Sri Lanka for the year 2024.

I move that the Financial Statements and Operations be referred to the Committee on Public Finance.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on the Foreign Loans (Repeal) Bill, which was referred to the said Committee.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, පිළියන්දල, බිම්බාරාම පාර, අංක 41/1, දරන ස්ථානයෙහි පදිංචි ආර්.එම්. ටිකිරි බණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා (කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Namal Sudarshana - Deputy Minister of Women and Child Affairs)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මැල්සිරිපුර, නාබැට, අලුත්ගම, අංක 684 දරන ස්ථානයෙහි පදිංචි අයි.එම්. ප්‍රියංකා සුදර්ශනී මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ඉබ්බාගමුව, ඉබ්බාගමුව නැඹිලිකුඹුර කණිෂ්ඨ විද්‍යාලය යන ලිපිනයෙහි සේවයේ නියුතු ටී.ඩබ්ලිව්.එම්.ඒ.එස්. වීරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, කොළඹ 06, බලපොකුණ පාර, අංක 62 දරන ස්ථානයෙහි පදිංචි පී. ප්‍රේමලාල් පීරිස් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු වරුණ ලියනගේ මහතා**
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)

ගරු කථානායකතුමනි, බලංගොඩ, රාස්සගල, අසංග ස්ටෝර්ස්, අංක 113 දරන ස්ථානයෙහි පදිංචි ඒ.ඒ. ගුණතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ගරු කථානායකතුමනි, බිංගිරිය, තිසෝගම, ඉහළ රඹේපිටිය යන ලිපිනයෙහි පදිංචි එස්.එම්.ඒ.පී. මංචනායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු චන්දන තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ගල්ගමුව, පාලුකඩවල, ජාගම යන ලිපිනයෙහි පදිංචි එස්. නසාර් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) බංඩාරකොස්වත්ත, විල්බාගෙදර යන ලිපිනයෙහි පදිංචි ඩබ්.එම්.එම්.ඒ. ඉන්දික විජේකෝන් මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) වැළඩ, තෝරාණ පාර, අංක 101, 1/බී දරන ස්ථානයෙහි පදිංචි බී.බී.ජී. ප්‍රේමචන්ද්‍ර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) කුරුණෑගල, උඩබද්දාව යන ලිපිනයෙහි පදිංචි බී.බී.එම්. සුනිල් අතපත්තු මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) මණ්ඩාපොළ, කුරුණෑගල පාර, කුඩා වැව, අංක 603 දරන ස්ථානයෙහි පදිංචි එස්.එස්. පද්මිණී මෙනෙවියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

ගරු කථානායකතුමනි, ගාල්ල, උලුවිටිකේ, ජයසුමනාරාම පන්සල පාර, අංක 26/සී දරන ස්ථානයෙහි පදිංචි එච්.කේ. රශින්ත තුෂාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -72/2024 (1), ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා - [සභා ගර්භය තුළ නැත.]

ප්‍රශ්න අංක 2 -94/2024 (1), ගරු චමින්ද විජේසිරි මහතා - [සභා ගර්භය තුළ නැත.]

## 2024 නොවැම්බර් මාසයේ අයහපත් කාලගුණය හේතුවෙන් වූ වගා හානි: වන්දි
### 2024 நவம்பர் மாதம் நிலவிய சீரற்ற காலநிலை காரணமாக ஏற்பட்ட பயிர்ச்சேதம்: நட்டஈடு
### DAMAGE TO CROPS DUE TO ADVERSE WEATHER IN NOVEMBER, 2024: COMPENSATION

157/2024

3. **ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2024 වර්ෂයේ නොවැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවට බලපෑ අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන්

විනාශයට පත් වූ මුළු වගා බිම් ප්‍රමාණය කොපමණද;

(ii) එම වගා බිම් ප්‍රමාණය, කුඹුරු, බඩඉරිඟු සහ අනෙකුත් වගා බිම් ආදී ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වගා බිම්වලට සිදු වූ විනාශයේ ඇස්තමේන්තුගත මූල්‍යමය අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) විනාශ වූ වගා බිම්වලට ගෙවන ලද මුළු වන්දි මුදල කොපමණද;

(ii) එම වන්දි මුදල, කුඹුරු, බඩඉරිඟු සහ අනෙකුත් වගාවන් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ දක්වා වන්දි ගෙවා නොමැති වගා බිම් ප්‍රමාණය කොපමණද;

(iv) ඒවාට වන්දි නොගෙවීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2024ஆம் ஆண்டு நவம்பர் மாதம் இலங்கையில் நிலவிய சீரற்ற காலநிலை காரணமாகச் சேதமடைந்த மொத்த விளைநிலங்களின் அளவு யாதென்பதையும்;

(ii) மேற்படி விளைநிலங்களின் அளவு, நெற் காணிகள், சோளம் மற்றும் ஏனைய விளை நிலங்கள் ஆகியவற்றின் அடிப்படையில் வெவ்வேறாக எவ்வளவென்பதையும்;

(iii) விளைநிலங்களுக்கு ஏற்பட்ட சேதத்தின் மதிப்பீடு செய்யப்பட்ட நிதிசார் நட்டம் எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சேதமடைந்த விளைநிலங்களுக்காகச் செலுத்தப் பட்ட மொத்த நட்டஈட்டுத் தொகை எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி நட்டஈட்டுத் தொகை நெற் காணிகள், சோளம் மற்றும் ஏனைய பயிர்கள் என்ற அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) இதுவரையிலும் நட்டஈட்டுத் தொகை செலுத்தப் படாத விளைநிலங்களின் அளவு யாதென் பதையும்;

(iv) அவற்றுக்கு நட்டஈடு செலுத்தாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -

(i) total area of lands in which crops were damaged due to adverse weather that affected Sri Lanka in November, 2024;

(ii) total area of lands according to each crop damaged, i.e. paddy fields, maize fields, and lands cultivated with other crops et cetera, separately; and

(iii) estimated financial loss caused by the damage to crops?

(b) Will he also inform this House the -

(i) total amount of compensation paid for the damaged crops ;

(ii) total amount of compensation paid for each damaged paddy field, maize cultivation and lands cultivated with other crops, separately;

(iii) total area of lands that cultivated crops, for which compensation has not yet been paid; and

(iv) reasons for not paying the compensation for the lands referred to above?

(c) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)

(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) අක්කර 74,176කි.

(ii) වී වගාව මුළු හානි වපසරියෙන් සියයට 90ක් වන අතර, සෙසු වගා සියයට 10කි.

(iii) මිලියන 1,000කි.

(ආ) (i) මිලියන 952කි.

(ii) සියයට 90යි වී වගාවට, සියයට 10යි සෙසු වගාවලට.

(iii) 2024 නොවැම්බර් මස ඇති වූ ගංවතුරින් හානි වූ නිර්දේශිත වගාවලට වගා හානි වන්දි ගෙවා අවසන් කර ඇත.

(iv) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**

(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)

(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා රුපියල් මිලියන 1,000න් රුපියල් මිලියන 952ක් විතරයි ගෙවලා තිබෙන්නේ කියලා. ඉතිරි ප්‍රමාණය පිළිබඳව තිබෙන ප්‍රශ්නය මොකක්ද කියලා මම දැන ගන්න කැමැතියි. මම අද කුරුණෑගල දිස්ත්‍රික්කයේ තත්ත්වය ගැනත් කථා කරලා බැලුවා. එතැනත් තව ගෙවීම් කරන්න තිබෙනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඒ අය අභියාචනාත් ඉදිරිපත් කරලා තිබෙනවා. සමහර තැන්වලට ඇවිල්ලා සොයා බලා නැති තත්ත්වයකුත් තිබෙනවා. ගෙවීම් කරනකොට තමයි ඒ සමහර ගොවීන් දැනගෙන තිබෙන්නේ, වන්දි ගෙවනවා කියලා. එම නිසා මම විශේෂයෙන් අහන්න

[ගරු නිතිඥ දයාසිරි ජයසේකර මහතා]

කැමැතියි, ඒ අය සම්බන්ධයෙන් මොකක් හෝ වැඩ පිළිවෙළක් සකස් කරනවාද කියලා. ඒ අය සම්බන්ධයෙන් ගනු ලබන පියවර මොකක්ද කියලා කියන්න පුළුවන්ද, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමනි, ගිය අවුරුද්දේ යල කන්නයේ වන්දි මුදල් ගෙවලා තිබුණේ නැහැ. අපි අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ ඒ මුදල් සියල්ලම ගෙවා අවසන් කළා. ඒක ඊට කලින් ගෙවන්න තිබුණු වන්දි මුදලක්. ඊට පස්සේ නොවැම්බර් මාසයේ මහ කන්නයේත් හානි සිද්ධ වුණා. ඒ හානිවලට අදාළව තමයි මේ වන්දි මුදල් ගෙවලා තිබෙන්නේ. එතැන තව රුපියල් මිලියන 8ක ප්‍රමාණයක් ගෙවන්න තිබෙනවා. ඇත්තටම සමහර ගොවීන්ගේ තොරතුරු සහ දත්ත හරියට ඇවිල්ලා තිබුණේ නැහැ. එවැනි පොඩි පොඩි තාක්ෂණික කාරණාත් එක්ක තමයි ඒ ප්‍රමාණය ඉතුරුවෙලා තිබෙන්නේ. සමස්තයක් විධියට ගත්තාම, වන්දි මුදල් ගෙවලා ඉවරයි. අනික් ඒවා ගැන මේ වන විට සොයා බලමින් ඉන්නවා. අතපසු වී තිබෙන ප්‍රමාණයත් අපි ගෙවා අවසන් කරනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පොහොර මුදල් ලබා ගැනීම සම්බන්ධ ප්‍රශ්නයකුත් තිබෙනවා. භාරමස් වීවලට මාස දෙකක් ඉවර වෙලාත් තවම සමහර ප්‍රදේශවලට ඒ පොහොර මුදල් ටික ලැබිලා නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒක ගැන පොඩ්ඩක් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම විශේෂයෙන් ඉල්ලන්න කැමැතියි.

ඒ වාගේම, බිත්තර වීවලත් විශාල අර්බුදයක් තිබෙනවා. මම නිකවැරටියේ බිත්තර වී අභිජනන මධ්‍යස්ථානයට කථා කළා. ඒකේ බිත්තර වී නැහැ. මාස් කන්නයට සාපේක්ෂව හැම තැනකම රජයේ බිත්තර වී මිටිය රුපියල් 1,300කින් විතර වැඩි වෙලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒ කියන්නේ කිලෝ 20.5 බිත්තර වී මිටිය මාස් කන්නයේ රුපියල් 4,200ට තිබුණේ. දැන් යල කන්නය වෙනකොට ඒක රුපියල් 5,500ට විතර වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ රුපියල් 1,300ක විතර වැඩි ගණනක් යනවා. ඒ ගණනට ගන්නත් අදාළ ප්‍රදේශවල බිත්තර වී නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා අපේ දිස්ත්‍රික්කයේ වුණත් කියන්න ඕනෑ, නිකවැරටියේ බිත්තර වී අභිජනන මධ්‍යස්ථානයේ බිත්තර වී නැහැ කියලා. ඒ නිසා සමහර කට්ටිය ගිහිල්ලා පොළොන්නරුවෙන් මිටියක් රුපියල් 5,500ට බිත්තර වී අරගෙන ආවා. මා ළඟ ඒ ඔක්කෝම ලැයිස්තුත් තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මේ බිත්තර වී හිඟය වෙනුවෙන් ඔබතුමන්ලා ගන්න පියවර මොකක්ද?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු කථානායකතුමනි, පොහොර සම්බන්ධයෙන් ගත්තාම, හෙක්ටෙයාර දෙකක් සඳහා රුපියල් 50,000ක මුදලක් ගොවි ජනතාවට දෙනවා. එම මුදල් වගාවට අදාළව ඕනෑම කටයුත්තකට යොදවා ගැනීමට ගොවීන්ට අවසර තිබෙනවා. ඒ අනුව ඒ මුදල් නියර බඳින්න, හාන්න, පෝරු ගාන්න, අස්වනු නෙළන්න, පොහොර ගන්න, බෙහෙත් ගන්න වැනි ඕනෑම කටයුත්තකට යොදා ගැනීමේ හැකියාව තිබෙනවා. මේ වෙනකොට ලැබෙන තොරතුරු අනුව එම මුදල් නිදහස් කරමින් පවතිනවා.

ඊළඟට, ගරු මන්ත්‍රීතුමනි, බිත්තර වී සම්බන්ධයෙන් ඔබතුමා මතු කරපු කාරණයට විශේෂ අවධානයක් අපි යොමු කරලා තිබෙනවා.

විශේෂයෙන්ම සහතික කරපු බිත්තර වී පෞද්ගලික අංශයෙන් මිලදී ගෙන ගොවි ජනතාවට ලබා දීමටත්, ඒ වාගේම රජයේ ගොවිපළවල තිබෙන බිත්තර වී ටික කළමනාකරණය කරලා ලබා දීමටත් අපි මේ වන විට කටයුතු කර තිබෙනවා. ඇත්තටම මේ වනකොට ගොවීන් වගා කරලා අවසන් වෙලාගෙන එන්නේ. කෙසේ වෙතත් ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් අපේ විශේෂ අවධානයක් යොමු වෙලා තිබෙනවා.

ඊළඟට වන්දි මුදල් සම්බන්ධයෙන් ගත්තොත්, මහ කන්නයේ අවස්ථා දෙකකදී වගා හානි සිද්ධ වුණා. මුල් වගා හානියට අදාළ වන්දි ඔක්කෝම ගෙවලා ඉවරයි. ඒකේ අත් හැරුණු කිහිපයක් විතරයි තිබෙන්නේ. එ්ක ඉස්සරහට නිවැරදි වෙනවා. ඊළඟට, ජනවාරි මාසයේ සහ පෙබරවාරි මාසයේ නැවත වගා හානි සිද්ධ වුණා. ඒ හානි සිද්ධ වෙච්ච ගොවි ජනතාවට අදාළ වන්දි මුදල් සියල්ල ලබන මාසය ඇතුළත ගෙවා නිම කරනවා. ඉතිහාසයේ පළමුවැනි වතාවට තමයි, කන්නයක් අවසන් වෙන්න කලින් එම කන්නයේ මුල සිද්ධ වෙච්ච වගා හානිවලට වන්දි ගෙවලා අවසන් කළේ. ඒ වාගේම බිත්තර වී සම්බන්ධවත් අපේ අවධානය යොමු වෙලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -195/2024- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -213/2024- (1), ගරු රෝහණ බණ්ඩාර මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 -222/2024- (1), ගරු අජිත් පී. පෙරේරා මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

## සිංහල මාධ්‍ය සහ දෙමළ මාධ්‍ය පාසල්: දෙවන භාෂාව ඉගැන්වීම
## சிங்கள மொழி மற்றும் தமிழ் மொழிப் பாடசாலைகள்: இரண்டாம் மொழியைக் கற்பித்தல்
## SINHALA-MEDIUM AND TAMIL-MEDIUM SCHOOLS: TEACHING OF SECOND LANGUAGE

278/2024

**7. ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දෙමළ මාධ්‍ය පාසල්වල සිංහල භාෂාවත්, සිංහල මාධ්‍ය පාසල්වල දෙමළ භාෂාවත් ඉගැන්වීම අනිවාර්ය කිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එය ක්‍රියාත්මක කිරීමට නියමිත කාල වකවානු කවරේද;

(iii) ඒ සඳහා අවශ්‍ය ගුරුවරුන් සිටින්නේද;

(iv) නොඑසේ නම්, එම ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) தமிழ் மொழிப் பாடசாலைகளில் சிங்கள மொழியும், சிங்கள மொழிப் பாடசாலைகளில் தமிழ் மொழியும் கற்பிக்கப்படுவதை கட்டாய மாக்கத் திட்டமிடப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அதனை நடைமுறைப்படுத்த எதிர்பார்க்கின்ற காலப்பகுதி யாதென்பதையும்;

(iii) அதற்குத் தேவையான ஆசிரியர்கள் உள்ளனரா என்பதையும்;

(iv) இன்றேல், மேற்படி ஆசிரியர் வெற்றிடங்களை நிரப்புவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether plans have been formulated to make it compulsory for teaching Sinhala Language in Tamil-medium schools and Tamil Language in Sinhala-medium schools;

(ii) if so, the timeframe for its implementation;

(iii) whether teachers are available for the aforesaid purpose; and

(iv) if not, the steps that will be taken to fill the relevant teacher vacancies?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) දැනට සියලුම පාසල්වල 6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා දෙමළ මාධ්‍ය සිසුන් සඳහා සිංහල භාෂාව දෙවන බස ලෙසත්, සිංහල මාධ්‍ය සිසුන් සඳහා දෙමළ භාෂාව දෙවන බස ලෙසත් ඉගැන්වීම් කටයුතු සිදු කරනු ලබයි. ඊට අමතරව 10 සහ 11 ශ්‍රේණිවලදී කාණ්ඩ විෂය යටතේ දෙමළ මාධ්‍ය සිසුන් සඳහා දෙවන බස සිංහල ලෙසත්, සිංහල මාධ්‍ය සිසුන් සඳහා දෙවන බස දෙමළ ලෙසත් තෝරා ගැනීමේ අවස්ථාව සිසුන්ට ලබා දී ඇත.

(ii) 2026 වර්ෂයේදී 6 ශ්‍රේණියට විෂයමාලා ප්‍රතිසංස්කරණ ආරම්භ කර, ඊට අනුගාමීව ඉදිරි වර්ෂවල අනෙකුත් ශ්‍රේණි සඳහා ද විෂයමාලා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේදී ඉහත ක්‍රමවේදය ප්‍රකාරව අධ්‍යයන කටයුතු ක්‍රියාත්මක කිරීමට නියමිතය.

(iii) 2024.12.31 දිනට පවතින පුරප්පාඩු තොරතුරු අනුව ජාතික හා පළාත් පාසල්හි පහත පරිදි පුරප්පාඩු පවතී.

I. දෙවන බස සිංහල 820යි.

II. දෙවන බස දෙමළ 2,099යි.

(iv) දෙමළ මාධ්‍ය පාසල්වල සිංහල භාෂාවත්, සිංහල මාධ්‍ය පාසල්වල දෙමළ භාෂාවත් ඉගැන්වීම් සඳහා ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් බඳවා ගනු ලබන අතර, 2020- 2022 ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී කණ්ඩායමේ ඩිප්ලෝමාධාරීන් සඳහා 2025.05.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට ගුරු පත්වීම් ලබා දීම සිදු කර ඇත. ඒ අනුව, දෙමළ මාධ්‍ය පාසල්වල සිංහල භාෂාව ඉගැන්වීම සඳහා ගුරුවරුන් -දෙවන බස සිංහල- 95ක් බඳවාගෙන ඇති අතර, සිංහල මාධ්‍ය පාසල්වල දෙමළ භාෂාව ඉගැන්වීම සඳහා ගුරුවරුන් -දෙවන බස දෙමළ- 69ක් බඳවාගෙන ඇත.

එමෙන්ම, මෙම විෂයයන් සඳහා ඉදිරියේදී ගුරු අවශ්‍යතාව හඳුනාගෙන ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ මඟින් පුහුණු කරන ඩිප්ලෝමාධාරීන් සංඛ්‍යාවේ අවශ්‍ය සංශෝධන පිළිබඳව ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණය මත එම බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව තීරණය කළ හැකි අතර, ඒ අනුව ඉදිරියේදී ගුරු පුරප්පාඩු පිරවීමේ හැකියාව ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමියගෙන් අසනු ලබන මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපි දන්නවා, උතුරු, නැඟෙනහිර සහ අනෙක් පළාත්වල බහුතරයක් සිංහල ජනතාව ජීවත් වන ප්‍රදේශ හැරුණාම සිංහල, ද්‍රවිඩ සහ මුස්ලිම් ජනතාව මිශ්‍රව ජීවත් වන පළාත් තිබෙන බව. විශේෂයෙන්ම ගොඩක් තැන්වල මුස්ලිම් ජනතාව ජීවත් වෙන්නේ සිංහල ගම්මාන මැද. සිංහල දරුවන් දෙමළ භාෂාව දැන ගැනීමත්, මුස්ලිම් දරුවන් සිංහල භාෂාව දැන ගැනීමත්, ද්‍රවිඩ දරුවන් සිංහල භාෂාව දැන ගැනීමත් රටේ අනාගතයට බලපානවා කියන එක අප සියලුදෙනා පිළිගන්නවා. විශේෂයෙන්ම වර්තමාන ආණ්ඩුව සංහිඳියාව ගැන දැඩි උනන්දුවක් දක්වන නිසායි මා මේ ප්‍රශ්නය අහන්නේ. ගරු අගමැතිතුමියනි, මෙම විෂයයන් දැනට අනිවාර්ය විෂයයන් බවට පත් කරලා තිබෙනවාද, නැත්නම් කැමැති නම් විතරක් එම විෂයයන් කරන්න පුළුවන්ද? එහෙම කැමැති නම් විතරක් කරන්න පුළුවන් කියලා තිබෙනවා නම්, එම විෂයයන් ඉගෙනීම අනිවාර්ය කරන්න බලාපොරොත්තුවක් තිබෙනවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ඒක වැදගත් ප්‍රශ්නයක්. එක අතකින් අපි උත්සාහ කරනවා, ශිෂ්‍යයන්ට තිබෙන විෂය මාලාවේ බර පොඩ්ඩක් අඩු කරන්න ඕනෑය කියලා. නමුත්, එකිනෙකාගේ භාෂා පිළිබඳව ඉගෙන ගැනීම අතිශයින්ම වැදගත් නිසා, අපි කරනු ලබන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ එක්ක 6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා ඒ විෂයයන් අනිවාර්ය කරන්න තමයි අපි කථා කරමින් යන්නේ. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, පන්ති කාමරයෙන් පිටතදී භාෂාව ඉගෙන ගැනීමේ අවස්ථා දරුවන්ට හදලා දෙන්න. මේක පන්ති කාමරයටම සීමා වෙන විෂයයක් නොවෙයි. සිංහල දරුවන්ට දෙමළ හා මුස්ලිම් දරුවන් සමඟත්, දෙමළ හා මුස්ලිම් දරුවන්ට සිංහල දරුවන් සමඟත් යනාදී වශයෙන් ජාතීන් තුනේම දරුවන් මිශ්‍ර වෙලා කරන ක්‍රියාකාරකම් හරහා එකිනෙකාගේ භාෂාවත්, සංස්කෘතියත් ඉගෙන ගැනීමේ අවස්ථාව හදන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. ඒක අනිවාර්යයෙන්ම 1 වසරේ සිට 13 වසර දක්වාම සිද්ධ වෙන විධියට තමයි අපි සැලසුම් කරගෙන යන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, මම ගරු අග්‍රාමාත්‍යතුමියට ස්තුතිවන්ත වෙනවා, එම පිළිතුර ලබා දීම පිළිබඳව. මම දෙවැනි අතුරු ප්‍රශ්නයක් අහන්නේ නැහැ. හැබැයි, මම යම් මතයක් ප්‍රකාශ කරන්න කැමැතියි. එකිනෙකා අතර සමගිය ඇති වෙන්න නම් සැකය නැති වෙන්න ඕනෑ. ඒ කාරණයත් එක්ක තමයි එයට වටිනාකමක් එන්නේ. මොකද, එක ළඟ පුටු දෙකක වාඩි වෙලා ඉන්නා දෙදෙනෙක් සැකයෙන් ජීවත් වුණොත්, ඒ අය කරන කිසි වැඩක් හරියන්නේ නැහැ. ගරු අගමැතිතුමියනි, ඒ නිසා මම ඔබතුමියට යෝජනාවක් කරන්න කැමැතියි. ඔබතුමිය කලින් දුන් උත්තරයේ සඳහන් වුණා, දෙමළ ගුරුවරුන් දෙදහස් ගණනක vacancies තිබෙනවා, 69දෙනායි බඳවාගෙන තිබෙන්නේ කියලා. ඒ නිසා මේ කාර්යය සාර්ථක කරගන්න නම්, ඉදිරි මාස 6 තුළ ඒ බඳවා ගැනීම් ටික කරලා, 2026 ජනවාරි මාසයේ 01වැනි දා ඉඳලා මේ සඳහා විධිමත් ක්‍රමවේදයක් පුළුවන් නම් හදන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ඒක අවශ්‍ය දෙයක් තමයි. නමුත් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, ගුරුවරයෙක් හදන්න අවම වශයෙන් අවුරුදු 3ක් පමණ ගත වෙන බව. එහෙම නැත්නම් අවුරුදු 4ක් පමණ ගත වෙනවා. තාක්ෂණය පාවිච්චි කරලා online-blended learning හරහාත් අපට මේ ගුරු පුරප්පාඩුව යම්තාක් දුරකට සමනය කරගන්න පුළුවන්. ඒ කියන්නේ අපි ගුරුවරු හදා ගන්නකම් අන්තර් කාලීන වැඩ පිළිවෙළක් හැටියට blended learning හරහාත් ගුරු පුරප්පාඩුවට යම් පිළිතුරක් හොයා ගන්න අපි බලාපොරොත්තු වෙනවා. මොකද, අපිට ගුරුවරයෙක් මාස 6කින් හදන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඒකට අවම වශයෙන් අවුරුදු 3ක්වත් ගත වෙනවා. මේ තිබෙන පුරප්පාඩුවලට අවශ්‍ය කරන ගුරුවරුන් බිහි කරන්නත් අපට යම් කාලයක් ගත වෙනවා. එතෙක් අපිට බලාගෙන ඉන්න බැරි නිසා තමයි අපි අනෙක් විධි ගැනත් සලකා බලන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 8 -294/2024- (2), ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 9 -441/2025- (1), ගරු චාමර සම්පත් දසනායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## "සරුසාර" ණය යෝජනා ක්‍රමය: විස්තර
"சருசார" கடன் திட்டம்: விபரம்
"SARUSARA" LOAN SCHEME: DETAILS

618/2025

**10. ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) සුළු පරිමාණ ගොවීන් සඳහා "සරුසාර" නමින් සහන පොලී ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දී තිබේද;

(ii) එසේ නම්, එම ණය යෝජනා ක්‍රමය හඳුන්වා දීමේ අරමුණු කවරේද;

(iii) මේ දක්වා එම ණය යෝජනා ක්‍රමය මඟින් ණය ලබා ගෙන ඇති ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දීමේදී සලකා බලනු ලබන නිර්ණායක කවරේද;

(v) ගොවීන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சிறிய அளவிலான விவசாய நடவடிக்கைகளில் ஈடுபட்டுள்ள விவசாயிகளுக்கென "சருசார" எனும் பெயரில் சலுகை வட்டி வீதத்தில் கடன் திட்டமொன்று அறிமுகம் செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அத்திட்டத்தை அறிமுகம் செய்ததன் நோக்கங்கள் யாவை என்பதையும்;

(iii) இதுவரை மேற்படி கடன் திட்டத்திலிருந்து கடன் பெற்றுள்ள விவசாயிகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(iv) மேற்படி கடன் திட்டத்தின்கீழ் கடன் வழங்கும் போது கவனத்தில் கொள்ளப்படும் அளவு கோல்கள் யாவை என்பதையும்;

(v) விவசாயிகளை பொருளாதார ரீதியாக வலுவூட்டுவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(i) whether a loan scheme named "Sarusara", which gives loans to small-scale farmers at a concessionary interest rate, has been introduced;

(ii) if so, the objectives of introducing the loan scheme concerned;

(iii) the number of farmers who have obtained loans under the loan scheme so far;

(iv) the criteria considered in granting loans under the loan scheme concerned; and

(v) the measures that are adopted for empowering farmers financially?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ඔව්, "සරුසාර" නමින් ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වේ.

(ii) මෙම ණය යෝජනා ක්‍රමය පහත සඳහන් අරමුණු සඳහා හඳුන්වා දී ඇත.

- කෙටි කාලීන භෝග වගා කිරීම සහ ඔවුන්ගේ තවාන්, ගෙවතු වගාව සහ ගබඩා රිසිට්පත් මූල්‍යකරණය සඳහා ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ගොවීන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම.
- ගොවි ප්‍රජාව අතර මූල්‍යමය අන්තර්කරණය ප්‍රවර්ධනය කිරීම.
- රට තුළ ගෘහස්ථ කෘෂිකාර්මික අංශය ප්‍රවර්ධනය කිරීම/සංවර්ධනය කිරීම.
- ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ගොවීන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සහ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම.
- කලාපීය විෂමතා සහ ග්‍රාමීය දරිද්‍රතාව අඩු කිරීම.

(iii) වර්ෂ 2010-2024 කාලය තුළ ගොවීන් 1,216,587ක් සඳහා ණය ලබා දී ඇත.

(iv) මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දීමේදී පහත සඳහන් නිර්ණායක සලකා බැලිය යුතු වේ.

- ණය ගැනුම්කරු ගොවියෙකු විය යුතුය.
- ගොවියෙකුට මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දීමට වගා කිරීම සඳහා;
  - a. තමන් සතුව,
  - b. බදු හිමිකමක් සහිතව, හෝ
  - c. අඳ පදනමින් හෝ ඉඩමක් හිමි විය යුතු අතර;
  - d. හිමිකමක් නොමැති නමුත් රජයේ බලපත්‍රයකින් හිමි වූ ඉඩමක් පවතින හෝ
  - e. ඉඩමක් නොමැති නමුත් යම් කාලයක් සඳහා වගා කිරීමට ඉඩම් හිමියෙකුගෙන් අධිකාරි අයිතිය ලබාගෙන තිබිය යුතු වේ.
- ණය ගැනුම්කරු කිසිදු මූල්‍ය ආයතනයකින් ලබා ගත් ණයක් පැහැර හැරි අයෙකු නොවිය යුතුය.
- අවුරුදු 65 හෝ ඊට වැඩි ණය ගැනුම්කරුවෙකු විසින් ණයක් ලබා ගැනීම සඳහා පවුලේ සාමාජිකයෙකු (කලත්‍රයා, දියණිය, පුත්‍රයා හෝ අවුරුදු 18ට වැඩි සහ අවුරුදු 65ට අඩු සමීප ඥාතියෙකු) ණය ගැනුම්කරු සමඟ සම-ණය ගැනුම්කරුවෙකු ලෙස ලියාපදිංචි විය යුතුය.
- ගබඩා ලැබීම් මූල්‍යකරණ සංරචකය යටතේ, අනුරාධපුර, මැදිරිගිරිය, මොනරාගල, මන්නාරම සහ කිලිනොච්චි යන ප්‍රදේශවල පිහිටි රජය සතු ගබඩාවල සිය අස්වනු තැන්පත් කර ඇති ගොවීන්ට ණය ලබා ගත හැක.

(v) ගොවීන්ගේ වගා කටයුතු සඳහා අමු ද්‍රව්‍ය සපයා ගැනීමට අවශ්‍ය මූල්‍ය අඩු පිරිවැයක් යටතේ ලබා ගැනීමට පහසුකම් සලසමින්, දැරිය හැකි මිලකට ඔවුන්ගේ වගාවන් සඳහා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර ඇත. එමෙන්ම,

- ගොවි ප්‍රජාව සවිබලගැන්වීම සඳහා පොහොර සහනාධාර ලබා දීම.
- දැරිය හැකි මිලකට ගුණාත්මක බීජ ලබා දීම.
- ගොවීන්ගේ ආදායම සුරක්ෂිත කිරීම සඳහා ඔවුන්ගේ අස්වැන්න සඳහා සහතික මිලක් ලබා දීම.
- භෝග හානි අවදානම අවම කිරීම සඳහා භෝග රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
- වාරි ජල සම්පාදන සේවා සැපයීම වැනි පුළුල් අතිරේක සේවාවන් සැපයීමට රජය තවදුරටත් පියවර ගෙන තිබේ.

(ආ) පැන නොනඟී.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. 2025 වර්ෂයේ සිට "සරුසාර" නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය වාර්ෂික වැඩසටහනක් ලෙස මහා භාණ්ඩාගාරයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන බව රජය ප්‍රකාශ කළා.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මේ යටතේ සුළු හා මධ්‍ය පරිමාණ ගොවීන්ට, ඒ වාගේම වී ඇතුළු කෙටි කාලීන භෝග වගා කරන ගොවීන්ට ලබාදෙන උපරිම ණය මුදල කොපමණ ද?

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ගරු මන්ත්‍රීතුමනි, එක් එක් ගොවීන්ගේ හැකියාව සහ නැවත ගෙවීමේ පිළිවෙත අනුව සහ previous track record එක අනුව ඉහළ ප්‍රමාණයක් ඉල්ලා සිටීම සඳහා ගොවීන්ට අවස්ථාව තිබෙනවා. ඒ අනුව දැනට පවතින ක්‍රමවේද යටතේ ලබාදෙන ණය ප්‍රමාණ අනුව අවශ්‍ය කරන පොහොර සහනාධාර, අවශ්‍ය කරන කෘෂි උපකරණ මිලදී ගැනීම, බීජ මිලදී ගැනීම යනාදී එක් එක් වෙනත් කරුණු සඳහා ලබාදෙන ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් දක්වා තිබෙනවා. ඒකට අවශ්‍ය තොරතුරු සහ ණය සීමාවන් කොහොමද කියලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දැනුවත්වීම වෙනුවෙන් මම ඒ පිළිතුර **සභාගත*** කරනවා.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙම මුදල අය කර ගන්න නියමිත දිනයක් තිබෙනවාද? විශේෂයෙන්ම දැන් ගොඩ

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු කිංස් නෙල්සන් මහතා]

හෝගවලදී රජය විසින් සහතික මිලක් ලබා දීලා නැති නිසා අම්පාර, පොළොන්නරුව, අනුරාධපුරය වැනි දිස්ත්‍රික්ක තුළ විශේෂයෙන්ම බඩඉරිඟු වගා කරන ගොවීන් මේ වෙනකොට දැඩි අපහසුතාවට ලක්වෙලා තිබෙනවා. දැන් මේ ණය පහසුකමත් ලබා දීලා තිබෙනවා. හැබැයි, රජය විසින් මේ ගොඩ හෝග ගොවීන්ට සහතික මිලක් ලබා දීලා නැහැ. මේ ගොවීන් බලාගෙන ඉන්නවා ඒ ගැන. මේ මුදල මේ අහවල් දිනයේ ගෙවන්න ඕනෑ කියලා රජය විසින් කියලා නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයෙන් එවැනි නියමිත දිනයක් වෙන් කර තිබෙනවා ද?

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

කලින් ප්‍රශ්නයට වාගේම මේකටත් උදාහරණයක් මම කියන්නම්. ලබා දෙන ණය ප්‍රමාණයන් අනුව ඔබතුමා අහපු කෙටි කාලීන හෝග සඳහා දැන් සමහර වෙලාවට රුපියල් මිලියන 3ක විතර ප්‍රමාණයක් දෙනවා.

ඊට පසුව nurseries හැදීම සඳහා රුපියල් ලක්ෂ 5ක් විතර වාගේ ලබා දෙනවා. ඒ වාගේ එක් එක් කාණ්ඩය සඳහා වෙන් වෙන් ප්‍රමාණ තමයි තිබෙන්නේ. සමහර බෝග සඳහා සහතික මිලක් නොමැති නමුත් මේ ගොවීන්ව දිරි ගන්වලා අවශ්‍ය කරන ණය මුදල කලට වේලාවට ගෙවලා, ණය පැහැර හරින්නෙක් වශයෙන් ලේඛනගතවීම වළක්වා ගැනීමයි මේ තුළින් බලාපොරොත්තු වන්නේ. ඒ ක්‍රමය දැනට සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. ණය ගත් සමහර පිරිස් යම් යම් අපහසුතාවලට පත් වෙලා තිබෙන්නට පුළුවන්. ඒවාට අවශ්‍ය, සුදුසු වැඩ පිළිවෙළ පිළිබඳ අදාළ ආයතන සමඟ සාකච්ඡා කරලා බලන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## මඩ/කායන්කුඩා කන්නගි විද්‍යාලය සහ මඩ/ කෝරක්කල්ලිමඩු ශ්‍රී රමණ මහරිෂි විද්‍යාලය: ශාරීරික අභ්‍යාස උපදේශකයින්

## மட்/காயன்குடா கண்ணகி கல்லூரி மற்றும் மட்/ கோரகல்லிமடு ஸ்ரீ ரமண மஹரிஷி வித்தியாலயம்: உடற்பயிற்சிப் பயிற்றுவிப்பாளர்கள்

## BT/ KAYANKUDA KANNAHI VIDYALAYA AND BT/ KORAKKALLIMADU SRI RAMANA MAHARISHI VIDYALAYA: PHYSICAL TRAINING INSTRUCTORS

72/2024

**1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் சார்பாக)
(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මඩකලපුව-බටහිර අධ්‍යාපන කලාපයට අයත් මඩ/ කායන්කුඩා කන්නගි විද්‍යාලය සහ කල්කුඩා අධ්‍යාපන කලාපයට අයත් මඩ/කෝරක්කල්ලිමඩු ශ්‍රී රමණ මහරිෂි විද්‍යාලය යන පාසල් IC කාණ්ඩයට අයත් පාසල් බවත්;

(ii) මඩ/කායන්කුඩා කන්නගි විද්‍යාලයේ සිසුවියන් එල්ලේ ක්‍රීඩාවෙන් ජාතික මට්ටමින් ප්‍රථම ස්ථානයද, මඩ/කෝරක්කල්ලිමඩු ශ්‍රී රමණ මහරිෂි විද්‍යාලයේ සිසුවියන් කබඩි ක්‍රීඩාවෙන් ජාතික මට්ටමින් ප්‍රථම ස්ථානයද ජයග්‍රහණය කර ඇති බවත්;

(iii) එහෙත් ඉහත පාසල්වලට මේ දක්වා ශාරීරික අභ්‍යාස උපදේශකවරුන් පත්කර නොමැති බවත්;

එතුමිය දන්නේද?

(ආ) එසේ නම්, ඉහත පාසල් සඳහා ශාරීරික අභ්‍යාස උපදේශකවරුන් පත් කිරීමට පියවර ගන්නේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மேற்கு கல்வி வலயத்தின் மட்/ காயன்குடா கண்ணகி கல்லூரி மற்றும் கல்குடா கல்வி வலயத்தின் மட்/கோரகல்லிமடு ஸ்ரீ ரமண மஹரிஷி வித்தியாலயம் ஆகிய பாடசாலைகள் IC வகையைச் சேர்ந்த பாடசாலைகள் என்பதையும்;

(ii) மட்/காயன்குடி கண்ணகி கல்லூரியைச் சேர்ந்த மாணவிகள் எல்லே விளையாட்டில் தேசிய மட்டத்தில் முதலிடத்தையும், மட்/கோரகல்லிமடு ஸ்ரீ ரமண மஹரிஷி வித்தியாலயத்தைச் சேர்ந்த மாணவிகள் கபடி விளையாட்டில் தேசிய மட்டத்தில் முதலிடத்தையும் பெற்றுள்ளார்கள் என்பதையும்;

(iii) எனினும், மேற்படி பாடசாலைகளுக்கு இதுவரையில் உடற்பயிற்சி பயிற்றுவிப்பாளர்கள் நியமிக்கப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், மேற்குறிப்பிட்ட பாடசாலைகளுக்கு உடற்பயிற்சி பயிற்றுவிப்பாளர்களை நியமிப்பதற்கு நடவடிக்கைகள் மேற்கொள்வாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Is she aware that -

(i) Bt/ Kayankuda Kannahi Vidyalaya in Batticaloa West Educational Zone and Bt/ Korakkallimadu Sri Ramana Maharishi Vidyalaya in Kalkudah Educational Zone belong to the IC category;

(ii) students from Bt/ Kayankuda Kannahi Vidyalaya won the first place at the national-level in Elle and students from Bt/ Korakkallimadu Sri Ramana Maharishi Vidyalaya won the first place at the national level in Kabaddi; and

(iii) however, physical training instructors have not been appointed to the schools concerned up to now?

(b) If so, will she inform this House whether steps will be taken to appoint physical training instructors to these schools?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මඩකලපුව - බටහිර අධ්‍යාපන කලාපයට අයත් මඩ/කායන්කුඩා කන්නහි විද්‍යාලය සහ කල්කුඩා අධ්‍යාපන කලාපයට අයත් මඩ/කෝරක්කල්ලිමඩු ශ්‍රී රමණ මහරිෂි විද්‍යාලය යන පාසල් IC කාණ්ඩයට අයත් පාසල් වේ.ාපන කලාපයට

(ii) මඩ/කායන්කුඩා කන්නහි විද්‍යාලයේ සිසුවියන් එල්ලේ ක්‍රීඩාවෙන් ජාතික මට්ටමින් ප්‍රථම ස්ථානයද, මඩ/කොරක්කල්ලිමඩු ශ්‍රී රමණ මහරිෂි විද්‍යාලයේ සිසුවියන් කබඩි ක්‍රීඩාවෙන් ජාතික මට්ටමින් ප්‍රථම ස්ථානයද ජයග්‍රහණය කර ඇත.

(iii) මඩ/කායන්කුඩා කන්නහි විද්‍යාලය සඳහා එක් ක්‍රීඩා පුහුණුකරුවෙක්ද, මඩ/කොරක්කල්ලිමඩු ශ්‍රී රමණ මහරිෂි විද්‍යාලය සඳහා ක්‍රීඩා පුහුණුකරුවන් දෙදෙනෙක්ද වන පරිදි පත් කර ඇත

(ආ) ඉහත පාසල් සඳහා (අ) (iii) හි සඳහන් පරිදි ක්‍රීඩා පුහුණුකරුවන් පත් කර ඇති බැවින් ශාරීරික අභ්‍යාස උපදේශකවරුන් පත් කිරීමක් අවශ්‍ය නොවේ.

(ඇ) අදාළ නොවේ.

## රට තුළ නිෂ්පාදනය කරන ආහාර භෝග: වනසතුන් සිදු කරන හානිය

### உள்நாட்டு உணவுப் பயிர்கள்: விலங்குகளால் ஏற்படுத்தப்படும் சேதம்

DOMESTIC FOOD CROPS: DAMAGE CAUSED BY ANIMALS

94/2024

**2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චමින්ද විජේසිරි මහතා මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சமிந்த விஜேசிறி சார்பாக)
(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. Chaminda Wijesiri)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රට තුළ නිෂ්පාදනය කරන ආහාර භෝගවලට වනසතුන් විසින් සිදු කරනු ලබන හානිය තක්සේරු කර තිබේද;

(ii) එසේ නම්, එම හානිය වී, එළවළු සහ පළතුරු යන එක් එක් භෝගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ආහාර භෝග සඳහා වැඩි වශයෙන් හානි කරනු ලබන වනසතුන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நாட்டுக்குள் உற்பத்தி செய்யப்படும் உணவுப் பயிர்களுக்கு வன விலங்குகளால் ஏற்படுத்தப் படும் சேதம் மதிப்பிடப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி சேதம் நெல், காய்கறிகள் மற்றும் பழங்கள் ஆகிய ஒவ்வொரு பயிர் வகையினதும் அடிப்படையில் வெவ்வேறாக யாதென்பதையும்;

(iii) உணவுப் பயிர்களுக்கு அதிகமான பாதிப்புக்களை ஏற்படுத்தும் வன விலங்குகள் யாவை யென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether the damage caused by animals to domestic food crops has been assessed;

(ii) if so, separately, the damage caused to each crop, i.e. paddy, vegetables and fruits; and

(iii) the animals that cause the most disastrous damage to food crops?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) වනසතුන්ගෙන් සිදු වූ වගා හානි ප්‍රමාණය සම්බන්ධ තක්සේරු කිරීමක් මෑතකදී මෙම අමාත්‍යාංශය මැදිහත්ව සිදු කර නොමැත.

සාමාන්‍යයෙන් නියඟය, ගංවතුර වැනි ස්වාභාවික විපත් හා වනඅලින්ගෙන් සිදුවන වගා හානිවලින් සිදුවන අලාභ ගණනය කිරීමක් සිදු කළද නිරන්තරයෙන් සිදුවන රිළවා, වඳුරා, දඬුලේනා, වල් ඌරා හා ඉත්තෑවා වැනි වනසතුන්ගෙන් වන වගා හානි පිළිබඳ ජාතික මට්ටමින් අලාභ ගණනය කිරීමක් සිදු නොවේ.

(ii) කෘෂිකර්මාන්තයේ වනසත්ව හානි සම්බන්ධයෙන් 2022 වර්ෂයේදී හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනය මඟින් අර්ධ වාර්ෂික දළ තක්සේරුවක් සිදුකර ඇත.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ඒ සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ ගොවිජන සංවර්ධන බලප්‍රදේශ 464ක් ආවරණය කළ දත්ත හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනය වෙත ලබා දෙන ලදී. 2021/22 මහ කන්නය සඳහා වී සහ අනෙකුත් බෝගවලට අදාළ දත්ත මෙන්ම 2022 වර්ෂයේ ජනවාරි සිට ජුනි දක්වා කාලය සඳහා පොල් සහ අනෙකුත් බහුවාර්ෂික බෝගවලට අදාළ දත්ත ඊට ඇතුළත් විය.

බෝග/බෝග කාණ්ඩය අනුව වනසත්ව හානි වාර්තා වූ වපසරිය සහ බෝග/බෝග කාණ්ඩවල වපසරියට සාපේක්ෂව ඒවායේ ප්‍රතිශත අගයන්

| අංකය | බෝගය/ බෝග කාණ්ඩය | ගොවිජන සංවර්ධන බල ප්‍රදේශ සංඛ්‍යාව | බෝගයේ වපසරිය (හෙක්ටයාර්) | හානි වාර්තා වූ වපසරිය (හෙක්ටයාර්) | % |
|---|---|---|---|---|---|
| 1 | පොල් | 207 | 275,540 | 57,816 | 21.0 |
| 2 | වී | 334 | 569,362 | 31,922 | 5.6 |
| 3 | බඩ ඉරිඟු | 96 | 375,176 | 13,786 | 3.7 |
| 4 | එළවළු | 169 | 57,005 | 9,568 | 16.8 |
| 5 | කෙසෙල් | 86 | 17,754 | 4,533 | 25.5 |
| 6 | වෙනත් ධාන්‍ය | 40 | 11,705 | 2,327 | 19.9 |
| 7 | රටකජු | 19 | 5,196 | 1,675 | 32.2 |
| 8 | කොකෝවා | 2 | 1,488 | 1,101 | 74.0 |
| 9 | අඹ | 21 | 2,503 | 1,015 | 40.5 |
| 10 | මිරිස් | 7 | 1,519 | 976 | 64.3 |
| 11 | පැපොල් | 8 | 2,250 | 888 | 39.5 |
| 12 | කුරුඳු | 4 | 2,570 | 795 | 30.9 |
| 13 | වෙනත් අල වර්ග | 91 | 4,504 | 738 | 16.4 |
| 14 | දූරියන් | 3 | 377 | 301 | 79.8 |
| 15 | අලිපේර | 4 | 280 | 159 | 56.8 |
| 16 | ගෙවතු | 5 | 267 | 147 | 55.0 |
| 17 | උඳු | 5 | 859 | 138 | 16.1 |
| 18 | සාදික්කා | 1 | 280 | 120 | 42.9 |
| 19 | මුං ඇට | 8 | 1,033 | 107 | 10.4 |
| 20 | මඤ්ඤොක්කා | 9 | 2,445 | 95 | 3.9 |
| 21 | පැණි කොමඩු | 4 | 222 | 84 | 37.8 |
| 22 | රඹුටන් | 1 | 150 | 75 | 50.0 |
| 23 | අන්නාසි | 7 | 461 | 70 | 15.2 |
| 24 | පේර | 1 | 340 | 64 | 18.8 |
| 25 | ගම්මිරිස් | 2 | 91 | 43 | 47.3 |
| 26 | කුරක්කන් | 1 | 70 | 36 | 51.4 |
| 27 | ලූනු | 2 | 249 | 32 | 12.9 |
| 28 | සෝයා බෝංචි | 2 | 1,230 | 12 | 1.0 |
| 29 | වදුරු මෑ | 1 | 14 | 7 | 50.0 |
| 30 | තල | 1 | 48 | 5 | 10.4 |
| 31 | සෝගම් | 1 | 4 | 1 | 25.0 |
| 32 | කහ | 1 | 5 | 0.5 | 10.0 |
| 33 | බතල | 1 | 14 | 0.01 | 0.1 |
| | | එකතුව | **1,335,012** | **128,637** | **9.6** |

සවිස්තර තොරතුරු පසුබිම් වාර්තාවට** ඇතුළත් කර ඇත.

(iii) කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වනසත්ව හානි කළමනාකරණය සඳහා වන කමිටුවේ අවධානය අනුව, සුලභ හා පීඩාකාරී වනසතුන් පහත පරිදි වර්ගීකරණය කළ හැකිය.

* වගා භූමිය වෙත ඉහළින් ප්‍රවිෂ්ට වන වනසතුන්

  රිළවා, වඳුරා, දඬු ලේනා, මොනරා

* වගා භූමිය වෙත පොළොව මතුපිටින් ප්‍රවිෂ්ට වන වනසතුන්

* ප්‍රවිෂ්ටය ගොවින්ගේ මට්ටමින් පාලනය කිරීම අපහසු වනසතුන්

  අලියා

* ප්‍රවිෂ්ටය ගොවින්ගේ මට්ටමින් පාලනයට යම් හෝ හැකියාවක් සහිත වනසතුන්

  ඉත්තෑවා, වල් ඌරා

(ආ) අදාළ නොවේ.

---

*** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

## 2015 සිට සිදු කරන ලද චීන ආයෝජන: විස්තර
2015 தொடக்கம் மேற்கொள்ளப்பட்டுள்ள சீன முதலீடுகள்: விபரம்
CHINESE INVESTMENTS MADE FROM 2015: DETAILS

195/2024

**4. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා වෙනුවට)**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு நலின் பண்டார ஜயமஹ சார்பாக)

(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. Nalin Bandara Jayamaha)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා චීනය විසින් ශ්‍රී ලංකාවේ සිදු කරන ලද ආයෝජන ව්‍යාපෘති සංඛ්‍යාව, එම එක් එක් ආයෝජන ව්‍යාපෘතියේ නම, ආයෝජනයේ වටිනාකම සහ උත්පාදනය කර ඇති සෘජු හා වක්‍ර රැකියා සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ශ්‍රී ලංකාවට චීන ආයෝජන වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை இலங்கையில் சீனா மேற்கொண்டுள்ள முதலீட்டு கருத்திட்டங்களின் எண்ணிக்கை, அவ்வொவ்வொரு கருத்திட்டத்தினதும் பெயர், முதலீட்டின் பெறுமதி மற்றும் அதனூடாகத் தோற்றுவிக்கப்பட்ட நேரடி மற்றும் மறைமுகத் தொழில்வாய்ப்புகளின் எண்ணிக்கை என்பன ஆண்டு வாரியாக வெவ்வேறாக யாதென் பதையும்;

(ii) இலங்கைக்கு அதிகளவிலான சீன முதலீடுகளை ஈர்த்துக்கொள்வதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House the -

(i) number of investment projects carried out by China in Sri Lanka from 2015 up to now, along with the name of each such investment project, the value of the investment, and the number of direct and indirect jobs generated, for each year, separately; and

(ii) steps that will be taken to attract more Chinese investments to Sri Lanka?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා චීනය විසින් ශ්‍රී ලංකාවේ සිදු කරන ලද ආයෝජන ව්‍යාපෘති සංඛ්‍යාව, එම එක් එක් ආයෝජන ව්‍යාපෘතියේ නම, ආයෝජනයේ වටිනාකම සහ උත්පාදනය කර ඇති සෘජු හා වක්‍ර රැකියා සංඛ්‍යාව පිළිබඳව ඇමුණුම 01 හි සහ 02හි සඳහන් වේ.

Annex 1

**Board of Investment of Sri Lanka**
**Chinese Investment projects that have brought FDI from 2015 onwards (including inactive projects)**
**Projects under Sec 16 & 17 of BOI Law - Chinese Investment projects that have brought FDI from 2015 onwards**

Projects Approved under 17 of BOI Law

| S.No. | Project Name | Business Activity | Current Status | FDI Sector | Agreement signed year | Commercialized year | Total FDI | Employment Generation (Nos.) 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | Total |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | AVIC INTERNATIONAL HOTELS LANKA LTD. | MIXED DEVELOPMENT | In Commercial Operation | Housing Property Development & Shop | 2012 | 2020 | 142.11 | | | | | | | | 401 | 401 | 401 | 1203 |
| 2 | KELUN LIFESCIENCES (PVT) LTD. | IV FLUIDS | In Commercial Operation | Other Manufactured Products | 2018 | 2021 | 7.00 | | | | | | | 213 | 290 | 365 | 371 | 1239 |
| 3 | WOODLEAD LANKA INTL. (PVT) LTD. | PANEL FURNITURE, FURNITURE PARTS, FLOORING, CEILING | In Commercial Operation | Wood and Wood Products | 2018 | 2018 | 4.39 | | | | | 107 | 81 | 52 | 52 | 52 | 127 | 471 |
| 4 | JIE ZHONG JIE LANKA DEV.CON.AND ENG.(P)L | 176 ROOMED HOEL AT PANADURA | In Commercial Operation | Hotels & Restaurant | 2015 | 2017 | 3.25 | | | | | 253 | 135 | 160 | 195 | 160 | 160 | 1063 |
| 5 | DONGXIA INDUSTRIAL LANKA (PVT) LTD. | MFG. GARMENTS FOR EXPORT | In Commercial Operation | Textile, Wearing Apparel & Leather Prod. | 2020 | 2024 | 3.16 | | | | | | | | | | 358 | 358 |
| 6 | U C RAINBOW LANKA (PVT) LTD. | MIXED DEVELOPMENT PROJECT | In Commercial Operation | Housing Property Development & Shop Office | 2014 | 2017 | 0.60 | | | 2 | 2 | 2 | 3 | | 3 | 3 | 3 | 18 |
| 7 | LILIES INTIMATES LANKA (PVT) LTD. | GARMENT ACCESSORIES | In Commercial Operation | Other Manufactured Products | 2013 | 2015 | 0.41 | 14 | 17 | 38 | 24 | 31 | 29 | 45 | 79 | 99 | 108 | 484 |
| 8 | COOLCEPT HOLDINGS (PVT) LTD. | PROJECT TO SET UP A SOFTWARE DEVELOPMENT AND IT ENABLED SERVICES FOR EXPORT MARKET AT COLOMBO-02 | In Commercial Operation | IT & BPO | 2023 | 2023 | 0.05 | | | | | | | | | 21 | 26 | 47 |
| 9 | CEYLON HANGTAI CO. (PVT) LTD. | SPONGE MATTRESS MANUFACTURING PLANT (FOAM & SPRING MATTRESSES, PILLOWS, PU FOAM, FOAM SCRAP GENERATED FROM THE PRODUCTION PROCESS) | Partially Commenced Commercial Operations | Chemical, Coal, Petroleum, | 2023 | 2024 | 3.39 | | | | | | | | | | | 0 |
| 10 | HAMBANTOTA INTL. PORT GROUP (PVT) LTD. | DEVELOPMENT OF HAMBANTOTA PORT | Partially Commenced Commercial Operations | Port Container Terminals | 2017 | 2017 | 1120.31 | | | | 128 | | | | 92 | n.a | 113 | 333 |
| 11 | SINA INTL. HOTELS & RESORTS DEV. (P) L | 24 ROOMED HOTEL | Awaiting Commercial Operation | Hotels & Restaurant | 2017 | | 1.09 | | | | | | | | | | | 0 |
| 12 | PROJECT TO UNDERTAKE LOGISTIC SERVICES FOR THE EXPORT MARKET BY SETTING UP OF A LOGISTIC AND DISTRIBUTION CENTRE AT COLOMBO PORT | LOGISTIC SERVICES | Approved/Awaiting Agreement | Other Serivices | | | 126.00 | | | | | | | | | | | 0 |
| | | | Total | | | | 1411.76 | 14 | 17 | 40 | 154 | 393 | 248 | 470 | 1112 | 1101 | 1667 | [redacted] |

Note: FDI inflow after 2015 has been given for each project

Chinese Investment Projects - Grants

Annex II

| Project Name | | Funding Institution | Agreement Date | Closing Date | Implementing Agency | Amount (USD) | Status |
|---|---|---|---|---|---|---|---|
| Preparatory Feasibility Study on International Convention and Exhibition Centre | | Government of People's Republic of China | 09/10/2020 | 09/10/2020 | Ministry of Finance, Planning and Economic Development / Colombo Port City Economic Commission | RMB 480,000 | Ongoing |
| School Uniform Materials 2025 | | Government of People's Republic of China | | | Ministry of Education, Higher Education and Vocational Education | RMB 124.62 Mn | Completed |
| Emergency Humanitarian Assistance Project | Provision of 10,000 MT of Rice | Government of People's Republic of China | | | Ministry of Public Administration, Provincial Councils and Local Government | RMB 80 Mn | Completed |
| | Provision of 18 Types of essential Medicines and medical supplies | Government of People's Republic of China | | | Ministry of Health and Mass Media | RMB 106 Mn | Completed |
| | Provision of School Uniform Material for 2023 | Government of People's Republic of China | | | Ministry of Education, Higher Education and Vocational Education | RMB 90 Mn | Completed |
| | Provision of 9,000 MT of Diesel | Government of People's Republic of China | | | Ministry of Power and Energy | RMB 90 Mn | Completed |
| | Provision of School Uniform Material for 2024 | Government of People's Republic of China | | | Ministry of Education, Higher Education and Vocational Education | RMB 98.3 Mn | Completed |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | Provision of fishing nets for small-scale fishermen in the Northern and Eastern provinces of Sri Lanka | Government of People's Republic of China | | | Ministry of Fisheries, Aquatic and Ocean Resources | RMB 11.3 Mn | Completed |
| | Provision of in-kind assistance for the development of housing facilities for low-income fishermen living in the Northern and Eastern provinces of Sri Lanka | Government of People's Republic of China | | | Ministry of Fisheries, Aquatic and Ocean Resources | RMB 16.95 Mn | Completed |
| | Provision rice subsidies for selected small-scale fishermen in the Northern and Eastern provinces of Sri Lanka | Government of People's Republic of China | | | Ministry of Fisheries, Aquatic and Ocean Resources | RMB 12.55 Mn | Completed |
| Construction of 1996 Housing Units under the Chinese Aid Programme for the Low Income People | | Government of People's Republic of China | 09/01/2019 | 09/01/2019 | Ministry of Urban Development, Construction and Housing | RMB 553 Mn | Ongoing |
| Project of China-Sri Lanka Joint Research and Demonstration Centre for Water Technology | | Government of People's Republic of China | | | Ministry of Urban Development, Construction and Housing | RMB 81 Mn | Completed |
| Project of Sri Lanka National Hospitalized Nephrology Hospital in Sri Lanka | | Government of People's Republic of China | | | Ministry of Health and Mass Media | RMB 400 Mn | Completed |
| Comprehensive Refurbishment Superior Court Complex | | Government of People's Republic of China | 07/04/2016 | 31/12/2020 | Ministry of Justice and National Integration | RMB 229 Mn | Ongoing |

Chinese Investment Projects - Loans Annex II

| Project Name | Funding Institution | Agreement Date | Closing Date | Implementing Agency | Amount (USD) | Status |
|---|---|---|---|---|---|---|
| Central Expressway Project Section I from Kadawatha to Meerigama | The Export Import Bank of China | 22/03/2019 | 30/06/2024 | Ministry of Transport, Highways, Ports and Civil Aviation | USD 989,448,556 | Ongoing |
| Kandy North Pathadumbara Integrated Water Supply Project | The Export Import Bank of China | 22/12/2017 | 30/06/2023 | Ministry of Urban Development, Construction and Housing | RMB 1,636,553,500 | Ongoing |
| Gampaha, Attanagalla, Minuwangoda Integrated Water Supply Scheme | China Development Bank | 29/08/2016 | 27/12/2019 | Ministry of Urban Development, Construction and Housing | USD 195,075,000 | Loan was terminated after signing the amendment agreements for debt restructuring and the balance amount in the ESCROW account was returned to CDB. |
| Thambuttegama Water Supply Project | China Development Bank | 21/08/2017 | 25/10/2020 | Ministry of Urban Development, Construction and Housing | USD 102,543,898 | Loan was terminated after signing the amendment agreements for debt restructuring. |
| Katana Water Supply Project | China Development Bank | 21/08/2017 | 25/10/2020 | Ministry of Urban Development, Construction and Housing | USD 54,791,485 | Completed |
| Upgrading Health Facilities in Selected Hospitals in Sri Lanka | The Hongkong and Shanghai Banking Corporation | 12/03/2019 | | Ministry of Health and Mass Media | USD 72,250,000 | HSBC loan disbursement was suspended due to debt restructuring. Balance work |
| Procurement, Purchase and Delivery of 9 Diesel Multiple Units for Up-Country Line Operations in Sri Lanka Railways Project | The Hongkong and Shanghai Banking Corporation | 27/04/2018 | | Ministry of Transport, Highways, Ports and Civil Aviation | USD 79,787,806.80 | Completed |

තවද කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විසින් සිදු කරන ලද ඉඩම් වෙන් කිරීමට අදාළව 2024.08.31 දින වනවිට අදියර 01 යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 1,204.85ක මුදලක් ආයෝජනය කර ඇති අතර, අදියර 02 යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 260.47ක පිරිවැයක් දරා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා භූමි සැලසුම් කිරීමට - infrastructure development and landscaping - අපේක්ෂා කෙරේ. විස්තර අමුණුම 03** මඟින් දක්වා ඇත.

(ii) ශ්‍රී ලංකාවට චීන ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් මෙරට දේශපාලන හා ආර්ථික ස්ථාවරත්වය ආයෝජකයින්ට හිතකර දර්ශක ලෙස යොදා ගනී. ආයෝජන මණ්ඩලයෙහි අවධානය පුනර්ජනනීය බලශක්තිය, තොරතුරු තාක්ෂණ, සංචාරක, අධි තාක්ෂණික නිෂ්පාදන සහ කෘෂිකර්මාන්තය වැනි ප්‍රධාන අංශ කෙරෙහි යොමු වනු ඇත. කන්කසන්තුරේ, පරන්තන් සහ මාන්කුලම් හි නව ආයෝජන කලාප සහ ගාල්ල හා කුරුණෑගල තාක්ෂණික උද්‍යාන දෙකක් සංවර්ධනය කිරීම, ආයෝජන ව්‍යාපෘති සඳහා තවත් අවස්ථා නිර්මාණය කරනු ඇත.

ආයෝජන මණ්ඩලය චීනයෙන් සැලකිය යුතු ආයෝජන ආකර්ෂණයක් අපේක්ෂා කරන අතර, ඒවා මාර්ගගත සම්මන්ත්‍රණ තුළින්, වාණිජ මණ්ඩල සහ තානාපති කාර්යාලය සමඟ සම්බන්ධවීම් හරහා ක්‍රියාකාරීව ප්‍රවර්ධනය කරයි. අභ්‍යන්තර දූත පිරිස්වලට පහසුකම් සැලසීමේ ප්‍රයත්නවල ප්‍රතිඵලයක් ලෙස දැනටමත් 2025 ජනවාරි සිට

මාර්තු දක්වා කාලය තුළ චීන නියෝජිත කණ්ඩායම් හයක් ශ්‍රී ලංකාවට පැමිණ ඇත.

චීන ආයෝජන දිරිගැන්වීම සඳහා තවත් උපාය මාර්ගයක් ලෙස ජාත්‍යන්තර ආයෝජන සංසදයක්, 2025 තුන්වන කාර්තුවේ පැවැත්වීම සඳහා සැලසුම් කර ඇත.

(ආ) පැන නොනඟී.

## ඉංජිනේරු තාක්ෂණය උගන්වනු ලබන රජයේ පාසල්: විස්තර

## பொறியியல் தொழில்நுட்பவியலைக் கற்பிக்கும் அரச பாடசாலைகள்: விபரம்

## GOVERNMENT SCHOOLS TEACHING ENGINEERING TECHNOLOGY: DETAILS

213/2024

**5. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහණ බණ්ඩාර මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரோஹண பண்டார சார்பாக )
(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. Rohana Bandara)

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් අතරින් ඉංජිනේරු තාක්ෂණවේදය විෂයක් ලෙස උගන්වනු ලබන පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉංජිනේරු තාක්ෂණවේදය ඉතා වැදගත් විෂයක් බැවින් එය අනෙකුත් පාසල්වලත් ඉගැන්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள அரச பாடசாலைகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி பாடசாலைகளில் தொழில்நுட்பவியல் பாடத்தை கற்பிக்கும் பாடசாலைகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) தொழில்நுட்பவியல் மிக முக்கியமான பாடம் என்பதால், அதனை ஏனைய பாடசாலைகளிலும் கற்பிப்பதற்காக மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of government schools functioning in Sri Lanka;

(ii) number of schools that teach Engineering Technology as a subject among the said schools; and

(iii) measures that are being taken to teach Engineering Technology in other schools as it is a highly important subject?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති රජයේ පාසල් සංඛ්‍යාව 10,096කි.

(ii) ඉංජිනේරු තාක්ෂණවේදය විෂයක් ලෙස උගන්වනු ලබන පාසල්බ සංඛ්‍යාව - 498

ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයක් ලෙස උගන්වනු ලබන පාසල් සංඛ්‍යාව - 485

(iii) ඉල්ලුමක් සහිත ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් සහිත පාසල්වල ඉල්ලීම් පාසල් ව්‍යූහ කමිටුව මඟින් පළාත් ව්‍යූහ කමිටුව වෙතත්, එමඟින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ව්‍යූහ කමිටුව වෙතත් ඉදිරිපත් කර, අවශ්‍ය භෞතික හා මානව සම්පත් ප්‍රමාණවත් පරිදි ඇති පාසල් සඳහා තාක්ෂණවේදය විෂය ධාරාව ඉගැන්වීම සඳහා අනුමැතිය ලබා දේ.

තාක්ෂණවේදය විෂය අපොස (උසස් පෙළ) විෂයක් බැවින් උසස් පෙළ පන්ති සහිත පාසල්වල පමණක් ක්‍රියාත්මක අතර ඉදිරි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේදී "ජීවිතය සහ තාක්ෂණය" යනුවෙන් 06 ශ්‍රේණියේ සිට විෂයක් ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

(ආ) අදාළ නොවේ.

## තරුණ ව්‍යවසායකයන්ට ණය ලබා දීම සඳහා වන සංවර්ධන බැංකුව: පිහිටුවීම

## இளம் தொழில்முயற்சியாளர்கள் கடனைப் பெற்றுக்கொள்வதற்கான அபிவிருத்தி வங்கி: நிறுவுதல்

## DEVELOPMENT BANK TO GRANT LOANS TO YOUNG ENTERPRENEURS: ESTABLISHMENT

222/2024

**6. ගරු ගයන්ත කරුණාතිලක මහතා(ගරු අජිත් පී. පෙරේරා මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு அஜித் பீ. பெரேரா சார்பாக)
(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. Ajith P. Perera)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) තරුණ ව්‍යවසායකයන්ට ඇප ඉදිරිපත් කිරීමකින් තොරව ණය ලබාගැනීම සඳහා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව පිහිටුවීමට පොරොන්දු වූ සංවර්ධන බැංකුව මේ වනතෙක් පිහිටුවා නොමැති බව දන්නේද;

(ii) එකී මැතිවරණ පොරොන්දුව ඉටු කිරීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இளம் தொழில்முயற்சியாளர்கள் பிணையற்ற கடனைப் பெற்றுக்கொள்ளும் பொருட்டு, "வளமான நாடு அழகான வாழ்க்கை" கொள்கைப் பிரகடனத்துக்கு அமைவாக நிறுவப் படுமென வாக்குறுதி அளிக்கப்பட்ட அபிவிருத்தி வங்கி இற்றைவரை நிறுவப்படவில்லை என்ப தையும்;

(ii) மேற்படி தேர்தல் வாக்குறுதியை நிறைவேற்று வதற்குத் தாமதிப்பதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(i) whether he is aware that the development bank promised to be established for granting loans without collaterals to young entrepreneurs, which is stated in the Manifesto "A Rich Country, A Beautiful Life", has not been established so far; and

(ii) the reasons for the delay in delivering on the promise concerned?

(b) If not why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්. එසේ වුවත්, ඇපකර මත පදනම් වූ ණය දීම වෙනුවට තරුණ ව්‍යවසායකයින් ඇතුළු කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා මුදල් ප්‍රවාහ පදනම් කරගත් ණය දීම විශේෂයෙන් රජයේ බැංකු, එනම් ලංකා බැංකු, මහජන බැංකු මඟින් දැනටමත් සිදු වේ.

(ii) සුරැකුමක් ලබා ගනිමින් ණය ලබා දීම වෙනුවට මුදල් ප්‍රවාහ මත පදනම්ව ණය ලබා දීමේ ක්‍රම දෙකක් තිබේ.

1. පවත්නා බැංකු සම්මතයන්ට අනුකූලව තරුණ ව්‍යවසායකයින්ට සුරැකුමක් රහිතව මුදල් ප්‍රවාහය මත පදනම් වූ ණය ලබා දීම පිළිබඳව බැංකුවලට උපදෙස් ලබා දීම.

මේ සම්බන්ධයෙන් ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා උපදෙස් නිකුත් කර ඇත.

2. සුරැකුමක් ලබාගත යුතු ණය සඳහා ණය ඇපකර ලබා දීම.

රජයට තනි පුද්ගලයින් ලබාගන්නා ණය සඳහා ණය ඇපකර නිකුත් කළ නොහැකි බැවින් සීමාසහිත ජාතික ණය ඇපකර ආයතනය (NCGIL) ස්ථාපිත කර ඇත. ණය අවශ්‍ය නමුත් ඒ සඳහා අවශ්‍ය සුරැකුම් ලබා දීමට නොහැකි ව්‍යවසායකයින්ට සීමාසහිත ජාතික ණය ඇපකර ආයතනය වෙතින් ණය ඇපකර සහතිකයක් ලබාගෙන එය වලංගු සුරැකුමක් ලෙස සලකා ණය ලබා ගත හැකි වේ.

සංවර්ධන බැංකුවක් පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වන්නේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා හිතකර මූල්‍ය පරිසරයක් නිර්මාණය කිරීම වන අතර, සුරැකුම් මත පදනම් වූ ණය දීම වෙනුවට මුදල් ප්‍රවාහ මත පදනම් වූ ණය ලබා දීම ද එක් අපේක්ෂාවකි. එය දිගුකාලීන ක්‍රියාවලියක් වන අතර ආර්ථික තිරසරභාවය සහ පවත්වාගෙන යාම පිළිබඳ රජයේ ක්‍රියාමාර්ගවලට අනුකූල විය යුතුය. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහාය වීම, නිෂ්පාදන ධාරිතාව වැඩිදියුණු කිරීම සහ නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණු සහිතව සංවර්ධන බැංකුවක් පිහිටුවීමට යෝජනා කර ඇත. එහි ආරම්භක පියවරක් ලෙස, 2025 අයවැය මඟින් සීමාසහිත ජාතික ණය ඇපකර ආයතනය හි සහාය ඇතිව, සංවර්ධන බැංකු ක්‍රියාපටිපාටි අනුගමනය කිරීමෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා පවතින රාජ්‍ය බැංකු තුළ නව පරිපාලන ව්‍යුහයක් නිර්මාණය කිරීමට යෝජනා කරන ලදී. ඒ අනුව, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවාසයකයින්ගේ සංවර්ධන බැංකුවක් පිහිටුවීමට පියවර ගනු ලැබේ.

(ආ) පැන නොනඟී.

## ගංවතුර අවදානම සහිත ගංගා සහ ඇළ දොළ: ගංවතුර අවම කිරීමේ ව්‍යාපෘති

### வெள்ள அபாயமுள்ள ஆறுகள் மற்றும் ஓடைகள்: வெள்ளத்தைக் குறைப்பதற்கான கருத்திட்டங்கள்

### RIVERS AND STREAMS WITH CONSTANT THREAT OF FLOODING: FLOOD MITIGATION PROJECTS

294/2024

**8. ගරු ගයන්ත කරුණාතිලක මහතා(ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரஊப் ஹகீம் சார்பாக)
(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. Rauff Hakeem)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) නිරතුරුවම ගංවතුර ගැලීමේ අවදානම සහිත ගංගා සහ ඇළ දොළ කවරේද;

(ii) ඒවායේ ගංවතුර පාලනය කිරීම සඳහා මේ වනවිට ක්‍රියාත්මක කර ඇති දේශීය හා විදේශීය ව්‍යාපෘති කවරේද;

(iii) එම ව්‍යාපෘති සඳහා භාවිත කර ඇති දේශීය අරමුදල් ප්‍රමාණය සහ විදේශීය අරමුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ව්‍යාපෘති සඳහා අරමුදල් සපයා ඇති ආයතන කවරේද;

(v) ඉහත ව්‍යාපෘති අතර විවිධ බාධා හේතුවෙන් අසාර්ථක වී ඇති ව්‍යාපෘති තිබේද;

(vi) එසේ නම්, එම ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தொடர்ச்சியாக வெள்ளப்பெருக்கு அபாயம் காணப்படுகின்ற ஆறுகள் மற்றும் ஓடைகள் யாவையென்பதையும்;

(ii) அவற்றின் வெள்ளத்தைக் கட்டுப்படுத்துவதற்காக இன்றளவில் செயற்படுத்தப்பட்டுள்ள உள்நாட்டு மற்றும் வெளிநாட்டுக் கருத்திட்டங்கள் யாவையென்பதையும்;

(iii) அத்தகைய கருத்திட்டங்களுக்காகப் பயன்படுத்தப்பட்டுள்ள உள்நாட்டு மற்றும் வெளிநாட்டு நிதியளவு வெவ்வேறாக யாதென்பதையும்;

(iv) மேற்படி கருத்திட்டங்களுக்காக நிதி வழங்கிய நிறுவனங்கள் யாவையென்பதையும்;

(v) மேற்படி கருத்திட்டங்களில் பல்வேறு தடைகள் காரணமாகத் தோல்வியடைந்த கருத்திட்டங்கள் உள்ளனவா என்பதையும்;

(vi) ஆமெனில், அக்கருத்திட்டங்கள் யாவையென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) rivers and streams which pose constant threat of flooding;

(ii) local and foreign projects that have been implemented so far to control flooding of those water bodies;

(iii) separately, the amount of local funds and foreign funds utilized for the said projects;

(iv) the institutions that have provided funds for the projects concerned;

(v) whether there are any projects among these projects that have failed due to various obstacles; and

(vi) if so, the names of those projects?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) අත්තනගලු ඔය, මා ඔය, කළු ගඟ, මහවැලි ගඟ, ගිං ගඟ, නිල්වලා ගඟ, හැඩ ඔය, මුන්දෙනි ආරු, දැදුරු ඔය, මල්වතු ඔය, කලා ඔය, ගල් ඔය, කැලණි ගඟ, බෙන්තර ගඟ, පොල්වත්ත ගඟ, යාන් ඔය, කිරිඳි ඔය, වලවේ ගඟ, කුඹුක්කන් ඔය, මැණික් ගඟ, මාදුරු ඔය, කනකරයාන් ආරු, කරබලන් ඔය, අඹන් ගඟ.

(ii) <u>දේශීය ව්‍යාපෘති</u>

01. ගිං ගඟ පුනරුත්ථාපන ව්‍යාපෘතිය (2014-2021)

* දේශීය අරමුදල් යටතේ සිදු කොට ඇත.
* ගිං ගඟ ගංවතුර ආරක්ෂණ ව්‍යාපෘතිය යටතේ කරන ලද ඉදිකිරීම් පුනරුත්ථාපන කටයුතු මේ යටතේ සිදු කොට ඇත.

02. කැලණි ගඟ ගංවතුර ආරක්ෂණ ව්‍යාපෘතිය ( 2018-2024) (Kelani River Flood Protection Project)

* දේශීය අරමුදල් යටතේ සිදු කර ඇත.

<u>විදේශීය ව්‍යාපෘති</u>

01. ගිං ගඟ ගංවතුර ආරක්ෂණ ව්‍යාපෘතිය (1976-1982)

* චීන රජය මගින් අරමුදල් සපයා ඇත.
* මෙමගින් ගිං ගඟ, අගලියෙන් පහළ කොටසෙහි ගංවතුර ආරක්ෂණ බැම් 74 ඉදිකර ඇත.
* පොම්ප 37කින් යුත් පොම්පාගාර 10ක් ඉදිකර ඇත.

02. නිල්වලා ගඟ ගංවතුර ආරක්ෂණ ව්‍යාපාරය (1980 දශකය)

* ප්‍රංශ රජය මගින් අරමුදල් සපයා ඇත.
* නිල්වලා ගඟ පහළ නිම්නයේ ගංවතුර ආරක්ෂණ බැම් හා පොම්පාගාර ඉදිකිරීම.

03. CRIP - දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (2014-2021)

* ලෝක බැංකු අරමුදල් යටතේ සිදු කර ඇත.
* මෙම ව්‍යාපෘතිය යටතේ ගංවතුර අවදානම අධික ගංගාද්‍රෝණි 10ක් සඳහා ද්‍රෝණි ආයෝජන සැලසුම් සකස් කිරීම සිදු කර ඇත.
* රාගත් ගංවතුර අවම කිරීමේ පියවර සඳහා ශක්‍යතා අධ්‍යයන සිදු කිරීම.

04. CResMPA ව්‍යාපෘතිය - දේශගුණික අවබලපෑම අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය (2022 සිට මේ දක්වා)

* ලෝක බැංකු අරමුදල් යටතේ සිදු කරයි.
* ගංගා ද්‍රෝණි 22 සඳහා වන ගංවතුර ආකෘති සැකසීම හා ස්වයංක්‍රීය ජල මිනුම් ස්ථාන ඉදිකිරීම වැනි ගංවතුර පාලනය සඳහා ගංවතුර අනතුරු ඇඟවීම සඳහා අවශ්‍ය වන විවිධ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සිදු වෙයි.

05. IWWRMP ව්‍යාපෘතිය (2020 සිට මේ දක්වා)

* ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරන ව්‍යාපෘතිය (2020 සිට මේ දක්වා)
* ලෝක බැංකු අරමුදල් යටතේ සිදු කරයි.
* ස්වයංක්‍රීය ජල මිනුම් ස්ථාන නැවත ප්‍රතිසංස්කරණය කටයුතු කිරීම.

(iii)

| ව්‍යාපෘතියේ නම | කාල වකවානුව | දේශීය/ විදේශීය ද යන්න | ලැබූ අරමුදල් ප්‍රමාණය | වියදම |
|---|---|---|---|---|
| ගිං ගඟ පුනරුත්ථාපන ව්‍යාපෘතිය | 2014 -2021 | දේශීය | රු.මි. 700 | රු.මි. 687.00 |
| කැලණි ගඟ ගංවතුර ආරක්ෂණ ව්‍යාපෘතිය | 2018-2024 | දේශීය | රු.මි. 1000 | රු.මි. 601.10 |
| CResMPA ව්‍යාපෘතිය දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය | 2022 සිට මේ දක්වා | විදේශීය | Compo-nent 1 - USD 14.9 Million Compo-nent 2 - USD 28.5 Million | - |
| IWWRMP ව්‍යාපෘතිය | 2020 සිට මේ දක්වා | විදේශීය | USD 70.03 Million | රු.මි. 2,028.00 |
| CRIP-DBIP (දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය) | 2014-2021 | විදේශීය | USD 21.5 Million | රු.මි. 4,421.30 |

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(iv)

| ව්‍යාපෘතියේ නම | අරමුදල |
|---|---|
| CResMPA ව්‍යාපෘතිය - දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය | ලෝක බැංකුව |
| IWWRMP ව්‍යාපෘතිය | ලෝක බැංකුව |
| CRIP - දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය | ලෝක බැංකුව |

(v) නැත. එහෙත් නිල්වලා ගංවතුර වැළැක්වීමේ ව්‍යාපෘතිය අදියර 3ක් යටතේ සැලසුම් කර ඇතත් අදියර 2ක් පමණක් ක්‍රියාත්මක වී අතරමඟ නතර වී ඇත. 80 දශකයේ රටේ පැවති දේශපාලන හා සමාජ තත්ත්වය මත ව්‍යාපෘතිය නවතා දමා ඇත.

(vi) ඉහත ප්‍රශ්න අංක (v) අනුව අදාළ නොවේ.

(ආ) ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.

## වී අලෙවි මණ්ඩලය: වී මිලදී ගැනීම

நெல் சந்தைப்படுத்தல் சபை: நெல் கொள்வனவு

PADDY MARKETING BOARD: PURCHASE OF PADDY

441/2025

**9. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චාමර සම්පත් දසනායක මහතා වෙනුවට)**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க சார்பாக)

(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. Chamara Sampath Dasanayake)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසුගිය වර්ෂ දහය (10) තුළදී වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගෙන ඇති වී ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලය තුළ එම මණ්ඩලය ලැබූ ලාභය/අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කාලය තුළ ගොඩනැඟිලි අලුත්වැඩියා කිරීම සඳහා වී අලෙවි මණ්ඩලය විසින් වැය කර ඇති මුදල කොපමණද;

(iv) ගොඩනැඟිලි අලුත්වැඩියා කිරීම සඳහා ඉදිරියේදී වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த பத்து (10) வருட காலப் பகுதியில் நெல் சந்தைப்படுத்தல் சபையால் கொள்வனவு செய்யப்பட்டுள்ள நெல்லின் அளவு ஒவ்வோர் ஆண்டு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) அக்காலப்பகுதியினுள் அச்சபைக்குக் கிடைத்த இலாபம்/நட்டம் ஒவ்வோர் ஆண்டு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(iii) அக்காலப்பகுதியில் நெல் சந்தைப்படுத்தல் சபை, கட்டிடங்களைப் பழுதுபார்ப்பதற்காகச் செலவிட்டுள்ள தொகை யாது என்பதையும்;

(iv) கட்டிடங்களைப் பழுதுபார்ப்பதற்காக எதிர்காலத்தில் செலவிட உத்தேசிக்கப்பட்டுள்ள தொகை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -

(i) quantity of paddy that was purchased by the Paddy Marketing Board in each year over the past ten (10) years, separately;

(ii) profit earned/ loss incurred by the Paddy Marketing Board in each year during the aforesaid period, separately;

(iii) amount of money spent by the Paddy Marketing Board on the renovation of buildings during the period concerned; and

(iv) amount of money that is expected to be spent on the renovation of buildings in the future?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**

(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)

(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i)

| වර්ෂය | මිලදී ගත් මුළු වී ප්‍රමාණය (මෙ.ටො) |
|---|---|
| 2015 | 323,636.73 |
| 2016 | 157,429.28 |
| 2017 | 0 |
| 2018 | 6687.03 |
| 2019 | 48,307.00 |
| 2020 | 29,693.28 |
| 2021 | 52,851.84 |
| 2022 | 78,360.82 |
| 2023 | 2153.92 |
| 2024 | 2757.53 |

(ii)

| වසර | ලාභය (රු) | අලාභය (රු) |
|---|---|---|
| 2015 | - | 1,773,170,546 |
| 2016 | - | 5,894,285,458 |
| 2017 | - | 462,105,320 |
| 2018 | - | 1,185,101,723 |
| 2019 | - | 741,663,275 |
| 2020 | - | 1,248,739,079 |
| 2021 | - | 1,323,917,316 |

සටහන - 2022 සිට 2024 දක්වා කාල පරාසය තුළ අවසන් ගිණුම් සකසා නොමැති බැවින් එම කාලය තුළදී වී අලෙවි මණ්ඩලය විසින් ලැබූ ලාභ/අලාභ ගණනය කිරීමට නොහැකි වී ඇත.

(iii)

| වසර | වැය වූ මුදල (රු. මිලියන) |
|---|---|
| 2015 | 212.5 |
| 2016 | 27.8 |
| 2017 | 138.1 |
| 2018 | 107 |
| 2019 | 94.6 |
| 2020 | 0 |
| 2021 | 47.7 |
| 2022 | 0 |
| 2023 | 0 |
| 2024 | 2.2 |
| මුළු එකතුව | 629.9 |

(iv) රුපියල් මිලියන 90කි.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ඔබතුමා මේ සභාවට අද නිවේදනයක් නිකුත් කළා, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් ලැබුණු පැමිණිල්ලක් සඳහා ත්‍රිපුද්ගල කමිටුවක් පත් කළා කියලා. ඒ පිළිබඳව අපට අවබෝධයක් නැහැ. මගේ නමත් ඒ ත්‍රිපුද්ගල කමිටුවට දාලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග අංක 139, 146 අනුවයි මම ඒ කටයුත්ත කරලා තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් අපි ඉදිරි කටයුතු කරමු.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, මේක පූර්වාදර්ශයට ගෙන ආණ්ඩුවෙන් දැම්මා වාගේ විපක්ෂයෙනුත් හැම එකකටම පරීක්ෂණයක් කරන්නය කියලා ඉල්ලයි. එතකොට කමිටු පත් කරන්නත් වෙයි. අනික, ගරු කථානායකතුමනි, අපි ඉල්ලීමක් කරනවා, විපක්ෂයෙන් සාමාජිකයෙකු නම් කරන්න පෙර ඒ පිළිබඳව ඉදිරියේදී විපක්ෂ නායකතුමාගෙන් හෝ ඒ කාර්යාලයෙන් විමසීමක් කරන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න. විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ණය ගෙවීම සඳහා සාක්ෂාත් කරගත යුතු සාර්ව ආර්ථික ඉලක්ක
### கடன் செலுத்துவதற்காக பேரினப் பொருளியல் இலக்குகளை அடைதல் மற்றும் IMF நிபந்தனைகள்
### MACROECONOMIC TARGETS TO BE ACHIEVED FOR DEBT PAYMENT

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, 2024 ජනාධිපතිවරණයේදී "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය හරහා IMF සමඟ නව ණය තිරසර ගිවිසුමක් අනුගමනය කරමින් පසුගිය රජය ජනතාව මත දැමූ පීඩනය අඩු කරන බවට මැතිවරණ සමයේදී වත්මන් රජය පොරොන්දු වුණා. ඒ කෙරෙහි විශ්වාසය තැබූ ජනතාව IMF එකත් සමඟ වඩාත් හිතකර කොන්දේසි හරහා නව මුහුණුවරකට එළඹීමට වත්මන් රජයට ලබා දුන් ජන වරම ආණ්ඩුව නිවැරැදි අයුරින් භාවිත කරන්නේ ද යන්න අද දවසේ ගැටලුසහගත වී තිබෙනවා. විශේෂයෙන්ම ලබා දුන් ජන වරමත්, ආණ්ඩුවේ වත්මන් ක්‍රියා කලාපයත් දිහා බැලුවාම බරපතළ පරස්පරයක් තිබෙනවා.

ඒ අනුව මම පහත සඳහන් ප්‍රශ්න ඉදිරිපත් කරනවා, ඒවා සඳහා නිශ්චිත පිළිතුරු හා පැහැදිලි කිරීම රජයෙන් බලාපොරොත්තු වෙමින්.

1. ශ්‍රී ලංකාව ද්විපාර්ශ්වීය ණය හිමිකරුවන් සහ ජාත්‍යන්තර ස්වෛරී ණය හිමිකරුවන් වෙත ගෙවීමට ඇති සම්පූර්ණ ණය මුදල කොපමණද?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

2. එම ණය ගෙවීම් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන වසරේ සිට එක් එක් වසරක් වෙනුවෙන් ගෙවිය යුතු ණය වාරිකය - ඇමෙරිකානු ඩොලර්වලින් - වෙන් වෙන් වශයෙන් කොපමණද?

3. මෙම ණය ගෙවීම් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා රටක් වශයෙන් සපුරා ගත යුතුව ඇති සාර්ව ආර්ථික ඉලක්ක - macroeconomic targets - එනම්, ආර්ථික වර්ධන වේගය සහ අනෙකුත් ඉලක්ක -උදාහරණ ලෙස විදේශ සංචිත ප්‍රමාණ, සෘජු විදේශ ආයෝජන ඉලක්ක - කවරේද?

4. 2024 ජනාධිපතිවරණයේදී ඉදිරිපත් කෙරුණු "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් වූ නව ණය තිරසර ගිවිසුමක් - new debt sustainability agreement එකක් - IMF එක සමඟ ඇති කර ගැනීමට රජයට ජනවරමක් ලැබුණු බව පිළිගන්නේද? එසේ නොපිළිගන්නේ නම්, නව ණය තිරසර ගිවිසුම ඇති කර නොගැනීම ජනවරම පාවා දීමක් ලෙස සලකන්නේද?

ගරු කථානායකතුමනි, ණය ප්‍රතිව්‍යුහගත කිරීම තුළ අපි හැමෝම විශේෂයෙන් කථා කළා EPF, ETF අරමුදල්වලට සිදු වුණු හානිය, වැඩ කරන ජනතාවගේ අරමුදල්වලට සිදු වුණු හානිය; ඒ කප්පාදුව පිළිබඳව. මේ රටේ වැඩ කරන ජනතාවගේ අරමුදල් කප්පාදු කරලා සුපිරි ධනවතුන්ගේ, සුපිරි පොහොසතුන්ගේ, primary bond dealersලා වැනි කණ්ඩායම්වල අරමුදල් සුරක්ෂා කෙරුණා. ඉතින් අපි අහන්න කැමැතියි, රජයේ ප්‍රතිපත්තිය වන්නේත්, මේ වාගේ ඉතාම අසාධාරණ දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වන්නේත් IMF එකඟතාව නිසා නොවෙයිද කියන කාරණාව.

5. IMF සමඟ ඇති කරගත් එකඟතාව තුළ අප රටට ලබා දෙන විස්තීර්ණ ණය පහසුකම - Extended Fund Facility එක - යටතේ වාරික ලබා ගැනීම උදෙසා සපුරා ගත යුතු කොන්දේසි වෙන් වෙන් වශයෙන් කවරේ ද? අපි දැනගන්න කැමැතියි, මේ Extended Fund Facility එකේ වාරික ටික ලබා ගන්න සම්පූර්ණ කරන්න තිබෙන කොන්දේසි මොනවාද කියලා. විස්තීර්ණ ණය පහසුකම යටතේ ලබා දෙන ණය වාරික සංඛ්‍යාව කොපමණ ද? එම වාරිකවලදී හිමි වන ණය මුදල වෙන් වෙන් වශයෙන් කොපමණ ද?

ගරු කථානායකතුමනි, අපි තවත් කාරණයක් අවංකවම අහන්න කැමැතියි. දැන් විදුලි බිල සියයට 18කින් වැඩි කරන්න යනවා. මේ විස්තීර්ණ ණය අරමුදලේ - Extended Fund Facility එකේ - ඊළඟ වාරිකය - tranche එක - ලබා ගැනීම සඳහා වූ කොන්දේසියක් සපුරා ගැනීමට ද සියයට 18කින් විදුලි බිල වැඩි කරන්නේ? විදුලි බිල සියයට 33කින් අඩු කරනවා කියලායි කිව්වේ. ගරු කථානායකතුමනි, ඔබතුමාත් ඒ ගැන දන්නවා. රුපියල් 9,000 බිල 6,000 කරනවා කිව්වා. රුපියල් 3,000 බිල 2,000 කරනවා කිව්වා. විදුලි බිල සියයට 33කින් අඩු කරනවා කිව්වා. දැන් අපට අහන්න ලැබෙනවා, විදුලි බිල වැඩි කිරීමට සාපේක්ෂව ජල බිලත් වැඩි කරන්න යනවා කියලා. මේ දේවල් මෙහෙම වෙන්නේ IMF කොන්දේසි ක්‍රියාත්මක කිරීමක් හැටියට ද කියලා අපි අහන්න කැමැතියි.

6. පවතින IMF එකඟතාවට වඩා, සහනදායී නව එකඟතා ඇති කර ජනතාව මත පටවන ලද පීඩනය අවම කිරීම රජයේ වගකීම බව පිළිගන්නේ ද?

ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ගරු කථානායකතුමනි, මේ සඳහා පිළිතුරු ලබා දීමට කාලය ඉල්ලා සිටිනවා. ඊළඟ වාරයේ අවශ්‍ය පිළිතුර ලබා දෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, සම්ප්‍රදායයක් හැටියට, අප අහන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම සඳහා කාලය ඉල්ලන කොට අපි බොහෝ අවස්ථාවල ඒකට එකඟ වෙනවා. හැබැයි ගරු කථානායකතුමනි, මේ පිළිතුරු නැතුව පසුගිය Budget එක හදන්නත් බැහැ.

මේ පිළිතුරු අතේ තියාගෙන තමයි අය වැයක් හැදෙන්න ඕනෑ. ඒ නිසා මේ වාගේ වැදගත් ප්‍රශ්නයකට කල් ඉල්ලන්නේ ඇයි කියලා මම අහනවා. මේ තොරතුරු අතේ තියාගෙන තමයි අය වැය ලේඛනයක් හැදෙන්න ඕනෑ. අපි කිසිදාක නැඟිටලා කියලා නැහැ, පිළිතුර දැන්ම ම ඕනෑ, පිළිතුර හෙට ම ඕනෑ කියලා. අපි එහෙම කරලා නැහැ. අපි අධිකරණ ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා, PTA එක ගැන. එතුමා උත්තර දෙනකල් අපි හිටියා; සති ගණනක් හිටියා. මම හිතන්නේ නැහැ, මේ ප්‍රශ්නයට උත්තර දෙන්න කල් ගන්න එක ඒ තරම් සාධාරණයි කියලා, ගරු කථානායකතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ගරු කථානායකතුමනි, අවසාන මොහොතේ තමයි ප්‍රශ්නය ලැබී තිබුණේ. ඒ සඳහා මැදිහත් වන නිලධාරින් ඊයේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට පැමිණ සිටියා. ඒ නිසා තමයි ඒ වැඩ කටයුතු අවසන් කර ගන්න නොහැකි වෙලා තිබෙන්නේ. ඒ නිසා ඊළඟ රැස්වීම් වාරයේදී අවශ්‍ය පිළිතුර ලබා දෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මැතිතුමා. ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

හැමෝටම සුබ දවසක්! *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා.

**ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමාගේ ප්‍රකාශය තුළ සඳහන් වුණා, ජල ගාස්තු වැඩි කරන්න යනවාය කියලා එතුමාට දැන ගන්න ලැබුණා කියලා. ඒ විෂයය අපේ අමාත්‍යාංශය යටතට අයත් වන විෂයයක්. ගරු විපක්ෂ නායකතුමනි, මම දැන ගන්න කැමැතියි ඔබතුමාට එසේ දැන ගන්නට ලැබුණාය කියන්නේ මොන source එකක් පදනම් කරගෙනද කියලා. ජල ගාස්තු වැඩි කරන්න යනවාය කියා ඔබතුමා කියන්නේ මොන තොරතුරු පදනම් කරගෙනද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට මතක් කරන්න කැමැතියි, විදුලි බිල වැඩි කිරීමේ තීන්දුව රජය රටට කියන්නට පෙර අපි තමයි කිව්වේ කියන එක. ඒ අපට ලැබුණු තොරතුරු, කරුණු කාරණා මත. අපි අනුමාන කරනවා, - *[බාධා කිරීමක්]* කථා කරන්න අවස්ථාව දෙනවාද? *[බාධා කිරීමක්]* භාෂණයේ නිදහස තිබෙනවාද? *[බාධා කිරීමක්]* එහෙම නම් කථා කරන්න අවස්ථාව දෙන්නකෝ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමා කථා කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම කවදාවත් ඔබතුමාට බාධා කරලා නැහැ නේ. *[බාධා කිරීමක්]* එහෙම නම් මට අවස්ථාව දෙන්නකෝ කථා කරන්න. ඔච්චර කලබල වෙන්න එපා. අපි - *[බාධා කිරීමක්]* ඔබතුමා මගෙන් ප්‍රශ්නයක් ඇහුවා. මට උත්තර දෙන්න අවස්ථාව දෙන්න, බාධා කරන්නේ නැතුව. ඔබතුමන්ලා දැන් සියයට 18කින් විදුලි බිල වැඩි කරනවා නේ, සියයට 33කින් අඩු කරනවා කියලා. රුපියල් 9,000 බිල රුපියල් 6,000 කරනවා කිව්වා නේ. රුපියල් 3,000 බිල රුපියල් 2,000 කරනවා කිව්වා නේ. හැබැයි මේ වතාවේ රජය නිවේදනය කරන්නට පෙර බොහොම පැහැදිලිව අපි කිව්වා, IMF කොන්දේසි මත, IMF එක දමලා තිබෙන සූත්‍රය මත, විදුලි බිල වැඩි කරනවා කියලා. ඊට පසුව තමයි රජය ඇවිල්ලා ඒක කිව්වේ. ඉතින් අපි අනුමාන කරනවා, විදුලි බිල සියයට 18කින් වැඩි වෙනකොට ජල ගාස්තුත් වැඩි වෙයිදෝ කියලා. ඒ සැකය මත තමයි අපි මේ ප්‍රශ්නය අහන්නේ.

ඉතින් ඔබතුමාට පුළුවන්, *[බාධා කිරීමක්]* නැහැ. ගරු ඇමතිතුමනි, විදුලි බිල ගැන අපි අනුමාන කරනවා. ඇයි අපට සාධාරණව එහෙම සාමාන්‍ය ප්‍රශ්නයක් අහන්න අවස්ථාවක් නැද්ද? ඒකයි ඇහුවේ. අපි අනුමාන කරනවා. දැන් අපි ජල බිල වැඩි වෙන ප්‍රතිශතයක් කිව්වේ නැහැ නේ. අපි අනුමාන කරනවා විදුලි බිල වැඩි වීමත් සමඟ ජල බිලත් වැඩි වෙන්නට ඉඩප්‍රස්ථාව තිබෙනවා කියලා. ඉතින් ඔබතුමාට පුළුවන් ඇමතිවරයා හැටියට බොහොම පැහැදිලි ප්‍රකාශයක් කරන්න, එය වැඩි වෙනවාද අඩු වෙනවාද කියලා. එච්චරයි අපි අහන්නේ.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

මට මතකයි ඔබතුමා දවස් දෙකකට කලින් කථාවකදී කිව්වා, අපි නිශ්චිත දත්ත සහ තොරතුරු මත පදනම්ව තමයි යම් ප්‍රකාශ කරන්නේ කියලා. නමුත් දැන් විනාඩියට කලින් ඔබතුමා කිව්වා "අපට දැනගන්න ලැබුණා" කියලා, දැන් ඔබතුමා කියනවා, "මම අනුමාන කරනවා" කියලා. ඔබතුමන්ලා විදුලි බිල සම්බන්ධවත් පුරෝකථනය කළේ සියයට 35කින් වැඩි කරයි කියලා. දැන් වැඩි වෙලා තිබෙන්නේ සියයට 18යි. අනික, අපි මේ විදුලිය ගැන නොවෙයි කථා කරන්නේ බොන ජලය ගැන. මේ, කාරණා දෙකක්. ඒ නිසා මම බොහොම වගකීමෙන් කියන්න කැමැතියි, ජල ගාස්තු වැඩි කිරීම, පානීය ජල ගාස්තු වැඩි කිරීම සම්බන්ධයෙන් කිසිම සාකච්ඡාවක් අමාත්‍යාංශ මට්ටමින් මේ වෙනකොට සිද්ධ වෙන්නේ නැහැ කියන එක. මම විශ්වාස කරනවා අපට පානීය ජල ගාස්තු වැඩි කිරීමේ අවශ්‍යතාවක් පැන නඟින්නේ නැහැ කියලා. *[බාධා කිරීමක්]* අපි වගකීමෙන් කියනවා නැහැයි කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමා, හොඳයි, මොකක්ද කියන්න?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මට අවස්ථාව දෙන්න, විනාඩියක්. මොකද, එතුමා මට චෝදනාවක් කළා මම ඒකට උත්තර දෙන්න ඕනෑ. මට ඒකට අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔය කාරණය විවාදයක් කර ගන්න එපා. *[බාධා කිරීමක්]* ගරු විපක්ෂ නායකතුමා, ඔය කාරණය විවාදයක් කර ගන්න එපා. ඔබතුමා ප්‍රශ්නයක් ඇහුවා, එතුමා උත්තරයක් දුන්නා. ඒක දිග විවාදයක් වෙන්න විධියක් නැහැ. ඔබතුමා ඉඳගන්න. ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා කථා කරන්න. *[බාධා කිරීමක්]* ගරු විපක්ෂ නායකතුමා ඉඳගන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමා, එතැන point of Order එකක් නැහැ.

ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

## II

## අලිමංකඩ ලුණු ලේවායේ ගැටලු
### ஆனையிறவு உப்பளத்தில் நிலவும் பிரச்சினைகள்
### ISSUES ARISEN AT ELEPHANT PASS SALTERN

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Thank you, Hon. Speaker. I really appreciate your giving me this opportunity to raise my Question under Standing Order No. 27(2).

இலங்கை நாற்புறமும் கடலாற் சூழப்பட்ட தன்னிறைவான ஒரு நாடாக இருந்தும் எமது அடிப்படையான உணவுப் பதார்த்தமான கடல் உப்புப் பற்றாக்குறை என்பது அண்மைய நாட்களாக மிகவும் முக்கியமான ஒரு பேசுபொருளாக்கப்

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

பட்டிருக்கின்றது. இந்த அடிப்படையிலே, இலங்கையிலே பாரம்பரியமாக உற்பத்தி செய்யப்பட்ட கடலுப்பானது வடக்கு மாகாணத்தில் ஆனையிறவு, பரந்தன் உப்பளத்திலிருந்து மிகப் பெரிய அளவில் இதுவரை காலமுமே உற்பத்தி செய்யப்பட்டு வந்தது என்பதைத் தாங்கள் அறிந்திருக்கக்கூடும். அந்த அடிப்படையில், ஊழலுக்கு எதிரானவர்கள் என்று மக்களை நம்பவைத்து அண்மையில் ஆட்சிக்கு வந்த தங்களுடைய அரசாங்கத்தின் பாராளுமன்ற உறுப்பினர்கள் மற்றும் தெற்கிலிருந்து வந்த அமைச்சர்கள், பரந்தன் உப்பளத்திலே உப்பினை உற்பத்தி செய்து இலங்கையிலிருந்து வெளிநாடு களுக்கு ஏற்றுமதி செய்யப்போவதாக அண்மைய காலங்களில் தெரிவித்திருந்தது குறிப்பிடத்தக்கது.

மேலும், தங்களுடைய அரசாங்கம் ஆட்சிக்கு வந்த பின்னர், அரசியல் ரீதியாக ஒவ்வோர் அரசாங்க நிறுவனங்களிலிருந்தும் முகாமைத்துவம் செய்கின்ற முகாமைத்துவக் கட்டமைப்பு களைச் சீர்குலைத்து, பெருமளவானவர்களை இடமாற்றம் செய்து, தங்களுக்குச் சார்பான, எந்த ஓர் அனுபவமுமற்ற, முகாமைத்துவத் தகுதி இல்லாத தங்களுடைய கட்சி சார்ந்த சாதாரண பணியாளர்களை முகாமைத்துவ அதிகாரிகளாக வேலைக்கு அமர்த்தியிருப்பது தெட்டத் தெளிவாகத் தெரிகின்றது. அந்தவகையில் பரந்தன் உப்பளத்திலே ஏற்பட்ட தொழிலாளர் போராட்டம், நான் நினைக்கின்றேன் இப்போது பன்னிரண்டாவது நாளாக நடைபெற்றுக்கொண்டிருக்கின்றது என்பதைப் பொதுமக்களுக்குத் தெரிவிக்கவேண்டிய கடமைக்கு நான் உள்ளாகியிருக்கின்றேன்.

மேலும், அந்த உப்பளத்துத் தொழிலாளர்கள் மிகக் கேவலமாக நடத்தப்படும் அதேவேளை, தொழிலாளர் தொழில் விதி முறைகளுக்கு இன்றியமைவு இல்லாதவாறு பொலிசாரின் உதவியுடன் பலவந்தமாக உப்பளத்திலிருந்து அராஜகமாக வெளியேற்றப்பட்டிருப்பதாகவும், 12 நாட்களுக்குமேல் அந்தத் தொழிலாளர்களுக்கு வேலைவாய்ப்பு மறுக்கப்பட்டிருப்ப தாகவும் பொதுமக்களால் தெரிவிக்கப்பட்டிருக்கின்றது.

எனவே, பின்வரும் விடயங்களைத் தயவுசெய்து கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர் என்ற ரீதியில் அவர் இந்த மேலான சபைக்குத் தெளிவுபடுத்த முடியுமா?

1. ஆனையிறவு உப்பளம் பாரம்பரியமாக உற்பத்தி செய்துவந்த உப்பினை 'ரஜ உப்பு' என்று பெயர் மாற்றியதற்கான காரணம் என்ன? இது தமிழர்கள் மீதான திட்டமிட்ட அடக்குமுறை ஒன்றின் வடிவமா?

2. ஆனையிறவு உப்பளத்தில் 2024ஆம் ஆண்டு உற்பத்தி செய்ததைவிட இப்போது உற்பத்தி செய்யப்படுகின்ற உப்பின் அளவு மிகக் குறைவானது என்பது உண்மை. இதனைத் தாங்கள் ஏற்றுக்கொள்கிறீர்களா?

3. ஆனையிறவு உப்பளத்திலே தங்களுடைய அரசாங்கத்தால் மூன்று மாதங்களுக்கு முன்னராக முகாமைத்துவ மாற்றமொன்று செய்யப்பட்டுள்ளது என்பதைத் தாங்கள் ஏற்றுக்கொள்கிறீர்களா?

4. அவ்வாறான இடமாற்றலுக்குத் தொழிலாளர்கள் எதிர்ப்புத் தெரிவித்தபோது, அங்கு வேலை செய்து வந்த தொழிலாளர்கள் இப்போது பன்னிரண்டு நாட்களாகப் பணியிலிருந்து நிறுத்தப்பட்டுள்ளதால் ஆனையிறவு உப்பளத்தின் உப்பு உற்பத்தி தற்போது மிகவும் குறைந்துள்ளது அல்லது முற்றிலும் இல்லாமற் போயுள்ளது என்பதை ஏற்றுக் கொள்கிறீர்களா?

5. தற்போது நாட்டில் உப்பினைப் பிறிதொரு நாட்டி லிருந்து இறக்குமதி செய்வதற்கு அமைச்சரவை அனுமதி அளித்திருக்கின்றது என்பதை உறுதிப்படுத்த முடியுமா?

6. தொழிற்சங்கங்களால் உருவாக்கப்பட்ட தங்களுடைய அரசாங்கம், இப்போது தொழிலாளர்கள்மீது மிகவும் கேவலமான அடக்குமுறை ஒன்றினைக் கட்டவிழ்த்து விட்டிருக்கின்றது என்பதையும், அதற்குரிய மிகச் சிறந்த உதாரணம் ஆனையிறவு உப்பளத்தில் தொழிலாளர்கள் வெளியேற்றப்பட்டு அவர்களுடைய தொழில் மறுக்கப்பட்டிருப்பது என்பதையும் தாங்கள் ஏற்றுக்கொள்கிறீர்களா?

7. உடனடியாகத் தொழிலாளர்களை மீண்டும் சந்தித்து, அவர்களுடைய கோரிக்கைகள் நியாயமானது என்பதை ஏற்றுக்கொண்டு, ஆனையிறவு உப்பளத்தில் உப்பு உற்பத்தி செய்யப்படுவதைச் சாதாரண நிலைக்குக் கொண்டுவர முடியுமா?

8. இலங்கையில் உப்பு உற்பத்தி தங்களுடைய ஆட்சிக் காலத்தில் படுமோசமாகக் குறைவடைந்திருக்கிறது என்பதை ஏற்றுக்கொண்டு, ஆனையிறவு உப்பளத் தினை மறுபடியும் சாதாரண நிலையில் இயங்கவைக்க முடியுமா?

9. அங்கே வேலை செய்கின்ற தொழிலாளர்களை மரியாதையுடன் நடத்துகின்ற அதேவேளை, அவர்களுக்கான அடிப்படை வசதிகளைத் தங்களால் ஏற்படுத்திக் கொடுக்க முடியுமா?

நன்றி.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය අපේ අමාත්‍යාංශයට ලැබුණේ ඊයේ හවස 2ට විතර. ඊයේ මගේ කථාවේදීත් මේ පිළිබඳව යම් කිසි පැහැදිලි කිරීමක් කළා. මේ සඳහා සම්පූර්ණ විස්තරයක් සහිත පිළිතුරක් සතියකින් මම පාර්ලිමේන්තුවට ලබා දෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු කථානායකතුමනි, ඊට කලින් මම මේ ප්‍රශ්නය භාර දීලා තිබුණේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමා ප්‍රකාශ කළා නේ, සතියකින් පිළිතුරක් ලබා දෙනවා කියලා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

මේ ප්‍රශ්නය ලබා දුන්නේ ඊයේ හවස කියලා එතුමා අසත්‍ය කියන්නේ. මම දවස් 6කට කලින් තමයි මේක භාර දුන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ඔය ප්‍රශ්නය දෙවතාවක්ම reject කරලා ඉන් පසුව revise කරලා දෙන්න කියලායි තිබුණේ. Standing Orders violate කරලා තමයි ඔබතුමා මීට කලින් ඔය ප්‍රශ්නය දීලා තිබුණේ. පළමු වතාවේ එය පිටු 5කින් යුක්ත වෙලා තිබෙනවා.
මීළඟට පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත
### இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம்
### SRI LANKA ELECTRICITY(AMENDMENT) BILL

"2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ බලශක්ති අමාත්‍ය ගරු කුමාර ජයකොඩි මහතා විසිනි.***
***2025 ජූනි 06වන සිකුරාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*வலுசக்தி அமைச்சர் மாண்புமிகு குமார ஜயகொடி அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*
*2025 யூன் 06, வெள்ளிக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் மூலோபாய அபிவிருத்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டு மெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Kumara Jayakody, Minister of Energy; to be read a Second time upon Friday, 06th June, 2025 and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Infrastructure and Strategic Development.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2 ඉදිරිපත් කිරීම, the Hon. Harshana Nanayakkara. You have 18 minutes.

## අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
## குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்
## CODE OF CRIMINAL PROCEDURE (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[පූ.භා. 10.18]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ඊට අමතරව, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - විදේශීය ණය (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත ද මා ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, අපේ රටේ අධිකරණ පද්ධතිය තුළ තිබෙන ගැටලු එකින් එක ගන්නවාට වඩා අපි සාමාන්‍ය මහජන මතය ගැන බැලුවොත්, අපේ රටේ ජනතාව යන්න අකමැතිම තැන තමයි, උසාවිය. උසාවියට යන්න කැමැති වෙන්නේ නීතිඥ මහත්වරුනුත්, නඩුකාර මහත්වරුනුත් පමණයි. මොකද, ඒක ඔවුන්ගේ රස්සාව නිසා. ඒ වාගේම උසාවියට යන්න අකැමැති තවත් ප්‍රධානම කොටසක් තමයි සාක්ෂිකරුවන්, නැත්නම් වරදක් නොකරපු මිනිස්සු. මොකද ඔවුන් කියනවා, රස්තියාදුව වැඩියි, නඩු කල් යනවා වැඩියි කියලා.

ඒ වාගේම වෘත්තිකයන් පවා පැමිණිලි කරනවා, ඔවුන්ගේ කාලය නාස්ති වෙනවා කියලා. ගරු කථානායකතුමනි, අධිකරණය මුහුණ දීලා තිබෙන මෙම අර්බුද එක් අධිකරණ ඇමතිවරයෙකුගේ කාලයක් තුළදී හෝ එක් ආණ්ඩු කාලයක් තුළදී ඇති වෙච්ච අර්බුද නොවෙයි. මේක දශක ගණනාවක neglect එකක් හරහා ඇති වුණු තත්ත්වයක්. අවුරුදු 15ක්, 20ක් තිස්සේ මේ තත්ත්වය කවුරුන් ඇති කළත්, ඒ ප්‍රශ්න විසඳීමේ වගකීම ජනතාව විසින් මේ ආණ්ඩුවට භාර දීලා තිබෙනවා.

මේ වගකීමේ කොටසක් හැටියට කරුණු රාශියක් තිබෙනවා. හිර ගෙවල්වල තදබදය අඩු කිරීම, නඩු පමා වීම වැළැක්වීම, එම කටයුත්තට අවශ්‍ය කාර්ය මණ්ඩල පත් කිරීම, උසාවි නැවත පිහිටුවීම, ක්‍රමවේද සැකසීම, ඩිජිටල්කරණය යනාදී කරුණු ගොඩක් මෙතැන තිබෙනවා. හැබැයි වඩාත් වැදගත් දෙයක් තමයි, මෙම නඩු කල් යන්න හේතු, සම්පත් නාස්ති වන හේතු සොයා බලා ඒවාට පිළියම් යෙදීම. අන්න එයින් එක පිළියමක් ගැන අපි සාකච්ඡා කළා. මේ තුළින් සම්පූර්ණයෙන් ප්‍රශ්න විසඳෙන්නේ නැහැ. නමුත් මේක ඉතා විශාල ඉදිරි පිම්මක්; වසර ගණනාවක් පරක්කු වෙච්ච සංශෝධනයක්. ඒ කියන්නේ මොකක්ද? ගරු කථානායකතුමනි, අපේ අධිකරණ පද්ධති තුළට නවීන තාක්ෂණය ගෙන ඒමේ අභියෝගය ජයගන්නට තමයි මෙම අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කරනු ලබන්නේ.

ගරු කථානායකතුමනි, මට ලැබෙන ලිපි ගත්තත්, ඉතාම සාධාරණ, අවංක ලිපි ජනතාවගෙන් ලැබෙන්නේ. ඔවුන් කියන්නේ ඔවුන්ගේ නඩු අහලා ඉවර වෙන්නේ කවදාද, මම දැන් කී පාරක් උසාවි ආවාද, ඒත් සැකකාරයා ආවේ නැහැ වාගේ නොයෙකුත් කරුණු. මේ නිසා මිනිස්සු විශාල වශයෙන් දුක් විඳිනවා. මම විශ්වාස කරනවා, මේ පනත ක්‍රියාවට නැංවීම හරහා මේ ප්‍රශ්නය යම්තාක් දුරකට මඟහැර ගන්න අපට පුළුවන් වෙයි කියලා.

මෙහි තිබෙන ප්‍රධානම කාරණය මේකයි. අපි දන්නවා, අපේ අපරාධ නීතිය අනුව නඩුවක් විභාග කිරීමේදී ඒ අධිකරණ පරිශ්‍රය තුළ විත්තිකාරයෝත් ඉන්න ඕනෑ, සැකකරුවෝත් ඉන්න ඕනෑ,

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

සාක්ෂි දෙන පුද්ගලයාත් අධිකරණයට ඇවිල්ලා සාක්ෂි කූඩුවට නැඟලා දිවුරුම් දෙන්න ඕනෑය කියලා. අසනීපයක් වෙලා හෝ මේ පාර්ශ්වයන්ගෙන් එක් පාර්ශ්වයක් හරි අධිකරණයේ නැති වුණොත්, එදාට නඩුව කල් යනවා. එතකොට අනෙක් හැමෝම රස්තියාදු වෙනවා. මෙන්න මේක අපේ ක්ෂේත්‍රයට විශාල ගැටලුවක් වෙලා තිබුණා. නමුත් දැන් නවීන තාක්ෂණය හරහා ඒ තත්ත්වය වෙනස් කරන්න අවශ්‍ය නීති සංශෝධනයක් අපි මේ තුළින් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 144වන වගන්තිය සංශෝධනය කිරීමේ ප්‍රධානම අරමුණ තමයි, අධිකරණය ඉදිරියේ පෞද්ගලිකවම පෙනී සිටින්නේ නැතුව සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් - contemporaneous audio-visual linkage - හරහා සාක්ෂි විභාග කිරීම. මේක ඉතාම සුලබ තාක්ෂණයක්. අද තරුණයන් අතර ගත්තත්, WhatsApp video conferencing තිබෙන කාලයේ, Skype වාගේ දේවල් තිබෙන කාලයේ, Zoom meetings තිබෙන කාලයේ මේක ඉතාම සුලබ දෙයක්.

නමුත් අපේ නීතිය වෙනස් වෙලා තිබුණේ නැහැ, මේ දේවල් ආරෝපණය කර ගන්න. මේ පනත් කෙටුම්පත සැකකරුවකු අධිකරණයට ගෙනෙන්නේ නැතිව, සාක්ෂිකරුවකු අධිකරණයට ගෙනෙන්නේ නැතිව දුරස්ථ ස්ථානයක සිට ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය මඟින් කෙසේද සාක්ෂි දෙන්නේ, එහි විශ්වසනීයත්වය රඳවන්නේ කොහොමද යනාදී කරුණු සාක්ෂාත් කර ගැනීමට ඉදිරිපත් වුණු කෙටුම්පතක්. එමෙන්ම අපි දන්නවා, ගරු විනිශ්චයකාරතුමන්ලා විශේෂයෙන්ම කොරෝනා සමයේදී නීතියේ ප්‍රතිපාදනයක් නොතිබුණත්, ඒ තිබුණු තත්ත්වයන් සැලකිල්ලට ගෙන Zoom තාක්ෂණය හරහා නඩු කටයුතු කළ බව. මොකද, කොවිඩ් වසංගතය පැවති කාලයේ නඩු කටයුතු කිරීමට නොහැකිව තිබුණු නිසා. අද ඒ සියලු දේවල් නීත්‍යනුකූල පදනමට අපි ගෙනැවිත් තිබෙනවා. විශේෂයෙන්ම මේකට සවන් දෙන නීතිඥතුමන්ලා සහ ඒ අදාළ අය මේක තේරුම් ගන්න ඕනෑ.

මෙහි 2වන වගන්තිය යටතේ 144අ.(1)හි තිබෙනවා, අධිකරණය ඉදිරියේ පෞද්ගලිකව ම පෙනී සිටින ලෙස නියම කිරීම අත්හරිනු ලබන්න පුළුවන් කියලා. ඒ, කොයි වාගේද? එකක්, රඳවා තබා ගැනීමේ කාලසීමාව දීර්ඝ කිරීම. අපි දන්නවා, සැකකරුවෙකු සති දෙකකට රිමාන්ඩ් කළාට පස්සේ ඒ remand extension එක කරන්න නැවත ඒ සැකකරු උසාවියට ගෙනෙන්න ඕනෑය කියලා. නමුත්, මේ පනත සම්මත වුණාට පස්සේ ඒක audio-visual linkage එක හරහා කරන්න පුළුවන්. ඇප ඉල්ලීමක් විභාග කරන්න සැකකරු අධිකරණයට එන්න අවශ්‍ය වෙන්නේ නැහැ, audio-visual linkage එක හරහා ඒක කරන්න පුළුවන්. යම් විමර්ශනයක, අපරාධ නඩුවක ඉල්ලීමක් කරන්න තිබෙනවා නම් එදාට සැකකරු කැඳවන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ වාගේම නඩුකාරතුමන් - මහේස්ත්‍රාත්වරයා - හිතන ඕනෑම සුදුසු අවස්ථාවක ඔහු නොකැඳවා මේ audio-visual linkage එක හරහා මේ කටයුත්ත කරන්න පුළුවන්.

ඒ වාගේම ඒ සැකකරුට හෝ චූදිතයාට, එහෙම නැත්නම් නීතිපතිවරයාට, අදාළ පොලිස් ස්ථානය භාර නිලධාරියාට, සැකකරු හෝ චූදිතයා රඳවා ඇති බන්ධනාගාරයේ බන්ධනාගාර අධිකාරිවරයාට, සැකකරු හෝ චූදිතයා රඳවා ඇති ස්ථානයේ ස්ථාන භාර නිලධාරියාට මේ ඉල්ලීම සිදු කරන්න පුළුවන්. හැබැයි, අධිකරණයට නොපැමිණ කරන්නා වූ මේ ඉල්ලීම කිරීමට අවසර දීමේදී නඩුකාරතුමන්ලා භාවිත කරන්න ඕනෑ නිර්ණායක 144අ(4) යටතේ සඳහන්ව තිබෙනවා. ඒ කියන්නේ සැකකරුගේ හෝ චූදිතයාගේ ජීවිතයට තර්ජනයක් හෝ බරපතළ හානියක් පිළිබඳ සැකයක් මතු වන අවස්ථාවකදී කැඳවන්න අවශ්‍ය වෙන්නේ නැහැ; ඒ චූදිත සැකකරු විසින් කළාය කියන වරදට මහජන කැලඹීමක් ඇති වනවා නම්, ඔහු අනාරක්ෂිත වනවා නම්, ඔහුව කැඳවන්න අවශ්‍ය වෙන්නේ නැහැ; එහෙම නැත්නම්, ප්‍රවාහනයේදී ඔහු පලා යන්න පුළුවන්, යම් කෙනෙකු ඔහුව පැහැර ගන්න පුළුවන් කියලා හිතනවා නම් කැඳවන්න අවශ්‍ය නැහැ; ඒ වාගේම ඔහුට කුමන හෝ රෝගයක් වැලඳී නිරෝධායන තත්ත්වයේ ඉන්නවා නම් ඔහුව කැඳවන්න ඕනෑ නැහැ. මෙහිදී සිදු වන මූලික දේ මොකක්ද? උදාහරණයකට අපි සැකකරුවකු ගත්තොත්, ඈත ප්‍රදේශයක ඉඳලා -බූස්සේ ඉඳලා එහෙම නැත්නම්, අඟුණුකොළපැලැස්සේ ඉඳලා- ඔහුව ගෙනෙන්න ඕනෑ නැහැ. ඔහුට එතැන ඉඳලාම audio-visual linkage එක හරහා සාක්ෂි දෙන්න පුළුවන්. ඒ තුළින් බන්ධනාගාරයේ සම්පත් නාස්තිය අවම වනවා, රජයේ සියලු වියදම් අවම වනවා.

ගරු කථානායකතුමනි, අපි දන්නවා පසුගිය කාලයේදී කොළඹ, අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයේදී වූ අවාසනාවන්ත සිදුවීම. ඔහු නමගිය අපරාධකරුවෙක්, අනාරක්ෂිතව හිටපු කෙනෙක්. එදා ඔහුව උසාවි ගෙනෙන්න සිදු වුණා. ඉදිරියේදී එවන් risk එකක් තිබෙන කිසි කෙනෙක් අධිකරණයට ගෙනෙන්න ඕනෑ නැහැ, ගරු කථානායකතුමනි. ඒ සඳහා දැන් ප්‍රතිපාදන තිබෙනවා. බන්ධනාගාර දෙපාර්තමේන්තුවත් මට පැහැදිලිව කියා තිබෙනවා, සෑම බන්ධනාගාරයකම මේ audio-visual linkages සකස් කර තිබෙන බව. ඒ වාගේම උසාවිවලටත් අපි ඒ කටයුතු සඳහා නිලධාරියෙක් පාවිච්චි කරනවා. එතැනත් නිලධාරියෙක් ඉන්නට ඕනෑ, එම කටයුතු සොයා බලා කරන්න. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැකසීමට අධිකරණ සේවා කොමිෂන් සභාවත්, අධිකරණ අමාත්‍යාංශයත් මැදිහත් වෙලා මේ තාක්ෂණය ක්‍රියාවට නඟන්න අපි ඒ සම්පත් දායකත්වය සපයන්නට ඕනෑ. ඒ වාගේම අධිකරණයට නැවිත් සිටියා කියලා ඔහුගේ අයිතිවාසිකම්වලට හානියක් වන්නේත් නැහැ. මොකද, ඔහු නියෝජනය කරමින් නීතිඥවරයෙකුට අධිකරණයේ පෙනී සිටින්න පුළුවන්. ඒ වාගේම මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් සැකකරුට හෝ චූදිතයාට ස්වකීය නියෝජනය සිදු කරමින් නඩු කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසන්න ඕනෑ. එලෙස අවශ්‍ය පහසුකම් සලසා නැත්නම් මේ සඳහා ඉඩ දෙන්නේත් නැහැ.

ගරු කථානායකතුමනි, මෙම සංශෝධනයේ තිබෙන මූලික දේ තමයි, ඔහු සාක්ෂි දෙන දුරස්ථ ස්ථානය මේ පනත් කෙටුම්පත අනුව අධිකරණයේම කොටසක් හැටියට පිළිගැනීම. ඒ කියන්නේ, ඔහු කොහේ සිටියත් -පිටරටක හෝ වෙනත් ස්ථානයක සිටියත්- ඔහු ලබා දෙන දිවුරුමෙන් පසුව එම නඩු කටයුතු සියල්ල අධිකරණය ඉදිරියේ සිදුවන දෙයක් හැටියට උපකල්පනය කරනවා. මක්නිසාද, අපේ අපරාධ නීතියේ තිබෙන්නේ සැකකරු ඉදිරිපිට නඩුව විභාග කළ යුතුයි කියලා. ඒ වාගේම එහෙම පෙනී සිටීම නවත්වපු අවස්ථාවලදී පැය 48ක් ගත වෙන්න කලින් අදාළ මහේස්ත්‍රාත්වරයාට හෝ High Court Judgeට ඔහු සිටින තැනට ගිහින් නිරීක්ෂණය කරන්න අවශ්‍ය ප්‍රතිපාදනත් මේ තුළ සකස් කර තිබෙනවා. ඒ වාගේම යම් නඩුකාරතුමෙකු - High Court Judge කෙනෙක් හෝ Magistrate කෙනෙක් - එම ස්ථානය බලන්න යනවා නම් චූදිතයාගේ නීතිඥවරයෙකුටත් ඒ නිරීක්ෂණයට සහභාගි වන්නට හැකියාව තිබෙනවා. ඒ කියන්නේ, ඔහු අධිකරණයට නොගෙනාවාට නීතියෙන් සපයා ඇති චූදිතයාට අවශ්‍ය සියලුම ආරක්ෂාවන්ට හානියක් නොවන ආකාරයට තමයි මෙය සිද්ධ වෙන්නේ.

හැබැයි, දුරස්ථ ක්‍රමය භාවිත නොකර සැකකරුවකු හෝ චූදිතයකු අනිවාර්යයෙන්ම අධිකරණයට ඉදිරිපත් කළ යුතු අවස්ථා කිහිපයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ තමයි,

පුද්ගලයෙකු අත්අඩංගුවට අරගෙන මුල් වතාවට මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන වෙලාව. ඒ වෙලාවේ අනිවාර්යයෙන්ම ඔහු අධිකරණයට ගෙනෙන්නට ඕනෑ. ඒ වාගේම ඒ අත්අඩංගුවට ගත් පුද්ගලයා කියනවා නම්, ඔහුගේ මානව හිමිකම් උල්ලංඝනය වෙලා තිබෙනවා, ඔහුව කෲරත්වයට පත් කර තිබෙනවා කියලා, ඒ අවස්ථාවේත් දුරස්ථ ක්‍රමය භාවිත නොකර, audio-visual linkage එක භාවිත නොකර, එම තැනැත්තාව අධිකරණය ඉදිරියට ගෙනෙන්න ඕනෑ. මොකද, එම ප්‍රශ්නය ගැන බලන්න ඕනෑ නිසා. ඒ වාගේම මහෙස්ත්‍රාත්වරයාට විශාල අභිමතයක් තිබෙනවා, අවස්ථානුගත කරුණු අනුව සැකකරුවකු හෝ චූදිතයකු එහෙම කැඳවන්න හෝ නොකැඳවන්න. මේ පනත චූදිතයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන ආකාරයට ඉතාම පරිස්සමින් සකස් කර තිබෙන්නේ.

ඒ වාගේම මම කලින් කිව්වා, මේ ප්‍රතිපාදන මහාධිකරණයටත් තිබෙනවා කියන එක. මේ හා සමානවම මා කලින් සඳහන් කළ ආකාරයට හේතු වාර්තාගත කිරීමෙන් පසුව, සැකකරුට හෝ චූදිතයාට ඉන්න තැනම සිට සාක්ෂි දෙන්න පුළුවන්. මෙහි වඩාත් වැදගත් දේ වෙන්නේ, මම කියපු ප්‍රවාහනයේදී ඇති වන ගැටලු සහ වියදම් වැඩි වීම විතරක්ම නොවෙයි. තව තිබෙනවා, මම ඒක පසුවට ගන්නම්. මෙහිදී සැකකරුගේ හෝ චූදිතයාගේ ආරක්ෂාව හා කාලය ඉතිරිවීම සහ මේ සඳහා අවශ්‍ය වන manpower ප්‍රමාණයත් අඩුයි. නමුත්, ඒ සඳහා ඒ තාක්ෂණය හරියට තිබෙන්නට ඕනෑ.

හැබැයි, මේකේ වඩාත්ම වැදගත් වෙන්නේ සාක්ෂිකරුවන් සම්බන්ධයෙන් තිබෙන වගන්තියයි. මොකද, මේ පනත් කෙටුම්පතේ 5වන වගන්තියේ 273අ. යටතේ තිබෙන්නේ, "නඩු විභාගය හෝ පරීක්ෂණයක් අතරතුර සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම" කියන එක. ගරු කථානායකතුමනි, ඇත්තවශයෙන්ම මමත් වෘත්තියෙන් නීතිඥවරයෙකු වශයෙන් කටයුතු කළා. සාක්ෂිකරුවන්ට තිබෙන ලොකුම ගැටලුව මොකක්ද? සමහර වෙලාවට උදේ 9.00 ඉඳලා සවස 2.00 වනතුරු උසාවියේ ඉඳලාත් නඩුව කල් යනවා; අරයා නැහැ, මෙයා නැහැ කියලා නඩුව කල් යනවා. මම මේ නඩුකාරතුමන්ලාට දොස් කියනවා නොවෙයි. ඒක තමයි, අපේ ක්‍රමය හැදිලා තිබෙන විධිය. ඒ වාගේම සමහර වෙලාවට ඔවුන් පැමිණිල්ලක් දාලා තිබෙනවා, නමුත් පැමිණිල්ල විභාග කරනකොට අවුරුදු හතරක්, පහක් කල් ගිහිල්ලා. එතකොට සමහර වෙලාවට ඒ සාක්ෂිකාරයා මේ රටේත් නැහැ. ඉතින්, මේ ක්‍රමය හඳලා තිබෙන්නේ එහෙම ඈත ඉන්න සාක්ෂිකරුවන්ට දුරස්ථ ක්‍රමය මඟින් සාක්ෂි දෙන්නයි. එතකොට ඔවුන් අධිකරණයට එන්න ඕනෑ නැහැ. මේ පනත් කෙටුම්පතේ 5වන වගන්තියේ 273අ. යටතේ තිබෙනවා, මේ රටේ ඉඳන් සාක්ෂි දෙනවා නම් දුරස්ථ ස්ථානයක ඉඳන් සාක්ෂි දෙන්නේ කොහොමද, යම් හෙයකින් එම තැනැත්තා විදේශගත වෙලා ඉන්නවා නම්, ඒ විදේශගත ස්ථානයේ ඉඳලා සාක්ෂි දෙන්නේ කොහොමද කියලා. මේක විශාල ඉදිරි පිම්මක්, තාක්ෂණය හරහා අධිකරණ පද්ධතියට කරනු ලබන. ඒ කියන්නේ, පළමුවැනි වතාවට සාක්ෂිකරුවන්ට දුරස්ථ ස්ථානයක සිට නඩුවකට සාක්ෂි දෙන්න පුළුවන් වීම.

ගරු කථානායකතුමනි, මෙහිදී රජයේ සේවකයන්ට ගොඩක් වැදගත් වන කාරණයක් තිබෙනවා. Government Analystට හෝ JMOට තමන්ගේ සේවා ස්ථානයේ හෝ තෝරා ගත් ස්ථානයක ඉඳලා උසාවියට එන්නේ නැතුව මේ කටයුත්ත කරන්න පුළුවන්. අපි උදාහරණයක් විධියට හිතමු, රස පරීක්ෂකවරයෙකුට නඩුවකට සාක්ෂි දෙන්න අම්පාර උසාවියට යන්න වෙනවා කියලා. ඔහුට එහි යන්න දවසක් ගත වෙනවා, නැවත එන්න තව දවසක් ගත වෙනවා, සාක්ෂි දෙන්න තව දවසක් ගත වෙනවා. දවස් තුනක් මහටම නාස්ති වෙනවා. මේ අලුත් සංශෝධනය තුළින් මෙන්න මේ තත්ත්වය පැය භාගයකට අඩු කර ගන්න පුළුවන්. මොකද, ඒ සඳහා මේ පනතේ ප්‍රතිපාදන තිබෙනවා. එහෙම රජයේ නිලධාරීන් තමන්ගේ සාක්ෂි දෙන ආකාරය, ලේඛන ඉදිරිපත් කරන්න පුළුවන් ආකාරය ඉතාම පැහැදිලිව මෙහි සඳහන් කරලා තිබෙනවා.

ඒ වාගේම අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියටත් ඉල්ලීම් කරන්න පුළුවන්, සාක්ෂිකරුවෙකුට දුරස්ථ මාර්ගයෙන් සාක්ෂි දීම සම්බන්ධයෙන්. ඒ වාගේම දෙමව්පියන් නැතිව ළමා නිවාසවල ජීවත් වන දරුවන්ටත් මේක ගොඩක් වැදගත් වෙනවා, ගරු කථානායකතුමනි. ළමා ආරක්ෂක ක්ෂේත්‍රයේ හිටපු කාලයේ මම දන්නවා, ඒ දරුවෝ රස්තියාදු වෙනවා, වැඩිහිටියෝ එක්ක මිශ්‍ර වෙනවා, අතවරයට පත් වෙනවා කියලා. මෙවැනි දේ නිසා ඒ දරුවන්ට මහන්සියි කියලා ඔවුන් බොහෝ අවස්ථාවල කියන බවත් මා දන්නවා.

විශේෂයෙන්ම යම්කිසි සාක්ෂිකරුවෙකුට අධිකරණයේ පෙනී සිටීමට අපහසු වන අවස්ථාවකදී ඒ නඩු කටයුත්ත කල් යන එක වළක්වන්න ඔහුට ඩිජිටල් අවකාශයෙන් අවස්ථාව සැලසීම තුළින් පුළුවන් වෙනවා. ඒ අනුව, එම තැනැත්තා භෞතිකව අධිකරණයේ පෙනී නොසිටියත්, ඒ සාක්ෂි අධිකරණයට ලබා ගන්න පුළුවන්. එවැනි අවස්ථාවලදී නඩු කල් යාම වළක්වන්න පුළුවන්. මේ සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පතේ 5වන වගන්තියේ 273ඇ යටතේ පැහැදිලිව දක්වා තිබෙනවා. 273ඇ මඟින් කොමසාරිස්වරයාගේ කාර්යභාරය පැහැදිලි කර තිබෙනවා. අදාළ නඩු විභාගය සඳහා සාක්ෂිකරුවෙකුගේ සාක්ෂි විභාග කිරීමට කොමසාරිස්වරයෙකු පත් කරන්නේ කොහොමද කියලා එහි සඳහන් වෙනවා. ඒ කොමසාරිස්වරයා දුරස්ථ ස්ථානයක සිට නඩු විභාගයට සම්බන්ධ වන ආකාරය, සාක්ෂිකරුවන් සම්බන්ධ කරන ආකාරය ගැන එහි සඳහන් වෙනවා. මෙවැනි ප්‍රතිපාදනයක් අපට අවශ්‍ය වෙලා දීර්ඝ කාලයක් වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත්, අද තමයි ඒක අනුමැතියට ඉදිරිපත් වෙන්නේ.

පසුගිය කාලවල සැකකරුවන් සහ චූදිතයන් අධිකරණයට ඉදිරිපත් කිරීමේදී අවාසනාවන්ත සිදුවීමක් වුණා. එවැනි ආකාරයට සැකකරුවෙකුගේ හෝ සාක්ෂිකරුවෙකුගේ ජීවිතයට තර්ජනයක් ඇති අවස්ථාවකදී මෙවැනි නීති ප්‍රතිපාදන අපට අවශ්‍ය වෙනවා. ඒ කියන්නේ, මේ පනත් කෙටුම්පතේ 2වන වගන්තියේ 144අ. (1) (අ), (ආ), (ඇ), (ඈ) යටතේ පැහැදිලිව තිබෙනවා, රඳවා තබා ගැනීමේ කාල සීමාව දීර්ඝ කිරීම සඳහා, ඇප ඉල්ලීමක් විභාග කිරීම සඳහා සහ තවත් කරුණු මත චූදිත තැනැත්තෙකු වුණත් භෞතිකව අධිකරණයට ඉදිරිපත් කිරීමකින් තොරව, විද්‍යුත් මාර්ගයෙන් පෙනී සිටීමින් ඔහුගේ ඉල්ලීම කළ හැකි බව. අපි හිතනවා, ඒවා ඒ ආකාරයට වෙන්න ඕනෑය කියලා. මේ දවස්වලත් අපේ නියෝජ්‍ය ඇමතිවරයෙක් සම්බන්ධ කරලා ඥාණසාර ස්වාමීන් වහන්සේ විසින් ජාතිවාදී ස්වරූපයෙන් ප්‍රකාශ නිකුත් කරනවා. මූලධර්මවාදීන් සහ වෙනත් කටයුතු කියලා කිසිම සම්බන්ධයක් නැතිව ජනතාව කුපිත කරවන ආකාරයේ ප්‍රකාශ නිකුත් කරනවා. නමුත් අපි පැහැදිලිව කියනවා, අපි එහෙම අන්තගාමී කණ්ඩායමක් නොවෙයි කියලා. අපට තිබෙන්නේ, ඉතාම පැහැදිලි, බොහොම ප්‍රගතිශීලීව යන ගමනක්. අපේ ගමනේදී එවැනි අන්තවාදයක් නැහැ. ඒ ගැන පැහැදිලි කරන්න වෙන කිසිම දෙයක් ඕනෑ නැහැ. ගාසා තීරයේ නිරාහාර දරුවන් සම්බන්ධයෙන් පසුගිය දවස්වල අගමැතිනිය මැදිහත් වුණේ කොහොමද? ආහාර නොමැතිව මිය යන දරුවන් සම්බන්ධයෙන් අපි මැදිහත් වෙලා කටයුතු කළා. අපි එක ආගමකටවත්, එක අන්තවාදයකටවත් නැහැ. අපි මුස්ලිම් ජාතිය හෙළා දකින්නේත් නැහැ. අපි බෞද්ධ දර්ශනයට ගරු කරනවා වාගේම ජාති, ආගම් සම්බන්ධයකින් තොරව ජාත්‍යන්තර වශයෙනුත් අපි එදා ඉඳලාම නිවැරදි තැන හිටගෙන ඉන්නවා. ඒකට හොඳම උදාහරණය තමයි පලස්තීනය.

එම නිසා අපි කියනවා, ඒ වාගේ තුච්ඡ දේවල්වලට ජාතිවාදය පාවිච්චි කරන්න එපා කියලා. මීට කලිනුත් ඥාණසාර හාමුදුරුවෝ ඒ වාගේම ප්‍රකාශ නිකුත් කිරීම නිසා මට මතකයි, මා නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කයේ දිගන ප්‍රදේශයේ ඇති වූ කලකෝලාහලය. ඒ වාගේමයි දර්ගා නගරය සහ මම උපන් බේරුවල ප්‍රදේශයේ ඇති වුණු ගැටලුව. එම ප්‍රදේශවල ජීවත් වන ජනතාව අපට කථා කරලා කියනවා, කොයි විධියේ දුෂ්කරතාවලටද ඒ අය මුහුණ දුන්නේ කියලා. එහෙම කටයුතු කරපු උන්වහන්සේට විරුද්ධව නඩු පැවරුණු අවස්ථාවේදී අපට මතකයි, කුපිත වුණු ජනතාව තාප්ප පෙරළාගෙන අධිකරණයට ආ ආකාරය. දැන් එවැනි තත්ත්වයක් නැවත ඇති වුණොත් අපට පුළුවන්, විද්‍යුත් මාර්ගයෙන් එම නඩුව විභාග කරන්න. අපි සලකනවා, "සිරකරුවෝ ද මනුෂ්‍යයෝ ය" කියලා. එහෙම නම් ඒ අයගේ ජීවිත ආරක්ෂා වෙන්නත් ඕනෑ, අධිකරණ කටයුතුවලට බාධාවක් නොවෙන්නත් ඕනෑ. මෙන්න මේ ප්‍රතිපාදනය එදාත් නීතියේ තිබුණා නම් උන්වහන්සේ සිර ගේ ඇතුළේම තියාගෙන විද්‍යුත් මාර්ගයෙන් නඩුව විභාග කරන්න අපට අවස්ථාව තිබුණා. අපි අන්න එවැනි අවස්ථා සලසනවා, මෙම පනත තුළින්.

අපි දන්නවා, කුඩා දරුවෙකු වුණත් යම්කිසි අපරාධයක වින්දිතයෙක් වුණු අවස්ථාවකදී -අපරාධයකට ලක් වුණු අවස්ථාවකදී- දීර්ඝ කාලයකට පසුව තමයි නඩුව මහාධිකරණයට ඉදිරිපත් වෙලා ඒ දරුවාට එම නඩු විභාගයට මුහුණ දෙන්න වෙන්නේ කියලා. මගේ පෞද්ගලික අත්දැකීමක් තිබෙනවා, දූෂණයට ලක් වුණු දැරියක් සම්බන්ධව. එම දැරියගේ මව විදේශගතව සිට මා මුණ ගැහෙන්න මුල් අවස්ථාවේදීම එන්නේ දැරියව පාසලෙන් අයින් කිරීම නිසා ඒ දැරියට පාසල් යන්න අවස්ථාව ලබා ගන්නයි. මව විදේශගත වෙලා මාමාගේ භාරකාරත්වය යටතේයි එම දැරිය සිටියේ. මාමාගේ සේවා යෝජකයාගේ -මාමාගේ බොස්ගේ- පුතා අතින් තමයි එම දැරිය දූෂණයට ලක් වන්නේ.

මාමා සාක්ෂිකරුවෙක්. ඒ දියණිය පාසලට භාර අරගෙන නැහැ, අතවරයට ලක් වුණාට පස්සේ. ඒ කාරණයට තමයි මාව මුණ ගැහෙන්න ආවේ. ඊට දීර්ඝ කාලයකට පසුව නැවත මට ඒ දියණිය මුණ ගැහුණා, ඒ නඩුව මහාධිකරණයට යොමු වුණු අවස්ථාවේදී. එතකොට ඒ දැරිය වැඩිහිටි කාන්තාවක්. ඒ දැරිය විවාහ වෙලා; මවක්. ඇයගේ අතදරුවාත් අරගෙන තමයි ඇය මහාධිකරණයේ සාක්ෂි දෙන්න ආවේ. ඇයගේ විවාහක සැමියා ආරක්ෂක අංශයට සම්බන්ධ තැනැත්තෙක්. ඔහු ඇවිල්ලා මගෙන් ඇහුවේ, උසාවි යන්නේ නැතුව මේ සාක්ෂිය දෙන්න ක්‍රමයක් නැද්ද කියලායි. එය ඉතාම සංවේදී අවස්ථාවක්. ඇයි? ඒ, ඔහුගේ භාර්යාව. ආරක්ෂක අංශවල සාමාජිකයන්, මුළු සමාජයක් ඇයව හඳුනනවා. ඔහු කොහොමද, ඇයව මහාධිකරණයට එක්කගෙන යන්නේ? කුඩා දරුවාත් එක්කම යන්නත් ඕනෑ. පැය ගණනක් රැඳී ඉන්නත් ඕනෑ. මව්කිරි බොන දරුවා ගෙදර තියලා යන්නත් බැහැ. එහෙම ගියාම ඒ යුවළ හඳුනා ගන්නවා, ප්‍රදේශයේ ජනතාව, ඔවුන්ගේ යහළු හිත මිත්‍රාදීන්. ඔවුන් කොහොමද, ඒ අයට මුහුණ දෙන්නේ? ඔහු අහපු ප්‍රශ්නයට එදා මම නිරුත්තරයි. හැබැයි, මේ පනත සම්මත වුණාට පසුව එවැනි ප්‍රශ්න සම්බන්ධව අපට උත්තර

දෙන්න පුළුවන්, ඔව්, එතැනට යන්නේ නැතුව ඔබට සාක්ෂි දෙන්න පුළුවන් කියලා. වසර ගණනාවකට පසුව එම දැරියන් වැඩිවියට පත්වුණාට පසුවත් සමාජය තුළ නැවත ඔවුන් අපහසුතාවට ලක් වෙන්න අවශ්‍ය නැහැ. තමන්ට සිද්ධ වුණු අපරාධය වසන් කරගෙන ඉන්න අවශ්‍යත් නැහැ. තමන්ට සිද්ධ වූ අසාධාරණයට විරුද්ධව නැඟී සිටින්න, ඉදිරියට එන්න කාන්තාවන්ට, දියණියන්ට අපි අවස්ථාවක් ලබා දෙනවා, මේ පනත සම්මත කිරීම තුළින්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ඇතැම් නඩුවල වූදිතයන් ඉන්නවා, ඒ අය සමහර අවස්ථාවලදී කෙටියෙන් නඩුව ඉවර කර ගන්න කැමතියි, ගරු අධිකරණයට ඉදිරිපත් වෙන්න හැකියාව තිබෙනවා නම්. නමුත් ඒ අයට අධිකරණයට එන්න අවස්ථාවක් නැහැ. එක්කෝ ඒ අය විදේශගත වෙලා ඉන්නේ, වරෙන්තු නිකුත් වෙලා. නමුත් නීතිඥවරුන් මාර්ගයෙන් ඉදිරිපත් වෙලා නඩු කටයුතු අවසන් කර ගන්න ඒ අය සූදානම්. සමහර වෙලාවට ජීවිත ආරක්ෂාව පතා සමහරුන් විදේශ රටවල ඉන්නවා. ඔවුන් වුණත් කැමැතියි, නඩු කටයුතු අවසන් කර ගන්න. එහෙම අවස්ථාවලදීත් පහසුවෙන් ඒ කටයුතු සිදු කරගන්න හැකි ආකාරයට මේ පනත තුළ ප්‍රතිපාදන සකස් වෙලා තිබෙනවා. විවෘතව උසාවියට ගෙන්වන්නේ නැතුව අපට පුළුවන්, ඒ තැනැත්තාව නඩු විභාගයට සම්බන්ධ කර ගන්න.

ඒ වාගේම අපි අහලා තිබෙනවා, අපරාධ සහායකයන් - accomplices - ගැන. අපරාධ සහායකයන් ඇතැම් විට රජයේ සමාව ලබාගෙන ඒ සිද්ධිය සම්බන්ධයෙන් රජයේ සාක්ෂිකරුවෙක් හැටියට ඉදිරිපත් වෙනවා. අපි නීතිඥ වෘත්තියේදී ඒ සම්බන්ධ අත්දැකීම් ලබා තිබෙනවා. ඒ අය ඉන්නේ හුඟක් වෙලාවට රක්ෂිත බන්ධනාගාරගත වෙලා. ඒ අයට අවස්ථාවක් නැහැ, නීතිඥවරයෙකු මුණ ගැහෙන්න. එවැනි අවස්ථාවකදී ගෙදර ඉන්නකොට වාගේ ලෙහෙසියෙන් නීතිඥවරයෙකුගේ සහාය ලබා ගන්න බැහැ. හැබැයි ඒ අය කැමැතියි, නීතිඥ සහායක් ලබාගෙන තමන්ගේ ප්‍රකාශය කරලා නඩු විභාගය කෙටියෙන් ඉවර කරගන්න; නඩු විභාගයට සහාය දීම සඳහා රජයේ සාක්ෂිකරුවෙකු හැටියට පෙනී සිටින්න. එවැනි කාරණා කටයුතු සම්බන්ධයෙන් අපට ප්‍රතිපාදන අවශ්‍ය වෙලා දීර්ඝ කාලයක් වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි හුඟක් පිටුපසින් ඉන්න ජාතියක්. ලෝකය ජාත්‍යන්තර වශයෙන් ඉස්සරහට ගිහින් තිබෙනවා, තාක්ෂණයත් එක්ක. ඒ නිසා අපිත් මේ දේවල් තුළින් ඉදිරියට යන්න ඕනෑ.

ඒ වාගේම කාන්තාවන් හැටියට අපි දන්නවා, අසනීපයක් කියලා කියන්න බැරි අසනීපයක් කාන්තාවන්ට හැදෙන බව. අපි උසාවියකට කියන්නේ කොහොමද, මේ කාන්තාවට අසනීපයි කියලා. වෛද්‍ය සහතිකයක්වත් දෙන්නේ නැහැ, මාසික ආර්තව දිනය නිසා ඇය අසනීපයි කියලා. අධිකරණයට තියා කොහේට වුණත් යන්න අපහසු වුණත් වෛද්‍යවරයෙක් වෛද්‍ය සහතිකයක් දෙන්නේ නැහැ, ඒක අසනීපයක් කියලා. එහෙම දෙන්නත් බැහැ. මොකද, ඒක ස්වාභාවික සංසිද්ධියක්. ලෝකයටම මේ ගැන කථා කරන්න අද අපට විශේෂ අවස්ථාවක් ලැබී තිබෙනවා. අනුදි ගුණසේකර කියන ශ්‍රී ලාංකික දියණිය මේ ආර්තව දුප්පත්කම - period poverty - ගැන කථා කරනවා, ඇයගේ "සහේලි පදනම" හරහා. ඇයගේ ජයග්‍රහණය සඳහා සුබ පැතීමටත් මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඒ සියලුම කාරණා සලකා බලමින්, එවැනි ඕනෑම අවස්ථාවකදී අධිකරණයට භෞතිකව - physically - යන්න බැරි පුද්ගලයන් නඩු කාර්ය පටිපාටිය සඳහා සහභාගි කර ගැනීමේ වැදගත්කම හැම කෙනෙකුම අවධාරණයට ගන්නවා ඇතැයි මා විශ්වාස කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Priyantha Wijerathna. You have 11 minutes.

[පූ.භා. 11.38]

**ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரியந்த விஜேரத்ன)
(The Hon. Priyantha Wijerathna, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින අප විවාදයට භාජන කරනු ලබන්නේ, අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත සහ විදේශීය ණය (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පතයි.

මේ පනත් කෙටුම්පත් පිළිබඳව සාකච්ඡා කිරීමේදී මම මුලින්ම හොයා බැලුවා, මේ සම්බන්ධයෙන් වන නීති පිළිබඳව. විශේෂයෙන්ම අද දින අපි විවාදයට භාජන කරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පතට අදාළව එකතු කරනු ලබන නව ප්‍රතිපාදන සම්බන්ධයෙන් වන නීති විදේශ රටවල් කොයි තරම් කාලයකට පෙර තමන්ගේ නීති පද්ධතියට ඇතුළත් කරගෙන තිබෙනවාද කියන කාරණය පිළිබඳවත් මම හොයා බැලුවා. ඒ සොයා බැලීමේදී තහවුරු වුණු දෙයක් තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රට තාක්ෂණය භාවිත කිරීම අතින් වෙනත් රටවලට සාපේක්ෂව කොයි තරම් පසුගාමීද කියන එක. විශේෂයෙන්ම අද අපි සාකච්ඡා කරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පතට එකතු කරන ලබන නෛතික ප්‍රතිපාදන ලෝකයේ වෙනත් රටවල් තමන්ගේ නීති පද්ධතියට ඇතුළත් කරගෙන තිබෙන්නේ මීට දශක ගණනාවකට කලින්. ආරම්භයේදීම ඒ නෛතික ප්‍රතිපාදන තමන්ගේ නීති පද්ධතියට ඇතුළත් කර ගනු ලබන්නේ ඕස්ට්‍රේලියාව වාගේ රටවල්. 1990 වාගේ කාලයේ තමයි ඒ රටවල් අද අපි මේ ඇතුළත් කරන්න යන නීති තමන්ගේ නීති පද්ධතියට ඇතුළත් කරගෙන තිබෙන්නේ. විශේෂයෙන්ම කැනඩාව, මෙක්සිකෝව, නවසීලන්තය, එක්සත් ජනපදය, බ්‍රසීලය, ආර්ජන්ටිනාව, එක්සත් රාජධානිය, රුසියාව, ස්වීඩනය වාගේම අපේ අසල්වැසි රට වන ඉන්දියාවත් අද අපි කථා කරන, විවාදයට ගනු ලබන නීති ක්ෂේත්‍රයන් තමන්ගේ නීති පද්ධතියට ඇතුළත් කරගෙන තිබෙනවා.

විශේෂයෙන්ම අපි අද සාකච්ඡා කරන 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ක්ෂේත්‍ර තුනක් ආවරණය වන විධියට තමයි සකස් කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම අපරාධ නඩු විධාන සංග්‍රහය පනතට 144අ සහ 144ආ වශයෙන් අලුත් වගන්ති දෙකක් ඇතුළත් වෙනවා. ඒ වාගේම, ප්‍රධාන ප්‍රඥප්තියට 241අ වන සහ 241ආ වන අලුත් වගන්ති දෙක ඇතුළත් කරනවා. එමෙන්ම, අපරාධ නඩු විධාන සංග්‍රහය ප්‍රධාන ප්‍රඥප්තියට 273අ සිට 273ද දක්වා වන අලුත් වගන්ති කිහිපයක් ඇතුළත් කරන්න මේ සංශෝධිත පනත් කෙටුම්පත මඟින් අපේක්ෂා කරනවා.

මා මුලින් සඳහන් කළ ආකාරයට 144අ සහ 144ආ වගන්ති මඟින් සහ 241අ සහ 241ආ වගන්ති මඟින් වූදිතයෙක් හෝ සැකකරුවෙක් භෞතිකව අධිකරණයට ඉදිරිපත් නොකර ඔහු සම්බන්ධයෙන් වන මූලික කාරණා, විශේෂයෙන් කැඳවීම් අවස්ථාවේ නඩු අධිකරණයේ කැඳවන්න මේ හරහා ප්‍රතිපාදන සලසා තිබෙනවා. ඒ වාගේම අදාළ සැකකරුට හෝ වූදිතයාට පුළුවන්, video recording එකක් ඔස්සේ තමන්ගේ නඩුව දැක බලා ගන්න. එතකොට මේ වගන්ති සංශෝධනය කරන්නත්, මේ ප්‍රතිපාදන අලුතින් ඇතුළත් කරන්නත් මේ පනත් කෙටුම්පත හරහා අපට අවස්ථාවක් ලැබෙනවා.

[ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා ]

ඊළඟට, ප්‍රධාන ප්‍රඥප්තියට 273අ සිට 273ද දක්වා වන වගන්තිවලට අලුතෙන් කාරණා ඇතුළත් කරලා තිබෙනවා. ඒ යටතේ සාක්ෂිකරුවන්ට පුළුවන්, දුරස්ථව සිට තමන්ගේ සාක්ෂිය අධිකරණයට ලබා දෙන්න. විශේෂයෙන්ම රාජ්‍ය අංශයේ විශේෂඥ සාක්ෂිකරුවන්ට පුළුවන්, තමන්ගේ ආයතනයේ හෝ දුරස්ථව සිට අධිකරණයට තමන්ගේ සාක්ෂිය ලබා දෙන්න. ඒ වාගේම, ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ඔස්සේ අධිකරණයට ලේඛන ඉදිරිපත් කරන්න මේ හරහා අවස්ථාව ලබා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සංශෝධිත පනත් කෙටුම්පතේ වැදගත්කම් මොනවාද, වැදගත්කම කුමක්ද කියන කාරණය සලකා බලනකොට අපට පේනවා, සාක්ෂිකරුවෙකුට, එහෙම නැත්නම් චූදිතයෙකුට අධිකරණය ඉස්සරහ භෞතිකව පෙනී නොසිට තමන්ගේ සාක්ෂිය ඉදිරිපත් කරන්න මේ හරහා අවස්ථාව ලැබෙන බව. විශේෂයෙන්ම 273අ සිට 273ද දක්වා වන ප්‍රතිපාදන තුළ ඒ කාරණය අන්තර්ගත වෙලා තිබෙනවා.

ඒ අනුව තමන්ට යම් ජීවිත තර්ජනයක් තිබෙනවා නම්, නැත්නම් බාල විය නිසා, එහෙම නැත්නම් අධික මහලු බව නිසා, එහෙමත් නැත්නම් තමන් විදේශගත වෙලා සිටින නිසා හෝ භෞතිකව අධිකරණයේ පෙනී සිටින්නට නොහැකි වන සාක්ෂිකරුවෙකුට තමන්ගේ සාක්ෂිය අධිකරණයට ඉදිරිපත් කරන්න අවශ්‍ය ප්‍රතිපාදන මේ පනත තුළ අන්තර්ගත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තුළ තවත් ඉතා වැදගත් කාරණයක් තිබෙනවා. අපේ රටේ නඩු ප්‍රමාද වෙන්න කාරණා ගණනාවක් බලපානවා. ඒ අතරින් එක කාරණයක් තමයි, එක්කෝ චූදිතයා කුමක් හෝ හේතුවක් මත අධිකරණයේ පෙනී නොසිටීම. එහෙමත් නැත්නම් සාක්ෂිකාරයා අධිකරණය ඉදිරියේ පෙනී නොසිටීම. හැබැයි, මෙන්න මේ බාධකය යම්තාක් දුරට හෝ මග හරවා ගන්න අපට මේ ප්‍රතිපාදනය හරහා අවස්ථාව ලැබෙනවා. අපි දැකලා තිබෙනවා, සමහර නඩුවලදී නඩුවේ ප්‍රධාන සාක්ෂිකාරයා විදේශගත වීම නිසා සමහර අවස්ථාවල චූදිතයා නිදහස් වෙනවා. එහෙම නැත්නම් මුළු නඩුවම අනික් පැත්ත ගහනවා. දැන් මේ ගෙනෙන ප්‍රතිපාදන යටතේ විදේශ තානාපති කාර්යාල හරහා අදාළ සාක්ෂිකරුවාව භෞතිකව අධිකරණය ඉදිරියේ නොසිටියත් ඔහුගේ සාක්ෂිය ලබාගෙන අදාළ නඩුව සාර්ථක කර ගන්නට පැමිණිලි පාර්ශ්වයට අවස්ථාවක් ලැබෙනවා. මේක ඉතා වැදගත් ප්‍රතිපාදනයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත සම්මත කිරීමේ ඇති තවත් වැදගත් කාරණයක් තමයි, සැකකරුවන්ට -චූදිතයන්ට- ආරක්ෂාව සැලසීම. අපි දන්නවා, පසුගිය කාලය තුළ ලොකු කථා බහකට ලක් වුණා, අධිකරණයට ඉදිරිපත් කරන ලද සැකකරුවෙක් වෙඩි තබා මරා දැමීම ගැන. ඇත්තටම 2025 අවුරුද්දේදී සිද්ධ වුණු සිදුවීම නොවෙයි මේ සම්බන්ධයෙන් සිදු වුණු පළමුවැනි සිදුවීම. අපි දන්නවා, නොයෙල් අමරසිංහ බන්ධනාගාරය තුළදී මැරුවා. ඊළඟට, චින්තක අමරසිංහ නමැත්තා මීගමුව අධිකරණය තුළදී ඝාතනයට ලක් වුණා. ඒ වාගේම 2015දී කඩුවෙල උසාවියේදී "සමයං" ට වෙඩි තැබුවා. ඒකෙන් ඔහු මැරුණේ නැහැ. ඊට පස්සේ 2017දී බන්ධනාගාර බස් රථයක් තුළදී වෙඩි තියලා "සමයං" සමඟ තවත් සැකකරුවන් පස්දෙනෙක් මරා දැම්මා. ඒ අවස්ථාවේදී බන්ධනාගාර නිලධාරීන් දෙදෙනකුත් ඝාතනයට ලක් වුණා.

ඊළඟට, 2022 අගෝස්තු මාසයේ ගල්කිස්ස උසාවියේදී එවැනිම ආකාරයේ වෙඩි තැබීමක් සිද්ධ වුණා. ඊට පස්සේ 2004.01.09වැනි දා ධම්මික අමරසිංහ නමැත්තා අලුත්කඩේ උසාවියේ කාමර අංක 6දී වෙඩි තබා ඝාතනයට ලක් වුණා. ඒ අවස්ථාවේදී ඝාතකයා ආවේ නීති ශිෂ්‍යයෙක් විධියට. 2025.02.19වැනි දා "ගනේමුල්ලේ සංජීව" අධිකරණ ශාලාවක් තුළදී වෙඩි තියලා මරා දැමුවා. මෙන්න මේ වාගේ තර්ජනයට ලක්වෙලා සිටින චූදිතයන් -සැකකරුවන්- භෞතිකව අධිකරණයට ඉදිරිපත් නොකර ඔවුන්ට ආරක්ෂාව සලසමින්, අදාළ නඩු කටයුතු පවත්වාගෙන යන්න මෙම සංශෝධනය හරහා අපට අවස්ථාව ලැබෙනවා. මේක ඉතා වැදගත් අවස්ථාවක් විධියට මා සලකනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම තවත් වැදගත් කාරණයක් තමයි, විශේෂඥ සාක්ෂිකරුවන්ට අධිකරණය ඉදිරියේ භෞතිකව පෙනී නොසිට මෙම ප්‍රතිපාදනය යටතේ දුරස්ථව සිට තමන්ගේ සාක්ෂි ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම. අපේ ගරු අධිකරණ ඇමතිතුමා කිව්වා වාගේ රස පරීක්ෂකවරයා අම්පාර මහාධිකරණයේ නඩුවකට යනවා නම්, යන්න එක දවසක්, සාක්ෂි දෙන්න තව දවසක්, එන්න තව දවසක් විධියට දවස් තුනක් වැය වෙනවා. හැබැයි, මෙම සංශෝධනයේ ප්‍රතිපාදන යටතේ අපට සාක්ෂි ලබා දෙන කාලය පමණක් ප්‍රයෝජනයට අරගෙන - උදාහරණයක් විධියට පැය භාගයක්, පැයක් පමණ- අදාළ සාක්ෂිය ලබා ගැනීමේ හැකියාව ලැබෙනවා.

ඒ වාගේම ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ඔස්සේ අධිකරණය වෙත ලේඛන ඉදිරිපත් කරන්නත් මේ හරහා ප්‍රතිපාදන සලසා තිබෙනවා. විශේෂයෙන්ම අධිකරණයේ සිදු වන කාලය නාස්තිවීම්, අධිකරණයේ සිදු වන මුදල් නාස්තිවීම්, බන්ධනාගාරවල සිදු වන මුදල් නාස්තිවීම් අවම කරන්නත්, එමෙන්ම නඩු කල් යෑම යම්තාක් දුරකට හෝ අවම කරන්නත් මෙම ප්‍රතිපාදන හරහා අවස්ථාව ලැබෙනවා. මේ වාගේ පනතක් දැකපු ගමන් නීතිඥවරු විධියට අපේ ඔළුවට එන්නේ, "මේක අස්සෙන් රිංගලා යන්න පුළුවන්ද?" වාගේ අදහසක්.

හැබැයි මේ පනත් කෙටුම්පත කියෙව්වාට පස්සේ අපිට තේරෙනවා, මේක අස්සෙන් රිංගලා යන්න තිබෙන ඉඩකඩ ඉතාම අල්පයි කියලා. උදාහරණයක් විධියට ගත්තොත්, සාක්ෂිකාරයින්ට සාක්ෂි ලබා දෙන විධියේදී - දුරස්ථ සාක්ෂි ලබා දීමේදී - ඒ ප්‍රතිපාදනය අවභාවිත කරන්න තිබෙන අවස්ථා ඉතාම අල්පයි. එහෙම අවස්ථා නැති තරම්. ඒ වාගේම, මේ පනතේ මේ ගැනත් අවධානය යොමු කරලා තිබෙනවා. අපේ වාගේ රටක මේ ප්‍රතිපාදනය පාවිච්චි කරද්දී -දුරස්ථ ක්‍රම; ඉලෙක්ට්‍රොනික ක්‍රම භාවිත කරද්දී- සන්නිවේදන දුර්වලතා ඇති වෙන්න පුළුවන්. හිටි ගමන් සිග්නල් නැති වෙන්න පුළුවන්. අදාළ සාක්ෂිය අතරමඟදී ඒ කටයුත්ත නතර වෙන්න පුළුවන්. මේ වාගේ අවස්ථා ගැනත් මේ පනතේ ප්‍රතිපාදන සලසා තිබීම ඉතාම වැදගත් වෙනවා. ඒ නිසා ලෝකයේ අනෙක් රටවල් දශක ගණනාවකට පෙර තමන්ගේ නීති පද්ධතියට ඇතුළත් කළ මෙවැනි පනතක් මේ කාලය තුළ හෝ ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ අපට ඉදිරිපත් කරන්න ලැබීම සතුටට කාරණයක් බව සඳහන් කරමින් මම මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Sajith Premadasa. You have 15 minutes.

[පූ.භා. 11.49]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1957 අංක 29 දරන විදේශීය ණය පනත ඉවත් කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ගැනත් අද සාකච්ඡා කරනවා. එහිදී අපි සාකච්ඡා කරන්නේ රටක්

හැටියට විදේශීය වශයෙන් අපි ලබා ගත්ත ණය කළමනාකරණය කිරීමේ විෂයය පිළිබඳවයි. විදේශ ණය ක්ෂේත්‍රය පිළිබඳ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනකොට මම අද අහනවා, විදේශ ණය පිළිබඳව, IMF ගිවිසුම පිළිබඳව, ද්විපාර්ශ්වීය ණය හිමිකරුවන්, ජාත්‍යන්තර ස්වෛරී ණය හිමිකරුවන් පිළිබඳව, කොච්චරක් ණය ගෙවන්න තිබෙනවාද, ඒ ගෙවන්න තිබෙන කාලවකවානු මොනවාද, වාර්ෂිකව ගෙවන්න තිබෙන ප්‍රමාණයන්, මේ ණය ගෙවීමේ ගිවිසුම්වලට එකඟ වීමේදී ඇති කරගත්ත කොන්දේසි, විශේෂයෙන්ම 2028දී ණය ගෙවීම සඳහා අපි සපුරාලන්නට ඕනෑ ආර්ථික ඉලක්ක - economic targets, විස්තීර්ණ ණය පහසුකම - Extended Fund Facility එක - ලබා ගැනීම, එය ලබා නොදීම, එය ලබා ගැනීම සහ ලබා නොදීම පදනම් වන්නේ විදුලි බිල වැඩි කිරීම මතද කියන කාරණා ගැන. අපි මෙවැනි ප්‍රශ්න ගණනාවක් ඇහුවා. හැබැයි අද පාර්ලිමේන්තුවේ දවසක් වෙන් කරලා තිබෙනවා, විදේශ ණය ගැන කථා කරන්න. මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන නියෝජ්‍ය ඇමතිවරයා මේ ප්‍රශ්නයට උත්තර දෙන්න කල් ඉල්ලනවා. මොකක්ද මේ වෙන්නේ? විදේශ ණය පිළිබඳව සාකච්ඡාවට භාජන කරන්න අද දවසම ගත කරලා තිබියදී, විදේශ ණය ක්ෂේත්‍රය පිළිබඳව, IMF ගිවිසුම පිළිබඳව, ද්විපාර්ශ්වීය ණය හිමිකරුවන් පිළිබඳව, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හිමියන් පිළිබඳව අපි විස්තර ටිකක් අහනවා. ඒ විස්තර ටික සපයන්නට කල් ඕනෑ ලු.

2025.02.17වැනි දා ඉදිරිපත් කළ වර්තමාන ජනාධිපතිවරයාගේ අය වැය කථාව තමයි මේ මගේ අතේ තිබෙන්නේ. මේ අය වැය කථාව නිර්මාණය කරනකොට අපි අහපු ප්‍රශ්න සියල්ලටම උත්තරත් සපයාගෙන තමයි අය වැය කථාව හැදෙන්නේ. මම හිතන විධියට හර්ෂ ද සිල්වා මැතිතුමා ඒකට එකඟ වෙයි. මේ හැම ප්‍රශ්නයකටම උත්තර ඔක්කෝම තිබෙනවා. එක්කෝ, උත්තර නැතුව අය වැය කථාව හැදුවා. එහෙම නැත්නම්, උත්තර දෙන්න දන්නේ නැහැ. එහෙමත් නැත්නම්, අද රට මුහුණ දෙන අභියෝගය පිළිබඳව අවබෝධයක් නැහැ.

අපි තමයි ඉස්සෙල්ලාම කිව්වේ, සියයට 33කින් විදුලි බිල අඩු කරනවාය කියලා ජනාධිපතිවරණ වේදිකාවේදී කොච්චර ප්‍රකාශ කළත්, මේ අය විදුලි බිල වැඩි කරනවා කියලා. රුපියල් 9,000 බිල රුපියල් 6,000 කරනවා කිව්වා; රුපියල් 3,000 බිල රුපියල් 2,000 කරනවා කිව්වා. අපි බොහොම පැහැදිලිව කිව්වා, අනිවාර්යයෙන්ම මේගොල්ලන් විදුලි බිල වැඩි කරනවා කියලා. ඒක හරියටම - නිට්ටාවටම- සිද්ධ වුණා නේ. දැන් රජය යෝජනා කරනවා, සියයට 18කින් විදුලි බිල වැඩි කරන්න. ඒ පදනම මත, ඒ කාරණාව අනුමාන කරමින් අද අපි ප්‍රශ්නයක් අහනවා, මේ එක්කම ජල බිලත් වැඩි වෙයි ද කියලා. ඉතින්, මේක පටලවනවා, ජල විදුලියත් එක්ක. ජල විදුලියක් ගැන නොවෙයි මම ඇහුවේ. පෙර පාසල් දරුවාගේ ඉඳලා අපි හැමෝම -මුළු රටම- දන්නවා, ජල විදුලි උත්පාදනය සහ සුළං විදුලිය, සූර්ය විදුලිය උත්පාදනය පැත්තෙන්, ඒ කියන්නේ පුනර්ජනනීය බලශක්තිය ශක්තිමත් කරනවා කියලා මැතිවරණ වේදිකාවේ ලොකු ලොකු පොරොන්දු දුන්නාට දැන් සුළං විදුලියට, ජල විදුලියට, solar powerවලට සම්පූර්ණයෙන්ම විරුද්ධ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වන රජයක් තමයි අද තිබෙන්නේ කියලා.

විදුලි බිල අඩු කරනවා කිව්වාට දැන් විදුලි බිල වැඩි කරනවා. ඒක අනුමාන කරලා අපි ප්‍රශ්නයක් අහනකොට, - ජල විදුලිය ගැන ප්‍රශ්නයක් නොවෙයි මේ අහන්නේ - ජල බිල ගැන ප්‍රශ්නයක් අහනකොට කියනවා, අපිට එහෙම අනුමාන කරන්න අයිතියක් නැහැ ලු. දත්ත මත කේන්ද්‍රීයව නොවෙයි ලු මේවා අහන්නේ. අද බොහොම වැදගත් ප්‍රකාශයක් ඇමතිවරයා කළා. ඒකට අනුව ජල බිල වැඩි වෙන්නේ නැහැ. අපි ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා ඔය ප්‍රතිපත්තියේම ඔබ සිටින්න කියලා. ඕකෙන් වෙනස් වෙන්න බැහැ. මොකද, ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ බොහොම පැහැදිලි ප්‍රකාශයක් කරලා තිබෙන්නේ. මේ හැම දෙයටම වඩා වැදගත්, මූලික ප්‍රශ්නයක් ගැනයි මම අදහස් ඉදිරිපත් කරන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක මම මීට පෙරත් කියලා තිබෙනවා.

මේ පාර්ලිමේන්තුවේ රජය නියෝජනය කරන සියලු ගරු මැති ඇමතිතුමන්ලාට මෙන්න මේ කාරණය මම මතක් කර දෙන්න ඕනෑ. "පොහොසත් රටක්- ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශයේ 105 වන පිටුවේ, අලුත් DSA එකක්, ණය සමාලෝචන කටයුතුවලදී භාවිත කිරීම සඳහා විකල්ප ණය තිරසරකරණ විශ්ලේෂණයක් පිළියෙළ කිරීම මැතිවරණ පොරොන්දුවක් ලෙස සඳහන් කර තිබෙනවා. මේ පොරොන්දුව සම්පූර්ණයෙන්ම කඩ කර තිබෙනවා. මේ වාගේ අලුත් DSA එකකට ගියා නම් ඔබට හැකියාව ලැබෙනවා, යම්තාක් දුරකට මේ කොන්දේසිවල වෙනසක් ඇති කරගෙන ජනතාවාදී; ජනහිතකාමී, ජනතාවගේ හිස මත, කරපිට බර පැටවීම අවම කරගත් අලුත් ගිවිසුමකට ඇතුළත් වෙලා මේ IMF වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න. නමුත්, ඒ අමාරු තීන්දු ගත්තේ නැහැ; ඒ අමාරු තැනට ගියේ නැහැ. තිබුණු IMF ගිවිසුම ගෙඩිය පිටින්ම ක්‍රියාත්මක කරන්නට, ණය හිමිකරුවන් එක්ක තිබුණු ගිවිසුම ක්‍රියාත්මක කරන්නට තීන්දු කළා. ඔබතුමන්ලා රටට හෙළිදරව් කරන්නට ඕනෑ, විදුලි බිල සියයට 18කින් වැඩි වෙන්නේ වෙන මොකක්වත් නිසා නොවෙයි, IMF කොන්දේසියක් නිසා කියන එක. ඒ IMF කොන්දේසියට එකඟ වෙන්නට මේ රජයට සිදු වෙලා තිබෙන්නේ ඔබම ඉදිරිපත් කළ ප්‍රතිපත්ති මාලාව මහ දවල් අමු අමුවේ උල්ලංඝනය කිරීම නිසා බව පිළිගන්න සිද්ධ වනවා. ඒ වාගේම මේ අවස්ථාවේ අපි රජයට යෝජනාවක් කරනවා. ප්‍රතිසංස්කරණ කටයුතු, ඒ ක්‍රියාදාමයන් සිද්ධ කරනකොට අපි පිළිගන්නවා අය කළ යුත්තන්ගෙන් ඒ අය කිරීම් ටික කරන්නට ඕනෑ කියලා.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලැබෙන ආහාරපානවල මිල දැන් වැඩි කර තිබෙනවා. ඒ වැඩි කිරීම අපි පිළිගන්නවා. හැබැයි, පොඩ්ඩක් හිතලා බලන්න, මේ පාර්ලිමේන්තුවේ සේවය කරන 786දෙනෙක් ඉන්නවා, විධායක නොවන නිලධාරීන්. ඒ අයගෙන් ආහාරවලට අය කරන මුදල රුපියල් 1,000 ඉඳලා රුපියල් 3,600 දක්වා වැඩි කර තිබෙනවා. අපි කියනවා, ඒක අසාධාරණයි කියලා.

විධායක ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අය කරන මුදල රුපියල් 1,500 සිට රුපියල් 4,000 දක්වා රුපියල් 2,500කින් වැඩි කර තිබෙනවා. එතැනට යන්න එපා. මම මේ විශේෂයෙන්ම කථා කරන්නේ විධායක නොවන කණ්ඩායම වෙනුවෙන්. එතැනට යන්න එපා. මේ පාර්ලිමේන්තුවේ සේවය කරන පොඩි මනුස්සයාගේ බඩට ගහන්න යන්න එපා. ඔවුන්ට සාධාරණත්වය ඉෂ්ට කරන්න. බර පටවන්න ඕනෑ කට්ටිය මත බර පටවන්න. දැන් ඔබතුමන්ලා තීන්දු කර තිබෙනවා මන්ත්‍රීවරුන්ට ලබා දෙන ආහාර පානවල මිල වෙනස් කරනවා කියලා. අපි ඒක පිළිගෙන තිබෙනවා. අපි ඒකට විරුද්ධව කථා කරන්න ගියේ නැහැ. නමුත්, මේ පාර්ලිමේන්තුවේම සේවය කරන පොඩි මනුස්සයාට මේ අසාධාරණය සිදු කරන්න එපා කියා අපි ඉල්ලා සිටිනවා.

ඒ වාගේම, මා නැවත නැවතත් මේ කාරණය කියන්න කැමැතියි. අද විදේශ ණය ගැන සාකච්ඡා කරනවා. නමුත්, විදේශ ණය ගැන උත්තර දෙන්න රජයට බැහැ. ඒ, දත්ත නැති නිසා ද, නොදැනුවත්කම නිසා ද, සැලසුමක් නැතිකම නිසා ද, දත්තවලට ප්‍රවේශයක් නැති නිසා ද, එහෙම නැත්නම්, තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය සකස් කළා වාගේ බලයට ඒම සඳහා ඕනෑම දෙයක් ප්‍රකාශ කළ නිසා ද? බලයට ඒම සඳහා ඕනෑම දෙයක් ප්‍රකාශ කරලා අද වනකොට අසරණ වී තිබෙන ආණ්ඩුවක්, මේක. අපි කනගාටු වෙනවා ආණ්ඩුව මේ රටේ ලක්ෂ 220ක් වන ජනතාව

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

නොමඟ යැවීම පිළිබඳව, රැවටීම පිළිබඳව, ඇන්දවීම පිළිබඳව, මංමුළා කිරීම පිළිබඳව.

අවසාන වශයෙන් මා තවත් කාරණයක් කියන්න කැමැතියි. රජය තීන්දුවක් ගෙන තිබෙනවා බහුකාර්ය ක්ෂේත්‍රයේ නිලධාරින් 4,500කට වැඩි පිරිසකගේ රැකියා ස්ථිර කරන්න. අපි ඒක විවේචනය කරන්නේ නැහැ. ඒ වෙනුවෙන් අපේ ස්තුතිය පුද කරනවා; සතුට ප්‍රකාශ කරනවා. එය එසේ සිදු කරනවා වාගේම දහසකට ආසන්න ප්‍රමාණයක් වූ වනජීවී ක්ෂේත්‍රයේ ස්වේච්ඡා මාර්ගෝපදේශකයන් ද අමතක කරන්න එපා. ස්වේච්ඡා මාර්ගෝපදේශකයන් හැටියට වසර 15කට වැඩි කාලයක් ඒ තාරුණ්‍යය අපේ පරිසර කේන්ද්‍රීය සංචාරක කර්මාන්තයට ලොකු ශක්තියක් ලබා දුන්නා. දවසට රුපියල් 1,000යි ඔවුන්ට ගෙවන්නේ. ඒක සොච්චම් දීමනාවක්. බහුකාර්ය නිලධාරින් 4,500ක් දෙනා ස්ථිර කිරීම ගැන ස්තුතිවන්ත වන අතරතුර, ඒ වැඩ පිළිවෙළ තුළ ම මේ කියන 1,000කට ආසන්න ප්‍රමාණයක් වන ස්වේච්ඡා මාර්ගෝපදේශකයන්ගේ රැකියා ස්ථිර කරන්නට කටයුතු කරන්න කියාත් මම බොහොම කාරුණිකව ඉල්ලා සිටිනවා. ඔවුන් පරිසර කේන්ද්‍රීය සංචාරක කර්මාන්තයේ සුවිශාල කාර්යභාරයක් සිදු කරනවා. විදේශීය සංචාරකයන්ට අපේ රටේ පරිසර හිතකාමී ස්ථාන, පරිසර සම්පත, සතා සිවුපාවා පිළිබඳ තොරතුරු, පරිසර කේන්ද්‍රීය දත්ත ඔක්කොම සන්නිවේදනය කරන්නේ මේ ස්වේච්ඡා මාර්ගෝපදේශකයන් විසින්. අර බහුකාර්ය නිලධාරින් 4,500ක් දෙනා ස්ථිර කරන අතරතුර - බහුකාර්ය නිලධාරින් සම්බන්ධයෙන් ඒ නිවැරදි දේ කරන අතරතුර- මේ ස්වේච්ඡා මාර්ගෝපදේශකයන් 1,000 ගැනත් ඔබගේ අවධානය කරුණාකර යොමු කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. U.P. Abeywickrama. You have 11 minutes.

[අ.භා. 12.02]

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින පාර්ලිමේන්තුවේ විවාදයට ගනු ලබන 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතට ගෙනෙන සංශෝධන මහජන ආණ්ඩුකරණයේ එක්තරා වැදගත් අවස්ථාවක් කියලා අපි විශ්වාස කරනවා. මේ රටේ ජනතාවගේ ජන වරම අනුව කටයුතු කරන ආණ්ඩුවක් හැටියට අපට ඓතිහාසික වගකීමක් පැවරී තිබෙනවා. මේ රටේ හැම ක්ෂේත්‍රයක්ම නව්‍යකරණයට ලක් කරලා, ලෝකයේ නව තත්ත්වයන්ට ගැළපෙන ආකාරයට හැම ක්ෂේත්‍රයක්ම නවීකරණය කිරීමේ වගකීම ආණ්ඩුවක් හැටියට අප ඉටු කරමින් සිටින බව තමයි, අද දිනයේ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතට අප විසින් ඉදිරිපත් කරනු ලබන සංශෝධනවලින් පැහැදිලි වන්නේ.

අපි මේ දවස්වල දකිනවා, විපක්ෂය බොහෝ වෙලාවට ලුණු සොයමින් ලුණු ලේවායවල පීන පීනා සිටින ආකාරය. හැබැයි, ඒ තත්ත්වයන් තුළ පවා අපි අපට ලැබෙන හැම අවස්ථාවකම මේ රටේ ජනතාවගේ දැවෙන ප්‍රශ්න නිරාකරණය කිරීම වෙනුවෙන් මේ උත්තරීතර සභාවේදී කටයුතු කරමින් ඉන්නවා. අද දිනයේ ද පනත් කෙටුම්පත් දෙකක් පිළිබඳ දෙවැනි වර කියවීමේ විවාදය පැවැත්වෙනවා. මේ පනත් කෙටුම්පත් සම්මත කිරීම හරහා අප බලාපොරොත්තු වන්නේ, අත්‍යවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ සඳහා අපේ ආණ්ඩුවට පැවරී ඇති වගකීම ඉටු කිරීමටයි.

නූතන ලෝකයේ නවීකරණයට සාපේක්ෂව විශේෂයෙන්ම අපරාධ යුක්තිය විනිශ්චය පහසු කිරීම සඳහා බලපාන කාරණාවක් හැටියට ඩිජිටල්කරණය - digitalization - අපේ ආණ්ඩුවේ ප්‍රධාන ප්‍රතිපත්තියක්. ඒ වාගේම අපි දකිනවා, අපේ අධිකරණ ක්ෂේත්‍රය දීර්ඝ කාලයක් තිස්සේ බොහෝ වෙලාවට ලිපි ලේඛන මත පදනම් වෙලා, එහෙම නැත්නම් විශාල පිරිවැයක් දරමින්, දීර්ඝ කාලයක් නඩු කල් අදිමින්, ජනතාවට අධිකරණය කෙරෙහි ඇති විශ්වාසය පලුදු වන මට්ටමට කටයුතු කරන, අධිකරණය කිව්වාම ජනතාවට විශාල භීතියක්, එහෙම නැත්නම් විශාල පීඩාවක් ගෙන දෙන ආයතනයක් බවට පත් වෙලා තිබෙන බව. ඒ තත්ත්වයෙන් මුදාගෙන වඩා කාර්යක්ෂම, වඩා ඵලදායී අධිකරණ සේවාවක් ජනතාවට ලබා දීමේ වගකීම තමයි, අද දිනයේ ඉදිරිපත් කරන එක් පනත් සංශෝධනයක් හරහා අප අපේක්ෂා කරන්නේ. ඒ සංශෝධන පනත් කෙටුම්පත හරහා මහාධිකරණවල සහ අනෙකුත් අධිකරණවල විනිශ්චයකාරවරුන්ට චූදිතයන් සහ සාක්ෂිකරුවන් ඇතුළු අධිකරණයේ ක්‍රියාවලියට අදාළ සියලු තැනැත්තන් අධිකරණයෙන් බැහැරව සිටින අවස්ථාවක පවා electronic ක්‍රමයට සාක්ෂි ලබාගෙන, ඒ සාක්ෂි ආවේක්ෂණය කරගෙන අධිකරණයට නීතිය පසිඳලීමේ අවස්ථාව උදා වී තිබෙනවා. මේ හරහා අප බලාපොරොත්තු වන දෙයක් තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා, පසුගිය දින කිහිපය තුළත්, දීර්ඝ කාලයක් තිස්සේත් අධිකරණ ප්‍රවේශය ඉතා දුෂ්කර අවස්ථාවල ඇති වූ තත්ත්වයන් ගැන. විශේෂයෙන්ම 1950 ගණන්වල සතාසිවම් නඩුවට අදාළ සාක්ෂිකරුවන් පිටරට ඉඳලා ඇවිල්ලා සාක්ෂි ලබා දීම, ඒ මැදිහත් වීම අධිකරණ ක්ෂේත්‍රයේ විශාල වෙනස්කම් ඇති කරන්නට හේතු වුණා. හැබැයි, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ තිබෙන සමහර ප්‍රතිපාදන නිසා, අධිකරණය ඉදිරියේම පෙනී සිට සාක්ෂි ලබා දීමට සිදු වෙලා තිබුණා. නමුත්, COVID-19 තත්ත්වයත් එක්ක අපේ රටේ විනිශ්චයකාරවරුන් ඉතා නම්‍යශීලීව අවශ්‍ය ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කරලා කටයුතු කරනවා අපි දැක්කා. අප මේ පනත් කෙටුම්පත හරහා බලාපොරොත්තු වන්නේ, ඒ ආකාරයට විනිශ්චයකාරවරුන් තමන්ගේ අභිමතය මත ඉටු කරපු ඒ රාජකාරි සඳහා නීත්‍යනුකූලව ව්‍යවස්ථාදායකය මඟින් පනවනු ලබන නීතියක් මඟින් අවස්ථාව සලසා දීමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පවතින තත්ත්ව යටතේ පවා අපේ රටේ ඉතා හොඳ නීති පද්ධතියක් පවතිනවා. ඒ නීති පද්ධතිය තුළ පවා විවිධ ජාතිවාදී, ආගම්වාදී ප්‍රවණතා මේ මොහොතේ රට තුළ ඉතා විනාශකාරී ලෙස ක්‍රියාත්මක වන බවක් අපි දකිනවා. අපේ නියෝජ්‍ය අමාත්‍යවරයෙකු හැටියට කටයුතු කර ගරු මුනීර් මුලාෆර් මැතිතුමා සම්බන්ධයෙන් මේ මොහොතේ සමාජ මාධ්‍ය හරහා ජාතිවාදීන් පිරිසක් විශාල ආන්දෝලනාත්මක ප්‍රකාශයක් කරලා තිබෙන බවත් අපි දකිනවා. එතුමා ජාතිවාදය වපුරන, එහෙම නැත්නම් මේ රටේ ආගම්වාදය, ජාතිවාදය වෙනුවෙන් මිනී මරන ව්‍යාපාරයක නායකයෙකු හැටියට එක්තරා භික්ෂුන් වහන්සේනමක් කරපු ප්‍රකාශයක් සමාජ මාධ්‍ය හරහා සංසරණය වෙනවා.

ඇත්තවශයෙන්ම ආණ්ඩුවක් හැටියට අපි ඒ සම්බන්ධයෙන් කම්පාවට පත් වෙනවා. අපි දන්නවා, ගම්පහ දිස්ත්‍රික්කයේ සිංහල, දෙමළ, මුස්ලිම් කියන සියලු ජනතාවගේ ඡන්දයෙන් තමයි මුනීර් මුලාෆර් සහෝදරයා මේ පාර්ලිමේන්තුවට තේරී පත් වුණේ කියන

එක. ඉතිහාසයේ කිසිම පක්ෂයකට බැරි වුණා, මුස්ලිම් මන්ත්‍රීවරයෙක් ගම්පහ දිස්ත්‍රික්කයෙන් තෝරා පත් කර එවන්න. දීර්ඝ කාලයක් දේශපාලනය කරපු එක්සත් ජාතික පක්ෂයටවත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටවත් ඒක කරන්න බැරි වුණා. නමුත් ජාති, ආගම්, කුල කියන කිසිම භේදයක් නොසලකන, සමගිය, සමානාත්මතාව, සහෝදරත්වය මත පදනම් වුණු දේශපාලන ව්‍යාපාරයක් වන අපේ ජාතික ජන බලවේගයෙන් තමයි ඉතිහාසයේ පළමු වතාවට ගම්පහ දිස්ත්‍රික්කයෙන් ඉතාම ශ්‍රේෂ්ඨ සහෝදරයෙක් වන අප සමඟ දීර්ඝ කාලයක් දේශපාලනය කරපු මුනීර් මුලාෆර් සහෝදරයා පාර්ලිමේන්තුවට තේරී පත් වුණේ. අද මුළු ලංකාව පුරාම -උතුර, නැඟෙනහිර, කඳුකරය කියන මේ හැම තැනින්ම- මතු වෙන ජාතික සමගිය, සහෝදරත්වය දරා ගන්න බැරුව, ජාතිවාදයෙන් මේ රට පාලනය කරපු, ඒ හරහා තමන්ගේ ජීවිකාව කරගෙන ගිය කණ්ඩායම් නැවත උත්සාහ කරන බවක් පෙනෙනවා, මේ හරහා සමාජය තුළ යම් කැලඹීමක් ඇති කරන්න. නමුත් අපි විශ්වාස කරන්නේ නැහැ, අපි ගොඩනගා තිබෙන මේ සමගියට, මේ සහෝදරත්වයට අභියෝග කරන්න කිසිම කෙනෙකුට පුළුවන් වෙයි කියලා. එහෙම කරන්න බැරි තැනටම අපි ඒ තත්ත්වයය ගොඩනගා හමාරයි.

ගම්පහ දිස්ත්‍රික්කයේ 130,000කට වැඩි මුස්ලිම් ජනතාවක් ජීවත් වෙනවා. 83,000ක් පමණ මුස්ලිම් ඡන්ද දායකයන් ඉන්නවා. මුනීර් මුලාෆර් සහෝදරයාට 135,000කට වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා දුන්නේ සියලු ජාතිවලට, ආගම්වලට අයත් සහෝදර ජනතාව. ඒක නිසා අපි මේ ජාතිවාදීන්ට, ආගම්වාදීන්ට අවධාරණය කරනවා, ඔබට කිසි සේත්ම ඒ දේට අපි ඉඩ තබන්නේ නැහැ කියලා. මේ මොහොතේ අපි ආණ්ඩුවක් හැටියටත්, දේශපාලන ව්‍යාපාරයක් හැටියටත් එම ප්‍රකාශවලට විරුද්ධව නීත්‍යනුකූල පියවර ගන්න අවශ්‍ය කටයුතු සිදු කර හමාරයි. ඒ අනුව මේ රට තුළ සිදු කරන අන්තවාදී, ජාතිවාදී, විනාශකාරී දේශපාලනය අවසන් කරන්න අවශ්‍ය කටයුතු අපි කර තිබෙන නිසා ඒගොල්ලන් කරන ඒ ප්‍රකාශවලට නෛතිකව වන්දි ගෙවන්න සිද්ධ වෙන බව මේ වෙලාවේ අපි අවධාරණය කරනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ගොඩනගා තිබෙන මේ දේශපාලන සංස්කෘතිය තුළ ඉදිරි කාලයේ මේ රටේ හැම ක්ෂේත්‍රයකටම අවශ්‍ය, ඒ වාගේම සිංහල, දෙමළ, මුස්ලිම් කියන සියලු ජාතීන්ට සමගියෙන් ජීවත් වෙන්න පුළුවන් නව දේශපාලන, ආර්ථික හා සමාජයීය ප්‍රතිසංස්කරණවලට අදාළ නව ව්‍යවස්ථා සංශෝධනයක් කරන්නත්, ඒ අවශ්‍ය තැන්වලට මැදිහත්වීම් කරන්නත් ආණ්ඩුවක් හැටියට අපි කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අපරාධ නඩු විධාන සංග්‍රහය පමණක් නොවෙයි, ඊට ආනුෂංගිකව තිබෙන සාක්ෂි ආඥා පනත වාගේම නීති ක්ෂේත්‍රයට අදාළ සියලු ක්ෂේත්‍ර නවීකරණය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ රටේ ජනතාවට පහසුවෙන් ප්‍රවේශ වී යුක්තිය සාක්ෂාත් කරගන්නට හැකි ආකාරයේ නීති පද්ධතියක් වාගේම, හැම ක්ෂේත්‍රයකටම අවශ්‍ය කරන, නූතන රාජ්‍යයකට, නව රටකට අවශ්‍ය ප්‍රතිසංස්කරණ ගෙන ඒමට අපි රජයක් හැටියට කටයුතු කරන බව ප්‍රකාශ කරමින්, කථා කරන්න මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Mrs.) Hiruni Wijesinghe. You have 11 minutes.

[අ.භා. 12.12]

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருனி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි මේ විවාදය කරන්නේ අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීමට අදාළවයි. මේ පනත් කෙටුම්පත සම්මත කිරීම ඔස්සේ නීති ක්ෂේත්‍රය තුළ වාගේම මුළු මහත් සමාජය තුළත් අපට ඉතා ප්‍රගතිශීලි කථා බහක් ගොඩනගා ගන්න පුළුවන්. මොකද, සාමාන්‍යයෙන් අපට නඩුවක් තිබෙනවා නම්, උසාවියට යන්න සිද්ධ වෙනවා. නමුත් මේ පනත සම්මත වීමෙන් පසුව මේ රටේ ඉන්න ජනතාවට සාක්ෂි ලබා දීමට -යම් කිසි නිශ්චිත තත්ත්ව යටතේ- එසේ යැමට අවශ්‍ය වන්නේ නැහැ. ඒ නිසා අපට හරිම සතුටුයි, මෙම ප්‍රගතිශීලි තීරණය අපේ ආණ්ඩුව පත් වෙලා මාස 6ක්, 7ක් පමණ වන කාල සීමාව තුළදී කඩිනමින් ලබා ගැනීම වෙනුවෙන්.

ඉතින්, අදින් පසුව අපේ ජනතාව ඒ අධිකරණ පරිශ්‍රයට යන්නේ නැතිව තමන්ගේ නිවසේ ඉඳන් සාක්ෂි ලබා දීමේ හැකියාව ලබා ගන්නවා. විශේෂයෙන්ම අපේ සහෝදර සහෝදරියෝ ඉන්නවා විදේශගත වෙලා. ඔවුන්ගේ නඩුවක් වෙනුවෙන් පෙනී ඉන්න, සාක්ෂි ලබා දෙන්න ලංකාවට එන්න ලක්ෂ 5ක්, 6ක් වියදම් කරන්න වෙනවා. නමුත්, විදේශගත වෙලා ඉන්න අපේ සහෝදර සහෝදරියන්ට -ජනතාවට- කියන්න කැමතියි මෙම පනත් කෙටුම්පත සම්මතවීමෙන් පසුව ඒ සඳහා ඔබට ලංකාවට පැමිණීමට අවශ්‍ය වෙන්නේ නැහැ, ඔබ ඉන්න රටේ ඉඳන් ඒ සාක්ෂි ලබා දීමට අවස්ථාව උදා වෙනවා. ඒ වාගේම මෙම පනත් කෙටුම්පතේ විශේෂත්වය වෙන්නේ අපේ රටේ ඉන්න සියලු ප්‍රජාවට සුබසෙත සැලසෙන විධියට මෙය නිර්මාණය වෙලා තිබීමයි. උදාහරණයක් හැටියට, අපේ වැඩිහිටි ප්‍රජාව, ආබාධිත ප්‍රජාව ඉන්නවා. මේ අය අධිකරණ භූමියට යද්දී විවිධ අපහසුතාවලට පත් වෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, අපේ අවුරුදු 80ක්, අවුරුදු 90ක් වෙන අම්මලා, තාත්තලා අධිකරණ භූමියට යද්දී දරුවන් හතර පස් දෙනෙක් එක්ක යන්න සිද්ධ වෙනවා. ඒ දරුවන්ගේ රාජකාරි පැත්තකට දාලා ඒ වයසක අම්මලා, තාත්තලා එක්ක අධිකරණ භූමියට යන්න සිද්ධ වෙනවා. ඒ වාගේම ආබාධිත පුද්ගලයන් ඉන්නවා නම්, ඔවුන් රෝද පුටුවෙන් නම් යන්නේ, -යන්න එන්න අපහසුතාවක් තිබෙනවා නම්- කවුරුන් හෝ හතර පස් දෙනෙක් එක්ක තමයි අධිකරණයට යන්න වෙන්නේ. සමහර අධිකරණවල ආබාධිත පුද්ගලයන් වෙනුවෙන් ඒ පහසුකම් සැලසෙන්නේ නැහැ. අධිකරණ භූමි තිබෙන්නේ උඩතට්ටුවල. ඒ නිසා ඔවුන් කර තියා ගෙන යන්න සිද්ධ වෙනවා. නමුත්, මේ පනත සම්මත වීමෙන් පසුව අපේ වැඩිහිටි ප්‍රජාවට, ආබාධිත ප්‍රජාවට තවදුරටත් අධිකරණය තුළට යැමට අවශ්‍ය වෙන්නේ නැතිව ඒ අයගේ අධිකරණ කටයුතු නිවසේ සිටම සිද්ධ කර ගැනීමට, යුක්තිය ළඟා කර ගැනීමට අවස්ථාව උදා වෙලා තිබෙනවා. ඒ වාගේම අපේ කුඩා දරුවෝ ඉන්නවා. පරිවාසයේ ඉන්න දරුවෝ ඉන්නවා. ඒ දරුවන් අධිකරණවලට අවුරුදු 4ක්, 5ක් තිස්සේ ඉදිරිපත් කරද්දී බන්ධනාගාරවල ඉන්න, බන්ධනාගාරවල බස් රථවල ඉන්න විවිධ පුද්ගලයන්, අපරාධකාරයන් සමඟ මුසුවීම සිදු වෙනවා. නමුත්, මේ පනත හරහා ඒ දරුවන් ඉන්න ස්ථානවල ඉඳලාම අධිකරණයට ඉදිරිපත් කිරීමේ අවස්ථාව උදා වෙනවා. ඒක ඉතාම හොඳ ප්‍රගතිශීලි තත්ත්වයක්. මෙම පනත් කෙටුම්පත එන්න කලින් ඉඳන්ම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාව තුළ ඇතැම් ප්‍රගතිශීලි විනිසුරුවන් කොවිඩ් වසංගත සමයේ Zoom තාක්ෂණය ඔස්සේ, Skype තාක්ෂණය ඔස්සේ නඩු විභාග කිරීම සිද්ධ කරනු ලැබුවා. ඒ දරපු පරිශ්‍රමයට නෛතිකභාවයක් මෙම පනත හරහා ලබා දීම සිද්ධ වෙනවා.

[ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවක් හැටියට අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ සඳහන් කරලා තිබෙනවා රාජ්‍ය ක්ෂේත්‍රය ඩිජිටල්කරණයට ලක් කරනවා කියලා. ඉතින් මේ ආණ්ඩුව පත් වෙලා බොහොම කෙටි කාලයක් තුළදී අපේ අධිකරණ අමාත්‍යාංශය යටතේ අද මෙම පනත් කෙටුම්පත සම්මත කර ගැනීමෙන් පළමු පියවර තබනවා, අධිකරණ ක්ෂේත්‍රය ඩිජිටල්කරණයට ලක් කර ගැනීමට. මම නීතිඥවරියක හැටියට ප්‍රායෝගිකව දන්නවා තවම ලංකාවේ අධිකරණ ක්ෂේත්‍රය තිබෙන්නේ කඩදාසි යුගයේ කියන එක. ඉතින් ඒ කඩදාසි යුගයෙන් බැහැර වෙලා ඔන්න දැන් තාක්ෂණික යුගයට මුල් අඩිය තියන්න දැන් පුළුවන් වෙලා තිබෙනවා. ඒ වෙනුවෙන් අපි ආණ්ඩුවක් හැටියට අණ පනත් සම්මත කරගෙන අවස්ථාව උදා කර දීලා තිබෙනවා.

ඒ වාගේම මට මේ අවස්ථාවේ දී සිහියට නැඟෙනවා, අපි ප්‍රගතිශීලි විධියට මේ අණ පනත් සම්මත කර ගන්නේ සමාජයේ විවිධ තත්ත්වයන් උද්ගත වෙලා තිබෙන නිසායි. නේද? විශේෂයෙන්ම මේ පනත්වල අවශ්‍යතාව පෙනෙද්දී අපි ඒවා කඩිනමින් පාර්ලිමේන්තුවේ සම්මත කර ගන්න දැන් කටයුතු කරමින් පවතිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කලින් හිටපු ආණ්ඩු තමන්ගේ බලය තහවුරු කර ගන්න විවිධ අවස්ථාවල දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළා. අපට මතකයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17, 18, 19, 20, 21 කියන සංශෝධන. බැරි වෙලාවත් ඒ ආණ්ඩු මෙවරත් බලයට පත් වෙලා හිටියා නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තව හතර, පස් සැරයක් සංශෝධනය වෙලා. හොඳ වෙලාවට ජාතික ජන බලවේගයේ ආණ්ඩුව බලයට පත් වුණු නිසා තවදුරටත් බලය තර කර ගැනීමේ අභිලාෂයෙන් එවැනි සංශෝධනවලට ලක් වෙන්නේ නැහැ. ඊට අමතරව සමහර නීති රීති, අණ පනත්, ගැසට් තමන්ගේ වාසිය තකා සංශෝධනය කර ගනිද්දී අපි මේ සමාජයේ උද්ගත වෙලා තිබෙන තත්ත්වය තේරුම් ගෙන ඒවාට අවශ්‍ය නීති රීති කඩිනමින් සංශෝධනය කරමින් පවතිනවා.

අපි දන්නවා, අධිකරණ භූමිවල ද විටින් විට වෙඩි තැබීම් එහෙම සිද්ධ වෙලා තිබෙන බව. මට මතකයි, මුලින්ම මීගමුව අධිකරණ භූමියේ වෙඩි තැබීමක් සිද්ධ වුණා. ඒ වාගේම කඩුවෙල, ගල්කිස්ස අධිකරණවල ද, මෑතකදී අපේ ආණ්ඩුව පත් වුණාට පස්සේ අලුත්කඩේ අධිකරණයේදී වෙඩි තැබීමක් සිද්ධ වුණා. බන්ධනාගාර බස් රථවලින් සිරකරුවන් ප්‍රවාහනය කිරීමේ දී වෙඩි තැබීම් සිද්ධ වෙලා තිබෙනවා. අපේ ආණ්ඩුවක් ගත්තාට පස්සේ එවැනි සිදුවීමක් සිද්ධ වුණා. ඒ සිදුවීම පෙබරවාරිවල සිද්ධ වුණේ. ඒකට දැනට මාස තුනක වාගේ කාලයක් ගත වෙලා තිබෙනවා. ඒ සඳහා අපි ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒ වෙනුවෙන් තමයි මේ පනත් කෙටුම්පත සම්මත කරලා ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් නීති ක්‍රියාමාර්ග ගන්න කටයුතු කරන්නේ. මොකද, ජීවිත තර්ජනයට ලක් වෙච්ච, එහෙම නැත්නම් යම් කිසි සංවිධානාත්මක අපරාධවලට ලක් වෙලා ඉන්න යම් කිසි පුද්ගලයෙක් හෝ සිරකරුවෙක් ඉන්නවා නම් එවැනි තැනැත්තන් අධිකරණයට එක්ක ගෙන එද්දී විශාල තර්ජනයකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

මට මතකයි, වැලිකඩ බන්ධනාගාරය ඉස්සරහා ලොකුවට ගහලා තිබෙනවා, "සිරකරුවෝ ද මනුෂ්‍යයෝය" කියලා. එම නිසා ආණ්ඩුවක් වශයෙන් අපට වගකීමක් තිබෙනවා, ඒ සිරකරුවන්ගේ ජීවත්වීමේ අයිතිවාසිකම තහවුරු කර දෙන්න. ඒ නිසා තමයි සැකකරුවෙකු ආරක්ෂිතව අධිකරණ භූමියට ඉදිරිපත් කිරීමට හැකියාවක් නොමැති බව පෙනී යනවා නම්, ඔවුන්ව බන්ධනාගාරයේ සිටම ඒ නඩු කටයුතු සඳහා ඉදිරිපත් කිරීමේ හැකියාව සකසා තිබෙන්නේ. එහෙම නැත්නම්, සමහර අවස්ථාවල පුද්ගලයන් විසින් සිදු කරන ලද වැරදි නිසා විශාල වශයෙන් සමාජයෙන් විරෝධතා ගොඩ නැඟීම් සිදු වෙනවා. එවැනි අවස්ථාවලදී ඔවුන්ව අධිකරණ භූමියට ගෙනියද්දී සමාජය තුළ සාමය කඩවීම් සිද්ධ වෙන්න පුළුවන්. එවැනි අවස්ථාවලදීත් බන්ධනාගාරයේ ඉඳන් එම තැනැත්තන් ඉදිරිපත් කිරීමට හැකියාව ලැබී තිබෙනවා.

මම නීතිඥවරියක් විධියට පෞද්ගලිකව දන්නා කාරණාවක් තිබෙනවා. යාපනයේ පදිංචි පුද්ගලයෙකුට අලුත්කඩේ අධිකරණ සංකීර්ණයේ හෝ කොළඹ ප්‍රදේශයේ යම් අධිකරණයක නඩුවක් තිබෙනවා කියා හිතමුකෝ. හැබැයි, ඔහු හෙට තිබෙන නඩුව වෙනුවෙන් අද දවසේ යාල්දේවි දුම්රියේ නැඟලා, එහෙම නැත්නම් බස් රථයක නැඟලා කොළඹට එන්න ඕනෑ. මට පෞද්ගලික අත්දැකීමක් තිබෙනවා; මගේ සේවාදායකයෙක් යාල්දේවි දුම්රියේ නැඟලා උදේ තිබෙන නඩුවට කොළඹ එද්දී කෝච්චිය අතරමඟදී කැඩිලා තිබුණා. අධිකරණයට එන්න ප්‍රමාද වුණු නිසා ඔහුට වරෙන්තු කර තිබුණා. එහෙම නැත්නම්, කලින් දවසේ කොළඹ ඇවිල්ලා විශාල වියදමක් දරමින් ඔවුන් කොහේ හෝ කුලී ස්ථානයක නතර වෙලා ඉන්න ඕනෑ. නමුත්, දැන් මෙම පනත හරහා ලංකාවේ හතර කොනේ ඉන්න ඕනෑම පුද්ගලයෙකුට අධිකරණ පරිශ්‍රයට එන්නේ නැතිව අධිකරණයේ පෙනී සිටීමේ හැකියාව ලැබෙනවා. එම නිසා මෙය ඉතා ප්‍රගතිශීලී තත්ත්වයක් හැටියට මම දකිනවා.

ඒ වාගේම, අපේ ගරු විනිසුරුවරුන්ට සමහර අවස්ථාවලදී වෙනත් අධිකරණ ප්‍රදේශවලට ගිහිල්ලා සාක්ෂි ලබා දීමට සිද්ධ වෙනවා. එවැනි අවස්ථාවලදී අධිකරණ කටයුතු සම්පූර්ණයෙන්ම නතර කිරීමට සිද්ධ වෙනවා. එලෙස සාක්ෂි ලබාදීම්වලට යෑමට සිද්ධ වීම නිසා නඩු විශාල ප්‍රමාණයක් කල් දැමීමට සිදු වෙනවා. නමුත්, මෙම ක්‍රමවේදය ඔස්සේ ඒ අධිකරණ භූමි පරිශ්‍රයේම ඉඳගෙන අපේ විනිසුරුතුමන්ලාට සාක්ෂිය ලබා දීලා, එදා දවසේ තිබෙන නඩු කටයුතු පවත්වාගෙන යාමට හැකියාව ලැබෙනවා. ඒ වාගේම, අධිකරණවලට පැමිණිය යුතු රාජ්‍ය සේවකයන් ඉන්නවා. ඒ අය දුරබැහැර ප්‍රදේශවල සිට එන්න ඕනෑ. විශේෂයෙන් අපේ පොලිස් නිලධාරින් ඉන්නවා. ඒ අයට ඈත ප්‍රදේශවලට ස්ථාන මාරුවීම් ලැබෙනවා. ඔවුන්ට අධිකරණවලට පැමිණීමේ අපහසුතා තිබෙන විට දිගින් දිගටම මහාධිකරණවල, මහේස්ත්‍රාත් අධිකරණවල තිබෙන නඩු ප්‍රමාද වෙනවා. නමුත්, මේ ක්‍රමවේදය හරහා ඒ පොලිස් නිලධාරින්ට ද ඔවුන්ගේ පොලිස් ස්ථානයේ සිට සාක්ෂි ලබා දීමේ හැකියාව ලැබෙනවා. මෙම පනත ඉතාම ප්‍රගතිශීලී පනතක්. ලංකා ඉතිහාසයේ - අපි සාමාන්‍ය අධිකරණ පරිචයක්, Mentions Court කියලා කියමුකෝ - මේ සාමාන්‍ය අධිකරණ පරිචය digital court system එකක් බවට පරිවර්තනය කිරීමේ නියමු පියවරක් හැටියටයි මා මෙය දකින්නේ. ඉතාම ප්‍රගතිශීලී විධියට මෙම පනත සාර්ථකව ලංකාව තුළ ක්‍රියාත්මක කර ගැනීමට නීතිඥ ප්‍රජාවගෙන් වාගේම අපේ ජනතාවගෙනුත් ඒ අවශ්‍ය සහයෝගය අපි ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ අවස්ථාවේ විශේෂයෙන් මතක් කරන්න කැමැතියි, මෙවර ශ්‍රී ලංකාව නියෝජනය කරමින් අනුදි ගුණසේකර "Miss World" තරගයට පෙනී සිටින බව. මේ මොහොතේදී head-to-head pageant එකේ final තරගය සඳහා ඇය තරග කරනවා. සමස්ත ශ්‍රී ලාංකීය කාන්තාවන් වෙනුවෙන් තමයි ඇය ශ්‍රී ලංකාව නියෝජනය කරන්නේ. එම නිසා සියලුම ශ්‍රී ලාංකික කාන්තාවන් වෙනුවෙන් මම ඇයට සුබ පැතුම් එකතු කරනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Mrs.) Anushka Thilakarathne. You have 11 minutes.

Order, please! Before she starts, will an Hon. Member propose the Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne to the Chair?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

Sir, I propose that the Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE took the Chair.*

**ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින විශේෂයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සම්බන්ධවත් සාකච්ඡා කරනවා. මෙය විශේෂයෙන් ගරු අධිකරණයට විතරක් නොවෙයි, පොදු මහත් ජනතාවටම බලපාන විශේෂ පනතක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එම පනත පිළිබඳව කථා කිරීමට පෙර විශේෂයෙන්ම මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. කියමනක් තිබෙනවා නේ, "අලුත් අලුත් දැ නොතනන ජාතිය ලොව නොනඟී" කියලා.

අපි අලුත් දේ නිර්මාණය කළ යුතුයි; අලුත් දේ අත්හදා බැලිය යුතුයි; වැරදීම්වලින් අලුත් දේ ඉගෙනගත යුතුයි; ඉගෙන ගනිමින් ඉදිරියට යා යුතුයි. අපි ඉතිහාසය පුරා විවිධ සන්ධිස්ථාන පසුකළා. රටක් ලෙස අධ්‍යාපනයේ නව අවස්ථා ලබා දෙමින් අත්හදා බැලීම් කළා. අපි අධ්‍යාපනයට නව හැදෑරීම්, පෙන්වා දීම් කළා. ඒ වාගේම රටේ නව නිෂ්පාදන ඇති කිරීම සඳහා කර්මාන්ත සහ වෙනත් ව්‍යවසායකයන්ට ඒවා ලබා දෙමින් ඉතිහාසයේ සිට මේ වනතුරු අපි විවිධ නව නිෂ්පාදනවලට ඉඩ හසර හැදුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රටක් ලෙස ඉදිරියට යැමේදී සමාජ ප්‍රතිසංස්කරණයට සාපේක්ෂව නීතිය ද ප්‍රතිසංස්කරණය විය යුතුයි සහ නීතියේ අඩු ලුහුඬුකම් සකසා ගනිමින් රටක සාමය සහ නීතිය ආරක්ෂා කිරීමට අදාළව අපි කටයුතු කළ යුතුයි. විශේෂයෙන්ම ජාතික ජන බලවේගය ආණ්ඩුවට බලය හුවමාරු කිරීමේදී මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණා, මේ රටේ ජනතාව දැඩි විශ්වාසයක් තියාගත්තා, මෙකේ වෙන කවුරු හොරකම් කළත්, මෙකේ වෙන කවුරු නීති කඩ කළත් ජාතික ජන බලවේගයේ එකම මන්ත්‍රීවරයෙක්වත්, එකම සහෝදරයෙක්වත්, එකම සහෝදරියකවත් නීතියේ පසුබිම පසෙකලා, නීතිය හා සාමය ආරක්ෂා කිරීම පසෙකලා කටයුතු කරන්නේ නැහැ කියලා. ඒ නිසා මේ රටේ මිනිස්සු අපෙන් බලාපොරොත්තු වුණා, නීතියේ අඩු ලුහුඬුකම්වලින් පැනලා ගිය, නීතියේ සිදුරුවලින් රිංගලා දේශපාලන ආරක්ෂාව ගත්, දේශපාලන බලය පාවිච්චි කරලා ආරක්ෂාව ගත් ඉතිහාසය වෙනස් කරලා නීතිය හොඳ තැනකට ගෙනෙයි කියලා. නීතිය හැම දෙනාටම සර්ව සාධාරණ වන සහ සමානාත්මතාව අගයන රටක් හදයි කියන විශ්වාසය මේ රටේ මිනිසුන්ට තිබුණා.

මේ නීති ප්‍රතිසංස්කරණ එක රැයකින් ඇති වුණේ නැහැ. අපි ඒක පිළිගන්නවා. මීට කලින් මේ සඳහා වෙහෙස මහන්සි වෙච්ච හැම කෙනෙකුටම ස්තුති කරන්නත් මා මෙය අවස්ථාවක් කර ගන්නවා. ඔවුන්ගේ වෙහෙස මහන්සිය සහ ඔවුන්ගේ මුල පිරීම තමයි මේ නීති ප්‍රතිසංස්කරණ මේ විධියට ඉදිරියට එන්නට හේතු වුණේ. ඒ සියලුදෙනාට මම මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කියමනක් තිබෙනවා, justice delayed is justice denied කියලා; යුක්තියේ ප්‍රමාදය අපට යුක්තිය අහිමි කරනවා. අපි හැමෝම යුක්තිය දැක්කේ කොතැන හෝ පා වෙලා තිබෙන දෙයක් විධියටයි. අපට යුක්තිය කිව්වාම මතක් වෙන්නේ අධිකරණය විතරයි. නමුත් යුක්තිය හා බැඳුණු, මිනිසුන්ට යුක්තිය ඉෂ්ට වීම සඳහා සම්පූර්ණ විය යුතු විෂය මූලික කාරණා රාශියක් ඒ වටේ තිබෙනවා. ඒ සියල්ලත් අපි නිවැරදි කර ගත යුතුයි. මිනිසුන්ට යුක්තිය ඉටු වීමේදී ඒ සියලු කාරණා සම්පූර්ණ කර ගත යුතුයි. ඒ අතින් බැලුවත් මේ නීති ප්‍රතිසංස්කරණය ඉතාම වටිනා නීති ප්‍රතිසංස්කරණයක්.

මෑත ඉතිහාසයේ අධිකරණවල තිබුණු ලොකුම ප්‍රශ්නය තමයි, අතිවිශාල නඩු ප්‍රමාණයක් අධිකරණවල හිරවෙලා තිබීම. විභාග කරගන්න බැරිව, ඒවාට නිශ්චිත තීරණයක් දෙන්න බැරිව, විවිධ හේතු නිසා කල් ගිය නඩු විශාල ප්‍රමාණයක් තිබෙනවා. මම සංඛ්‍යා ලේඛන කිහිපයක් විතරක් ඉදිරිපත් කරන්නම්, අද උදෑසන සිට මාගේ සහෝදර මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් මේ පනත් කෙටුම්පත පිළිබඳව විශ්ලේෂණය කරපු නිසා.

අධිකරණ අමාත්‍යාංශයෙන් ලබා ගත් තොරතුරු අනුව 2023 අවුරුද්දේ මහාධිකරණවල නඩු 29,664ක් පවරා තිබෙනවා. මේ වනකොට ඉන් අවසන් කරලා තිබෙන්නේ නඩු 21,937යි. ඒ වාගේම 2023 අවුරුද්ද අවසාන වෙනකොට මහෙස්ත්‍රාත් අධිකරණවල අවසන් නොකළ නඩු 805,502ක් තිබුණා. ළමා මහෙස්ත්‍රාත් අධිකරණවල අවසන් නොකළ නඩු 1,215ක් තිබුණා. 2024 අවුරුද්දේ සංඛ්‍යා ලේඛන පිළිබඳව සලකා බලද්දී 2024.06.30වැනි දා වෙනකොට මහාධිකරණවල අවසන් නොකළ නඩු 27,324ක් තිබුණා. මහෙස්ත්‍රාත් අධිකරණවල 2024.06.30වැනි දා වෙනකොට අවසන් නොකළ නඩු 813,726ක් තිබුණා. මේ, මේ රටේ මිනිසුන්ගේ ප්‍රශ්න. මේ රටේ මිනිස්සු යුක්තිය බලාපොරොත්තු වෙන්නේ අධිකරණයෙන්.

යුක්තියේ සාධාරණත්වය බලාපොරොත්තු වෙන්නේ අධිකරණයෙන්. මිනිස්සු අපෙන් නිතර අහන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි, මේ නඩු කවදාද ඉවර වෙන්නේ, මේ කරදරයෙන් අපි කවදාද නිදහස් වෙන්නේ කියන එක. ඔවුන් දින කීයක් තමන්ගේ නඩු වෙනුවෙන් කරදර වෙනවාද? සමහර නඩුවලට ආපු මිනිස්සුන්ට තම ජීවිත කාලය තුළදී ඒ නඩුවේ නියෝගය දකින්න ලැබුණේ නැහැ. අවසානයට නඩුවේ සාධාරණත්වය ඔවුන්ට භුක්ති විඳින්න පුළුවන් වුණේ නැහැ. මොකද, ඒ වන විට ඔවුන් මිය ගිහිල්ලා.

ඇත්තටම අපි නව ආණ්ඩුවක් ලෙස සතුටු වෙනවා, මෙවැනි ප්‍රවේශයක් හෝ ගන්න ලැබීම ගැන. අපට වැරදීම් සිද්ධ වෙයි. මේ තුළින් ඉදිරියට යද්දී, අපට කාර්ය පටිපාටි ගැටලු එන්න පුළුවන්. කාර්ය මණ්ඩල ප්‍රමාණවත් නැහැ, අධිකරණවලට පහසුකම්

[ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය]

දෙන්න ඕනෑ, ඒවාට අදාළ විද්‍යුත් උපකරණ ලබා දෙන්න ඕනෑ, ඒවාට මුදල් ප්‍රතිපාදන සොයා ගන්න ඕනෑ. ගැටලු ගොඩක් එයි. ඒ ගැටලු එන අවස්ථාවලදී ඒවාට පියවරෙන් පියවර ක්‍රමානුකූලව විසඳුම් ලබා දෙමින් ඉදිරියට යන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. අපේ රජයේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන්න කලින්ම කිව්වා, අපේ මූලික ප්‍රතිපාදන වෙන් කරන අවස්ථාවේදීම කිව්වා, මූලික කාරණා තුනක් යටතේ තමයි අපේ ආණ්ඩුව කටයුතු කරන්නේ කියලා.

ඉන් පළමුවැනි කාරණාව තමයි, ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීමට අදාළ වැඩසටහන. ඊළඟට, ඩිජිටල්කරණය සම්බන්ධ වැඩසටහන සහ Clean Sri Lanka වැඩසටහන. ඩිජිටල්කරණය පිළිබඳ වැඩසටහන අපි හඳුන්වා දෙනකොට විරුද්ධ පක්ෂයේ බොහෝ අය අපට නොයෙක් කථා කිව්වා. මේක කර ගන්න බැහැ කිව්වා, මේක නිකම්ම නිකම් මුලපිරීමක් විතරයි කිව්වා. ඒ සියල්ල තිබෙද්දී අපි වැඩ කළා. අපි ඒක ආරම්භ කළා. ආරම්භ කරලා ඉදිරියට යැමේදී අපට ගැටලු එන්න පුළුවන්. නමුත් අපි අත ගහපු කිසිම වැඩක් ජාතික ජන බලවේගයේ අපි කිසි දවසක පසුවට තියන්නේ නැහැ. අපට පුළුවන් ආකාරයට අපි ඉදිරියට යනවා කියන එක මේ අවස්ථාවේ දැඩි විශ්වාසයෙන් යුතුව මා කියනවා.

ඒ වාගේම මේ අවස්ථාවේදී මා මතක් කරන්න ඕනෑ, අද විශේෂ පනත් කෙටුම්පතක් ගැනත් අපි කථා කරනවා කියලා. නමුත් විපක්ෂය මේ පාර්ලිමේන්තුවෙන් එළියට ගිහිල්ලා එක එක කථා කියනවා, එක එක දේවල් කියනවා. මේ ආණ්ඩුව මිනිස්සු ගැන හිතන්නේ නැහැ, මේ ආණ්ඩුව මිනිස්සු ගැන කල්පනා කරලා නොවෙයි තීන්දු තීරණ ගන්නේ, ඔවුන්ට සැලැස්මක් නැහැ, අත්දැකීම් නැහැ, අරවා නැහැ, මේවා නැහැ කියනවා. පුළුවන් නම් බලන්න, විපක්ෂයේ මන්ත්‍රීවරුන් එක්කෙනෙක් හැර අනෙක් කිසිම කෙනෙක් මේ වෙලාවේ මේ පාර්ලිමේන්තුවේ නැහැ. විශේෂ පනත් කෙටුම්පතක් ගැන කථා කරන අවස්ථාවක එක මන්ත්‍රීවරයෙක් හැර අනෙක් කිසිම මන්ත්‍රීවරයෙක් විපක්ෂයේ අසුන්වල නැහැ. ඒ නිසා අපි කියනවා, අපි හදන්න හදන රට එහෙම නිකම් නීති ගෙනැල්ලා විතරක්, නීති ප්‍රතිසංස්කරණය කරලා විතරක් හදන්න බැරි බව. අපි විපක්ෂයෙන් බලාපොරොත්තු වෙනවා, ඔබ සියලුදෙනාගේ උදව්ව. අපට උදවු අවශ්‍යයි. අපට උදවු ඕනෑ වෙන්නේ මේ රටේ ජාතිවාදය අවුස්සන්න හරි, මේ රටේ පවත්වාගෙන යන සාමකාමී පරිසරය විනාශ කරන්න හරි නොවෙයි. අපි ඔබෙන් උදවු ඉල්ලන්නේ මිනිසුන්ගේ එදිනෙදා ජීවිතයට අවශ්‍ය, මිනිසුන්ගේ එදිනෙදා ජීවිතය සැපවත් කර ගන්න පුළුවන් ක්‍රියාමාර්ග ගැනීමේදී පමණයි. නීතිය හා සාමය ආරක්ෂා කරගෙන යැමේදී ඇත්තට, හෘදය සාක්ෂියට එකඟව ලැබෙන සහයෝගය විතරයි අපි බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා මේ වෙලාවේ කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ, විපක්ෂය මහ ලොකුවට කථා කළාට, අයිතිවාසිකම් ගැන කථා කළාට, මිනිස්සු මහ මහ එක එක විධියට මැරිලා යන එක ගැන කථා කළාට මේ වෙලාවේ කිසිම කෙනෙක් පාර්ලිමේන්තුවේ නැහැ කියන කාරණය. ඒ පිළිබඳව මම විශේෂයෙන් සඳහන් කරනවා, මේ රටේ මහජන නියෝජිතයන් විධියට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට වෙන් වූ කාලය අවසන්.

**ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ඉක්මනින් අවසන් කරනවා.

විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, අපි මේ නීති ප්‍රතිසංස්කරණ හරහා ඉදිරි දැක්මක් බලාපොරොත්තු වෙන බව; ඉදිරි ගමනක් බලාපොරොත්තු වෙන බව. අපේ අධිකරණවල විශාල අඩුපාඩු තිබෙනවා. ඒ සියල්ල මහ හරවා ගනිමින් ඒ සියල්ලට ක්‍රමානුකූලව විසඳුම් සපයා ගනිමින් යන්න ඉදිරි ගමනක් අපට තිබෙනවා. ඒ නිසා මේ අවුරුදු පහ අවසන් වෙද්දී, ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් යටතේ නීතියේ සමානාත්මතාව සහ නීතියේ සාධාරණත්වය වෙනුවෙන් අපට කරන්න පුළුවන් හැම කැප කිරීමක්ම, අපට තියන්න පුළුවන් හැම පියවරක්ම අපි ජාතික ජන බලවේගය ආණ්ඩුවක් විධියට තියනවා කියන විශ්වාසය සපථ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) நிலூஷா லக்மாலி கமகே)
(The Hon. (Mrs.) Nilusha Lakmali Gamage)

Madam, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නිලූෂා ගමගේ මන්ත්‍රීතුමිය, ඔබතුමියගේ point of Order එක මොකක්ද?

**ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) நிலூஷா லக்மாலி கமகே)
(The Hon. (Mrs.) Nilusha Lakmali Gamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විපක්ෂ නායකතුමා පාර්ලිමේන්තුව හමුවේ ප්‍රකාශයක් කරමින් පාර්ලිමේන්තු නිලධාරින්ගේ ආහාර මිල වැඩි කිරීමට ආණ්ඩු පක්ෂය විසින් තීරණයක් ගත් බව හැඟෙන පරිදි ප්‍රකාශයක් කළා. ඇත්තටම එය සිදු වුණේ නිලධාරින්ගේ ඉල්ලීම මත. ගෘහ්‍ය කාරක සභාවේ ඉන්න සාමාජිකාවක් විධියට මා එය එලෙස නිවැරදි කිරීමට කැමැතියි.

අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු පස් වරු 1.00 දක්වා අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 11ක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක ඉදිරිපත් කරන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියට මම පොඩි පැහැදිලි කිරීමක් කළ යුතුයි. ගරු සභාවේදී මීට මොහොතකට කලින් කියැවුණා, රුපියල් ට්‍රිලියන විස්සක පමණ ප්‍රමාණයක ණය අරගෙන තිබෙනවා, ඒ මුදල් ආගිය අතක් නැහැ කියලා. රජයේ නියෝජ්‍ය ඇමතිවරයෙක් තමයි ඒක කිව්වේ. ඒ කාරණය දැන් news එකක් හැටියට ලොකුවට ප්‍රචාරය වනවා. හැබැයි, ඒක එහෙම නොවෙයි. ණය ගත්තාට, සමහර වෙලාවට ඒවායේ assets තිබෙන්නේ වෙන වෙන ආයතනවල. මහවැලියට ණය ගත්තා නම් ඒ වත්කම තිබෙන්නේ මහවැලි අධිකාරියේ. පාරවල් හදන්න ණය ගත්තා නම් ඒක අයිති RDA එකට. එහෙම නැතුව කවුරුවත් ට්‍රිලියන විස්සක් හොරකම් කරලා නැහැ. 2015-2019 කාලයේ Comptroller General කෙනෙක් පත් කළා, Island Account එකේ තිබෙන මේ deficit එක හොයන්න. ඒ තොරතුරු එක තැනකට ගෙනෙන්න. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, ඒ ගැන සොයන්න දැන් පටන් ගත්තා කියලා. ඒක එහෙම නොවෙයි. මම Comptroller Generalට දැන් කථා කළා. මම හිටපු Auditor-Generalටත් කථා කළා. එතුමාත් කිව්වා, ඒ කාර්යය පටන් අරගෙන සිදු වෙමින් පවතිනවා කියලා. ඒ නිසා මම වගකීමෙන් කියනවා, ට්‍රිලියන විස්සක් නැති වෙලා නැහැ කියන එක. ණය ගත්තාම සමහර වෙලාවට එම මුදල් consumptionවලට පාවිච්චි වනවා. සමහර විට assetsවලට පාවිච්චි වනවා. සමහර වෙලාවට ගත්ත ණය depreciation නිසා වෙනස් වනවා. එම නිසා වගකීම් සහිතව කථා කරන්න කියලා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති හැටියට මම බොහොම ගෞරවයෙන් ඉල්ලනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

[අ.භා. 1.02]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අපි විවාදයට ගන්නා පනත් කෙටුම්පත් දෙක අතුරින් අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පතට අදාළව සාකච්ඡාවත් තිබෙනවා. අපි දන්නවා, අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධව දැනට පළ වුණු අදහස්වලින් වාගේම මේ ගරු සභාවේ ඉන්න සියලුදෙනාගේම විරෝධතාවක් හෝ දෙගිඩියාවක් නැහැ කියලා. බොහෝ මන්ත්‍රීවරු ඒ ගැන අදහස් ප්‍රකාශ කළා. විශේෂයෙන්ම පසුගිය මාස කිහිපයේ අපි අත්දැකපු සමහර ඛේදවාචක, ඛේදජනක සිද්ධි අරගෙන බැලුවත් මෙම සංශෝධන පනත් කෙටුම්පතේ මූලික කාරණාවක් වුණේ, නඩු විභාග කටයුතුවලදී සාක්ෂිකරුවන් උසාවි භූමිය තුළට පැමිණීමකින් තොරව නඩු කටයුතු සිදු කිරීමයි. විදෙස් රටක, එහෙමත් නැත්නම් බන්ධනාගාරයක හෝ වෙනත් තැනක ඉඳගෙන නවීන තාක්ෂණය උපයෝගී කරගෙන සාක්ෂි සටහන් කර ගැනීම ඇතුළු දේවල් කර ගැනීමට අදාළ විධිවිධාන මෙම පනත් කෙටුම්පතේ ඇතුළත් වනවා. පසුගිය දවසක ආංශික අධීක්ෂණ කාරක සභාවේදීත් මේ ගැන පුළුල් සාකච්ඡාවක් සහ පැහැදිලි කිරීමක් සිදු වුණා. මේ සංශෝධනයට අපි හැමෝම එකඟයි. ඒ ගැන විවාදයක් නැහැ. මේක අවශ්‍යතාවක්; කාලීන අවශ්‍යතාවක්. ඒ වාගේම අපි දන්නවා, නීති, අණපනත්, කෙටුම්පත්, තාක්ෂණය දියුණු වනකොට ඒවාත් එක්ක ඉදිරියට යන්න ඕනෑ බව. වත්මන් ආණ්ඩුවේ මුල්ම පනත් කෙටුම්පත් සංශෝධනවලින් එකක් විධියට මේ සංශෝධන ගෙන ඒම ගැන ඇත්තෙන්ම අපි ඉතා සතුටු වනවා. අපි හිතනවා, කිසිම අර්බුදයකින් තොරව අද මෙම පනත් කෙටුම්පත සම්මත වෙයි කියලා.

මෙම පනත් කෙටුම්පත ගැන අපේ ගරු මන්ත්‍රීවරු බොහෝදෙනෙක් කථා කළ නිසා මම අවධානය යොමු කරන්න කැමැතියි, පළාත් පාලන මැතිවරණය සම්බන්ධව. අද මෙම පාර්ලිමේන්තු රැස්වීම් සතියේ අවසන් දවස. ලබන මාසයේ 02වැනි දා පළාත් පාලන ආයතන පිහිටුවීම, සභාපතිවරු පත් කිරීම, නගරාධිපතිවරු පත් කිරීම සිදු වනවා. අපි දැක්කා, පසුගිය දවස් කිහිපයේම ඒ සම්බන්ධ සාකච්ඡාවක් ගරු සභාව තුළ නිරන්තරයෙන් මතු වුණු බව සහ නිරන්තරයෙන් ඒ ගැන කථා කළ බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විපක්ෂයේ පක්ෂ - විශේෂයෙන් සමගි ජන බලවේගය - කොළඹ මහ නගර සභාව සහ අනෙකුත් පළාත් පාලන ආයතන ගැන, ඒවායේ බලය පිහිටුවීම ගැන විවිධ අවස්ථාවල වාද විවාදවලට පැටලෙනවා අපි දැක්කා. විශේෂයෙන් එවැනි වාද විවාද කරනවා වාගේම බොහොම උජාරුවෙන් බලය පිහිටුවීම ගැන කථා කරනවා අපි දැක්කා. පළාත් පාලන ආයතනවල බලය පිහිටුවීම සහ සභාපතිවරු පත් කිරීමට පළමුව, මෙම පාර්ලිමේන්තු රැස්වීම් සතියේ අවසාන දවස අද නිසා මම හිතනවා, මේ වෙලාවේ මේ තත්ත්වය ගැන වැඩිපුර කථා කළොත් හොඳයි කියලා.

2025 පළාත් පාලන මැතිවරණයේ මොකක්ද ප්‍රතිඵලය? මේ වතාවේ මැතිවරණ ප්‍රතිඵලය ගත්තොත් මොකක්ද ඒකෙන් දෙන පණිවුඩය?

කාටද ඒ පළාත් පාලන ආයතන පාලනය කරන්න බලය දීලා තිබෙන්නේ? ඒක නේ ප්‍රශ්නය. ආසා දේ මොකක්ද කියන එක වැදගත් නැහැ. හැමෝම ආසයි, තමන්ට තිබිච්ච ඒවා ඒ විධියටම තිබෙනවා නම්. එහෙම නැත්නම් තව වැඩි වෙනවා නම්. හැබැයි, ඉතින් ආසා දේවල් නැති වෙලාත් තිබෙනවා. සමහර අයට මෑත කාලයේ නොලැබිච්ච, අහිමි වෙච්ච ලොකුම අහිමි වීමත් මෙවර සිද්ධ වෙලා තිබෙනවා.

මැතිවරණයක් කියන්නේ ජනතා මතය. අපි මැතිවරණ පවත්වන්නේ විනෝදයට නොවෙයි නේ. මැතිවරණ පවත්වන්නේ ජනතා මතය නැවත නැවතත් පරීක්ෂා කර බලන්නයි. එතකොට ජනතා මතය නැවත නැවතත් පරීක්ෂා කර බලා ඒකෙන් යම් ප්‍රතිඵලයක් ආවාම, ඒකෙන් බලය පිහිටුවන්න ඕනෑ කවුද කියලා පණිවුඩයක් දුන්නාම, ඒකට අනුව කටයුතු කිරීම තමයි ප්‍රජාතන්ත්‍රවාදයේ ලක්ෂණයක් විය යුත්තේ. දිනන්නේ කවුරුවත්, බලය පිහිටුවන්නේ කවුරුවත් වෙන්න බැහැ. එහෙම ක්‍රමයක් නැහැ. ඒකට පනත් කෙටුම්පත අරගෙන, දෙකයි, දෙකයි, තුනයි, හතරයි එකතු කළාම දහයට වඩා වැඩියි කියන්න පුළුවන්. හැබැයි, හැම පළාත් පාලන ආයතනයකම ජනතාව විසින් ලබා දීපු නිශ්චිත පණිවුඩයක් තිබෙනවා. ඒක තමයි ඒ පළාත් පාලන ආයතන

[ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා]

ජයග්‍රහණය කරලා තිබෙන්නේ කවුද කියන එක. ඒ ප්‍රතිඵලය ගැන ආයෙත් සැකෙවින් කිව්වොත්, ලංකාවේ තිබෙන පළාත් පාලන ආයතන 300 ගණනින් පළාත් පාලන ආයතන 267ක් ජාතික ජන බලවේගය ජයග්‍රහණය කරලා තිබෙනවා, පසුගිය මැයි 6වැනි දා. ඒක ලංකා ඉතිහාසයේ ලොකුම පළාත් පාලන ආයතන ජයග්‍රහණය. ඒ පළාත් පාලන ආයතන 267න්, 120ක් ජාතික ජන බලවේගය බහුතර මන්ත්‍රී ධුර සහිතව ජයග්‍රහණය කර තිබෙනවා. මාලිමාවේ මන්ත්‍රී ධුර සහ අනෙකුත් ඔක්කොම ටික එකතු කළාම පළාත් පාලන ආයතන 30ක සමානකමක් ඇවිල්ලා තිබෙනවා. තවත් 117ක මාලිමාව දිනලා තිබෙනවා. නමුත්, අනෙක් ඔක්කොම පක්ෂ එකතු කරලා බැලුවාම ඒ පැත්තේ වැඩි ප්‍රමාණයක් තිබෙනවා. අනෙක් ඔක්කොම කියන්නේ, එක කට්ටියක් නොවෙයි.

මේ කාරණය ගැන මම විශේෂයෙන්ම කථා කරන්න ඕනෑ. පළාත් පාලන ආයතනවලට අදාළව විපක්ෂයක් නැහැ. නමුත් අපි දැක්කා, සමහරු සමහර සභාවල දැන්ම විපක්ෂ නායක වෙලාත් තිබෙනවා. එහෙම එකක් නැහැ. ඒ සභාවල ඉන්නේ සභිකයෝ. සභාවල සභාපති කෙනෙක් හෝ නගරාධිපති කෙනෙක් ඉන්නවා. උප නගරාධිපති කෙනෙක් හෝ උප සභාපති කෙනෙක් ඉන්නවා. ඉතුරු අය සභිකයෝ; විවිධ පක්ෂවලින්, ස්වාධීන කණ්ඩායම්වලින් පත් වෙච්ච සභිකයෝ. ඒවායේ විපක්ෂය කියලා එකක් නැහැ. ඒක මූලික දෙයක්. පාර්ලිමේන්තුවේ තමයි ආණ්ඩු පක්ෂයයි විපක්ෂයයි කියලා තිබෙන්නේ. ඒ මූලික දෙයට අනුව ගත්තොත්, බහුතර මන්ත්‍රී පිරිසකින් අනුමත කරන කෙනා සභාපති වෙනවා. ඒක තමයි විධිය. අපට -ජාතික ජන බලවේගයට- පළාත් පාලන ආයතන 267ක බලය ඇවිල්ලා තිබෙද්දී විපක්ෂයේ අයට කොහොමද බලය ආවේ? පළාත් පාලන ආයතන කියන්නේ, කොට්ඨාස ක්‍රමය මත පදනම් වෙච්ච එකක්. කොට්ඨාසය තමයි ඒකේ unit එක. කොට්ඨාසයට තමයි මන්ත්‍රීවරු ඡන්දය ඉල්ලන්නේ. ඒ ඒ කොට්ඨාස ජයග්‍රහණය කළ කෙනා තමයි මන්ත්‍රී වෙන්නේ. උතුරු, නැඟෙනහිර හැරෙන්න ඉතුරු පළාත් හතේ කොට්ඨාසවලින් සියයට 80ක්, 90ක්, සමහර දිස්ත්‍රික්කවල සියයට 94ක් ජාතික ජන බලවේගය ජයග්‍රහණය කර තිබෙනවා. සියයට 90කුත් ජයග්‍රහණය කරලා තිබෙනවා. ලංකාව පුරාම ගත්තොත්, අපට මන්ත්‍රී ධුර 3,926ක් ලැබිලා තිබෙනවා. ඒ, එක පක්ෂයක් විසින් ගත්ත ඉතිහාසයේ වැඩිම මන්ත්‍රී ධුර සංඛ්‍යාව. ඒ ජයග්‍රහණය ගැන තවත් පැහැදිලි කළොත්, අපි යාපනය, මඩකලපුව හැර අනෙකුත් සියලු දිස්ත්‍රික්කවල වැඩිම ඡන්ද ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. ත්‍රිකුණාමලය, දිගාමඩුල්ල, වවුනියාව වාගේ දිස්ත්‍රික්කවල වැඩිම ඡන්ද ප්‍රමාණයක් අපට තිබෙනවා. යාපනය දිස්ත්‍රික්කයේ අපි දෙවැනි තැනට ඇවිල්ලා තිබෙනවා. යාපනය දිස්ත්‍රික්කය ජයග්‍රහණය කරමින් දෙමළ ජාතික සන්ධානය මන්ත්‍රී ධුර 130ක් ගනිද්දී, ජාතික ජන බලවේගය මන්ත්‍රී ධුර 80ක් අරගෙන තිබෙනවා. සරලව කිව්වොත්, ලංකාවේ මට්ටමින් ගත්තොත්, ඉතිහාසයේ පළමුවැනි වතාවට ජාතික දේශපාලන පක්ෂයක් විසින් යාපනයේ දූපත්වල සිට උතුරු, නැඟෙනහිර හා දකුණේ සියලු පළාත් පාලන ආයතනවල මන්ත්‍රී ධුර හොබවනවා. මීට කලින් එහෙම එක් පක්ෂයක් විසින් සියලු පළාත් පාලන ආයතනවල මන්ත්‍රී ධුර හොබවා නැහැ. රට මුළුල්ලේ පැතුරුණු විශාල ජයග්‍රහණයක්, මන්ත්‍රීවරුන් පත් කිරීමක් මේ මැතිවරණය හරහා අපට ලැබිලා තිබෙනවා. ඒක තමයි ජනතා පණිවුඩය. නැතිව වෙන මොකක්ද? කවුරු හරි ඒක අරගෙන ඉලක්කම් ටික කියලා වෙන කථාවක් කියන එක නොවෙයි නේ ජනතා පණිවුඩය කියන්නේ. ජනතා පණිවුඩය කියන්නේ, දීපු ඡන්ද ප්‍රමාණය, ඡන්ද අනුපාතය, හම්බ වෙච්ච මන්ත්‍රී ධුර ප්‍රමාණය. ඒකට ගරු කරමින් තමයි සියලු දේවල් සිද්ධ විය යුත්තේ. විශේෂයෙන්ම උතුරු, නැඟෙනහිර දෙමළ සහ මුස්ලිම් පක්ෂ හැරුණුකොට දකුණේ විපක්ෂ දේශපාලන පක්ෂ විධියට සිටින සමගි ජන බලවේගය, එක්සත් ජාතික පක්ෂය, පොහොට්ටුව -පුටුව ලකුණෙනුත් ඉල්ලුවා. එක එක ඒවායෙන් ඉල්ලුවා- යන ඒ කාටවත් එකම සභාවකවත් බලය නැහැ. මතක තියා ගන්න, එකම සභාවක්වත් නැහැ. ඔවුන් එකම ප්‍රාදේශීය සභාවක්වත් දිනලා නැහැ. සමගි ජන බලවේගය විතරක් පළාත් පාලන ආයතන 13ක් ජයග්‍රහණය කරලා තිබෙනවා. 2018දී එක්සත් ජාතික පක්ෂය විධියට ඔවුන් ඉල්ලද්දී පළාත් පාලන ආයතන 35ක් ජයග්‍රහණය කරලා තිබුණා. දැන් පළාත් පාලන ආයතන 13ක් දිනලා තිබෙනවා. හැබැයි, ඒ පළාත් පාලන ආයතන දහතුනේ එකම තැනකවත් බහුතර මන්ත්‍රී සංඛ්‍යාවකින් දිනලා නැහැ.

ඒ එකම තැනකවත් වෙනත් පක්ෂයක සහයෝගයක් නැතුව සභාපතිවරයෙක් පත් කරන්න බැහැ. ඒක තමයි ජනතා පණිවුඩය. ජනතා පණිවුඩයෙන් කියන්නේ ඕක. වෙන දෙයක් නොවෙයි. ජාතික ජන බලවේගයට සභා 267ක බලය දෙද්දී ඕක තමයි සමගි ජන බලවේගය ඇතුළු විපක්ෂයට දීලා තිබෙන පණිවුඩය. මේ තත්ත්වය ඇතුළේ තමයි මේ සභා පත් කිරීම ගැන කථා කරන්නේ. මෙකෙදි ගොඩක් කථා කියනවා අපි දැක්කා. විශේෂයෙන් කොළඹ මහ නගර සභාව ගැන කථා කළා. කොළඹ මහ නගර සභාවට අයිති මැතිවරණ කොට්ඨාස පහක් තිබෙනවා. ඒක ලංකාවේ ලොකුම පළාත් පාලන ආයතනය. ඒ ආසන පහෙන් නැඟෙනහිර කොළඹ මැතිවරණ කොට්ඨාසයේ සියලු කොට්ඨාස ජාතික ජන බලවේගය දිනුවා. බටහිර කොළඹ සියලු කොට්ඨාස ජාතික ජන බලවේගය දිනුවා. බොරැල්ලේ සියලු කොට්ඨාස ජාතික ජන බලවේගය දිනුවා. උතුරු කොළඹ කොට්ඨාස නවයෙන් හයක් දිනුවා. මැද කොළඹ කොට්ඨාසවලින් භාගයක් දිනුවා. අනෙක් අය එහෙම දිනලාද ඉන්නේ?

ඊළඟට, සමගි ජන බලවේගය කථා කරනවා, අනෙක් අයත් එක්ක එකතු වෙලා නගරාධිපති පත් කිරීම ගැන. ඔවුන් නගරාධිපති අපේක්ෂකයෙක් දැම්මා, ඡන්දයට කලින්. මොකක්ද ජනතාව දීපු පණිවුඩය? එයා දකුණු බොරැල්ල කොට්ඨාසයෙන් ඉල්ලුවේ. සියයට 27යි ගත්තේ. පළමුවැනි වරට ඡන්දය ඉල්ලපු ජාතික ජන බලවේගයේ අපේක්ෂිකාවට තමයි පරාජය වුණේ. එතකොට ජනතා පණිවුඩය මොකක්ද කියන එක හරි පැහැදිලියි. ඒ නිසා එක පැත්තකින් ජනතා පණිවුඩය තිබෙනවා. අනෙක් පැත්තෙන් තිබෙනවා පනත. මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා පනත් අනුව වැඩිම මන්ත්‍රීවරුන් සංඛ්‍යාවකගේ සහයෝගය හම්බ වෙන කෙනා තමයි සභාපති වෙන්න ඕනෑ. එතකොට ජාතික ජන බලවේගය දිනලා තිබෙනවා; කොළඹ මහ නගර සභාව දිනලා තිබෙනවා; තවත් බොහෝ සභා දිනලා තිබෙනවා. නමුත් මන්ත්‍රී ධුර කිහිපයක් අඩු තැන්වල ස්වාධීන මන්ත්‍රීවරු ඇතුළු තනි තනි මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ඇතුව, ජනතා පණිවුඩයට, ඒ ජයග්‍රහණයට, ඒ ජනතා අභිලාෂයට ගරු කරමින් ජාතික ජන බලවේගය විසින් සභා පිහිටුවනවා; සභාපතිවරු, නගරාධිපතිවරු පත් කරනවා. එසේ පත් කළ යුතුයි. ඒක තමයි ඒ ඡන්ද ප්‍රතිඵලයෙන් දීපු පණිවුඩය.

හැබැයි එහෙමයි කියලා, දැන් පනතට අනුව බහුතරය තිබෙන කෙනාට පුළුවන් කියලා, ජනතාව විසින් ජයග්‍රහණය කරවපු පක්ෂයට සාපේක්ෂව භාගයක්වත් නැති, පරාජය වුණු අය ගැන හිතන්නකෝ. කොළඹ මහ නගර සභාවම උදාහරණයට ගත්තොත්, 59දෙනෙක් ඕනෑ සභාව පිහිටුවන්න. නමුත් 29යි ඉන්නේ සමගි ජන බලවේගයට. භාගයක් අඩුයි. එතකොට මොකක්ද තිබෙන අයිතිය, මොකක්ද තිබෙන සදාචාරාත්මක අයිතිය එහෙම දෙයක් කරන්න උත්සාහ කරන්නවත්, ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරනවා නම්, ඡන්ද ක්‍රමයට ගරු කරනවා නම්? හරි, ව්‍යවස්ථාව අනුව, නැත්නම් පනත අනුව එහෙමයි

කියලා කියන්න පුළුවන්. නමුත් ඒකට සදාචාරාත්මක බලයක් නැහැ. ඒ බලයක් නැති නිසාම ජාතික ජන බලවේගය දිනපු සභා -අපි දිනපු නගර සභා, ප්‍රාදේශීය සභා සහ මහ නගර සභා- ජාතික ජන බලවේගය විසින් පිහිටුවනවා. ඒක තමයි ජනතාවගෙන් ලැබී තිබෙන mandate එක. ඒක තමයි ජනතාවගෙන් ලැබී තිබෙන ඡන්දය. එතකොට කොළඹ මහ නගර සභාව ඇතුළු අපි දිනපු සියලු සභා ජාතික ජන බලවේගය පිහිටුවනවා. ඒකට තමයි මිනිස්සු ඡන්දය දීලා තිබෙන්නේ. ඒ නිසා මේක විකෘති කරන්න හදන්න එපා. මේක වැරදියට interpret කරන්න හදන්න එපා. පාර්ලිමේන්තුව නැවත රැස් වෙන්නේ තවත් සතියකින්. ඒ වෙද්දී මේ ජනතා පණිවුඩයට ගරු කරමින්, මේ ඡන්දයට මේ මතයට ගරු කරමින්, ජාතික ජන බලවේගය දිනපු සියලු සභා ජාතික ජන බලවේගය විසින් පිහිටුවන්න අපි කටයුතු කරනවා. සියලු කුමන්ත්‍රණ අහෝසි කරලා ඒ සභා ටික පිහිටුවන්න අපි කටයුතු කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 15ක කාලයක් තිබෙනවා.

[1.14 p.m.]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Presiding Member, I rise to speak on the Foreign Loans (Repeal) Bill, which basically repeals the hitherto fragmented law of 1957 and which would be substituted by the Public Debt Management Act, No. 33 of 2024, the Public Financial Management Act, No. 44 of 2024, the Economic Transformation Act, No. 45 of 2024 and the Active Liability Management Act, No. 8 of 2018. So, this repealing is done on a timely concern and it basically nullifies the old, antiquated laws and would be replaced by modern law. However, things must go on, on a more positive note and that is why I thought I would speak on this particular Bill.

The reason behind the repealing of this Bill is the US Dollars 2.9 billion EFF given to Sri Lanka by the IMF and this needs to be looked at in terms of how it has really got to be implemented. The IMF Executive Board, which is supposed to meet in the next couple of days to decide on the fourth tranche under the Staff-Level Agreement, is anxiously looking at the Government's follow-up action particularly on the cost-reflective sales strategy of the CEB and whether the modernization and commercialization process of State-owned enterprises would be accepted, which are imperative for the IMF to go forward with the fourth tranche and from there onwards. So, we have to keep that in mind.

මම අගය කරනවා ගරු ලාල් කාන්ත අමාත්‍යතුමා සභාවට පැමිණ සිටීම. එතුමා මේ දවස්වල අලුත් ආකාරයකට ආර්ථිකයට නව නැම්මක් දීගෙන යනවා. අපි හිතන ආකාරයට හිතන එක තමයි මම හිතන හැටියට එතැන තිබෙන ලොකුම වෙනස. මම අද කථා කරන්න යන්නේත් අන්න ඒ වාගේ අලුත් දර්ශනයක ගමනක් ගැන. ඔබතුමන්ලා රතු කොඩිය වන වනා ඉන්න, පැරණි ගතානුගතික යුගය අමතක කරලා අලුත් ආකාරයකට යන එක ගැන තමයි මම මතක් කරන්න හදන්නේ. ඒ නිසා ඔබතුමා සභාවට පැමිණීම මම අගය කරනවා.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
කොළ කොඩිය දාගෙන?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්.

I basically look at the strategy to be followed because this is not an easy time. When we come out of bankruptcy, the most important thing that has got to be looked at is the default which necessitates to come up with harsh treatment. So far, we have come through this. The operation has been successful and the patient must not be allowed to die. That is the reason why we have to take corrective action.

Now, we have to look at the revenue aspect. අපි සලකා බලන්න ඕනෑ ආදායම, වියදම, අය වැය හිඟය, අය වැය පරතරය, ගන්නා ණය ප්‍රමාණය - මේ සභාවේදී මීට පෙර කිව්වා අපි සත පහක් ණය ගන්නේ නැහැ කියලා. එහෙම නැහැ, හැම අවුරුද්දේම ට්‍රිලියන දෙක තුනක ණය ගන්නවා. මෙලෝ දෙයක් කළේ නැතත් අරගෙන තිබෙනවා - දැන් තිබෙන ණය ප්‍රමාණය, the debt sustainability, the debt sustainability analysis and the country ratings. Fitch has given us "CCC", the Moody's has given us "Caa" and the Standard & Poor's rates us as if the country is still in a deficit. So, on that particular basis, we have got to look at as to how we take this forward. There are no poor countries, only failed systems in managing the resources. The godfather of the IMF in today's context is Evan Papageorgiou, who replaced Peter Breuer, and he is the link between the IMF and the Government.

Madam, I will now speak about the situation at this particular moment. The total debt stock of Rs. 84 billion as of 31st December, 2022 was taken as the base in deciding as to how we move forward with the debt. Mr. Mahinda Siriw ardana mentioned just two or three days ago that we must ensure this is the last time we are going to borrow from the IMF.

මම මුදල් ඇමති වශයෙන් කටයුතු කරනකොට 16වෙනි වතාවට IMF එක සමඟ කළ සාකච්ඡාව අපි ඒ ආකාරයෙන්ම ගෙනිච්චා. නමුත්, ඒක අන්තිමට, අවසන් කරන්න එනකොට දර්ශනය වෙනස් කරලා ඉදිරියට යෑම නිසා නැවතත් හිටපු තත්ත්වයටම ගමන් කළා. ඒ නිසා මේක අපි IMF එකෙන් ණය ගන්න මේ 17වෙනි වතාව, එයින් ණය ගන්න අන්තිම අවස්ථාව බවට පත් කරගෙන රටක් හැටියට ඉදිරියට යන්න අවශ්‍යයි.

මේ කථා කරන මොහොතේ, මේ රට මේ අවුරුද්දට ණය ගෙවන්න තිබෙනවා බිලියන 4,950ක්. එහි පොලිය 2,950යි; ප්‍රාග්ධන ක්ෂය කිරීම 1,680යි. අපි මේ අවුරුද්ද අන්තිමට ආදායමක් උපයන්න හදනවා ට්‍රිලියන 5ක. මේ ට්‍රිලියන 5ම යනවා

[ගරු රවී කරුණානායක මහතා]

මේ ණය ගෙවන්න, debt servicingවලට. මෙන්න මේක තමයි තිබෙන භයානක තත්ත්වය. මේ අවස්ථාවේදී දත්ත ඉදිරිපත් වෙලා තිබෙනවා, සියයට 22ක් ගෘහ ඒකකවල ණය බර ඇති වෙලා තිබෙනවා කියලා. 2022ට වඩා සියයට 60ක් අඩු ආදායමක් උපයන තත්ත්වයක් තමයි තිබෙන්නේ. මේ තුළ රට ඉතාම භයානක තත්ත්වයක ගමන් කරන බව තමයි අපට මේ අවස්ථාවේදී පේන්න තිබෙන්නේ.

මේ කථා කරන මොහොතේ අපේ ආදායම වැඩි කරන්න පුළුවන් කොහොමද කියලා සොයන්න අවශ්‍යයි. නම්‍යශීලි අලුත් දර්ශනයක් සමඟ තමයි ඒක කරගෙන යන්න ඕනෑ. ඒ නිසා තමයි මම කැමැති ලාල් කාන්ත ඇමතිතුමා කියලා තිබුණු කාරණයට. පැරණි කොමියුනිස්ට්වාදී සටන් පාඨ පැත්තකට විසි කරන්න. අපේ ජනාධිපතිතුමා කියනවා trade unionsවල අයට, මේ අවස්ථාවේදී කේවල් කිරීම නොවෙයි අවශ්‍ය වෙන්නේ, රටේ ආර්ථිකයට ඔරොත්තු දෙන්න පුළුවන් විධියට කථා කරන්න කියලා. ඒවා මෙතෙක් කල් කථා නොකළ ඒවා. මේ තමයි හරි මාර්ගය. වමට සිග්නල් දාලා දකුණට හැරෙන්නේ නැතිව ඔබතුමන්ලා කෙළින් පාරේ යන එක තමයි අවශ්‍ය වෙන්නේ. මෙතෙක් කල් strike action නැහැ. නමුත් ආයෝජන තවම එන්නේ නැහැ. අපට දැනට සෘජු ආයෝජන ඇවිල්ලා තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 197යි.

Madam, we have got only US Dollars 197 million as foreign direct investments while we are looking at a target of US Dollars 2 billion. So, I guess it is a long haul because the investments which come in today bring in revenue for tomorrow. On the basis that we have got to collect a Rs. 5 trillion revenue, it is essential that we look at getting more investments to come in, whether domestic or foreign. Foreign investments need to come in.

Remember, we borrowed Rs. 2.2 trillion in 2023, Rs. 1 trillion in 2024 and Rs. 2 trillion in 2025 to finance the Budget deficit. So, on that basis, you have added another Rs. 5.2 trillion to the debt stock as at 31st December 2022, which was a total of US Dollars 84 billion or Rs. 27.8 trillion.

So, how are we going to ensure that we achieve the targets we are aiming for? As I said earlier, the Government received only US Dollars 197 million as foreign direct investments.

Private sector is still waiting to see what Government's policies are to make investments. Remember, every one per cent increase in interest rate costs the Government Budget Rs. 160 billion. A one-rupee depreciation against the dollar has a Rs. 47 billion impact on the Budget. The policy rates have been reduced from 8 to 7.75 per cent, thinking that it would spur investments into the country or increase the credit creation ability.

Then, supply side management is what we have got to increase because that is what would create a better tomorrow. A three to four per cent reduction in the interest rates would not only yield a much more competitive base for our investors, but would also help ensure that we reduce a Rs. 600 billion to Rs. 700 billion Government Budget deficit because the borrowings are roughly US Dollars 56 billion in domestic debt and US Dollars 40 billion in foreign debt. So, an interest reduction would basically help domestic borrowings.

Then, the other one is the attack on inflation. We must ensure that the attack on inflation is by mopping up thes surplus. Liquidity is not the only solution to this problem and that is what is being pursued by the Central Bank. Therefore, I urge the Hon. Members of both sides to ensure that we get together and target the supply side of this economy. I have been repeatedly mentioning this, but the easy way that seems to be pursued by the Central Bank is to reduce the money circulation and to ensure that an anti-deflationary approach is being adhered to. So, let us ensure that we take this forward to the next level.

The most important aspect is, when are we going to be ready to pay our debts?

අපි කවදාද ණය ගෙවීම සඳහා සූදානම් වෙන්නේ? Multilateral, bilateral ණය කතන්දර නිසා අපි මේ අවස්ථාවේත් අවුරුද්දකට US Dollars 3 billion විතර ගෙවනවා. 2028 වනකොට බිලියන 6ක් විතර ගෙවන්න අපට සිදු වී තිබෙනවා. ඒ කියන්නේ, multilateral ණය ආදියට බිලියන 3ක්, Paris Club එකෙන් කථා කර ගත් ඒවාට අදාළව ගෙවිය යුතු මුදල ආදි වශයෙන්. 2033 වනකොට International Sovereign Bonds වෙනුවෙන් අපි බිලියන 7.5-8 විතර ගෙවන්න අවශ්‍යයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ගැන කියමින් එදා හිනා වුණාට, අන්තිමට රනිල් වික්‍රමසිංහ ඒ අයත් එක්ක කථා කරලා මේ රටේ ආර්ථිකය පණ ගන්වන්න පටන් ගත්තු ගමන තුළින් සියයට 15ක විතර ආදායමක් උපයන්න කටයුතු කරලා තිබෙනවා. මේක වෙනස් කරන්න අමාරුයි; වෙනස් කරන්න බැහැ; වෙනස් කරන්න එපා. එහෙම කළොත් ඒක රටේ අනාගතයට ලොකු ප්‍රශ්නයක් වෙනවා.

දැන් තමයි තේරෙන්නේ විපක්ෂයෙන් ආණ්ඩු පක්ෂයට ආවාම ලොකු වෙනසක් තිබෙනවා කියලා. විපක්ෂයේ ඉඳන් ඕනෑම එකක් කියන්න පුළුවන්. නමුත්, ආණ්ඩු පක්ෂයට ආවාට පස්සේ ඒ කථා කරපු දේවල් ඉදිරියට ක්‍රියාත්මක කරන්න අවශ්‍යයි.

හැබැයි ගරු ලාල් කාන්ත ඇමතිතුමා, අපි අගය කරනවා ඔබතුමා කථා කරපු දේවල්. ඒක මීට වඩා ප්‍රසිද්ධ කරන්න. ඔබේ 159දෙනාටම අර tuition lesson එක දීලා, ඒ තුළින් ආර්ථිකය නවීකරණය කරන්න පුළුවන් කොහොමද කියන එක කියලා දෙන්න. අපට කරන්න බැහැ කියලා ඔබතුමන්ලා එදා කිව්වත්, අද ඔබතුමන්ලාටත් මේ ගමන යන්න තිබෙන්නේ මේ ආර්ථික ක්‍රමය තුළ. ලෝකයේ රටවල් 212ක් තිබෙනවා. මේ ආර්ථික ක්‍රමය අනුගමනය කරනවා රටවල් 170ක්. විවෘත ආර්ථික ක්‍රමය ගෙනාවා කියලා ජේආර්ට බැන්නා; අවුරුදු 76ක ශාපයක් තිබෙනවා කිව්වා. ඒ ශාපයයි, මේ ශාපයයි අතර වෙනසක් නැහැ. මොකද, ආර්ථිකය ඉදිරියට ගෙන යන්න තිබෙන ගමන එකයි. වියදම අඩු කරන්න, ආදායම වැඩි කරන්න, රටේ සංවර්ධනය වෙනුවෙන් ආයෝජන ගේන්න. ආයෝජන තුළින් තමයි රට ඉදිරියට ගෙන යන්න හැකි වන්නේ.

මේ රටට සුළු සහ මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයන්ගේ දායකත්වය අත්‍යවශ්‍යයි. නමුත්, අද ඒ අයගේ ඔළුවට ගහලා තිබෙනවා. ආර්ථිකයට කිසිම වරදක් කරපු නැති, සියයට 7ක, 8ක පොලියක් ගෙවපු පිරිසක් වන ඒගොල්ලන්ට සියයට 30ක්

ගෙවන්න කියලා එක පාරටම කියනවා. ඒක මොන පාපයක්ද? අද මහ බැංකුව අමනුෂ්‍යභාවයකින් යුතුව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් එක්ක ඒ ගැන කථා කරන්නේවත් නැති තත්ත්වයක් තමයි තිබෙන්නේ. එම නිසා මම මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා. අපට හැම මාසයකම US Dollars 200 million එකතු කරන්න සිදු වී තිබෙනවා. මොකද, 2028 වනකොට ණය ගෙවන්න නම් අපට ඩොලර් බිලියන 15ක් අවශ්‍යයි. එම නිසා අපට එකතු කරන්න සිදුව තිබෙනවා, මාසයකට US Dollars 200 million. එතකොට, primary surplus එක සියයට 2.6ක් වැඩි කරන්න අවශ්‍යයි.

අද තිබෙන ලොකුම ප්‍රශ්නය ඒක නොවෙයි. මම අද පත්තරයේ ලිපියක් කියෙව්වා. රජයේ සේවකයන් ගැන, ඒගොල්ලෝ වැඩ කරන විදිය කථා කරලා තිබෙනවා, ගරු ලාල් කාන්ත අමාත්‍යතුමා. ඒක මීට වඩා ඕනෑකමින් කරන්න අවශ්‍යයි. අද බලන්න, ඒගොල්ලෝ Cabinet Appointed Tender Board එකට යනවාද? ඒගොල්ලෝ අද Technical Evaluation Committee එකට ගිහිල්ලා අත්සන් කරනවාද? ඒගොල්ලෝ අද Standby Committees or Accelerated Progress Committeesවලට ගිහිල්ලා අත්සන් කරනවාද? නැහැ. අද ඒගොල්ලෝ බයයි. වැඩ කරපු ඇමතිවරු වශයෙන් හිටපු අපිත් එක්ක ඒගොල්ලෝ කථා කරනවා. "අනේ සර්! අද අපට වැඩ කරන්න බයයි" කියනවා. එක පැත්තකින් Proceeds of Crime Act එක ගැන කියනවා, අනෙක් පැත්තෙන් Anti-Corruption Act එක ගැන කියනවා, තවත් පැත්තකින් Assets and Liabilities Law එක ගැන කියනවා. නිර්නාමික ලියුමක් එව්වත් ගෙන්නලා ප්‍රශ්න කරනවා. National Audit Office එකට surcharge කරන්න පුළුවන් හැකියාව තිබෙනවා.

එක්සත් ජාතික පක්ෂය ඇතුළු යහ පාලන රජය කාලයේ රජයේ සේවකයන්ට කරපු එක වැරැද්දක් තමයි FCID එකට අරගෙන ගිය එක. ඒකෙන් ඒගොල්ලන්ට හොඳින් වැඩ කරන්න පුළුවන් වුණා කියලා හිතනවා. නමුත් අන්තිමට ඒගොල්ලෝ බය වුණා. බය වෙලා වැඩ කළා. නමුත්, ඔක්කෝම එකතු වෙලා එක team එකක් වශයෙන් වැඩ කරන්නේ නැති තත්ත්වයක් ඇති වුණා. අද වෙලා තිබෙන්නේත් ඒකමයි. ඒකත් මතක තබා ගන්න. ඒ නිසා අලුතින් Public Service Discharge Act එකක් ගේන්න වෙයි. ඒගොල්ලන්ට ෆයිල් එකක් ගියොත් පැය දෙකෙන්, තුනෙන් අත්සන් කරලා එවනවා. නැඟෙනහිර යුරෝපයේත් මේ තත්ත්වය ඇති වුණා. ඉදිරියටත් ඒ වාගේ කරන්න පුළුවන් නීති ගේන්න. දැන් නීති විශාල ප්‍රමාණයක් ගෙනැල්ලාත් තිබෙනවා. රනිල් වික්‍රමසිංහ මහත්මයා ඒ අවශ්‍ය නීති ටික සම්පාදනය කළාට, අලුතින් Public Service Discharge Act එකක් ගෙනෙන්න ඕනෑ. ඒ කියන්නේ, රජයේ සේවකයන් වැඩ කළ යුතු ආකාරය ගැන. ඒ සම්ප්‍රදාය තමයි අපි ඉදිරියට ගෙන යන්න අවශ්‍ය වන්නේ. අඩු ගණනේ පනතක් ගෙනැල්ලා ඒ අයගේ බය නැති කළේ නැත්නම් රජයේ සේවකයන් වැඩ කරන්නේ නැහැ.

ඒගොල්ලන්ට බණින්න පුළුවන්. නමුත්, බණින කොට ඒ කාරණා සාධාරණ වෙන්න අවශ්‍යයි. ඒගොල්ලන්ගේ බය නැති කරන්න. අද ඒගොල්ලන්ට යමකට අත්සන් කරන්න තිබෙන බය තමයි, "අත්සන් කළේ මොකද" කියලා ප්‍රශ්න කරන එක. මීට කලින් Commissioner General of Exciseට බැන්නා, FL licences, FL 3, FL 4 licences දුන්නේ ඇයි කියලා. නමුත්, අද චක්‍රලේඛයක් ඇවිල්ලා තිබෙනවා, ඒ ඔක්කොම දෙන්න. ඒක තමයි හරි. සල්ලි හොයාගන්න පුළුවන් FL 3, FL 4 licences තියාගෙන ඒවා නොදී ඉන්න තරම්, ඒවායෙන් වෙලා තිබෙන අපරාධය මොකක්ද?

විජිත හේරත් ඇමතිවරයා ගිහිල්ලා මමත් දන්නා තරු පහේ හෝටලයක් විවෘත කළා. මමත් එදා එතැන හිටියා. මාස 3යි දවස් 28ක් ගිහිල්ලාත් තවම ඒ තරු පහේ හෝටලයට මත්පැන් විකුණන්න පුළුවන් licence එකක් ලැබිලා නැහැ. දවසකට ලක්ෂ දෙකක් ගෙවනවා. එහෙම ගෙවලා අන්තිමට මොකක්ද වෙන්නේ? සුද්දාට ඒ ලක්ෂ ටික එකතු කරන්න පුළුවන්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
**(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
**(மாண்புமிகு ரவி கருணாநாயக்க)**
(The Hon. Ravi Karunanayake)

Madam, I hear you, but I would love to take five minutes. My Friend, the Hon. Lal Kantha, is here and I would like to educate him a little more on right-leaning economics so that he could give tuition to his leftists friends.

මම මේ අවස්ථාවේ කියන්නේ මේ රටේ ආර්ථිකයට බැණ බැණ මේ රට හදන්න බැහැ කියලායි. අද වන විට NEXT Manufacturing (Pvt.) Limited එක වහලා. ඒ අයට බණින එක නොවෙයි කරන්න තිබෙන්නේ. ඔබතුමන්ලා අද රෑ නිදාගෙන හෙට උදේ නැඟිටලා කියනවා, පෞද්ගලික අංශයේ වැටුප් රුපියල් 15,000 ඉඳලා රුපියල් 28,000 දක්වා වැඩි කරන්න කියලා. රජය -නලින්ද ජයතිස්ස ඇමතිතුමා- කියන්නේ මොකක්ද? ඔබතුමන්ලා රජයේ සේවකයන්ට රුපියල් 15,000ක් අවුරුදු 3කදී වැඩි කරනවා. හැබැයි, රුපියල් 15,000ක වැටුප් වැඩි කිරීමක් පෞද්ගලික අංශයෙන් මාස හයෙන් ඉල්ලනවා. මේකේ සාධාරණයක් තිබෙනවාද? මේ රටේ ආර්ථිකය වැටිලා තිබෙන මේ අවස්ථාවේ ඒගොල්ලන්ගේ ණයවලට අදාළ පොලිය අඩු කරන්න. ඒගොල්ලන්ට ණය ගන්න පුළුවන් හැකියාව ඇති කරන්න. එහෙම නේද, ලාල් කාන්ත ඇමතිතුමා? අද මෙන්න මේ සටන් පාඨ ගේන්න, ව්‍යාපාරිකයෝ වෙනුවෙන්. අපි ඔක්කෝම එකතු වෙලා ඉදිරියේදී මේ ආර්ථිකය දියුණු කරන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් ඇති කරන්න අවශ්‍යයි. ඒක තමයි කළ යුතු වන්නේ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කැබිනට් ඇමතිවරයෙක්. මම ඔබතුමාට කිව්වා Public Service Discharge Act එක ගැන. ඒ කියන්නේ රජයේ නිලධාරියෙකුට ෆයිල් එකක් ගියොත්, ඒ දවසේ පැය දෙකකින් පමණ උත්තරයක් දෙන්න පුළුවන් විධියට නීති පද්ධතිය ගේන්න. හැබැයි ඒක ගේනකොට ඒගොල්ලන්ට ආරක්ෂාව දෙන්න. FL licences සම්බන්ධයෙන් ගිය වතාවේ ප්‍රශ්නයක් ඇති වුණා, ඒකට Commissioner General of Excise අත්සන් කළේ ඇයි කියලා. නමුත්, දැන් අත්සන් කරන්න දීලා තිබෙනවා. එදා අත්සන් කරපු අයට ප්‍රශ්නයක් ඇති වුණා. දැන් දෙන්න කියනවා. ඉතින් එදා ඒ අය වරදක් නොකර තිබියදීත් නේද ප්‍රශ්නයක් ඇති වෙලා තිබුණේ? මේ ගැන හිතන්න ඕනෑ අද තිබෙන තත්ත්වය අනුවයි. ඒ නිසා කරුණාකරලා ඒ විධියට හිතලා අපි ඉදිරියට ගමන් කරමු.

අද black market එකේ US Dollar එක රුපියල් 304යි, රුපියල් 305යි. I know, Madam, you understand what business is. උණ්ඩියල් ක්‍රමය තුළ අද මුදල් සියයට 3ක්, 4ක් පිටතට යන්න පුළුවන්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දැන් නීත්‍යනුකූලව මේ රටට සහාය දෙනවා. රටක් බංකොලොත් වුණාට පසු ඒ අය අවශ්‍යයි. නමුත් ඒගොල්ලෝ කියන විධියටම නටන්න අවශ්‍යත් නැහැ. "ආදායම කොච්චර ඕනෑ ද, වියදම කොච්චර සීමා කර ගන්න අවශ්‍ය ද, ඒක පරිපාලනය කරන්න

[ගරු රවි කරුණානායක මහතා]

තිබෙන්නේ කොහොමද කියලා දැන් ලාංකිකයන්ට කියන්න" යැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කියන්න කොන්දක් තිබෙන්න ඕනෑ. අපි ඒගොල්ලන්ගෙන් සහාය ඉල්ලනවා. ඊට පස්සේ අපි අහනවා, කොහොම නටන්න ඕනෑ ද, කොච්චර උසට පනින්න ඕනෑ ද කියලා. ඒ නිසා අද තිබෙන තත්ත්වය අනුව, as you know, one can get 3 to 4 per cent more money out of the country through the Undiyal system. With the current official tax of 15 per cent on foreign earnings, you do not get the monies that should come to the country. So, people find it better to send money through the Undiyal system. This is what is happening today. Therefore, we must legitimize it.

දැන් බලන්න, මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය දිහා. ඒකට ලොකු බද්දක් දමන්න ගිහිල්ලා අද මැණික් එන්නේ නැහැ. ඒ ඔක්කොම තායිලන්තයට යනවා. Ensure that you charge one US Dollar per carat and that is the way you generate revenue. ගරු ලාල් කාන්ත ඇමතිතුමනි, ඔබතුමා ඒක දැන්මම ක්‍රියාත්මක කරන්න යනවා කියලා මට පේනවා. *[බාධා කිරීමක්]* අන්න හරි. අවශ්‍ය නම් අහන්න. අපි එකට එකතු වෙලා -ඒකාබද්ධව- සටන් කරමු, මේ තිබෙන ආර්ථික ත්‍රස්තවාදයට විරුද්ධව.

ඒ වාගේම, from tourism, we are looking at earning US Dollars 4 to 6 billion. Also, you must ensure that US trade tariff imposed by President Donald Trump is looked into. Worse than that comes the UK-US Free Trade Agreement they are going to sign. That will have a direct impact on us because we are a Commonwealth country and we have a very close relationship with the UK. We have De La Rue, which prints money, Marks & Spencer, Tesco, Primark and NEXT here. Ensure that more such companies are brought into the system. We had about US Dollars 1.5 billion worth of trade just about five years ago. Now, it has dropped to US Dollars 850 million. We must speak with other countries on our trade concern. The British High Commission in Sri Lanka should have asked us three, four years ago, "India is going to sign a Free Trade Agreement with the UK and why are you all not doing it?" We had a much closer relationship with the UK than any other country. So, ensure that we get back on the right track. And I hope you have the onus to get your team together and tell them to ensure that it happens.

Then, have market access. Go for a Free Trade Agreements with Singapore and China and take the Free Trade Agreement with India to ETCA level. Now that we have ensured the Indian system has come in, ensure that we have the deep pocket investments coming from China, Japan and South Korea as well. That is the way to go about it. We also have to open our market to the US so that President Donald Trump would also feel that we have opened our market. Protect our US Dollar 3.1 billion exports to the United States. It is not that we cannot, but it is a question whether we want to do it or not.

Then, the tax reduction. Madam Presiding Member, you know about this, as you have been speaking rightly in the Committee on Public Finance. Ensure there is tax reduction. I had been a Minister of Finance. So, I know the impact it has. We have 220,000 companies incorporated, but only 11,000 companies pay taxes. So, ensure that we basically adopt a more rational approach towards that. Tax planning cannot be stopped and ensure that we bring an end to tax evasion.

The tax at 36 per cent must be brought down to 20 to 24 per cent. If you bring it down, you will have a higher tax compliance and a broader tax base. The interest rates are at 8 to 12 per cent. But, we talking of a policy rate of 7.4 per cent or 7.5 per cent. And, the lending rates from commercial banks range from 13 to 20 per cent. So, how on earth can we compete in this region, where in India, it is about 6 per cent, in Bangladesh, despite their country being bankrupt, it is about 8 per cent and in Nepal, the Maldives and Singapore, the interest rate are at 6 or 7 per cent? So, ensure that we have a lending rate between 8 to 12 per cent maximum. The small and medium entrepreneurs must be helped. They are shouting, but their voice is not being heard. I want to ensure that the President listens their grievances and the small and medium businesses, which contribute 65 per cent to 70 per cent of the economy, are saved. So, ensure that their voice is being heard, and the economy will start moving.

And then with regard to the PAYE Tax, the last time, I was encouraging you to push the tax threshold up to about Rs. 250,000. Even though it had been increased to Rs. 150,000, it is insufficient with today's cost push inflation. So, ensure that it is increased to the range of Rs. 250,000.

Then with abolition of exchange control, any amount of money that comes through official banking channels could be given tax incentives and qualifying payments. I am talking on the basis that we require a Rs. 5 trillion revenue. If you get Rs. 5 trillion this year, next year, another 5 per cent would be added to that. So, in order to achieve that, you have to have investments coming in. Just earning Rs. 5 trillion this year would not be sufficient because your revenue for 2026 would be based on 13 per cent of GDP. So, we must ensure that we bring in investments perdurable and sustainable.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, could you please wrap up now?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I will take, maximum, two minutes to finish up. We also saved a little time, and I hope you have the compassion, Madam, to give me time.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
You have already exceeded the time.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I will take a maximum of two minutes with your generosity.

Now, having no union strikes, it is a very helpful sign. But, even with no unions striking, closing of companies is not good for the country. එක පැත්තකින් කියනවා, "අද strike කරන්නේ නැහැ, unions අද protest කරන්නේ නැහැ, අද සටන් පාඨ නැහැ" කියලා. නමුත් කොම්පැනි වැහෙනවා. ඒ කියන්නේ එක පැත්තකින් ඔවුන්ට ආර්ථිකය දරාගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

Then, you all have certainly been showing that you are a frugal Government, but where is the benefit? I am happy that FL3 and FL4 licences have been issued, but by selling cars you have brought in only US Dollars 200 million. Earlier, it was shown as if, roughly, one vehicle would bring in US Dollars 200 million.

So, on that basis, it would have been better if this Government, instead of having 8,800 local government members including MMCs, reduced it to 4,000. Then, you would have saved Rs. 1.75 billion.

මේ විධියට මන්ත්‍රීවරු 8,800ක් නැතුව 4,000ට අඩු කළා නම් රුපියල් කෝටි 175ක් අවුරුද්දකට ඉතුරු වෙනවා. එතකොට අවුරුදු 4 කාල පරිච්ඡේදයට රුපියල් කෝටි 700ක් ඉතුරු වෙනවා. මෙහෙම තමයි කරන්න අවශ්‍ය වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ඔබතුමිය හරහා එක ඉල්ලීමක් කරනවා, Mattala Rajapaksa International Airport එක ගැන. අද එහි total debt servicing එක රුපියල් බිලියන 41.6යි. ඒ කියන්නේ රුපියල් කෝටි 4,160යි. මේකෙන් අවුරුද්දකට රුපියල් කෝටි 260ක් යනවා, වැටුප් ගෙවන්න. අද මේක ඉදිරියට ගෙනියන්න බැහැ. ඒ නිසා මේක වාණිජකරණය කරන්න. මේකේ ඒ කටයුතු කරන්න පටන් ගත්තා. නමුත් දැන් ඒවා නවත්වලා තිබෙනවා.

ඊළඟට SriLankan Airlines එක ගත්තොත්, සම්පූර්ණ ණය US Dollars 1.2 billion. ඒ කියන්නේ රුපියල් බිලියන 372ක්. ඒ වාගේම ඉදිරියට ගෙවන්න තිබෙන consolidated loss එක රුපියල් බිලියන 591යි. නැත්නම් ඇමෙරිකානු ඩොලර් බිලියන 1.8යි. ඒ නිසා මේ ආයතන අනිවාර්යයෙන්ම වාණිජකරණය කරන්න. එහි හොඳ සභාපතිවරයෙක් ඉන්නවා. නමුත් ඒ කාර්ය මණ්ඩලයත් සමඟ අනිවාර්යයෙන්ම මේ ආයතනය වාණිජකරණය කරන්න. නැත්නම් ඒක ආර්ථිකයට දරාගන්න බැරි තත්ත්වයකට තමයි තල්ලු වන්නේ.

මම තව තත්පරයයි ගන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අන්තිමට තිබෙන්නේ හම්බන්තොට වරාය. මේක එදා වාණිජකරණය කරපු නිසා අද අවුරුද්දකට රුපියල් බිලියන 25ක්, රුපියල් බිලියන 30ක් විතර ඉතුරු වෙනවා. ඒ වාගේ දේවල් තමයි කරන්න අවශ්‍ය වන්නේ.

Madam Presiding Member, you are in the Committee on the Public Finance. You know that we do not look at only the negative side or the liabilities in the balance sheet. We have public enterprises like the CEB, which has a very rich balance sheet of Rs. 4 trillion. That is not brought into accounts. Then, we have the RDA which has highways under it that bring in about Rs. 2 trillion. It must be ensured that these assets are accounted for, leveraged and taken into the assestability of the country.

Madam, my reflection on the Foreign Loans (Repeal) Bill is, repealing this law is good and the replacement is better, but I do not see the required professionalism there. You must have CFOs and Chartered Accountants; ensure that we put the right people in the right place and not square pegs in round holes. That is the only way we could get government servants motivated. Today, they are scared to death. You ask even the Secretary-General of Parliament.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Would you please wrap up, Hon. Member?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Okay, Madam.

You would find that the Secretary-General of Parliament, the Deputy Secretary-General of Parliament or the Assistant Secretary-General are worried to put their signature because if they do, somebody would send a petition and they would be questioned and might be handcuffed for no reason. So, as a result that, government servant is wondering, "Am I to develop the country or to save my skin?" At the moment, all the laws put together, government servant is already handcuffed. He has only to be arrested. So, the motivation aspect must be done and I call upon the Government to ensure that it is done.

මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවට ඇවිල්ලා ඉන්නවා. මම ලාල් කාන්ත ඇමතිතුමාට කියලා දුන්නේ ආර්ථිකය කොහොමද කරගෙන යන්නේ කියලායි. අපට එකට එකතු වෙලා අපේ ආර්ථිකය හදන්න පුළුවන් ගමනක් යන තත්ත්වයක් ඔබතුමන්ලා ඇති කරන්න. අපට අවුරුද්දකට බිලියන 5,000ක් හොයන්න තිබෙනවා. ඊට පසු අවුරුද්දට ඒක තවත් සියයට 5කින් වර්ධනය වෙනවා. ආර්ථිකය හැදුවේ නැත්නම්, අනෙක් මොන යුද්ධයක් දිනුවත් වැඩක් නැහැ. ඒ නිසා මේ ආර්ථික යුද්ධය දිනන්න, අපේ තරුණ තරුණියන්ට අනාගතයක් ඇති කරන්න, ලංකාව ලෝකයට ඒකාබද්ධ කරන්න. මතක තබා ගන්න, ලංකාව තිබෙන්නේ ලෝකය ඇතුළේ මිසක් ලෝකය තිබෙන්නේ ලංකාව ඇතුළේ නොවෙයි කියන එක.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සමන්ත රණසිංහ මන්ත්‍රීතුමා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා "NEXT" ආයතනය ගැන කිව්වා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මම උදේ ඒ ගැන විශේෂ ප්‍රකාශයක් කළා. මා හිතන විධියට ඔබතුමා ඒ වෙලාවේ සභාවේ හිටියේ නැහැ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම දැක්කා ඒක.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
BoI එකත්, "NEXT" ආයතනයේ management එකත් සමඟ අපි ඊයේ සාකච්ඡා කළා, දීර්ඝ වශයෙන්. මම අද පස් වරු 2.00ට වෘත්තීය සමිති සහ සේවකයන් නැවත රැස් කරනවා. ඇත්තටම මේක අපේ ආණ්ඩුවේ ප්‍රශ්නයක් නොවෙයි. මේක, ඔවුන්ගේ බිස්නස් එක වෙනුවෙන් ඔවුන් ගත්තු තීරණයක්. ඔවුන් කියන්නේ, පසුගිය වසර 5ක, 6ක කාලයක් තිස්සේ ඉඳන් ඩොලර් මිලියන 10කට වැඩි අලාභයක් සිදු වෙලා තිබෙනවා, ඒ නිසා තමයි එය වහන්නේ කියලා. නමුත්, ඔවුන්ගේ නවගත්තේගම සහ ආඬිගම කියන factories දෙක ඒ විධියටම ක්‍රියාත්මක වෙනවා. ඔබතුමා ඒ කරුණ මතු කළ නිසායි මට ඒ ගැන පැහැදිලි කරන්න ඕනෑ වුණේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඒ කාලයේ වාගේ අපි බෝඩ් ලෑලි අල්ලාගෙන නටන්නේ නැහැ. ඉතින් ඒකෙන් පෙනෙනවා, එතැන තිබෙන union එක ඔබතුමන්ලාගේ බව. [බාධා කිරීමක්] මෙය එතැනින් ඉවර වෙන්නේ නැහැ. [බාධා කිරීමක්] ඒගොල්ලන්ගේ තිබෙන්නේ- [බාධා කිරීමක්] අන්තිමේදී ඒ 1,400 දෙනාගේ- [බාධා කිරීමක්] ඒගොල්ලෝ හිතනවා- [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. කාරණය පැහැදිලියි. අපි ඊළඟ කථිකයාට අවස්ථාව ලබාදෙමු.

ගරු සමන්ත රණසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.41]

**ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා**
(மாண்புமிகு ஆர்.எம். சமந்த ரனசிங்ஹ)
(The Hon. R.M. Samantha Ranasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බොහොම ස්තුතියි, මට මේ අවස්ථාව ලබා දුන්නාට. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන නවක මන්ත්‍රීවරයකු හැටියටයි මා අද මේ ගරු සභාව ආමන්ත්‍රණය කරන්නේ.

මම මේ අවස්ථාවේ මුලින්ම මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ අපේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ගරු කෝසල නුවන් ජයවීර මන්ත්‍රීතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කරනවා. ඒ කාරණය මතක් කරන ගමන්ම තවත් කාරණයක් කියන්න තිබෙනවා. මට මේ පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව ලැබුණේ 42,000කට ආසන්න පිරිසක් ඡන්දය ලබා දුන් නිසා. ඒ වාගේම, ඒ සඳහා හිතවතුන් මට උදවු කළා. මම මේ අවස්ථාවේ ඒ අයත් මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මේ පාර්ලිමේන්තුව වාගේ උත්තරීතර ආයතනයකට ඒමට කවදාකවත් සිහින දැකපු අය නොවෙයි. මීට දශක දෙකකට කලින් තමයි, අපි මේ දේශපාලන ක්ෂේත්‍රයට අවතීර්ණ වුණේ. එදා අපි මේ පාර්ලිමේන්තුව තියා ප්‍රාදේශීය සභාවකවත් මන්ත්‍රී ධුරයක් බලාපොරොත්තුවක් නැතිව තමයි දේශපාලනයට අවතීර්ණ වුණේ; මේ ව්‍යාපාරය ගොඩ නඟන්න මහන්සි වුණේ. මොකද, තරුණයන් හැටියට අපි දැක්කා, මේ සමාජය විශාල අවුලක, වියවුලක, පැටලිල්ලක තිබෙන බව. සමාජය පැත්තෙන් විශාල පීඩනයක් එන මොහොතක ඒකට උත්තරයක් හොයන්න ගිහිල්ලා තමයි අපට මේ දේශපාලන ව්‍යාපාරය හමු වුණේ. අපි මේ දේශපාලන ව්‍යාපාරයේ වැඩ කරගෙන එද්දී අපට තිබුණේ එකම එක අරමුණයි. ඒ අරමුණ තමයි, මේ රට නිවැරදි මාවතකට යොමු කර ගන්න එක. මේ රට නිවැරදි මාවතට යොමු කර ගන්න කාලය ගැන හිතන්නේ නැතිව, අපේ පෞද්ගලික අනාගතය ගැන හිතන්නේ නැතිව, අපි මේ රටේ රාජ්‍ය ආංශයේ, පෞද්ගලික අංශයේ, වතු ක්ෂේත්‍රයේ වැඩ කරන ජනතාවත් එක්ක වැඩ කළා. ගොවි ජනතාවගේ ප්‍රශ්න අපි දැක්කා. මේ රටේ අහිංසක දුවා දරුවන්ගේ ප්‍රශ්න අපි දැක්කා. ඒවා නිවැරදි කරන්න තමයි මේ ගමන් මගට අපි ආවේ. හැබැයි, අපි හිතුවේ නැහැ මේ තරම් ඉක්මනට අපට රාජ්‍ය බලය ලබා ගන්න පුළුවන් වෙයි කියලා. නමුත් කියන්න සතුටුයි, ආදරණීය අම්මලා තාත්තලා, සහෝදර සහෝදරියන් ඇතුළු මේ රටේ මිනිස්සු -මේ රටේ ජනතාව- ඒක තේරුම් ගෙන, අප හඳුනු දේශපාලන ව්‍යාපාරය වැලඳ ගෙන ඒ සමඟ එකතු වුණා; එය ජයග්‍රහණය කරවන්න එකතු වුණා. විශේෂයෙන්ම පසුගිය සැප්තැම්බර් 21වැනි දා අපේ රටට ඓතිහාසික ජයග්‍රහණයක් ලබා දුන්නා, අපේ රටේ ආදරණීය ජනතාව.

ඒකෙන් පන්නරය ලබා දින 45කට ආසන්න කාලයක් ගත වනකොට මේ උත්තරීතර පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරු 159දෙනෙක් තෝරා එවලා ජනතාව අතිවිශාල බලයක් අපට හදලා දුන්නා. අප එතැන් පටන් මාස 5ක් වැඩ කරගෙන යද්දී, ඒ ජනාධිපතිවරයාගේ, ඒ ඇමතිවරුන්ගේ, ඒ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ දක්ෂ වැඩ කලාව, මේ රට ගොඩ නඟන වැඩ පිළිවෙළ දැකලා ඊළඟ අවස්ථාවේ පළාත් පාලන මැතිවරණයේදී මේ රටේ ජනතාව නැවත වතාවක් ජාතික ජන බලවේගය කෙරෙහි විශ්වාසය තබා දැවැන්ත ජයග්‍රහණයක් ලබා දුන්නා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ නිසා අපට දැන් ජනාධිපතිවරයෙක්, ශක්තිමත් හොඳ පාර්ලිමේන්තුවක් ලැබී තිබෙනවා. ඒ වාගේම ඒ වැඩ කටයුතු ග්‍රාමීය මට්ටමින් කරගෙන යෑම සඳහා විශාල පදනමක් වැටී තිබෙනවා, පළාත් පාලන ආයතන බහුතරයක බලය ජාතික ජන බලවේගයට ලබා දීම හේතුවෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මීට අවුරුදු 20කට කලින් මේ දේශපාලනයට අවතීර්ණ වනකොට අපට සිහිනයක් තිබුණා. අපි මැරෙන්න කලින් මේ රට නිවැරදි මාවතකට යොමු කර ගන්න අපට මොනවා හෝ කරන්න පුළුවන් නම් එය කළ යුතුයි කියන අධිෂ්ඨානය මත තමයි අපි මේ දේශපාලන ව්‍යාපාරයට අවතීර්ණ වුණේ. ඉතින්, මට හරිම සතුටක් දැනෙනවා. මොකද, මේ මාස 6ක ආණ්ඩුවෙන් අප බලාපොරොත්තු වුණු දේවල් ගම් බිම් මට්ටමින් දැන් ටික ටික ඉෂ්ට වෙමින් තිබෙනවා. මා හිතන විධියට, හිටපු පාලකයන් තව අවුරුදු සිය ගණනක් හිටියත් වෙනස් කර ගන්න බැරි වුණු බොහෝ දේවල් මේ මාස 6ට වෙනස් වෙලා තිබෙනවා; වෙනස් වෙමින් තිබෙනවා. විශේෂයෙන්ම අපේ රටේ

දේශපාලන ක්ෂේත්‍රය ගඳ ගහන, කැත ක්ෂේත්‍රයක් විධියට තමයි තිබුණේ. හැබැයි, දැන් මේ රටේ දේශපාලන සංස්කෘතිය ඉතාම නිවැරැදි තැනකට වෙනස් වෙලා තිබෙනවා; වෙනස් වෙමින් තිබෙනවා. අප අතරින් වුණත් චුටි චුටි අඩු පාඩුකම් වෙන්න පුළුවන්. නමුත්, ඒවා අප හිතා මතා හෝ සැලසුම් සහගතව කරන ඒවා නොවෙයි.

මේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් වෙලා තිබෙනවා. ඒක අප ලැබූ විශාල ජයග්‍රහණයක්. ඒ වාගේම, මේ රටේ ජනතාවත් දේශපාලන සංස්කෘතියේ යම් වෙනසක් ඇති කර ගනිමින් ඉන්නවා. මේ රටේ ජනතාව එක්ක අපි තවදුරටත් සාකච්ඡා කරගෙන යනවා. අපි අපේ සිතුම් පැතුම්වල, අපේ සංස්කෘතියේ, අපේ ඇවතුම් පැවතුම්වල විශාල වෙනස්කමක් කර ගන්න ඕනෑ. මොකද, අපේ රට අඳුරු අගාධයකයි තිබුණේ. විශේෂයෙන්ම අපේ ගරු ඇමතිවරු ඉතාම කාර්යශූරව පැය 10, 12, 15, සමහර අය පැය 18 නිදි නොලබා තමන්ගේ ක්ෂේත්‍රයේ ගැටලු හඹාගෙන යනවා; මිනිස්සු හමු වෙනවා; මහජන දින පවත්වනවා; මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා; විශාල කැපවීමක් කරනවා. මට ඒ ගැන හරිම සතුටුයි. අපි සිතුවාට වඩා මේ මාස 6 තුළ විවිධ ක්ෂේත්‍රවල විශාල පරිවර්තන සිදු වෙනවා. ජනතාව ඒක දකිනවා.

මම ඊයේ දැක්කා, අපේ ගරු ප්‍රවාහන, මහාමාර්ග අමාත්‍යතුමා මාධ්‍ය සාකච්ඡාවකදී රටට හෙළිදරව් කළා, මේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ මගියා පීඩාවට පත් වන ආකාරය පිළිබඳව. එතුමා මේ ඛේදවාචකය මැනවින් අවබෝධ කරගෙන, ඉතාම දක්ෂ ලෙස ඒ ක්ෂේත්‍රයේ විශාල පරිවර්තනයකට අත්තිවාරම දමනවා. අපේ රටේ මගී ජනතාව විශාල ඛේදවාචකයකට ලක් වෙලා සිටියා. අන්න ඒකෙන් ඔවුන් මුදා ගැනීම සඳහා ඉතාම හොඳ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබෙනවා. එහි අඩු පාඩු ඇති. අපි එකතු වෙලා ඒවා වෙනස් කර ගනිමු.

අධ්‍යාපන ක්ෂේත්‍රයේත් දීර්ඝ කාලයක් තිස්සේ විශාල ගැටලු ප්‍රමාණයක් ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන්ම දරුවන්ගේ පැත්තෙන්, ගුරුවරුන්ගේ පැත්තෙන්, දෙමාපියන්ගේ පැත්තෙන් ගත්තාම, පසුගිය කාලයේ විශාල අඩු පාඩු ප්‍රමාණයක් තිබුණා. මෙය අපේ රටේ ජනතාව විශාල පිරිසක් පීඩා විඳපු ක්ෂේත්‍රයක්. ඒ ක්ෂේත්‍රයට අලුත් යෝජනා ගෙනැල්ලා, ඒ පිළිබඳව සාකච්ඡා ඇති වෙමින් තිබෙනවා. ඒ ක්ෂේත්‍රයේ දරුවන්ට, ගුරුවරුන්ට, දෙමාපියන්ට අදාළව අලුත් යෝජනා කිහිපයක් සාකච්ඡා වෙමින් තිබෙනවා. ඒක අප ලබපු විශාල ජයග්‍රහණයක්.

අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළත් විශාල අඩු පාඩු තිබුණා. රෝගීන් විශාල ලෙස පීඩාවට පත් වුණා. විශේෂයෙන්ම ඖෂධ මාෆියාව, රෝහල්වල විවිධ සංවර්ධන වැඩවලදී සිදු වුණු අඩු පාඩු නිසා මේ රටේ ජනතාව විශාල වශයෙන් පීඩාවට පත් වුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් මිනිත්තු 2ක කාලයක් තිබෙන්නේ.

**ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා**
(மாண்புமிகு ஆர்.எம். சமந்த ரனசிங்ஹ)
(The Hon. R.M. Samantha Ranasinghe)
හොඳමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අපි සෞඛ්‍ය ක්ෂේත්‍රයත් දියුණු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද සාකච්ඡාවට බඳුන් වන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත ගනිමු. අධිකරණ ක්ෂේත්‍රය තුළ මේ වන විට විශාල තද බදයක්, හිරවීමක් තිබෙනවා වාගේම සාමාන්‍ය ජනතාව විශාල පීඩාවකට පත් වෙලා ඉන්නවා. මේ පනත් කෙටුම්පත කියවන කොට, මේ ගැන අධ්‍යයනය කරන කොට වාගේම අද උදේ ගරු අමාත්‍යවරයා කළ පැහැදිලි කිරීම අහගෙන ඉන්න කොට මට පෙනී ගියා, මේ ක්ෂේත්‍රයේ විශාල පිම්මකට අවශ්‍ය සංශෝධනයක් තමයි අද සිදු වෙමින් තිබෙන්නේ කියලා. විශේෂයෙන්ම අධිකරණ ක්ෂේත්‍රය තුළ තිබෙන විශාල ගැටලු ගණනාවකට උත්තර ලැබෙනවා, අලුත් තාක්ෂණය එම ක්ෂේත්‍රයට එකතු කිරීම මඟින්.

අපේ රටේ දුර බැහැර සිටින අම්මලා, තාත්තලා විශාල වැය බරක් දරනවා, විශාල පීඩනයක් දරනවා, විශාල බියක් දක්වනවා උසාවිවලට එද්දී. එහෙම එන අයට වැඩි කාලයක් රස්තියාදු වෙන්න සිදු වෙනවා. නමුත්, පනත සංශෝධනය කළාට පසුව අපට මේ ක්ෂේත්‍රය තුළ ඉදිරි පිම්මක් ගන්න පුළුවන්. ඒකත් අප රටක් හැටියට ලබපු විශාල ජයග්‍රහණයක්. ඒ සියලු ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් අපේ කාලය, ශ්‍රමය වැය කරමින් මේ රට නිවැරැදි මාවතකට යොමු කරන්න අපේ උපරිම ශක්තිය යොදවන බව ප්‍රකාශ කරමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[பி.ப. 1.51]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, விசேடமாக, இந்த அரசாங்கம் ஆட்சியமைத்து ஏழு மாதங்கள் கடந்திருக்கின்ற நிலையிலே, நாட்டில் பொருளாதார ரீதியாக என்ன மாற்றம் ஏற்பட்டிருக்கின்றது? நாடு எந்த நிலையில் செல்லுகின்றது? நாட்டின் உற்பத்தித் திறனை, பொருளாதாரத்தை வளர்க்கக்கூடியதான எத்தகைய திட்டங்கள் செயற்படுத்தப்படுகின்றன? என்ற விடயங்கள் பற்றி ஆராயும்போது, அவை தெளிவாக இல்லாத ஒரு நிலையிலே இந்த அரசு சென்றுகொண்டிருப்பது உண்மை யாகக் கவலையளிக்கின்ற ஒரு விடயமாக இருக்கின்றது. நாட்டிலே எங்களுடைய மக்கள் வறுமையிலிருந்து நீங்கி யிருக்க வேண்டும் என்றால் அல்லது எமது நாட்டின் பொருளாதாரத்தை நாங்கள் உயர்த்த வேண்டுமென்றால், மீண்டும் மீண்டும் வெளிநாடுகளிடமும் IMFஇடமும் கடன் பெறுவது ஒரு தீர்வாகவோ, ஒரு சாதகமான சூழ்நிலை யாகவோ அமையாது.

இந்த அரசு பதவியேற்றுச் சுமார் ஏழு மாதங்களில் நாட்டின் பொருளாதாரத்தை உயர்த்துவதற்காக என்ன திட்டங் களைச் செய்தது? நாட்டிலே வறுமையை ஒழிப்பதற்காக என்ன முயற்சிகளை மேற்கொண்டது? புதிய புதிய முதலீடுகளை இந்த நாட்டுக்குக் கொண்டுவந்ததா? அல்லது உற்பத்தித் திறனை ஏற்படுத்தி ஏற்றுமதிப் பொருளாதாரத்தை வலுப்படுத்தியதா? என்ற விடயங்கள் பற்றி நாங்கள் கேள்விகேட்க வேண்டியவர்களாக இருக்கின்றோம். இதே நிலை தொடருமானால், இந்த நாட்டிலே உப்பு விலை மற்றும் மின்சாரக் கட்டண உயர்வு மட்டுமல்ல, ஏனைய அனைத்து விடயங்களுக்குமான செலவினங்களும் உயர்ந்து செல்லக் கூடிய ஒரு நிலைமைதான் ஏற்படும். இந்தச் சுமைகள்

[ගරු කවින්දිරන් කෝඩීස්වරන් මහතා]

அனைத்தும் ஏழை மக்களின் முதுகிலே சுமத்தப்படுகின்ற ஒன்றாகவே காணப்படும். ஆகவே, இந்த நாட்டில் சரியான முறையில் பொருளாதாரத்தைத் திட்டமிட்டு, மக்களின் வாழ்வாதாரத்தை உயர்த்தக்கூடிய செயற்றிட்டங்களை அரசு முன்வைக்கவேண்டும்.

ஊழல்வாதிகளுக்குத் தண்டனை வழங்கப்படவேண்டும் என்பது நாங்கள் ஏற்றுக்கொள்ளக்கூடிய ஒரு விடயம்தான். அந்த வகையில், முன்னைய அரசாங்களின் குறைகளைப் பல்லவியாக மீண்டும் மீண்டும் சொல்லிக்கொண்டிருக்க வேண்டாம். அது ஒரு புறமிருந்தாலும், அதனையே திரும்பத் திருப்பச் சொல்லிக்கொண்டிருக்காமல், நாட்டின் பொருளாதார அபிவிருத்தி, பொருளாதார உற்பத்தி, பொருளாதாரத் திறன் போன்றவற்றில் கூடுதலான அக்கறையைக் கொண்டிருக்க வேண்டுமென்று நான் இந்த இடத்தில் அரசிடம் தாழ்மையாக வேண்டிக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து விசேடமாக, எங்களுடைய மத, கலாசாரத்தோடு சம்பந்தப்பட்ட ஒரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். அதாவது, இந்து மக்கள் காலங்காலமாகத் தொன்றுதொட்டுப் பழைமையாகக் கடைப்பிடித்து வருகின்ற மத விழுமியங்களை நாங்கள் ஏற்றுக்கொள்ள வேண்டும்; அதற்குரிய மதிப்பை அளிக்கவேண்டும். அவ்வாறான ஒன்றுதான் கதிர்காம பாத யாத்திரை. அதாவது, யாழ்ப்பாணம் செல்வச்சந்நிதியில் இருந்து பாத யாத்திரிகள் உகந்தையை வந்தடைந்து அங்கிருந்து காட்டுவழிப் பாதையூடாகக் கதிர்காமத்திற்குப் பாத யாத்திரை செல்வது வழமை. இது வழமையாக ஆடி மாதத்தில்தான் நடைபெறுகின்றது. அதுபோல், இந்துக்களால் பாரம்பரியத் திருவிழாவாகக் கடைப்பிடித்து வரப்படுகின்ற ஆடிவேல் விழா ஆடி மாதத்தில் நடைபெறுவதுதான் வழக்கம். ஆனால், இந்தமுறை ஆடி மாதத்தில் நடைபெறவேண்டிய ஆடிவேல் திருவிழாவின் மதச் சடங்குகளை ஒரு மாதத்திற்கு முன்னர் மாற்றி, ஆனி மாதத்தில் நடைபெறும் ஆனிவேல் திருவிழாவாக ஆக்கப்பட்டுள்ளது. இந்துக்களின் மனதைப் புண்படுத்துகின்ற ஒரு செயற்பாடாகத்தான் இதனை நாங்கள் பார்க்கின்றோம். ஏனென்றால், கதிர்காமத்திற்குப் பாத யாத்திரை செல்வதற்காக யாழ்ப்பாணத்திலிருந்து வருகின்ற யாத்திரிகள் தங்களின் மதக் கடமைகளைச் சரிவரச் செய்வதற்காக ஒரு கால ஒழுங்கின் அடிப்படையிலேயே வருகை தருகின்றார்கள்.

எனவே, இவ்வாறு திடீரென்று எடுக்கப்பட்ட முடிவானது, அதாவது அம்பாறை மாவட்டத்தில் கச்சேரியில் இருக்கின்ற அரசாங்க அதிபருடனோ அல்லது அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற இந்து மதத் தலைவர்களுடனோ கலந்தாலோசிக் காமல், கதிர்காமத்தில் இருக்கின்றவர்களும் அதேபோன்று கண்டியில் இருக்கின்ற பௌத்த பீடாதிபதிகளும் தன்னிச்சை யாக எடுத்த முடிவானது, இந்து மக்களின் மனதை நோகடிக்கின்ற ஒரு விடயமாக இருக்கின்றது. "மத, கலாசாரங்களில் நல்லிணக்கம் இருக்க வேண்டும்; இன, மத பாகுபாடு இருக்கக்கூடாது" என்று சொல்கின்ற இந்த அரசாங்கம் தொடர்ச்சியாக இந்த விடயங்களில் மீண்டும் மீண்டும் பிழைகளைச் செய்யக்கூடாது என்று இந்த இடத்தில் நான் தாழ்மையாகக் கேட்டுக் கொள்கின்றேன்.

அதுபோல, அம்பாறை மாவட்டத்தில் தமிழர்கள் நூறுவீதம் செறிந்து வாழ்கின்ற வீரமுனைப் பிரதேசத்திலே அமைந்துள்ள அருள்மிகு ஸ்ரீ சிந்தாயாத்திரைப் பிள்ளையார் ஆலயமானது நான்காம் நூற்றாண்டில் சீர்பாததேவி ஆண்ட காலத்தில் உருவாக்கப்பட்ட மிகப் பழமையான ஆலயமாகும். அந்த ஆலயத்தை மையப்படுத்தி அக்கிராமத்தில் ஒரு வளை கோபுரத்தை அமைப்பதற்கான முயற்சிகளை அங்குள்ள மக்கள் மேற்கொண்டார்கள். ஆனால், குறித்த சில அடிப்படை மதவாதிகள், அடிப்படைச் சிந்தனைவாதிகள், சில அரசியல்வாதிகள் அந்த வளைகோபுரத்தை அமைப்பதற்குத் தடங்கல்களை ஏற்படுத்தி அதனை எதிர்த்திருக்கிறார்கள். உண்மையில் அந்த வளைகோபுரம் அமைப்பதற்காக உரிய திணைக்களங்களிடம் அனுமதி பெறப்பட்டிருந்தும்கூட, திட்டமிட்ட வகையில் அதனைத் தடுத்து நிறுத்தியதை இன நல்லிணக்கத்தைப் பாதிக்கக்கூடிய ஒரு விடயமாகத்தான் நாங்கள் பார்க்கின்றோம். சம்மாந்துறை பிரதேசத்திலே அதிகமான இடங்களில் வீதிகளில் வளைகோபுரங்கள் அமைக்கப்பட்டிருக்கின்றன. அதற்கு தமிழர்கள், இந்துக்கள் எந்தவிதமான எதிர்ப்பும் தெரிவித்திருக்கவில்லை. ஆனால், வீரமுனைப் பிரதேசத்தில் பழைமை வாய்ந்த ஆலயத்திற்கு வளைகோபுரத்தை அமைப்பதற்கான முயற்சிகளை எடுத்தபோது அதனைத் தடுத்திருக்கின்ற செயற்பாட்டினை இன நல்லிணக்கத்திற்குக் குந்தகம் விளைவிக்கின்ற ஒரு விடயமாகத்தான் நாங்கள் பார்க்கின்றோம். ஆகவே, அடிப்படை மதவாதச் சிந்தனை உடையவர்கள் அத்தகைய செயற்பாடுகளை நிறுத்த வேண்டும்; அதற்கு இந்த அரசு உதவிபுரிய வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அதுமட்டுமன்றி அம்பாறை மாவட்டத்தில் காணி சம்பந்தமான பிணக்குகள் மிக அதிகமாகக் காணப்படுகின்றன. விசேடமாக, பொத்துவில் கனகர் கிராமத்திலே வாழ்ந்த கிட்டத்தட்ட 196 குடும்பங்கள் யுத்தத்தின் காரணமாக 1983 - 1990ஆம் ஆண்டு காலப்பகுதியிலே தமது வீடு வளவுகளை, காணிகளை, விவசாயத்தை, கால்நடைகளை விட்டுவிட்டு தூர இடங்களுக்கு இடம்பெயர்ந்திருந்தார்கள். ஆனால், அவர்களில் 76 குடும்பங்களுக்கு மட்டும்தான் அந்த இடத்தில் மீள்குடியேற்றத்திற்காக 2018ஆம் ஆண்டு காணி வழங்கப் பட்டிருந்தது; மீதமுள்ள குடும்பங்களுக்கு அந்தக் காணியை வழங்குவதற்கான முயற்சிகளை அரசு இன்னும் மேற்கொள்ளவில்லை. ஆனால், 196 குடும்பங்கள் அங்கே இருந்ததற்கான அத்தாட்சி ஆவணங்கள் முழுவதும் அரசாங்க அதிபர் அலுவலகத்திலே - கச்சேரியிலே - இருக்கின்றது. மீள்குடியேற்றத்திற்காகக் காணிகள் வழங்கப்பட்ட அந்த 76 குடும்பங்களுக்கும்கூட வீட்டு வசதிகளையோ அல்லது அடிப்படை வசதிகளையோ அரசு இன்னமும் செய்து கொடுக்கவில்லை. அதற்கான நடவடிக்கைகளை இந்த அரசு செய்ய வேண்டும். இடம்பெயர்ந்திருந்தவர்களுக்கான அடிப்படை வீட்டு வசதிகளை, வீதி மற்றும் அடிப்படைக் கட்டுமான வசதிகளைச் செய்து தருவதாகக் கடந்த 3 - 4 மாதங்களுக்கு முன்பும்கூட இந்த அரசு சொன்னது. ஆனால், அந்த விடயங்கள் இன்னும் நடைபெறவில்லையென்பதை இந்த இடத்திலே கூறவிரும்புகின்றேன். ஆகவே, இந்த விடயத்தில் அரசு முழுக் கவனமெடுத்து அந்த 76 குடும்பங்களுக்கு மட்டுமல்லாமல், 196 குடும்பங்களுக்கும் அந்த இடத்தில் காணிகள், வீடுகள், வீதிகள், ஏனைய அடிப்படைக் கட்டுமான வசதிகளை ஏற்படுத்திக்கொடுக்க வேண்டுமென்று இந்த உயரிய சபையிலே தாழ்மையுடன் கேட்டுக் கொள்கின்றேன்.

அதுபோல், விசேடமாக, சம்மாந்துறை, மல்வத்தைப் பிரதேசத்தில் இருக்கின்ற தொட்டாச்சிணுங்கிவட்டைப் பகுதியில் இருக்கின்ற 176 ஏக்கர் காணிக்குரிய மக்கள் அதற்குரிய permit, அத்தாட்சி ஆவணங்கள் அனைத்தையும் வைத்திருந்தும் இவர்கள் யுத்த காலத்திலே இடம்பெயர்ந்த பின்னர் குறித்த காணியை வேறு நபர்கள் பிடித்துவைத்

திருக்கிறார்கள். ஆகவே, குறித்த காணியை உரியவர்களுக்குப் பெற்றுக் கொடுக்க வேண்டும். ஏனென்றால், அதற்கான சகல ஆவணங்களும் அவர்களிடம் இருக்கின்றன. இதிலேயுள்ள பிரச்சினை என்னவென்றால், இந்தப் பிரதேசத்தை உரிமை கொண்டாடுவது சம்மாந்துறைப் பிரதேச செயலகமா அல்லது உகணை பிரதேச செயலகமா என்பதில் பிணக்கு இருப்பதனால் அவர்களுக்குரிய காணி கொடுக்கப்பட வில்லையென்று அரசாங்க அதிபர் சொல்கின்றார். எனவே, சகல ஆவணங்களையும் வைத்திருக்கின்ற, அதனைத் தொடர்ச்சியாகப் பயன்படுத்தி வந்தவர்களிடம் அந்தக் காணியைத் தயவுசெய்து இந்த அரசாங்கமானது கையளிக்க வேண்டுமென்று இந்த உயரிய சபையில் நான் கேட்டுக் கொள்ள விரும்புகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.01]

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මම පළමුවෙන්ම පළාත් පාලන මැතිවරණයේදී අපේ පක්ෂයට ඡන්දය දුන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාව ඇතුළු අපේ රටේ සමස්ත ජනතාවට මේ අවස්ථාවේදී විශේෂ ස්තුතියක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම පක්ෂයක් විධියට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ වැටෙන්න පුළුවන් උපරිමයටම වැටුණා. ජනාධිපතිවරණයේදී සියයට 2.5ට, පාර්ලිමේන්තු මැතිවරණයේදී සියයට 3ට අපි වැටුණා. මීට මාස 7කට කලින් මට තිබුණු ලොකුම ප්‍රශ්නය තමයි, පාර්ලිමේන්තු මැතිවරණයට 10දෙනෙකුට නාම යෝජනා ලබා දෙන එක. ඒක තමයි මට තිබුණු ලොකුම ප්‍රශ්නය. නමුත්, මාස 7ක් වැනි කෙටි කාලයක් තුළදී ලංකාවේ පසුගිය මැතිවරණවලදී ගත්ත වැඩිම වර්ධනය -ඡන්ද වශයෙන් ගත්තත් ඡන්දවලින් වැඩිම වර්ධනය, ප්‍රතිශතය වශයෙන් ගත්තත් ප්‍රතිශතවලින් වැඩිම වර්ධනය- ලබා ගත් පක්ෂය බවට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පත් කරන්න අද වනකොට රටේ ජනතාව තීරණය කර තිබෙනවා. මිලියනයකට ආසන්න වෙච්ච ඒ ඡන්ද දායකයන් සියලුදෙනාට මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අපි වැටුණු වෙලාවේ, අපට ආසන සංවිධායක කෙනෙක් හරියට නැතුව හිටපු වෙලාවේ, අපේ නායකයෝ අප දාලා ගිය වෙලාවේ, පාර්ලිමේන්තුව ඇතුළේ නියෝජිතයෝ තුන් දෙනෙක් විතරක් ඉන්න වෙලාවේත් සහයෝගය ලබා දීලා මිලියනයකට ආසන්න ඡන්ද ප්‍රමාණයක් අපට ලබා දීම පිළිබඳව මම ඒ ජනතාවට නැවතත් ස්තුතිවන්ත වෙනවා.

ටී.බී. සරත් නියෝජ්‍ය ඇමතිතුමා හිනා වෙවී ඉන්නවා. වැඩිය හිනා වෙන්න එපා. ඔන්න, දැන් සියයට 18ක්,-

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
2018දී පළාත් පාලන ආයතන 226ක්ම ගත්තා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ඇත්ත. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, 2016දී සහ 2018දී අපි පළාත් පාලන ආයතන 226ක් ජයග්‍රහණය කළා. එතකොට ඔබතුමන්ලා ලබා ගත්තේ සියයට 6යි. සියයට 6 හිටපු ඔබතුමන්ලා අද වනකොට පළාත් පාලන මැතිවරණය විතරක් නොවෙයි, ජනාධිපතිවරණයත්, පාර්ලිමේන්තු මැතිවරණයත් දිනුවා. හැබැයි, ඔබතුමන්ලාට සියයට 6ට එන්න අවුරුදු 60ක් ගත වුණා; සියයට 6ට එන්න ඔබතුමන්ලාට අවුරුදු 60ක් ගත වුණා. ඔබතුමන්ලාට ආණ්ඩුවක් පිහිටුවන්න අවුරුදු 60ක් ගත වුණා. තුනෙන් දෙකක් ගන්න අවුරුදු 60ක් ගත වුණා. හැබැයි, අපේ සියයට 2.5, සියයට 10ට වැඩි කර ගන්න, එහෙම නැත්නම් ඡන්ද මිලියනයකට වැඩි කර ගන්න අපට ගත වුණේ මාස 7යි. ඔබතුමන්ලා එදා අපි සියයට 2.5ක් ගත්ත වෙලාවේත් හිනා වුණා. සියයට 3 වනකොටත් හිනා වුණා. තව හිනා වෙන්න. අපි කැමතියි, තව හිනා වෙනවාට. දන්නේම නැතුව ඔබතුමන්ලා සියයට 3ට වැටෙනකල්ම ඔය වාගේ හිනා වෙවී ඉන්න.

ලංකාවේ ඡන්ද ප්‍රමාණයෙන් නොවෙයි, වැටුණු ඡන්ද ප්‍රමාණයෙන් සියයට 18ක් ඔබතුමන්ලාට අඩු වෙලා තිබුණා. ගොඩක් අය කථා කරද්දී කියන කාරණයක් තමයි, දැන් අපේක්ෂකයෝ වැඩි වෙලා කියන එක. අපේක්ෂකයෝ වැඩි වෙච්ච නිසා තමයි ඡන්ද අඩු වෙන්නේ. ඉතින්, ඔබතුමන්ලාගේ මාලිමාවේත් අපේක්ෂකයෝ වැඩි වුණා. හැම පක්ෂයකම අපේක්ෂකයෝ වැඩි වෙනවා. හැබැයි, ලංකාවේ ඡන්ද භාවිතාව අඩු වෙද්දීත් අපේ ලක්ෂ 6කට වඩා ඡන්ද වැඩි කරන්න කටයුතු කරපු සියලුදෙනාට මම ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉස්සර නම් කිව්වේ ස්වාධීන කණ්ඩායම්වල ඉන්නේ හොරු කියලා. ස්වාධීන කණ්ඩායම්වලින් පරණ හොරු එනවා කිව්වා. ඒ පොහොට්ටුවේ හොරු තමයි ඡන්ද ඉල්ලන්නේ කිව්වා. හැබැයි, එහෙම කියපු අය මේ දවස්වල සභා පිහිටුවන්න නම් රට රට හොරු ළඟට එනවා. දැන් අලුත් ක්‍රමයකට එන්නේ. අපේ අපේක්ෂකයාගේ phone එකට call එකක් දුන්නොත් ඒකේ recording දාලා ද කියලා භයයි. ඒ නිසා ගමේ අපේක්ෂකයා ගෙදරට ඇවිල්ලා phone එක දෙනවා. හැබැයි, phone එකේ recordings නැති වුණාට, ගෙදර CCTV තිබෙනවා. ඒ නිසා පොඩ්ඩක් පරිස්සම් වෙන්න. දැනටම අපි ළඟ එක CCTV පටියකුත් තිබෙනවා. හෙට-අනිද්දා වෙනකොට ඒක අපි එළියට දාන්නම්. ඔය රට රට හම්බවෙන්න එන අය ඒ දවස්වල නම් හොරු. දැන් හොඳයි නේද? දැන් සභාව පිහිටුවා ගන්න බැරි වෙනකොට ඒ දවස්වල හොරු හොඳයි. අර ස්වාධීන කණ්ඩායම්වලින් එනවා කියපු හැංගිච්ච හොරු ටික අද හොඳයි. බලය ගන්න ඕනෑ වුණාම කබරගොයා, තලගොයා වෙන න්‍යාය අනුව අද මාලිමාවට යන්න වෙලා තිබෙනවා. ඒක, එක කාරණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම අපි දන්නවා, පළාත් පාලන ආයතනවලින් හිතපු තරම් ජයග්‍රහණ ඔබතුමන්ලාට ලැබුණේ නැහැ කියලා. ඔබතුමන්ලා බලාගෙන හිටපු සියයට 70, ඔබතුමන්ලාගේ ලේකම් ටිල්වින් සිල්වා මහත්මයා කියපු සියයට 70 ගන්න බැරි වුණා. ඒකත් එක්ක පාර්ලිමේන්තුවේ දැන් වෙනසක් පෙනෙනවා නේද? වෙන දා වැඩිය කෑ ගැහුවේ නැහැ නේද, ටී.බී. සරත් නියෝජ්‍ය ඇමතිතුමනි? වෙන දා වාගේ නොවෙයි, දැන් සද්දය පොඩ්ඩක් වැඩි වෙලා. පොඩ්ඩක් දැන් කලබල වෙලා ඉන්නේ. ඒ නිසා පළාත් පාලන මැතිවරණයෙන් බැරි වෙනකොට දැන් උත්සාහ කරනවා, සිවිල් ආරක්ෂක කමිටු, එහෙම නැත්නම් මහජන ආරක්ෂක කමිටු පිහිටුවන්න. ඒවාට කවදාවත් දේශපාලන බලපෑම් තිබුණේ නැහැ.

[ගරු ඩී.වී. චානක මහතා]

ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. අද නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ අත්සනින් චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවා, ගමේ මහජන ආරක්ෂක කමිටු පිහිටුවීමේදී අනිවාර්යයෙන්ම සංවර්ධන කමිටුවේ සභාපතිවරයාගේ මහ පෙන්වීම, දායකත්වය ගන්න කියලා. මොකක්ද සංවර්ධන කමිටුවේ සභාපතිවරයාට තිබෙන තැන? මොකක්ද මේකෙන් කරන්නේ? ගමේ තිබෙන මහජන ආරක්ෂක කමිටුවත් දේශපාලනීකරණය කරන්නයි මේ සූදානම් වෙන්නේ. ඉස්සර නම් ගමේ පන්සලේ නායක හාමුදුරුවෝ, පල්ලියේ සිටින ආගමික නායකයන්, ගමේ සිටින ක්ෂේත්‍ර නිලධාරින්, ග්‍රාම නිලධාරිතුමන්ලා, ගමේ ඉන්න volunteersලා එකතු කරගෙන තමයි මේ කමිටුව හැදුවේ. හැබැයි, අද මොකක්ද කියන්නේ? අද චක්‍රලේඛයක් එවනවා, සංවර්ධන කමිටුවේ සභාපතිගේ දායකත්වය ගන්න කියලා. දැන් මොකක්ද මේ කරන්න යන්නේ? මේකත් දේශපාලනීකරණය කරන්න ඔබතුමන්ලා උත්සාහ කරනවා. ඊළඟට කියනවා, Clean Sri Lanka එකේ දෙදෙනෙකුත් අනිවාර්යයෙන් ඒකට දමා ගන්න ඕනෑ කියලා. *[බාධා කිරීමක්]* අමාරු නැහැ, දේශපාලනීකරණය කරන්නේ නැහැයි කියනවා. පොලීසිය තිබෙන්නේ, ගමේ ආරක්ෂක කමිටු තිබෙන්නේ දේශපාලනය කරන්න නොවෙයි.

ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරයෙක් කියනවා අපි අහගෙන හිටියා, පොඩි ප්‍රශ්න ටිකක් තමයි දැන් තිබෙන්නේ කියලා. මොනවාද තිබෙන පොඩි ප්‍රශ්න? පොල් නැහැ, හාල් නැහැ, ඒ වාගේම ලුණු නැහැ. ඔබතුමන්ලාට නම් ඒවා පොඩි ප්‍රශ්න වෙන්න පුළුවන්. හැබැයි, මිනිස්සුන්ට කන්න නැති වෙන එක පොඩි ප්‍රශ්නයක් නොවෙයි. රුපියල් 100ට තිබුණු ලුණු පැකට් එකක මිල රුපියල් 300ක්, 400ක් දක්වා වැඩි වෙන්න බලපෑ හේතුව මොකක්ද? ඒකට හේතුව මොකක්ද ඇමතිතුමා? *[බාධා කිරීමක්]* නැහැ, යන්න වුණේ නැහැ තවම. *[බාධා කිරීමක්]* මොකක්ද ඇමතිතුමා? ඇහුණේ නැහැ. මයික් එකෙන් කියන්නකෝ, ඇහෙන්නේ නැහැ. රුපියල් 300ට, රුපියල් 400ට ලුණු පැකට් එකේ මිල වැඩි වුණේ ඇයි? ලංකාවේ දැන් ලුණු හදන ප්‍රධාන තැන් පහයි තිබෙන්නේ, ඇමතිතුමනි. *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
සතොසේ ලුණු පැකට් එකක් රුපියල් 120යි. තංගල්ල සතොසේ රුපියල් 120ට තිබෙනවා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
සතොසෙන් විතරක් ලුණු ගන්න පුළුවන් නම්,- *[බාධා කිරීමක්]* ලංකාවේ මිනිස්සු දැන් හැම තැනම ලුණු හොය හොයා යන්නේ නැද්ද බිමල් රත්නායක ඇමතිතුමා? *[බාධා කිරීම්]* ලුණු හොය හොයා යන්නේ නැද්ද? ලංකාවේ ලුණු ප්‍රශ්නයක් තිබෙනවා. රුපියල් 300යි, රුපියල් 400යි දැන් ලුණු කිලෝවක මිල. ලංකාව පුරා සතොස ශාඛා කීයක් තිබෙනවාද කියන්නකෝ. ඒවායෙන් කීයක දැන් ලුණු තිබෙනවාද කියන්නකෝ. *[බාධා කිරීම්]* දැන් ලුණු නැහැ. *[බාධා කිරීම්]* අද වනවිට ලංකාවේ ලුණු හදන තැන් 5යි තිබෙන්නේ. මන්නාරම ලේවායේ මෙට්‍රික්ටොන් 6,500ක් හදනවා; හම්බන්තොට මෙට්‍රික්ටොන් 60,000ක් හදනවා. අලිමංකඩ මෙට්‍රික්ටොන් 17,000යි, බූන්දල මෙට්‍රික්ටොන් 18,000යි, පලටුපානේ මෙට්‍රික්ටොන් 22,000යි. ඒ අනුව මෙට්‍රික්ටොන් 100,000කට ආසන්න ප්‍රමාණයක් ලුණු හදන්නේ මේ කියන ස්ථාන 5 තුළ. පසුගිය මාස 3 තුළ ඔබතුමන්ලාට මේ ස්ථාන 5න් ලුණු හදා ගන්න බැරි වුණා නම්, ඇයි ඒ ගැන දැනගෙන හිටියේ නැත්තේ? ලුණු හදා ගන්න බැරි නම්, ඔබතුමන්ලාට නිසි වෙලාවට ලුණු ආනයනය කරන්න තිබුණා. හැබැයි මොකක්ද කළේ? රුපියල් 100ට තිබුණු ලුණු පැකට් එකක මිල රුපියල් 400ට ගියාට පස්සේ තමයි ලුණු ආනයනයට පර්මිට් එක දෙන්නේ.

ලුණු ගෙනෙන එක open කළාම මොකද වෙන්නේ? සහල්වලින් කෝටි 200ක් වංචා වුණු විධියටම ලුණුවලිනුත් කෝටි ගාණක් වංචා කරන්න හදපු පාර තමයි මේක. ටෙන්ඩර් නැතිව කෙළින්ම open කරනවා, ලුණු ගෙනෙන්න. රුපියල් 100ට තිබුණු ලුණු කිලෝ එක රුපියල් 400ට යනවා. අලුතින් ආනයනය කරන ලුණුත් ඒ මිලටම විකුණලා රටේ ජනතාවට කෝටි ගණනක වංචාවක් කරන්න තමයි මේ සූදානම් වෙලා ඉන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එච්.එම්. සරත් කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.10]

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අපේ පාර්ලිමේන්තුවේ කථා කරමින් ඉන්නේ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතට ගෙනෙන සංශෝධන පිළිබඳවයි. හැබැයි, ඩී.වී. චානක මන්ත්‍රීතුමාගේ සාකච්ඡාව තිබෙන්නේ -ගරු මන්ත්‍රීතුමනි, යන්නේ නැතිව පොඩ්ඩක් ඉන්න- පොදුජන පෙරමුණේ ඡන්දවල වර්ධනය ගැන. අද විවාදය ඒක නොවෙයි; මාතෘකාව ඒක නොවෙයි. අද එතුමාට අපේ මාතෘකාවත් අමතක වෙලා. තමුන්නාන්සේට ඒ වාගේ දේවල් කියලා පොඩ්ඩක් සතුටු වෙන්න පුළුවන්. හැබැයි, අපි එක අභියෝගයක් කරනවා. ඔච්චර සතුටු වෙන ඔබතුමාට අපි එක අභියෝගයක් කරනවා. පුළුවන් නම් එක පළාත් පාලන ආයතනයක බලය පිහිටුවා පෙන්වන්න. ඒ සම්බන්ධයෙන් අපි ඔබට අභියෝගයක් කරනවා. අපි කියනවා ඔබේ පක්ෂයට ඒ අරමුණ දිනන්න බැහැ කියලා. ඔබතුමන්ලාගේ පක්ෂය බංකොලොත් දේශපාලන පක්ෂයක් බවට අපේ රටේ ජනතාව තීන්දු කරලා ඉවරයි.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට අවස්ථාව දෙන්න.

ගරු මන්ත්‍රීතුමනි, මට තිබුණු ප්‍රශ්නය මේකයි. රුපියල් 100ට තිබුණු ලුණු කිලෝ එක, රුපියල් 300ට ගෙනැල්ලා -ආනයනය කරලා- ලොකු වංචාවක් කරන්න යනවා. ඒක ගැනයි මම කථා කළේ. ඒක ඔබතුමාට ප්‍රශ්නයක් නොවුණාට, සහල් නැති එක, සහල්වලින් වංචා කරපු එක, ලුණුවලින් වංචා කරපු එක මේ රටේ ජනතාවට ප්‍රශ්නයක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාගේ කාරණය පැහැදිලියි. ගරු සරත් කුමාර මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමා, අපේ අභියෝගය තේරුම් ගන්න. අපි කියන්නේ ඔබතුමන්ලා පුළුවන් නම් එක සභාවක් පිහිටුවලා පෙන්වන්න කියලායි. දැන් ගොඩක් වෙලා ඔය මහ ලොකු වර්ධනය ගැන කථා කළා නේ. ඉතින් එක පළාත් පාලන ආයතනයක බලය පිහිටුවලා පෙන්වන්න. ඔබතුමන්ලා බංකොලොත් වෙලා ඉවරයි. දැන් ලුණු ගැන කථා කරන්න දෙයක් නැහැ. ලුණු ප්‍රශ්නය අපි විසඳලා ඉවරයි. අපේ රටේ තිබෙන සියලු ප්‍රශ්න විසඳන්න මේ රටේ ජනතාව,-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට විනාඩියක් දෙන්න.

ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමනි, ඔබතුමා දික්වැල්ල කොට්ඨාසයේදීත් පැරදුණා නේද? ගම පැරදුණා නේද?*[බාධා කිරීමක්]* අපේ මන්ත්‍රීවරු තව ප්‍රශ්නයක් අහනවා. විපක්ෂයේ අනෙක් පක්ෂවල නායකවරු උදේ වරුවේ කථා කරනවා. ඔබතුමාගේ නායකතුමා lunch එකෙන් පස්සේ පළමුවැනි කථාව කරලා, කවුරුවත් නැති වෙලාවේ කථා කරලා මාරු වෙනවා කියලා අපේ මන්ත්‍රීවරු කියනවා. මම නම් දන්නේ නැහැ. ඒක ඇත්තද? *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපෙන් තත්පර 30ක් එතුමාට දෙන්න. කමක් නැහැ.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ඔය කථාව වෙන කෙනෙක් කිව්වා නම් මම එච්චර ගණන් ගන්නේ නැහැ. ගරු සභානායකතුමා කියපු නිසා ඒ ගැන යමක් කියන්න ඕනෑ. ගරු සභානායකතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කාලය වෙන් කිරීමේ ක්‍රමයක් තිබෙනවා. විපක්ෂයේ ක්‍රමය තමයි පළමුවෙන්ම- *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ඔබතුමා ඇහුවා අපේ නායකතුමා සවස කථා කරන්නේ ඇයි කියලා. හේතුව තමයි, මුලින්ම අවස්ථාව යන්නේ සජබයට. ඊට පස්සේ අවස්ථාව යන්නේ TNA එකට. ඊට පස්සේ අවස්ථාව යන්නේ සිලින්ඩරය පක්ෂයට. ඊට පස්සේ තමයි අපට කථා කරන්න අවස්ථාව එන්නේ. ඒ වෙලාව අනුව තමයි අපි කථා කරන්නේ. සභානායකතුමා කියපු කථාව ඇත්ත. මේ සැරේ අපි කොට්ඨාසය පරාදයි. හැබැයි, ඔබතුමා අවුරුදු 20ක් තිස්සේ ඔබතුමාගේ කොට්ඨාසය පරාදයි නේ. මේ පළමුවැනි වතාවටයි අපි පරාද වුණේ. ඔබතුමා විතරක් නොවෙයි, අනුර කුමාර දිසානායක මහත්මයාත් ඡන්දය දාපු දවසේ ඉඳන් කොට්ඨාසය පරාදයි. ඔය ඉන්න සියලුදෙනා අවුරුදු 60ක් තිස්සේ පැරදිලා, එක පාරක් දිනලා දැන් කෑ ගහන්න එනවා. ඒක තමයි ඇත්ත තත්ත්වය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සරත් කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමා කථා කරන්න.

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අදට නියමිත මාතෘකාව ගැන අපි කථා කරමු.

අද මා බලාපොරොත්තු වෙනවා, 1979 අංක 15 දරන අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය පනතට ඉදිරිපත් කරන ලද වැදගත් සංශෝධන කිහිපයක් වෙනුවෙන් අදහස් එකතු කරන්න. දේශපාලන ව්‍යාපාරයක් හැටියට මේ වෙනකොට අපි විශාල ජනවරමක් අත්පත් කරගෙන තිබෙනවා. ඒ විශාල ජනවරම තුළින් අපේ රටේ ජනතාව අපේක්ෂා කරපු දෙයක් තමයි, නීතියේ පාලනයට යටත් රටක් හදන එක. නීතියේ පාලනයට යටත් රටක් හදන ඒ අරමුණ ජයග්‍රහණය කරන්න අපි අද ඉතාම වේගයෙන් ගමන් කරමින් ඉන්නවා. එහි ප්‍රතිඵලයක් හැටියට තමයි 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතට මේ වැදගත් සංශෝධනය අපට ගේන්න පුළුවන් වෙලා තිබෙන්නේ. එම නිසා ඒ ගැන අපි සතුටු වෙනවා.

අපි කවුරුත් දන්නවා, අපේ රටේ පසුගිය කාලයේ තිබුණු වාතාවරණය. අධිකරණයකට සැකකරුවෙකුට යන්න බැහැ. අධිකරණයට චූදිතයෙකු ප්‍රවාහනය කරගෙන යන්න බැහැ. බන්ධනාගාර තුළදී, ගරු අධිකරණ තුළදී, මහා මාර්ගවලදී ප්‍රචණ්ඩ ක්‍රියාවලට ඔවුන් ගොදුරු වෙනවා. ඒ ප්‍රචණ්ඩ වාතාවරණය ඇති කළේ වෙන කවුරුවත් නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ විපක්ෂය නියෝජනය කරන එවැනි ඇතැම් මන්ත්‍රීවරු දැනුත් ඉන්නවා. අන්න ඒ මන්ත්‍රීවරුන්ගේ පූර්වගාමීන් මේ රටේ හදපු ඒ වාතාවරණය නිසා තමයි එවැනි තත්ත්වයක් ඇතිවෙලා තිබෙන්නේ. ඔවුන් තමයි පාතාලයට අවි ආයුධ ලබා දෙන්න කටයුතු කළේ. මේ දවස්වල රන් ආලේපිත අවියක් ගැන මාධ්‍යවල ඉතා පැහැදිලිව යනවා. ඒ අවිය පිළිබඳව මේ වෙනකොට විමර්ශන කටයුතු සිද්ධ වෙනවා. ඒ අවි පාතාලයට දුන්නේ කවුද? අපේ රට පාලනය කරපු ඒ දේශපාලන පක්ෂ, ආණ්ඩු නියෝජනය කරපු ඒ දේශපාලනඥයෝ තමයි ඒ අවි දුන්නේ.

ඒවා වෙනස් කරලා අපි මේ වෙනකොට නීතියේ පාලනයට යටත් රටක් බොහොම වේගයෙන් හදමින් ඉන්නවාය කියන පණිවුඩය බොහොම සතුටින් ලබා දෙන්නේ.

ඒ වාගේම මේ අලුත් සංශෝධන හරහා අපේ රටේ අපරාධ නීතියේ විශාල වර්ධනයක් අපට දකින්න පුළුවන්කම ලැබෙනවා. විශේෂයෙන් අපි සඳහන් කරන්න ඕනෑ, චූදිතයෙක් එහෙම නැත්නම් සැකකරුවෙක් පෞද්ගලිකවම අධිකරණයේ පෙනී සිටීමෙන් බැහැර කිරීමේ බලයක් මේ පනත් කෙටුම්පත හරහා ගරු අධිකරණයේ විනිසුරුතුමන්ලාට ලබා දීලා තිබෙන බව. ඉතින්, මේක ඉතාම වැදගත්. ඇයි මේක වැදගත් වෙන්නේ? ඇතැම්විට අපි දකිනවා, විශාල වශයෙන් ජීවිත තර්ජන තිබෙන සැකකරුවන්, චූදිතයින් ඉන්න බව. ඒගොල්ලන්ට උසාවියේ පෙනී සිටීමට විශාල බාධා තිබෙනවා. ඒ වාගේම ඒගොල්ලන් මුහුණ දෙන තත්ත්වය යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට බාධාවක් බවට පත් වෙලා තිබෙනවා. එහෙම නම් ඒ අභියෝගය අපි දිනන්න ඕනෑ. ඒක දිනන්න තමයි අපි මේ සංශෝධනය අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ඒ වාගේම සමහර සැකකරුවන්ගේ ක්‍රියාකලාප නිසා, මහජනතාවගේ ප්‍රතික්‍රියා නිසා සාමය කඩ වීමේ තත්ත්වයක් උද්ගත වෙන්න පුළුවන්. එහෙම අවස්ථාවක මේ ප්‍රතිපාදනය ඉතාම වැදගත් වෙනවා. සමහර සැකකරුවන්, සමහර චූදිතයන්, බන්ධනාගාර නිලධාරීන්, පොලිස් නිලධාරීන් සිටියදීම පලා යන අවස්ථා ගැන අත්දැකීමෙන් අපි දන්නවා. එවැනි අවස්ථා මඟ හරවන්න, පාලනය කරන්න අපට පුළුවන්කම තිබෙනවා, මෙන්න මේ ප්‍රතිපාදනය හරහා. සමහර සැකකරුවන්ගේ හැසිරීම අධිකරණ ක්‍රියාවලියට බාධාවක් වෙන අවස්ථා අපට දකින්න පුළුවන්. සමහර වෙලාවට සැකකරුවන්, චූදිතයන් බෝවෙන රෝගවලට ගොදුරු වෙලා ඉන්න අවස්ථා අපට දකින්න පුළුවන්. ඒ වාගේම සැකකරුවන්, චූදිතයින් නිරෝධායනයට ලක් කරන්න අවශ්‍ය වෙන අවස්ථා අපට දකින්න තිබෙනවා. ඔවුන්

[ගරු නීතිඥ සරත් කුමාර මහතා]

පුනරුත්ථාපනයට ලක් කළ යුතු අවස්ථා තිබෙනවා. එවැනි අවස්ථාවල ඒ ක්‍රියාවලිවලට බාධාවක් නොවන ආකාරයට ඔවුන් අධිකරණයෙන් බැහැරව සිටියදී අදාළ නඩුව පවත්වා ගෙන යන්න අවස්ථාව ලැබෙනවා, මේ ප්‍රතිපාදනය හින්දා. විශේෂයෙන් මේ ප්‍රතිපාදන හරහා අපේ රටේ අපරාධ නීතියේ විශාල වර්ධනයක් සිදු වෙනවා කියන පණිවුඩය මම ලබා දෙන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සාක්ෂිකරුවන් පිළිබඳව ගත්තාම, සාක්ෂිකරුවන්ට ගරු අධිකරණයෙන් බැහැරව, තමන්ගේ සාක්ෂි ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය හරහා ගරු අධිකරණයේ අවධානයට යොමු කරන්න මේ තුළින් අවස්ථාවක් ලැබෙනවා. ඒක විශේෂ අවස්ථාවක් හැටියට අපි දකිනවා.

ඒ වාගේම විශේෂඥ සාක්ෂිකරුවන් අතින් බැලුවාම, අපේ රටේ අධිකරණ වෛද්‍ය නිලධාරින්ගේ හිඟයක් තිබෙනවා කියලා අපි දන්නවා. අපේ රටේ රෝහල් පද්ධතිය ඇතුළේ අධිකරණ වෛද්‍ය නිලධාරින්ගේ විශාල හිඟයක් පවතිනවා. ඒ වාගේම අපි දන්නවා, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේත් සීමිත ප්‍රමාණයක් ඉන්නේ කියලා. ඒ ගොල්ලන්ට අසීමිත වැඩ කොටසක් පැවරිලා තිබෙනවා. ඒ වාගේම තමයි විශ්වවිද්‍යාලවල මහාචාර්යවරු. අන්න එවැනි විශේෂඥ සාක්ෂිකරුවන් හැටියට සැලකෙන පිරිසට අද ගරු අධිකරණවල විශාල කාලයක් වැය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ තත්ත්වය වෙනස් කරලා ඒගොල්ලන් ලබා දිය යුතු සාක්ෂිය PDF මඟින් ඉලෙක්ට්‍රොනික සම්ප්‍රේෂණය සඳහා ඉඩකඩ ලබා දෙන්න ප්‍රතිපාදන සකස් කරලා තිබෙනවා, මේ පනත හරහා. ඒ විශේෂඥ සාක්ෂිකරුවන්ගේ වාර්තා ලබා ගන්නවා වාගේම, විශේෂඥ සාක්ෂිකරුවන්ට සිතාසි යොමු කිරීම විද්‍යුත් තැපැල මඟින් සිදු කරන්නත් මේ පනත හරහා අවස්ථාවක් ලැබෙනවා. විද්‍යුත් තැපැල මඟින් විශේෂඥ සාක්ෂිකරුවන් ගරු අධිකරණය වෙත එවන සාක්ෂි, වාර්තා, සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කර ගැනීමටත් මෙම පනත මඟින් ප්‍රතිපාදන, විධිවිධාන සකස් කරලා තිබෙනවා කියන පණිවුඩය මම විශේෂයෙන් ලබා දෙන්න කැමැතියි. ඒ නිසා අපරාධ නඩු විධාන සංග්‍රහය පනතට ඉදිරිපත් කරලා තිබෙන මේ සංශෝධන ඉතාම වැදගත්. අපේ අපරාධ නීතිය තවදුරටත් පුළුල් කරමින් මේ රටේ ජනතාවට ඉතා වැදගත් වන අධිකරණ පද්ධතියේ ක්‍රියාදාමය පහසු කිරීමක් මේ හරහා සිදු වෙන බව මම සඳහන් කරන්න කැමැතියි. විශේෂයෙන් මේ හරහා සැකකරුවන්ගේ, චූදිතයන්ගේ, සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම විශේෂ කාරණයක්.

අපේ රට තුළ අධිකරණ පද්ධතියට අදාළව තිබෙන මැසිවිල්ලක් තමයි නඩු කල් යෑම. නඩු කල් යෑම කියන මැසිවිල්ලට උත්තරයක් දෙන්නත් මේ පනත හරහා අපට පුළුවන්කම ලැබෙනවා. මේ පනත හරහා ඉදිරිපත් කර තිබෙන ප්‍රතිපාදන තුළින් නඩු කල් යෑම අවම කරගන්න අපට පුළුවන්කම ලැබෙනවා. ඒ නිසා අපි ඒක අමතරව වාසියක් හැටියට සලකනවා.

ඒ වාගේම අපි දන්නවා, අපි කථා කරනවා, ඩිජිටල් තාක්ෂණය ගැන. අපි රජයක් හැටියට ඩිජිටල් අමාත්‍යාංශයක් පිහිටුවා තිබෙනවා. එහෙම නම් මේ ඩිජිටල් තාක්ෂණය අපි අධිකරණ පද්ධතිය ඇතුළට ගේන්න ඕනෑ. අධිකරණ පද්ධතිය ඇතුළේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කරන්න අපි මේ ඩිජිටල් තාක්ෂණය උපයෝගි කරගන්න ඕනෑ. මේ පනත් කෙටුම්පත සම්මත වීමෙන් පසුව ඉදිරි කාලයේදී, අපේ අධිකරණ ක්‍රියාවලිය ඇතුළේ ඩිජිටල් තාක්ෂණය උපයෝගි කරගනිමින් අපේ රටේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කරන්නත් අපට පුළුවන්කම තිබෙනවා.

මා විශේෂයෙන් තවත් කාරණයක් සඳහන් කරන්න ඕනෑ. පසුගිය කාලයේ අපි දැක්කා, අපේ රට පාලනය කරපු අය නීතියේ පාලනයෙන් බැහැරව මේ රටේ ආණ්ඩු කරගෙන ගිය ආකාරය. ඒ නිසා තමයි මා ඉස්සෙල්ලා සඳහන් කළා වාගේම පාතාලයේ නැඟිටීම, පාතාල ක්‍රියාකාරකම් වර්ධනය වුණේ. ඒ වාගේම අපි දන්නවා, අපේ රට පසුගිය කාලයේ පාලනය කරපු ආණ්ඩු -ඒ පුද්ගලයෝ- නීතිය භාවිත කළේ කොයි විධියටද කියලා. ඒගොල්ලන් නීතිය අවභාවිත කරමින් කටයුතු කරපු අවස්ථාවලට උදාහරණ අපට ඕනෑ තරම් දකින්න පුළුවන්කම තිබෙනවා. කාටත් මතක ඇති, අපේ රටේ හිටපු අගවිනිසුරුතුමියක් වන ශිරානි බණ්ඩාරනායක මැතිනියට එරෙහිව දෝෂාභියෝගයක් ගෙනැල්ලා, ඒ නඩුව විභාග කළේ කොහොමද කියලා. එතැන ක්‍රියාත්මක වුණේ මේ රටේ නීතියත් නොවෙයි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් මිනිත්තු දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)
හොඳමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

එදා එතුමිය සම්බන්ධයෙන් මේ රටේ ව්‍යවස්ථාපිත නීතිය නොවෙයි ක්‍රියාත්මක වුණේ. ඒගොල්ලෝ කැලෑ නීතියක් ක්‍රියාත්මක කළේ. ඒ කැලෑ නීතිය ක්‍රියාත්මක කරපු මහත්වරු අද පාර්ලිමේන්තුවට ඇවිල්ලා අපට නීතියේ පාලනය ගැන උගන්වන්න හදනවා; නීතිය ක්‍රියාත්මක කරන හැටි උගන්වන්න හදනවා. හැබැයි, ඊට පස්සේ මොකක් හරි කියලා පැනලා යනවා. ඒ නිසා මම ඒ මහත්වරුන්ට කියන්න කැමැතියි, ඔය පිරුවට ඇඳගෙන, සාටක දමාගෙන මිනිසුන් ඉස්සරහ රඟපාන්න උත්සාහ කළාට, ඔබතුමන්ලා ඇඳගෙන ඉන්නේ සීතාම්බර පට කියන එක මේ රටේ සමස්ත මහජනතාව දන්නා බව.

මා මෙහිදී විශේෂයෙන් කියන්නේ, නීතියේ පාලනයට යටත් රටක් හදන්න මේ රටේ විශාල ජන වරමක් සහිත රජයක් හැටියට අප සූදානම් වෙලා ඉන්න බවයි. ඒක මේ රටේ මහජනතාවගේ අපේක්ෂාව. මේ රටේ ජනතාව විශාල ජනවරමක් අපට ලබා දුන්නේ ජනතාව තුළ ඒ අපේක්ෂාව තිබුණු හින්දා. එම නිසා ඒ ජනතාවගේ අපේක්ෂා මල්පල ගැන්වීමේ වගකීමක් අපට තිබෙනවා. ඒ වගකීම දරාගත්තු කණ්ඩායමක් හැටියට තමයි අප මේ බලය අත්පත් කරගෙන පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නේ. ඒ නිසා තමයි අපි මේ රට දවසින් දවස ඉස්සරහට ගෙන යන්න, ආර්ථික වශයෙන් ශක්තිමත් කරන්න, නීතියේ පාලනය රටට ගේන්න අලුත් පනත් කෙටුම්පත්, අලුත් නීති දවසින් දවස මේ පාර්ලිමේන්තුවේදී හඳුන්වා දෙන්නේ. හැබැයි අපට පෙනෙනවා, ඒ ගැන සාකච්ඡා කරන්න වුවමනාවක් මේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට නැහැ කියලා. ඒ නිසා තමයි මේ වැදගත් සාකච්ඡාව තිබෙන වෙලාවේත් විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවෙන් බැහැර වෙන්නේ. මෙවැනි වැදගත් විවාදයක් තිබෙන වෙලාවට ඒකට සම්බන්ධ වෙන්න, ඒ විවාදයේදී අදහස් දක්වන්න, යෝජනා එකතු කරන්න ඒගොල්ලන්ට වුවමනාවක් නැහැ. ඒ නිසා ඒගොල්ලන්ගේ අපේක්ෂාව හරි පැහැදිලියි. ඒගොල්ලන්ගේ අපේක්ෂාව වී තිබෙන්නේ රටේ ජනතාව රවට්ටලා බලය අත් පත් කර ගැනීම විතරයි. ඒගොල්ලන්ගේ ඉතිහාසයේ භාවිතාව ඒක තමයි. හැබැයි, ඒ ඉතිහාසයේ භාවිතාව මේ රටේ ජනතාව මේ වන කොටත් ප්‍රතික්ෂේප කරලා ඉවරයි. ඒ නිසා විපක්ෂයේ මන්ත්‍රීවරුන් වන ඔබතුමන්ලාට අපි කියන්නේ

තමුන්නාන්සේලාගේ දේශපාලන භාවිතාව අද ප්‍රතික්ෂේප වෙලා තිබෙන බවයි. ඒ නිසා සියයට 9ක ඡන්ද ප්‍රතිශතයක් අත්පත් කර ගත්තා කියලා ලොකුවට උඩ පනින්න එපා. තමුන්නාන්සේලා මේ වන කොටත් මේ රටේ ජනතාව තුළ ප්‍රතික්ෂේප වෙලා ඉවරයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)
හොඳමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මම විශේෂයෙන් ඔබතුමන්ලාට කියන්නේ, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතට අප අද ඉදිරිපත් කරන සංශෝධන හරහා අපේ අපරාධ නීතියේ විශාල ඉදිරි පිම්මක් අපට දකින්න පුළුවන්කම ලැබෙන බවයි. ඒ ජයග්‍රහණ අපේ රටේ ජනතාවට නියත වශයෙන්ම ලැබෙනවා කියන පණිවුඩය ලබා දෙමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. G.G. Ponnambalam. You have 12 minutes.

Order, please! Will an Hon. Member propose the Hon. Sanjeewa Ranasingha to the Chair?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Sir, I propose that the Hon. Sanjeewa Ranasingha do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[2.23 p.m.]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Presiding Member, I would like to state at the very outset that, in principle, we are in agreement with the Hon. Minister of Justice and National Integration on bringing in these Amendments, particularly the Amendment to the Code of Criminal Procedure. I think that any steps taken by the Government, whether it be this Government or any government, to use technology to make the criminal justice process more convenient and more reasonable must, in principle, be agreed upon and supported. So, on that basis, with these Amendments, allowing people abroad to give evidence, to have the accused or the suspect, under certain circumstances, excused from being present, all of these steps, I think, will go a great deal toward preventing delays in the process of criminal justice, and we concur with the Government in taking those steps. I think there is much more to be done.

In an odd way, it is quite surprising that it has taken this long for some of these Amendments to be brought in. So, in that sense, I would like to congratulate the Hon. Minister. I do think that in processes such as this, there will be shortcomings even with these Amendments; there might be gaps that need to be filled. But, knowing the Minister for what he is, I am pretty certain he will address those in the future.

I also wish to take this opportunity, Sir, to bring up certain comments which have concerns with regard to the rule of law and natural justice. These are concepts, I think, any Ministry of Justice would be concerned about. These comments that I wish to draw the attention of this House had been made by the Hon. Minister of Foreign Affairs, Foreign Employment and Tourism Vijitha Herath in an interview given to a private TV channel. I saw the interview. It was in Sinhala. So, I can vouch for the veracity of the positions I am going to state now. He had, in short, stated that legal action will be taken against those who claim that a genocide took place during the war, particularly the last stages of the war, and the basis for him to assert that position is because he feels that it goes counter to reconciliation, that it creates divisions and that on that basis, it cannot be allowed. That has got to be one of the most ridiculous statements that any responsible Minister, that, too, a Minister of Foreign Affairs who is the ultimate Minister answerable to the international community at the Human Rights Council and various other fora - could actually make. The number one reason is, Sri Lanka does not have the backbone to ratify the Rome Statute. You do not even have the guts to recognize genocide as a crime in this country. You run away from that reality because you are too frightened, that just in case you ratify the Rome Statute, you could be hauled up to the ICC. So, you do not want that. And, in some way, without even ratifying the Rome Statute, if you make genocide a crime, maybe, there would be a time when the Judiciary and the prosecuting authority, if it is genuinely independent of the Government, might, at some point, prosecute. So, you do not have the guts.

And, without making genocide a crime in this country, to say that it is a crime if anybody asserts that genocide has taken place, I think you cannot get anything more ridiculous than that. If we take this attitude of the Government, on the one hand, they say that they want to be different from the previous governments saying that the previous governments were racist and that that they did wrong and on the other, before the elections, the NPP did not want to talk in terms of war heroes. They said that

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

the term "war heroes" must not be used. That was before the elections in order to get votes. But, thereafter, attending a function of the military and then stating things of this nature to the media, in our view, actually runs counter to the Government's intention or at least, claimed intention of wanting to be genuine about reconciliation. The fact remains, Sir, that the Sri Lankan State, in its prosecution of the war and even before, even in a non-war situation, because of the policies that have been pursued over the last 76 years, has, we believe, systematically dismantled our identity. That is the accusation.

Today, for example, we had a meeting headed by the Hon. Prime Minister with regard to a very controversial Gazette that came out on the 28th of March and the Government, in principle, agreed that the history in Sri Lanka has been quite problematic and that the Tamil people have legitimate reasons to be very suspicious about various things that the governments do. On that basis, that particular Gazette can be construed as problematic although the Government's intention apprently was not, in fact, to make it so controversial. The fact that that Gazette can be construed in that way means that the process must be re-thought. We welcome that.

So, you acknowledge that the history has been so heinous to the Tamil people. You cannot say that a genocide took place without even being willing to make it a crime and then be willing to face prosecutions; that only makes it double-talk. I do not think the Government should go down that path. The Hon. Vijitha Herath must withdraw those comments because those comments are dangerous; those comments curtail free speech, make a mockery of human rights and give sinister people the authority, the stamp of a Minister, to go after people like myself, who genuinely believe that a genocide took place. I want to assert the fact that a genocide took place and want justice for it. Why are you running away from justice? We are asking for justice. We want a criminal prosecutory process that is independent enough and the only independent process that is possible is an international process. Why are you running away from that? Why are you not even being prepared to face it, unless you are guilty as charged? And if the Hon. Foreign Minister's intention is, in fact, to defend the guilty, then what he is doing becomes very clear. I do not think that it is the path this Government should take. So, he must withdraw those comments.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
තවම විනාඩි 8යි නේ ඉවර. මට විනාඩි 12ක් තිබෙනවා කිව්වා.

So, he must make it very clear.

The second matter that I wish to bring out is with regard to Kurunthur Malai, which is a very controversial site where the Sivan temple is located and by the way, a registered temple.

(11th Start)

It was registered under the Ministry of Hindu Cultural Affairs in Colombo, the Government's own Ministry, on 12th November, 1981 as a legitimate Hindu worship site, which has now been desecrated, has been destroyed and a Buddhist temple has been built. That is one controversy. That is the first controversy, which has not still been resolved; this Government has not even been willing to take that up. Sir, the original Gazette Notification came out in the 1930s under the British, declaring about 79 acres as archaeologically sensitive areas. That is the only Gazette to date that is available with regards to Kurunthur Malai. After that, during the Gotabaya Rajapaksa Government, the Department of Archaeology wanted to take over a further 340 acres saying that it should belong to Kurundi Viharaya and they earmarked those 340 acres. But then, when President Ranil Wickremesinghe came to power, there was a meeting, in which he refused to accept that. He said, "No, that is all a farmland. You cannot just confiscate land like that. That must be allowed to be farmed."

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I am finishing up, Sir.

Despite that decision, Sir, the Buddhist monk in charge of Kurundi Viharaya has caught hold of the Police and the Department of Archaeology and has started arresting people who are doing farming in the area that former President Wickeremesinghe said should be given for farming; they are now arresting people there. Just two weeks ago, three people were arrested and one was a minor. The minor was released and the other two remain under remand custody even today. There is no Gazette Notification that is demarcating anything other than those 79 acres, which was gazetted in the 30s, with regard to Kurunthur Malai. But, despite that, the Department of Archaeology and the Buddhist monk along with the Police are going around arresting people. Is it not a rule of law problem? On what basis are you arresting them? So, the Government must intervene and stop that; that must be stopped. The Government's decision was taken over two years ago that those areas must be allowed to farm. Despite that decision and that decision not being reversed, for the police to be going around arresting people like this and for the Department of Archaeology to be working in an *ad hoc* way like this is just completely unacceptable. Therefore, I ask that the Government intervene and ensure that those people arrested are released forthwith.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.;

[අ.භා. 2.36]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා රජය විසින් ඉදිරිපත් කර තිබෙන මෙම පනත් කෙටුම්පතට විපක්ෂය හැටියට අපේ සහයෝගය පළ කරනවා. නවීන තාක්ෂණය යුක්තිය පසිඳලීමේ කටයුතුවලදී භාවිත කිරීම ප්‍රවර්ධනය කළ යුතු බව අපි පිළිගන්නවා. නවීන තාක්ෂණය ප්‍රායෝගිකව මතු වෙලා තිබෙන සමහර ප්‍රශ්න විසඳීම සඳහා උපයෝගි කරගත යුතු බව අපි පිළිගන්නවා. අපි දීර්ඝ කාලයක් පාවිච්චි කරපු අපරාධ නඩු විධාන සංග්‍රහය නවීකරණය සඳහා දීර්ඝ කාලයක් උත්සාහ කිරීමෙන් පසුව මෙම පනත් කෙටුම්පත රැගෙන ඒම පිළිබඳව මම රජයට ස්තුතිවන්ත වනවා. මේ නීතිය අවුරුදු හතක්, අටක් තිස්සේ සංශෝධනය කිරීමට උත්සාහ කරලා තිබුණා. අපට අධීක්ෂණ කාරක සභාවේදී දැන ගන්න ලැබුණා, හතර වතාවක් විතර මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට උත්සාහ කළ බවත්, එය මේ මොහොතේ සම්මත කර ගැනීම කාලීන අවශ්‍යතාවක් බවත්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම සාක්ෂිකරුවන් විදේශගතව ඉන්න අවස්ථාවලදී, එහෙමත් නැත්නම් විත්තිකරුවන් විදේශගතව ඉන්න අවස්ථාවලදී, ඒ වාගේම සැකකරුවන් බන්ධනාගාරගතව සිටින නමුත් ආරක්ෂාව පිළිබඳ කාරණා නිසාත්, රජයේ සම්පත් සීමිත වීම නිසාත් එම සැකකරුවන් දුර බැහැර අධිකරණ වෙත රැගෙන ඒම දුෂ්කර, ඒ වාගේම අනතුරුදායක අවස්ථාවලදී අවශ්‍ය නීතිමය ප්‍රතිපාදනවල වැදගත්කම දැනුණා. කොරෝනා වසංගතය සමයේ මෙවැනි නීති නොතිබුණත්, සීමිත ආකාරයට අපි තාක්ෂණය ප්‍රායෝගිකව පාවිච්චි කරමින් යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය දුෂ්කර වසංගත කාලය තුළදී පවා අඛණ්ඩව ඉදිරියට ගෙන යැමට හැකියාව ලබා ගත්තා. නමුත්, වඩා විධිමත්ව කටයුතු කිරීමට කාලීන සහ නවීන නීතිවල අවශ්‍යතාව අපට තිබෙනවා. ඒ නිසා පළමුව මම රජයට ස්තුතිවන්ත වනවා, මෙම නීතිය ඉදිරිපත් කිරීම ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා දශක තුනක පමණ කාලයක් මේ රටේ අධිකරණවල කටයුතු කරලා, අධිකරණ කටයුතු ගැන අත්දැකීම් තිබෙන නීතිඥ මහත්මයෙක්. එම නිසා එතුමා තේරුම් ගනීවි මා මේ කියන කාරණා. මෙහි තිබෙන අඩු පාඩු කිහිපයක් මම කියන්න කැමැතියි. ඒවා එක්කෝ කාරක සභා අවස්ථාවේදී සංශෝධනය කර ගන්න. නැත්නම් පසුව අවස්ථාවක සලකා බලන්න.

පළමු කාරණය තමයි, විදේශීය රටක ඉඳලා විත්තිකරුවෙක් හෝ සාක්ෂිකරුවෙක් සාක්ෂි දෙන අවස්ථාවකදී එම තානාපති කාර්යාලයේ රාජ්‍ය තාන්ත්‍රික නිලධාරියෙකුට අප විසින් යම් ආකාරයක අධිකාරයක් ලබා දෙනවා. අපි සාමාන්‍ය අධිකරණ භාෂාවෙන් කියනවා නම් කොමිසමක් ලබලා දෙනවා. එම අධිකරණ වගකීම පවරන ඒ රාජ්‍ය තාන්ත්‍රික නිලධාරියාගේ තරාතිරම කුමක්ද කියලා මේ පනත් කෙටුම්පතේ අන්තර්ගත වෙන්නේ නැහැ. අපි දන්නවා තානාපති කාර්යාලයක විවිධ තරාතිරම්වල නිලධාරින් ඉන්න බව. මේ අධිකාරි පත්‍රය මත සාක්ෂි ලබා ගැනීමේදී ස්වාධීනව සාක්ෂි දීමට, බාහිර බලපෑමක් නොමැතිව සාක්ෂි දීමට, නුසුදුසු පුද්ගලයන්ගේ මැදිහත් වීමකින් තොරව සාක්ෂි දීමට සහ ඒ අවශ්‍ය ප්‍රමාණවත් පහසුකම් ලබා දීම සඳහා වගකීමත්, ඉන් පසුව එම සාක්ෂි ආරක්ෂිතව ශ්‍රී ලංකාව වෙත ලබා ගැනීම සඳහාත් ඒ අවශ්‍ය වන නිලධාරියාගේ තරාතිරම පනත් කෙටුම්පතේ සඳහන් නොවීම අඩුපාඩුවක් වනවා. ඒ සඳහා වන අධිකාරි පත්‍ර ආකෘතියේත් එවැනි සඳහනක් නැහැ.

එම ප්‍රශ්නයම තිබෙනවා ශ්‍රී ලංකාව තුළ යම් සාක්ෂියක් සටහන් කර ගැනීම සම්බන්ධවත්. "කොමසාරිස්වරයා හෝ උසාවි නිලධාරියා විසින් දෙනු ලබන දිවුරුම හෝ ප්‍රතිඥාව" තිබෙනවා, අංක 25 ආකෘතියේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනත් ඉතා වැදගත් කරුණක් තිබෙනවා. විශේෂයෙන්ම බන්ධනාගාරයක් වැනි පරිසරයක් තුළ සාක්ෂි දෙන තැනැත්තෙකුට හෝ විත්තිවාචකයට මුහුණ දෙන තැනැත්තෙකුට ඒ අවශ්‍ය නිදහස තිබිය යුතුයි. බලපෑම්වලින් තොරව අධිකරණයේ පෙනී සිටීමට හෝ සාක්ෂි දීමට හෝ තමන්ගේ විත්තිවාචකය ඉදිරිපත් කිරීමට තිබෙන නිදහස තහවුරු කිරීම සඳහා මීට වඩා වැඩි ප්‍රතිපාදන ඇතුළත් විය යුතු බවයි, දීර්ඝ කාලයක් අධිකරණ කටයුතුවල නිරත වුණු නීතිඥවරයකු හැටියට මගේ හැඟීම.

එතැනදීත් මෙම අධිකාරී පත්‍රය ලබන නිලධාරියා කවුද, ඔහුගේ තරාතිරම කුමක්ද කියන කාරණය ගැන වඩාත් හොඳ පැහැදිලි කිරීමක් ලැබිය යුතුයි. මොකද, යම් පහළ නිලධාරියෙකුට පුළුවන්ද, ජීවිතය හා මරණය පිළිබඳ මෙවැනි ප්‍රශ්නයකදී කටයුතු කරන්නට කියන කාරණය සැලකිල්ලට ගත යුතුයි.

අපි දන්නවා, මෙවැනි ආකාරයට බන්ධනාගාරය තුළ සිට සාක්ෂි දෙන්නට සිදු වන්නේ හෝ බන්ධනාගාරය තුළ ඉඳලා විත්තිවාචක දීමට සිදු වන්නේ යම් සුවිශේෂ අනතුරුදායක තත්ත්වයන්ට මුහුණ දීපු තැනැත්තන්ට බව. නඩුවේ එක සාක්ෂියක්, එක වචනයක් කියන්නේ, ඔවුන්ගේ ජීවිතය හා මරණය පිළිබඳ ප්‍රශ්නයක්. ඔවුන් කොපමණ දීර්ඝ කාලීන සිර දඬුවමක් ලබනවාද, ඔවුන්ට මරණීය දණ්ඩනය හිමි වෙනවාද වැනි ඉතා බරපතළ කාරණා මෙතැනදී සිද්ධ වෙනවා. ඒ නිසා ඒ අයට අවශ්‍ය නිදහස තහවුරු කිරීම ඉතා වැදගත් දෙයක්.

ඒ වාගේම රජය විසින් ඉල්ලීමක් කළොත් රජය වියදම් දරා ගන්නවා කියන එක පැහැදිලියි. නමුත් විත්තිය විසින් ඉල්ලීමක් කළ විට ඒ වියදම් දරා ගන්නේ කවුද? ඒක වැදගත් කාරණයක්. ඒ වාගේම සාක්ෂිකරුවෙකු විසින් -ඔහු නඩුවේ විත්තියත් නොවෙයි, පැමිණිල්ලත් නොවෙයි- මෙවැනි ඉල්ලීමක් කළ විට කවුද ඒ වියදම දරන්නේ? මේ කාරණා රජය පැහැදිලි කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම විවාදය තුළ අපට වැදගත්ම කාරණය තමයි ඩිජිටල්කරණයේ ඇති වැදගත්කම. මේ සියලු කටයුතු වඩාත් විධිමත්ව කරන්න, සිවිල් සහ අපරාධ නඩු කටයුතු වඩාත් විධිමත් ආකාරයට සහ නවීන තාක්ෂණය භාවිතයෙන් පවත්වාගෙන යන්න, ගුණාත්මකභාවයෙන් ඉහළ යුක්තිය පසිඳලීමක් කරන්න අද ලෝකය පාවිච්චි කරන උපාය මාර්ගය තමයි මේ ඩිජිටල්කරණය. මේ වැඩ පිළිවෙළ අපි දීර්ඝ කාලයකට කලින් පටන් ගත්තා; යම් තැනකට අරගෙන ඇවිල්ලා තිබුණා. ඒ කටයුතුවලට ඇමතිවරයකු හැටියට, මන්ත්‍රීවරයකු හැටියට සහ ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ඩිජිටල්කරණය පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියට මාත් දායක වෙලා තිබෙනවා. ඒ නිසා මේ කටයුතු කඩිනමින් කරලා මුළු රටේම තිබෙන සෑම අධිකරණයක්ම ඩිජිටල්කරණයට ලක් කිරීම ඉතා වැදගත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව තව වැදගත් කරුණක් මම කියන්න කැමැතියි. මේ පාර්ලිමේන්තුවේ තුන්වන වරටත් කටයුතු කරන මන්ත්‍රීවරයකු හැටියට මම ඊයේ ඉතාම නරක දෙයක් දැක්කා. මේ පාර්ලිමේන්තුවට පළමු වතාවට ආපු එක්තරා මන්ත්‍රීවරයෙක් ඉන්නවා. එතුමා මේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායය සලකන්නේ නැහැ. බාධා කරමින් හැසිරෙනවා. අපි

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ඒක අනුමත කරන්නේ නැහැ. ඒ මන්ත්‍රීවරයාට මේ පාර්ලිමේන්තුව විසින් දැනටමත් දඬුවම් පමුණුවා තිබෙනවා. නමුත්, ඉතා පළපුරුදු, උගත් අපේ ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා අර ප්‍රශ්නවලට ලක් වෙලා ඉන්න මන්ත්‍රීතුමා ආමන්ත්‍රණය කරමින් ඊයේ පාවිච්චි කරපු වචන අතිශයින් පහළයි. එතුමාගෙන් මම බලාපොරොත්තු වුණේ නැහැ එහෙම දෙයක්. එතුමා උගත්, පළපුරුදු ඇමතිවරයෙක්. ප්‍රශ්නය මොකක් වුණත්, කොච්චර ආවේගශීලි වුණත් පෞද්ගලික නම්වලින්, දේශපාලන වේදිකාවල හෝ කඩ පිළේ කියන, සමහර අවස්ථාවල නොකිය යුතු තරම් වචනවලින් එතුමා ඒ මන්ත්‍රීවරයා ආමන්ත්‍රණය කළා. එපමණක් නොවෙයි, මේ සභාව තුළ "ඔයා", "ඔයා කවුද", "ඔයා මොනවද කරන්නේ" වගේ වචන පාවිච්චි කරනවා. සාමාන්‍යයෙන් මේ සභාව තුළ සිංහල භාෂාවෙන් කථා කරනවා නම් "ගරු මන්ත්‍රීතුමා", "ගරු ඇමතිතුමා", "ඔබතුමා" කියලා අපි කථා කරනවා. එහෙම නැත්නම් ඉංග්‍රීසි භාෂාවෙන් හෝ දෙමළ භාෂාවෙන් කථා කරනවා නම් ඊට ගැළපෙන වචනවලින් ගෞරව සහිතව කථා කරනවා. ඒ මතය ගැන සම්පූර්ණයෙන් එකඟ නොවුණත්, එම කාරණය පිළිබඳව දක්වන මතය සම්පූර්ණයෙන් පිළිකුල් කළ යුතු මතයක් වුණත් අද්විතීය වාද මණ්ඩපය වන්නේ, මේ පාර්ලිමේන්තුව. මේ පාර්ලිමේන්තුව තුළ යම් කාරණයක් පිළිබඳව කරුණු දක්වන මන්ත්‍රීවරු සංයමයෙන් කථා කරන්න ඕනෑ. ඒ වාගේම පාර්ලිමේන්තුවට ගැළපෙන වචන පාවිච්චි කරන්න ඕනෑ. Unparliamentary language කියලා ඉංග්‍රීසි භාෂාවේ තිබෙනවා, පාර්ලිමේන්තුව තුළ පාවිච්චි කරපු වචන ගැන. මම පුදුමයට පත් වුණේ, පළපුරුදු ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා එවැනි වචන භාවිත කිරීම ගැන. මට එතුමා ගැන පෞද්ගලික ප්‍රශ්නයක් නැහැ. නමුත්, මේ සභාවේ ඉන්න සියලු පක්ෂවල -ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත්- සියලු මන්ත්‍රීවරු පොදුවේ තේරුම් ගත යුතු දෙයක් තිබෙනවා. අපි එක දවසක විපක්ෂයේ ඉන්නවා. තව දවසක ආණ්ඩු පක්ෂයේ ඉන්නවා. හැබැයි, මොන පක්ෂයේ හිටියත්, තරාතිරම මොකක් වුණත්, මතවාදය කුමක් වුණත් අපි එකිනෙකාට ගෞරව කරමින් කථා කළ යුතුයි. ඒක තමයි පාර්ලිමේන්තු සම්ප්‍රදාය. ඒ පාර්ලිමේන්තු සම්ප්‍රදාය කැඩුවොත්, ඒ කැඩීම සම්ප්‍රදාය බවට පත් වුණොත්, මේ පාර්ලිමේන්තුවේ තිබෙන උත්තරීතරභාවය හෑල්ලුවට ලක් වෙනවා. ඒ හරහා සමාජය ඉස්සරහ ආයතනයක් වශයෙන් මේ ගරු පාර්ලිමේන්තුවත්, මේ ව්‍යවස්ථාදායක ක්‍රියාදාමයත් සම්පූර්ණයෙන් හෑල්ලුවට ලක් වෙනවා. ඒ පිළිබඳව ගරු කථානායකතුමාගේත්, මේ සභාවේ මන්ත්‍රීවරු සියලුදෙනාගේත් අවධානය යොමු කරවන්න මම කැමතියි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.46]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනයට අදාළ මේ විවාදය ඉතා වැදගත් විවාදයක් හැටියටයි මම දකින්නේ. රටක් විධියට සැහෙන ප්‍රශ්නවලට, විශේෂයෙන්ම අපරාධ සම්බන්ධව, සංවිධානාත්මක අපරාධ සම්බන්ධව විවිධ ප්‍රශ්න, ගැටලුවලට මුහුණ දීපු රටක් තමයි මේ රට. අධිකරණ පද්ධතිය සඳහා වැදගත් වන මේ වාගේ සංශෝධන, මේ වාගේ ප්‍රගතිශීලි සංශෝධන රටක් හැටියට අපි ගෙනෙන මේ අවස්ථාවේදී යම් කිසි පොඩි දුකකුත් තිබෙනවා. මොකද, මීට කලින් ගෙනෙන්න තිබුණු සංශෝධන තමයි දැන් මේ අපට ගෙන එන්න සිද්ධ වෙලා තිබෙන්නේ. Researches කරලා බලද්දී, ලෝකයත් එක්ක සංසන්දනය කරලා බලද්දී ඇත්තටම මේ තුළ සැහෙන පිටුපසින් තමයි අපි ඉන්නේ.

2000 වර්ෂය ආරම්භයේදී තමයි තාක්ෂණය මේ විධියට සමාජය තුළ ව්‍යාප්ත වෙන්න පටන් ගත්තේ. ඒ කියන්නේ, අන්තර්ජාල පහසුකම් ඇතුළු දේවල් ඉතාම හොඳ ආකාරයෙන් ව්‍යාප්ත වෙන්න පටන් ගත්තේ ඒ කාලයේ. බොහෝ රටවල් ඒවා භාවිතයට ගැනීම ඒ කාල වකවානුව තුළම පටන් ගත්තා. සාමාන්‍යයෙන් අවුරුදු 10න් 10ට වාගේ තාක්ෂණය ඉතාම වේගයෙන් වෙනස් වෙමින් ඉදිරියට යනවා. ඇත්තටම 2000 වර්ෂයේදීත් අපට මේක කරන්න බැරි වුණා. නමුත් බොහෝ රටවල් පටන් ගත්තා. 2010 වර්ෂය ගත්තොත්, අපේ රටේත් අන්තර්ජාලය භාවිතය ඇතුළු බොහෝ තාක්ෂණික කටයුතු ඉතාම වේගයෙන් දියුණු වෙන්න පටන් ගත්තා. Connectivity speed ගැන අපි කථා කරනවා. නමුත් එතකොට ඒ වේගය පිළිබඳ ලොකු ප්‍රශ්නයක් තිබුණේ නැහැ. ඊට පස්සේ ලෝකයේ වසංගත තත්ත්වයක් ඇති වුණා. ඒ හේතුවෙන්, ඒ වසංගත තත්ත්වයේ යම් කිසි අතුරු ඵලයක් විධියට අන්තර්ජාලය ඔස්සේ Zoom තාක්ෂණය භාවිතය වාගේ දේවල් වැඩි දියුණු වෙන්න පටන් ගත්තා. නමුත් වසංගතයෙන් පසුවත් -2019, 2020, 2021න් පසුවත්- අපට මේ තාක්ෂණය භාවිතය හරියාකාරයෙන් කරන්න බැරි වෙච්ච එක ගැන රටක් විධියට අපි ඇත්තටම කනගාටු වෙන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, ඒක වෙනම සොයා බලන්න ඕනෑ කාරණාවක්.

පසුගිය කාලයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ජාතික ආරක්ෂාව ගැන කථා කළා. මට නම කියන්න වුණත් පුළුවන්. ඒ තමයි දුමින්ද දිසානායක හිටපු මන්ත්‍රීතුමා. ගිනි අවි සිද්ධියකට අදාළව එතුමාත් දැන් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒකෙන් පෙන්නුම් කරන්නේ, රටේ සංවිධානාත්මක අපරාධකරුවන් සහ දේශපාලන යන්ත්‍රණය තුළ තිබෙන අන්තර් සම්බන්ධතාවයි. එතකොට ඇත්තටම එක දෙයක් අපි පිළිගන්න ඕනෑ, ආණ්ඩු පක්ෂයද, විපක්ෂයද කියන භේදයෙන් තොරව. ජාතික ජන බලවේග ආණ්ඩුව නොතිබුණා නම්, මෙවැනි ප්‍රගතිශීලි නීති රීති සංශෝධනය කිසිසේත්ම සිද්ධ වෙන්නේ නැහැ. ඇත්තටම මේ සංශෝධනය අරගෙන බැලුවොත්, සැකකරුවාටත් යම් කිසි අවස්ථාවක් දීලා තිබෙනවා. එක නඩුවක සැකකරුවෙක් තවත් නඩුවක සාක්ෂිකරුවෙක් වෙන්නත් පුළුවන්. යම් පුද්ගලයෙක් යම් නඩුවක සැකකරුවෙක් වෙන්න පුළුවන්. හැබැයි ඒ සැකකරුවාම තවත් නඩුවක සාක්ෂිකරුවෙක් වෙන්න පුළුවන්. එවැනි සැකකරුවන්, තවත් නඩුවක සාක්ෂිකරුවන් වන සමහර පුද්ගලයන් අධිකරණ තුළ ඝාතනය වූ අවස්ථාත් තිබෙනවා. ඒ සාක්ෂිකරුවන්ටත් අපි ආරක්ෂාව ලබා දිය යුතුයි. එවැනි බොහෝ අවස්ථා මේ සංශෝධනය තුළින් නිර්මාණය වෙලා තිබෙනවා.

ඒ වාගේම දැන් මේ දියුණු තාක්ෂණය යොදාගෙන විශේෂයෙන්ම අපේ බැංකු පද්ධතිය, ඒ වාගේම පෞද්ගලික අංශයේ ආයතන ඉතාම හොඳ ආකාරයෙන් කටයුතු කරගෙන යනවා. විශේෂයෙන්ම PDF තාක්ෂණය ගත්තොත්, ඒක මතුපිටින් බලනවා වාගේ නොවෙයි, වෙනම password එකක් තිබෙන වෙනම system එකක්. බොහෝ bank statements වාගේ ලේඛන, ඇත්තටම ගත්තොත් ඉතාම රහසිගත තොරතුරු පවා සුරක්ෂිතව හුවමාරු කරගත හැකි පරිදි තාක්ෂණය දියුණු වෙලා තිබෙනවා. ඉතින් එවැනි තත්ත්වයක් ලෝකයේ තිබෙද්දීත් මෙච්චර කාලයක්

අපට මේක කර ගන්න බැරි වුණා කියන්නේ, කනගාටුවට කාරණයක්. ඇත්තටම දැන් මේ සංශෝධනය හරහා ඒ අවස්ථාවත් අපට නිර්මාණය වෙනවා.

ඒ වාගේම සාක්ෂි දෙන්න උසාවියට යන එකත් සමහර අයට පීඩාවක් වෙන්න පුළුවන්. අපේ අධිකරණ ඇමතිතුමාත් මේ ගැන පැහැදිලි කළා. මම තවත් පැහැදිලි කරන්නම්. සාක්ෂි දෙන්න උසාවියට යන එකත් සමහර අයට පීඩාවක් වෙන්න පුළුවන්. නමුත් මේ සංශෝධනය තුළින් ඒ සඳහාත් අලුත් තත්ත්වයක් නිර්මාණය වෙනවා; පීඩාවකින් තොරව සාක්ෂි දෙන්න පුළුවන් නිදහස් වටපිටාවක් සකස් වෙනවා.

ඇත්තටම මෙතැනදී මම වගන්ති කිහිපයක් පිළිබඳව විශේෂයෙන් කරුණු මතු කරන්න කැමැතියි. විශේෂයෙන් මුල් පනතේ 144 වගන්තිය අරගෙන බැලුවොත්, පුද්ගලයෙකුගේ ජීවිතයට යම්කිසි තර්ජනයක් තිබෙනවා නම්, එහෙම නැත්නම් public safety සම්බන්ධයෙන් සමාජයට යම්කිසි ප්‍රශ්නයක් තිබෙනවා නම්, -උදාහරණත් එක්ක මම කියන්නම්- මේ සංශෝධනය හරහා සාක්ෂි දෙන්න අලුත් අවස්ථාවක් නිර්මාණය වෙනවා. මෙවැන්නක් ලෝකයේ සිද්ධ වෙච්ච පළමුවෙනි අවස්ථාව මෙය නොවෙයි. බොහෝ රටවල මේ වාගේ දේවල් සිද්ධ වෙලා තිබෙනවා. මේ වාගේ ගැටලුවලට, මේ වාගේ සංවිධානාත්මක අපරාධවලට, ඊටත් වඩා ජාලවලට මුහුණ දෙමින් තිබුණු රටවල් තිබුණා. ඒ දේවල් පරාජය කරමින් මෙවැනි සංශෝධනත් එක්ක ඒ රටවල් අද ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. නමුත් අපේ රටේ හිටපු "සොත්ති උපාලි", "ප්‍රලම්පිටියේ අමරේ" වැනි අයගේ කාලයේ සිට, ජනාධිපතිතුමියකගේ ආරක්ෂක නිලධාරියෙකු විධියට තියාගෙන හිටපු "බැද්දගාන සංජීව"ගේ කාලයේ සිට, ඒ වාගේම ඊයේ පෙරේදා සිද්ධ වෙච්ච "ගනේමුල්ල සංජීව"ගේ ඝාතනය දක්වා දේශපාලනය බද්ධ වෙලා තිබෙනවා. ඇත්තටම එවැනි දේශපාලන සංස්කෘතියකට හිමිකම් කියන එම පුද්ගලයන්ට කිසිසේත්ම මේ වාගේ පනතක් ප්‍රගතිශීලී විධියට සංශෝධනය කරන්නට බැහැ. නමුත් අපි ඉතාම උතුම් මේ කාර්යභාරය අද මේ සභාවට ඉදිරිපත් කරමින්, මේ සම්බන්ධව විවාද කරන්න යම්කිසි අවස්ථාවක් ලබා ගනිමින්, යම් සංශෝධන තිබෙනවා නම්, අපි ඒ සංශෝධනත් පිළිගෙන, මේ සංශෝධන පනත් කෙටුම්පත සම්මත කිරීමත් එක්ක අපට විශ්වාසයක් තිබෙනවා, අපේ අධිකරණ පද්ධතියේ තිබෙන මේ තදබදය අඩු කරන්න පුළුවන් වෙයි කියලා.

විශේෂයෙන් අපි දන්නවා, 2017 වර්ෂයේදී කළුතර බන්ධනාගාරයේ බස් රථයකට වෙඩි තැබූ සිද්ධිය පිළිබඳව. ඇත්තටම ගත්තොත්, ඒ වෙඩි තැබීමෙන් නිලධාරීන් පස්දෙනෙක් සහ සමස්තයක් විධියට හත්දෙනෙක් ඝාතනයට ලක් වුණා. ඇත්තටම එවැනි තත්ත්ව වළක්වන්න පුළුවන් අවස්ථාවක් දැන් අපට නිර්මාණය වෙලා තිබෙනවා. විශේෂයෙන් ඉදිරියේ එළඹෙන කාල වකවානුව ගත්තොත්, දේශපාලනිකව ගොඩක් කලබල වෙච්ච ඒ බලවේගය මේවායෙන් මිදෙන්න විවිධ උපක්‍රම පාවිච්චි කරන්න පුළුවන්, විවිධ බලපෑම් එල්ල කරන්න පුළුවන්.

සමහර විට ඔවුන්ට නඩු පිට නඩු, නඩු පිට නඩු වැටෙනකොට ඒක දරා ගන්න බැරිව, දූෂණ වංචාවලට සම්බන්ධ වුණු, නාස්තියට සම්බන්ධ වුණු, අක්‍රමිකතාවලට සම්බන්ධ වුණු, වැරදි දේශපාලන සංස්කෘතියේ හිමිකරුවෝ වුණු, සංවිධානාත්මක අපරාධ කල්ලිවලට සම්බන්ධ වුණු මේ දේශපාලකයෝ යම්කිසි කඩාකප්පල්කාරී ක්‍රියාවලියකට උත්සාහ කළා නම්, අනිවාර්යයෙන්ම මේ හරහා ඒ දේවල් වළක්වන්න පුළුවන් තත්ත්වයක් දැන් උදා වෙලා තිබෙනවා.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පතේ 5වන වගන්තිය යටතේ ප්‍රධාන ප්‍රඥප්තියේ 273වන වගන්තියට කරන ලද සංශෝධන අරගෙන බැලුවොත්, එහි audio-visual testimony and electronic evidence ගැන, ඒ කියන්නේ ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය හරහා අදාළ සාක්ෂි එකතු කරන කටයුත්ත ගැන ඉතාම හොඳ විධියට සාකච්ඡා කරලා තිබෙනවා. එයට අනුව මෙහිදී video links එකතු කරන්න පුළුවන්. ඒ වාගේම විවිධ දේවල් සාක්ෂි විධියට එකතු කරන්න පුළුවන්. මෙතැනදී සාක්ෂි එකතු කරන්න පුළුවන් යම්කිසි තාක්ෂණයකුත් එකතු කරලා තිබෙනවා.

මම මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි, Maryland vs. Craig කියන එක්සත් ජනපද උසාවියේ පැවති නඩුවේ තීන්දුව පිළිබඳව. අදාළ තැනට එන්නේ නැතිව remotely සාක්ෂි දෙන්න පුළුවන්, එහෙම නැත්නම් ඒකට අදාළ කරුණු එකතු කරන්න පුළුවන් කියන එක ලෝකයට ඉස්සෙල්ලාම පූර්වාදර්ශයක් විධියට එකතු වෙච්ච නඩුව තමයි, මේ Maryland vs. Craig කියන නඩුව. විශේෂයෙන් ඒ නඩුවේ සිදුවීම අරගෙන බැලුවොත්, ඒක කුඩා දරුවෙක් සැකකරුවෙකු විධියට නම් කළ නඩුවක්. අපි දන්නවා, එවැනි සිදුවීම් වෙන්න පුළුවන් බව. ඔවුන් සැකකරුවෝ විධියට නම් කරන්නත් පුළුවන්, සමහර අය සාක්ෂිකරුවෝ වෙන්නත් පුළුවන්. හැම දේටම වඩා සමහර පරිසර සැකකරුවෙකුට සාක්ෂි දෙන්න සුදුසු නැහැ. එම විධියට සාක්ෂිකරුවෙකුට ඉදිරිපත් වෙන්න නුසුදුසු පරිසර තිබෙනවා. එවැනි තත්ත්වයන් මේ සංශෝධන හරහා වෙනස් වෙන්න පුළුවන්. ඇත්තටම පුංචි දරුවෙක් වැරැද්දක් කළා වුණත්, ඒ දරුවාට නිදහසේ සාක්ෂි දෙන්න පුළුවන් අවස්ථාවක් අපි නිර්මාණය කර දෙන්න ඕනෑ. ඊටත් වඩා පීඩන ඇති කරන තත්ත්ව පවා තිබුණා. මේ සංශෝධන හරහා ඒ තත්ත්වය වෙනස් කරලා සාක්ෂිකරුවන්ට නිදහසේ සාක්ෂි දීලා, නිදහසේ කරුණු ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. වැරැද්ද පිළිගැනීමෙන් පසුව හෝ කුමන හෝ ආකාරයෙන් දඬුවම් ලබා දෙන එක අධිකරණයේ ක්‍රියාමාර්ගය. ඒකට අපි හොඳාකාරයෙන් බිම සකස් කරන්න ඕනෑය කියන එකයි මම කියන්නේ.

2003දී State of Maharashtra vs. Dr. Praful B. Desai කියන Indian Supreme Court නඩුවේ තමයි මුලින්ම වීඩියෝ තාක්ෂණය - video conferencing - හරහා යම්කිසි ආකාරයෙන් තොරතුරු, සාක්ෂි එකතු කරන්න පුළුවන් කියන දේ සඳහන් වෙලා තිබුණේ. ඒ, 2003 වර්ෂයේ, අද අපි ඉන්නේ 2025 වර්ෂයේ. අපේ අධිකරණ පද්ධතිය තුළත් යම්කිසි අවස්ථාවලදී සමහර දේවල් අත්හදා බලා තිබෙනවා. නමුත් ඒක නීතියක් විධියට ඉස්සරහට ආපු නැති තත්ත්වයක් තිබෙනවා. ඒ පිළිබඳව ඉතාම කනගාටුයි. කොවිඩ් වසංගත කාලයේදී මේ සම්බන්ධව යම්කිසි අලුත් තත්ත්වයක් නිර්මාණය වෙලා තිබුණා. ඒ අවස්ථාව ඉස්සරහට අරගෙන එමින්, යම්කිසි ආකාරයකට ජනතාවට සහනයක් විධියට ඒක තවදුරටත් ඉස්සරහට අරගෙන යන්න පුළුවන් අවස්ථාවක් නිර්මාණය වෙලා තිබියදීත් ඒක හරියාකාරව ප්‍රයෝජනයට ගත්තේ නැහැ කියන විවේචනය තිබෙනවා. ඒ නිසා මේ පනත් කෙටුම්පත හොඳ තත්ත්වයක්, අලුත් තත්ත්වයක් හැටියට අපි දකිනවා. අපි අලුත් රටක් බලාපොරොත්තු වෙනවා, අපි පුනරුදයක් ගැන කථා කරනවා.

විශේෂයෙන් විපක්ෂ මන්ත්‍රීතුමන්ලාට මම කියා සිටිනවා, මේ පනත් කෙටුම්පත ගැන හරවත් සංවාදයක් මේ උත්තරීතර සභාවේ සිද්ධ වුණේ නැහැ කියන කනගාටුව අපට තිබෙන බව. ඇයි එහෙම වුණේ කියලා මට තේරෙන්නේ නැහැ. මේ පනත ගේනවාට විරුද්ධයිද, අකමැත්තක්ද තිබෙන්නේ, නැත්නම් පනත සම්බන්ධව දැනුමක් නැද්ද, එහෙම නැත්නම් මොකක් හරි කනගාටුවක්ද තිබෙන්නේ කියලා මට තේරෙන්නේ නැහැ. නමුත් අපි හිතනවා, ආණ්ඩුවක් විධියට ඉස්සරහට යන්නත්, රටක් විධියට ඉස්සරහට යන්නත්, අධිකරණ පද්ධතියේ සැහෙන සංශෝධන

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

කරගෙන මීට වඩා ලෝකයේ තාක්ෂණයත් එක්ක ඉස්සරහට යන්නත් යම්කිසි උතුම් අවස්ථාවක් මෙයින් නිර්මාණය වෙනවා කියලා. මේ පනත විතරක් නොවෙයි, ඉදිරියේදී මීට වඩා ප්‍රගතිශීලී පනත් එන්න නියමිතව තිබෙනවා. ඒ නිසා මම සියලුදෙනාගෙන්ම ඉල්ලා සිටින්නේ මේ පනත් කෙටුම්පතට සහයෝගය ලබා දීලා අධිකරණ ක්ෂේත්‍රය ඉදිරියට ගෙන යන්න අපි මේක හොඳ අවස්ථාවක් කර ගනිමු කියලායි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවී කරුණායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පනත් කෙටුම්පත් දෙකක් විවාදයට තිබෙනවා. මූල්‍ය පනත් කෙටුම්පතකුත් ඒ අතරේ තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා නීතිය දන්න නිසා ඒ පැත්ත කථා කරලා ඇති. අද පනත් කෙටුම්පත් දෙකක් තමයි එකට විවාද කරන්නේ. ඒ ඕනෑ එකක් ගැන කථා කරන්න පුළුවන්. ඒ වාගේම දෙපැත්තම එකම ආකාරයට තමයි කථා කළේ. මම හිතන විධියට, එය සාධාරණ විය යුතුයි. වැඩියෙන්ම කථා කළේ මැතිවරණයක් සම්බන්ධයෙන්. හැබැයි ඔබතුමා නීතිය පැත්තත්, අපි ආර්ථිකය පැත්තත් කථා කළා. මම ඔබතුමාගෙන් එක ඉල්ලීමක් කරනවා. මොනවා වුණත්, මේ සංශෝධන ඉදිරිපත් වෙලා තිබෙන්නේ රනිල් වික්‍රමසිංහ ගෙනාපු පනත් ටිකට. ඒකත් ටිකක් සුබවාදීව හිතන්න. මොකද, මේ සංශෝධන සභාවට ගෙනා එක හොඳයි. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පනතක් ගේන්න අඩුම ගණනේ මාස 6ක, 9ක පමණ කාලයක් ගතවනවා. ඉතින් මම හිතනවා, ඒ credit එකත් එතුමන්ට දිය යුතුයි කියලා. මේවා අලුත් ඒවා නොවෙයි. *[බාධා කිරීමක්]*

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
ඇත්තටම පනත් කෙටුම්පත් ගැන විතරක් නොවෙයි අපි මීට කලින් කථා කළේ ගරු මන්ත්‍රීතුමනි. මේ කථා කරපුවා අපිත් අහගෙන හිටියා නේ. පනත් දෙකක් ගැන මේ සභාවේ විවාද වෙනවා කියන අදහස මටත් තිබෙනවා.

ප්‍රශ්නය තිබෙන්නේ අපි මේ ගරු සභාවේදී පනත් කෙටුම්පත් ගැන විතරක් නොවෙයි කථා කරන්නේ. විවිධ දේවල් කථා කරනවා. හැබැයි, "යන්නේ කොහේද - මල්ලේ පොල්" වාගේ කථා තමයි මෙතැන කරන්නේ. ඒක නිසා මේ තත්ත්වය වෙනස් කරමු. මම කියන්නේ, මේ සභාව මීට වඩා හරවත් විවාද ඇති වන තැනක් බවට පත් කර ගනිමු කියලායි. එම නිසා මම සියලුදෙනාටම ආරාධනා කරනවා, මේ ප්‍රගතිශීලී සංශෝධනයට එකතු වෙන්න කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.01]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම රවී කරුණානායක මැතිතුමා මතු කරපු කාරණයට ඌන පූරණයක් එකතු කරමින් මගේ කථාව පටන් ගන්නම්. විශේෂයෙන්ම අපි හොඳ දේවල්වලට හොඳයි කියනවා. එවකට හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයා ගෙනාපු මේ අණපනත් ටික පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව අපට තර්කයක් නැහැ වාගේම, ඒ සඳහා අපේ විරෝධයක් නැහැයි කියන එකත් මම මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ රටේ නීතියේ ආධිපත්‍යය සඳහා අපි මේ සියලු අණපනත් රටට ගේන්නේ රටේ නීතිය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය පසුබිම නිර්මාණය කරන මේ උත්තරීතර සභාව තුළින්; විශේෂයෙන්ම නීති හදන තැනින්. හැබැයි, මේ රටේ COPE එක වේවා, COPA එක වේවා, අනෙකුත් රාජ්‍ය ආයතන වේවා, ඒවා විගණනය කරන්න අවශ්‍ය විනිවිදභාවය තිබෙන්නේ ගරු විගණකාධිපතිවරයාට බවත් අපි දන්නවා. නමුත්, වර්තමාන ආණ්ඩුව, හොරු අල්ලන්න ආපු ආණ්ඩුව, අවුරුදු 76ක ශාපය ගැන කථා කරපු ආණ්ඩුව, කලින් ගෙනැවිත් තිබුණු පනත් ටික නැවත ගේන්න උත්සාහ ගන්නා ආණ්ඩුව, විගණකාධිපතිවරයා පත් කර ගන්න බැරි තරම් දුර්වල වුණේ ඇයි කියන ප්‍රශ්නය අපි අහනවා. ඉතිහාසය ගත්තොත්, ජ්‍යෙෂ්ඨත්වය අනුව, සුදුසුකම්වලට අනුව විගණකාධිපතිවරයා පත් කළත්, 42වැනි විගණකාධිපතිවරයා විධියට නම් කරන්නේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිලධාරියෙක්. එතකොට, උගත්කමට, පළපුරුද්දට, කළ පුරුද්දට, හැකියාවට හා දක්ෂතාවට මොකද වෙන්නේ? මේක මහින්ද රාජපක්ෂ මහත්මයා හෝ ගෝඨාභය රාජපක්ෂ මහත්මයා හෝ මෛත්‍රීපාල සිරිසේන මහත්මයා හෝ කවුරු හෝ කළා නම් අපට ඒ ගැන හිතන්න දෙයක් නැහැ. නමුත්, ඥාතිකමට, සහෝදරත්වයට, මිත්‍රත්වයට, පාසලේ එකට ඉගෙන ගත්ත නිසා, විශ්වවිද්‍යාලයේ එකට ඉගෙන ගත්ත නිසා තනතුරු, තානාන්තර දෙන්න වර්තමාන ආණ්ඩුවත් පටන් ගත්තොත් මොකද වෙන්නේ? ඒකද ජන මතය? ජනතාව මේකටද ඡන්දය දුන්නේ? අවුරුදු 76ක ශාපය ගැන කථා කියලා තමයි ජනතාවට කථා කළේ. අන්තිමට දැන් අපට පෙනෙන්නට තිබෙන දේ තමයි, මේ වර්තමාන ආණ්ඩුවත් තෝරා පත් කරගෙන, නැවත 77, 78 ශාපයටත් මේ රටේ ජනතාවට මුහුණ දෙන්න සිදුවෙලා තිබෙනවා කියන එක.

මම මේ කාරණයත් කියන්න ඕනෑ. අපට මතකයි, එදා මේ පාර්ලිමේන්තුවේ පැවති COPE එකේදී විගණකාධිපතිවරයා කරපු සේවය. ඒ වාගේම COPA එකේදී අනෙකුත් රාජ්‍ය ආයතන ඉදිරියේ එතුමා කරපු සේවයත් අපට මතකයි. නමුත්, මෙවැනි ඉතාම වැදගත් ආයතනයක ප්‍රධානියා පත් කරන්න ආණ්ඩුව

කටයුතු කරන්නේ නැහැ. මේ ආණ්ඩුවේ බලය තිබෙනකොට තමයි මහ දවාලේ ගරු අධිකරණයට ඇවිල්ලා වෙඩි තියලා හොරෙක් හෝ මංකොල්ලකරුවෙක් හෝ මිනී මරුවෙක් මරලා දැම්මේ. දැන් මහ දවාලේ පාරේ පන්න පන්නා වෙඩි තියනවා. ඒ වාගේම පාරේ යන අහිංසක මිනිස්සු, කිසිම දේකට සම්බන්ධ නැති මිනිස්සු වෙඩි වැදිලා මරණයට පත් වෙනවා. දැන් මේ රටේ ජාතික ආරක්ෂාව පිළිබඳ දැඩි ප්‍රශ්නයක් තිබෙනවා. මේ අය මේ රටේ ජනතාවට පොරොන්දු වුණා, පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්ට යුක්තිය හා සාධාරණත්වය ඉෂ්ට කරනවා කියලා. හැබැයි, අප්‍රේල් 21වැනි දා මොකද කළේ? ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාවේ copy එකක්, වෙළුමක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දුන්නා. ඒකට නිලධාරින් 4දෙනෙක් පත් කළා. ඒකේ කියවන්න පිටු 65,000ක් තිබෙනවා. වර්තමාන ජනාධිපතිතුමාට පුළුවන්, ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කරන්න. නමුත්, ඒවා එකක්වත් ක්‍රියාත්මක කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාවට පොල් ප්‍රශ්නය වාගේම හාල් ප්‍රශ්නයත් තිබෙනවා. ඒ වාගේම දැන් මේ රටේ ලුණු ප්‍රශ්නයකුත් ඇතිවෙලා තිබෙනවා. ඒකට අරයාට, මෙයාට චෝදනා කරලා වැඩක් නැහැ. ඒ ගැන ආණ්ඩුවේ වැඩ පිළිවෙළ මොකක්ද කියන එක ආණ්ඩුව කියන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. හෙට අනිද්දා වෙනකොට පොල් තෙල් ප්‍රශ්නයකුත් ඇති වෙයිද කියලා අපට භයක් තිබෙනවා. මේ ප්‍රශ්න තුළින් අද වනකොට මිනිසුන්ගේ ජීවන වියදම වැඩිවෙලා තිබෙනවා. තව පැත්තකින් විදුලි බිල වැඩි කරන්න කටයුතු කරලා තිබෙනවා.

අපි අද අධිකරණය ගැන කථා කරනකොට "Newswire" වෙබ්අඩවියේ පළ වෙලා තිබෙනවා මම දැක්කා, ගරු විනිසුරුවරියකට ලිංගික වශයෙන් අපහාස කළා කියලා නීතිඥවරයෙක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා කියලා.

Online Safety Act එක වාගේ Act එකක්, එහෙම නැත්නම් ඊට ආසන්න නීති සම්පාදනයක් කරලා මේ රටේ සමාජ මාධ්‍ය ආරක්ෂා කරන්න කටයුතු කරන්නේ නැහැ.

ඒ වෙනුවට අරයාට, මෙයාට, ඉතිහාසයට ඇඟිල්ල දිගු කරමින් ඉන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ වෙඩි තියන එක කොච්චර භයානකද කිව්වොත්, නාරාහේන්පිට අපේ ගෙවල් ළඟත් වෙඩි තැබීමක් වුණා. ජාඇල මගේ ගෙදර ළඟත් දෙවතාවක් වෙඩි තියලා ගියා. පාතාලය අද ඒ තරම් ඉතාම භයානක තැනකට ගිහිල්ලා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය අද කඩාගෙන වැටිලා. අද කැබිනට් මණ්ඩලය පිළිගන්නවා, රටේ ඖෂධ හිඟයක් තිබෙනවා කියලා. හැබැයි, මේ ඖෂධ හිඟයට මොකක්ද කරන්නේ කියන එක පිළිබඳ කිසිම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ නැහැ. මේ රටේ ඖෂධ නිෂ්පාදනය කරන ආයතනවල ලියාපදිංචිය - registration - මේ නිලධාරින් ප්‍රමාද කරනවා. මේ රටේ නිෂ්පාදනය කරන ඖෂධ ලෝකයේ වෙනත් රටවලින් ගෙන්වන්න හදනවා. ඒක ඉන්දියාවේ වෙන්නේ නැහැ; ජපානයේ වෙන්නේ නැහැ; චීනයේ වෙන්නේ නැහැ. මේ අය මේ රටේ විතරක් මේ දේවල් කරන්න කටයුතු කරමින් යනවා. සෞඛ්‍ය ඇමතිවරයා ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්ෂික මහා සමුළුවට ගිහිල්ලා කියනවා, 2022 සිට 2025 දක්වා කාලය තුළ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරින් 4,600ක් පමණ රට අත්හැර ගිහිල්ලා තිබෙනවා කියලා. එහෙනම් රජය මොනවාද කරලා තිබෙන්නේ, මේ නිලධාරින් අපේ රටේ තියා ගන්න? වෛද්‍යවරුන්ට දීලා තිබෙන්නේ මොනවාද? ඒ අයගේ permit එක issue කරලා තිබුණාට ඒ permit එකට වාහන ගෙන්වන්න පුළුවන්ද? ඒ වාගේම අහිංසක වෛද්‍යවරියක් දූෂණයට ලක් වුණා. මොකක්ද, ඒ අයට ලැබිලා තිබෙන ආරක්ෂාව, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? සෞඛ්‍ය ක්ෂේත්‍රයම කඩාගෙන වැටිලා. ඖෂධ හිඟයි. ඒ හිඟ ඖෂධ රට තුළ නිෂ්පාදනය කරන්න වැඩ පිළිවෙළක් නැහැ. ඒවා නිෂ්පාදනය කරන අයට සහයෝගයක් ලබා දෙන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි. අපි දැක්කා, තරුණ සේවා සභාව අලුතින් "Youth Club" කියලා එකක් ආරම්භ කරලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී ඇති කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි දැක්කා, ඉස්සර චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය සමෘද්ධිය ආරම්භ කළාම බැසිල් රාජපක්ෂ මහත්මයා ඒක "දිවිනැගුම" වශයෙන් වෙනස් කළා. ඒ වාගේ නම වෙනස් කරන්නේ නැතුව ඒවා ඉදිරියට ගෙන යා යුතුයි. අද වෙනකොට අපේ රටේ තරුණයා වෙනස්. අද ලෝකයත් එක්ක දියුණු වෙච්ච සමාජයක තරුණයා ජීවත් වෙන්නේ. ඒ නිසා මේ තරුණයා දේශපාලන වහලෙක්, ඉත්තෙක් කරගන්නේ නැතුව කටයුතු කරන්න ඕනෑ. ඒකට නොවෙයි ඔබතුමන්ලාට මේ ජන වරම ලැබුණේ. ඒ නිසා වහාම මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියන එක මතක් කර දෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.08]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මට කථා කරන්න වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පළාත් පාලන මැතිවරණයේ ජන වරමින් පීඩාවට ලක් වෙලා ඉන්න ආණ්ඩුව, ඒ ජන වරමින් යන්න ඕනෑ දිශාව පෙන්වලා දෙද්දි ඊට අනුගත වෙලා නිවැරදි දිශාවේ ගමන් කරමින් ඉන්නවා කියලා මට පෙනෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකට හොඳම උදාහරණය මෙයයි. ඊයේ පෙරේදා ආරක්ෂක නියෝජ්‍ය ඇමති අරුණ ජයසේකර මැතිතුමා මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට සිසුන් බඳවා ගැනීමේදී මෙවර විදේශීය ශිෂ්‍යයන් හා කැඩෙට් නිලධාරින් සඳහා පමණක් අවස්ථාව ලබා දීමට රජය තීරණය කර තිබෙනවා කියලා. අපේ රටේ සිසුවන්ට ඒ අවස්ථාව අහිමි කරන්න තීන්දුවක් ගත්තා. මම දන්නේ නැහැ, මේක NPP එකේ තීන්දුවක්ද, JVP එකේ තීන්දුවක්ද කියලා. මොකද, ඒ පක්ෂ දෙකක් නේ. මම හිතන්නේ නැහැ, මේක NPP එකේ තීන්දුවක් කියලා. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා NPP එකේ කට්ටිය පාපිස්සක් විධියට පෙන්නුම් කළාට මට හිතෙනවා, ඒ

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

පාපිස්සේ අයට අර ටින් බෙලෙක්කවලට වඩා රට තොට ගැන, ජාත්‍යන්තරය ගැන යම් දැනුමක්, නුවණක්, අවබෝධයක් තිබෙනවා කියලා.

මට හිතෙන විධියට, මේක ආණ්ඩුව ගත්ත ඉතා වැරදි තීන්දුවක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ කවුද යන්නේ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට? එක batch එකකට 120ක් විතර යනවා. අපේ රටේ වෛද්‍ය පීඨයකට යන්න බැරි දරුවන් - නූලෙන් ගහලා ගියා, දශමෙන් ගහලා ගියා, කෙස් ගහෙන් ගහලා ගියා කියලා අපි කියන්නේ- තමයි මුදල් ගෙවලා මේ විශ්වවිද්‍යාලයට යන්නේ. එතකොට එක දරුවෙක් සාමාන්‍යයෙන් රුපියල් මිලියන 25ක් විතර උපාධිය අවසන් කරනකොට වියදම් කරනවා. ඉතින් මේ බාධාව දැමුවේ ඇයි? මේක හින්දා නොවෙයිද, මීට දශක ගණනාවකට කලින් මලයාසියාවට ගිය, ඉන්දියාවට ගිය, අපට රැකගන්නට තිබුණු මේ අධ්‍යාපන කේන්ද්‍රය - education centre එක - අපට අහිමි වුණේ? අද මලයාසියාවේ අවුරුද්දකට ඩොලර් මිලියන 1.5කට ආසන්න ප්‍රමාණයක් විදේශ මුදල් උපයනවා, වෙනත් රටවල දරුවන්ට අධ්‍යාපනය දීලා. ගරු ඇමතිතුමනි, අපේ රටේ දරුවෝ 700ක්, 800ක් විතර අවුරුද්දකට පිට රටවලට යනවා. මම කියන්නේ ඒ දරුවෝ medical studentsලා විධියට Belarus, China, UK, USAවලට යනවා කියන එකයි. UK, USAවලට යනකොට නම් ඩොලර් ලක්ෂ 3ක් විතර වියදම් වෙනවා.

Average එක ඩොලර් ලක්ෂයක් කියලා ගත්තොත්, ඩොලර් මිලියන 700ක්, 800ක් අපේ රටේ මුදල් දැනටත් පිට රටට යනවා. කොතලාවල වෛද්‍ය පීඨයට පිරිසක් ඇතුළු වන නිසා ඩොලර් මිලියන 12කට ආසන්න ප්‍රමාණයක් අපට රට තුළ නතර වනවා. හැබැයි, බෙලරුස්වල, චීනයේ C-2, S-1 එකට මුදලට වෛද්‍යවරු බිහි වෙද්දී, සාධාරණ මුදලකට උසස් අධ්‍යාපන සුදුසුකම් තිබෙන දරුවෝ අපේ රටේ බිහි වන එක වළක්වන්න මේ ආණ්ඩුවට තිබෙන වුවමනාව මොකක්ද? වෛද්‍යවරු හිඟ කාලයක මොකක්ද මේ තිබෙන වුවමනාව? කාගේද මේ වුවමනාව? එදා ගත්ත වැරදි තීන්දුව, දැන් ඔබතුමන්ලා ආණ්ඩුව අරගෙන තිබියදීවත් නිවැරදි කරන්නකෝ, දෙයියනේ. මේ වැරදි තීන්දු නේද එදා ගත්තේ? SAITM එක හදනකොට, රාගම වෛද්‍ය පීඨය එනකොට ඒවාට විරුද්ධ වීම නිසා ඒ අවස්ථා අපෙන් ගිලිහිලා මැලේසියාවට, ඉන්දියාවට ගිහිල්ලා, ඒ රටවල් අද ආදායම් ලබනවා. දැන්වත් මේ ආයතන හරියට කරන්නකෝ. ඔබතුමන්ලාට ජන වරමක් දුන්නා නේ. දැන් මේ කරලා තිබෙන වින්නැහිය මොකක්ද? මගේ දරුවෝ නැහැ, ඔය batch එකට ඇතුළත් වෙන්න. නැත්නම් හිතයි, මගේ දරුවාටත් බැරි වුණ නිසා තමයි මෙහෙම කියන්නේ කියලා. ඒකයි නලින් බණ්ඩාර කථා කරන්නේ කියලා හිතයි. එහෙම එකක් නොවෙයි. මට මේ ප්‍රවෘත්තිය කියපු ඉංජිනේරු මහත්මයාගේ දරුවෙකුටවත් එහෙම වෙලා නොවෙයි. මට message එකක් දාලා තිබෙනවා. මේ මාස 6ට හැම දාම සමගි ජන බලවේගයටයි, සජිත් ප්‍රේමදාසටයි බැණපු ඉංජිනේරු මහත්මයෙක් තමයි මට මේක කිව්වේ, ගරු ඇමතිතුමනි. මොකක්ද කිව්වේ? "ඈ යකෝ පිස්සුද මුන්ට, මොකද මේ වෙලා තිබෙන්නේ?" මම ඇහුවා, ඇයි, උඹට මොකද වෙලා තිබෙන්නේ කියලා. "නැහැ මචං, සොරි මචං, අපිටත් වැරදුණා තමයි" කිව්වා. මොකක්ද මේ කරන්නේ?

අධ්‍යාපන ඇමතිතුමිය එකඟද KDU එක වහපු එකට? එතුමිය උත්තරයක් දෙන්නකෝ. මම හිතන්නේ නැහැ, එකඟයි කියලා. මෙතැන NPP එකේ යමක් කමක් දන්නා, ලිබරල්වාදය විශ්වාස කරන අය මේකට එකඟද? මම හිතන්නේ නැහැ, එකඟයි කියලා. මම හිතන විධියට අනිවාර්යයෙන්ම මේ තීන්දුව reverse කරන්න වෙනවා, මේගොල්ලන්ට ආණ්ඩුව අවුරුදු 5ක් ගෙනියන්න පුළුවන් වුණොත්. මම හිතන්නේ නැහැ, අවුරුදු 5ක් යයි කියලා. හැබැයි, මේ තීන්දුව වෙනස් කරන්න වෙනවා. මේක අමන, මරිමෝඩ තීන්දුවක්. පැලවත්තේ තීන්දුවක් විධියට තමයි අපි මේක දකින්නේ. රටක් ඉස්සරහට යනකොට රටට තිබෙන අවස්ථා අපි ලබා ගන්න ඕනෑ. අපි opportunities ගත්තොත් තමයි, රටක් විධියට ඉස්සරහට යන්න පුළුවන්. 76 වසරක ශාපයට ප්‍රධාන හේතුව වුණේ, මේ අවස්ථා මඟ හැර දැමීමයි. අපේ රජයන් මේවා කරන්න යද්දී පාරට බැස්සා, උද්ඝෝෂණය කළා, මිනී මැරුවා. දැන් අපි කිව්වා නේ ඕවාට විරුද්ධ වෙන්නේ නැහැ, ඒ නිසා කරන්න කියලා. අපේ ඩබල් ගේම්_නැහැ කිව්වා නේ. ඇයි, වටගල මහත්මයා, මේවාට ඔබතුමන්ලා කථා කරන්නේ නැත්තේ? *[බාධා කිරීමක්]* ඇයි, මේවාට විරුද්ධව කථා කරන්නේ නැත්තේ? KDU එක වහපු එකට ඔබතුමා එකඟද? විද්‍යා හා තාක්ෂණ ඇමතිතුමා, ඔබතුමා එකඟද KDU එක වහපු එකට? එක්කෙනෙක් මට නැඟිටලා කියන්න.

ඔබතුමන්ලාට "පාපිස්ස" කියලා කිව්වා. ඒවා අමතක කරන්න. ඔය "පාපිස්ස" කියපු අය, ටින් බෙලෙක්ක. අපි තරයේ විරුද්ධයි, මේ ගත්ත තීන්දුවට. KDU එකට වියදම් කළේ කාගේ සල්ලිද? මේ රටේ බදු ගෙවන මිනිස්සුන්ගේ සල්ලි. KDU එක මේ තත්ත්වයට ගන්න, ඒක වෛද්‍ය විද්‍යාපීඨයක් බවට පත් කරන්න කොච්චර රජයේ මුදල්, භාණ්ඩාගාරයේ මුදල් වියදම් කරලා තිබෙනවාද? රටේ මුදල් රටේ ජනතාව වෙනුවෙන්, රටේ සෞඛ්‍යය වෙනුවෙන්, රටට උසස් වෛද්‍යවරයෙකු බිහි කිරීම වෙනුවෙන් නොවෙයිද යොදවන්න ඕනෑ? එහෙම නම්, මේ වාගේ මරිමෝඩ තීන්දු ගත්තේ කාගේ වුවමනාවටද? කවුද මේ වැරදි උපදෙස් ජනාධිපතිවරයාට හෝ ආරක්ෂක ඇමතිවරයාට දුන්නේ? ඒ නිසා මම රටේ ජනතාවට මේ කාරණය කියනවා. දැන් ඔබතුමන්ලා පණිවුඩයක් දීලා තිබෙනවා, ලක්ෂ 23ක් ඡන්ද අඩු කරලා. මේවා ගැන කථා කරන්න. විශේෂඥ වෛද්‍යවරු එනවා; ඔබතුමන්ලා මේ ගැන කථා කරන්න.

විශේෂයෙන්ම අද ප්‍රාදේශීය රෝහල්වල -විශේෂයෙන් පොළොන්නරුවේ, කුලියාපිටියේ, බිංගිරියේ, ගල්ගමුවේ- වෛද්‍යවරු අඩුයි. මේ වාගේ තීන්දු තීරණ ගත්තාම තව තව සෞඛ්‍ය ක්ෂේත්‍රයට වන හානියට වග කියන්නේ කවුද? රටින් යන ඩොලර්වලට කවුද වග කියන්නේ? කොතලාවල වෛද්‍ය පීඨය වාගේ තව 5ක් හැදුවොත්, අපෙන් වර්ෂයකට යන 700ක්, 800ක් ප්‍රමාණය, බෙලරුස්වල, චීනයේ, මැලේසියාවේ, UK, USA, ඕස්ට්‍රේලියාවේ වෛද්‍ය විද්‍යාලවලට යන දරුවෝ මෙහේ නතර වනවා. ඒ රටවලට වඩා උසස් තත්ත්වයේ උපාධියක් අපට තිබෙන්නේ. අපේ වෛද්‍ය සේවාව, රෝහල් සේවාව, සත්කාරක සේවාව උසස් මට්ටමේ තිබෙනවා, UK, USAවලට සමානව. එහෙනම්, අපි එතැනට නේද මේ රට ගෙනියන්න ඕනෑ? ඒකට නේද ඔබතුමන්ලාට ජන වරමක් දුන්නේ? අද හැම දෙයටම විරුද්ධ වන විපක්ෂයක් නැහැ. එහෙනම්, ඒ වැරදි තීන්දුව ගත්තේ කවුද කියන එක කරුණාකරලා අපට කියන්න. මෙතැන සිටින එක්කෙනෙකු නැඟිටලා කියන්න. එක්කෙනෙකු හෝ හයිය අරගෙන කියන්නකෝ, මේක වැරදි තීන්දුවක් නොවෙයි, හරි තීන්දුවක් කියලා. ඒ මේ නිසාය කියලා කියන්නකෝ බලන්න එක්කෙනෙක් හරි නැඟිටලා? ඔය ඉන්න එක NPP හෝ JVP මන්ත්‍රීවරයෙක් මම කියන කතන්දරය හරිද, වැරදිද කියලා කියන්න. වැරදි නම් වැරදියි කියන්න එපා යැ. නැහැ, නැහැ අපි තීන්දුව ගත්තේ මේකයි කියලා කියන්න එපා යැ. ඉස්සර ඔයගොල්ලන් මේ ගැන කිව්වා. ඉස්සෙල්ලා ඔයගොල්ලන් කිව්වා, "සැමට අධ්‍යාපනය, සමාන අධ්‍යාපනය" කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ නිසා ඉස්සර කියපු කතන්දර වැඩක් නැහැ. දැන් ඔබතුමන්ලා බලයේ ඉන්නවා. මේ රටේ මිනිස්සු ඡන්දය දුන්නේ JVP හෝ NPP ප්‍රතිපත්තිවලට නොවෙයි. මේ රටේ ජනතාව ඔබතුමන්ලාට බලය දුන්නේ හරි දේවල් කරන්නයි. මේ ගන්නා තීන්දු, තීරණ නිසා මාස හය හතකින් ඔබතුමන්ලාට පාරේ බැහැලා යන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
හා, හා!

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
අන්න, ඒකට විතරක් කට ඇරෙනවා. වටගල මහත්මයාට ඒකට "හා, හා" කියැවෙනවා. හැබැයි, මේ KDU එක ගැන කියනකොට "හ්ම්" ගාගෙන ඉන්නේ. මොකක්ද නියෝජ්‍ය ඇමතිතුමා, නැඟිටලා කියන්නකෝ. ඔබතුමා ඒ දවස්වල අධිකරණය ඉස්සරහට ගිහින් හැම දාම voice-cut දුන්නා. ඔබතුමාගේ තිබුණු තේජාන්විත, ප්‍රතාපවත්භාවය දැන් කෝ? තෙමුණු කුකුළෙක් වාගෙයි දැන් වටගල මහත්මයා. මේවාට උත්තර නැහැ. එක්කෙනෙක් හෝ නැඟිටලා කියන්නකෝ, ඇයි KDU එක වැහුවේ කියලා. මම බලාගෙන ඉන්නම්, තව අවස්ථාවක් දෙන්නම්, ඇයි KDU එක වැහුවේ කියන්න? මේ රටේ ජනතාවට මම කියනවා, දැන්වත් ඇස් ඇරලා බලන්න කියලා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
KDU එක වැහුවේ නැහැ. KDU එක තිබෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
KDU එකේ මේ වෛද්‍ය උපාධිය නැවැත්තුවේ මොකද කියලා මම අහන්නේ. KDU එක වැහුවා කියලා මගේ කටින් වචනය පිටවෙනකොට ඒකට ඔබතුමාගේ කට ඇරෙනවා. KDU එකේ වෛද්‍ය උපාධිය නැවැත්තුවේ ඇයි කියලා කියන්න කෙනෙක් මේ පාර්ලිමේන්තුවේ ඉන්න පාටක් නැහැ. ඒ නිසා කරුණාකර ඒ වැරදි තීන්දුව නිවැරදි කරන්න කියා අධ්‍යාපන ඇමතිතුමිය විධියට ගරු ආචාර්ය හරිනි අමරසූරිය අගමැතිතුමියට අපි කියනවා. මේක නිවැරදි කරන්න. මේක, ඔබතුමන්ලා එදා විපක්ෂයේ සිටියදී ගත්ත ඒ මරිමෝඩ තීන්දුව ආණ්ඩුවේ ඉඳගෙනත් ගත්තා වාගේ වැඩක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මම අවසන් කරනවා.

ඒ නිසා කරුණාකර, KDU 10ක් හදන්න යෝජනාවක් ගෙනෙන්න. අපි අනුමත කරන්නම්. KDU එක දියුණු කරන්න. පිට රට විශ්වවිද්‍යාලවලට මේ රටට එන්න කියන්න. අපේ රට අධ්‍යාපන hub එකක් කරන්න. පාපිසි කියලා අපහාස කරපු අය පාපිසි නොවෙයි කියලා මම දන්නවා. ටින් බෙලෙක්කවලට පාපිසි යටවෙන්න එපා කියලා මම කියනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුනීර් මුලෆ්ෆර් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.17]

**ගරු මුනීර් මුලෆ්ෆර් මහතා (ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - தேசிய ஒருமைப்பாட்டு பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of National Integration)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් අද සුවිශේෂී පනත් කෙටුම්පත් දෙකක් පිළිබඳව මේ උත්තරීතර සභාව තුළ සාකච්ඡා වෙනවා. අපි දන්නවා, සාමාන්‍යයෙන් ලෝකය දියුණු වෙනකොට, ලෝකය වෙනස් වෙනකොට, ලෝකයේ පැවැති නීති ඒ කාල වකවානු අනුව වෙනස් වන බව. නීතියක් සඳහා අරමුණක් තිබෙනවා. ඒ වාගේම ඒ නීතියේ අන්තර්ගතයක් තිබෙනවා. ඒ වාගේම, ඒ නීතිය සැකසීම සඳහා වූ පසුබිමක් තිබෙනවා. ඒ සකසන නීතිය හරහා යම් ඉලක්කයකුත් තිබෙන බව අපි හැමදෙනාම දන්නවා. තාක්ෂණයත් එක්ක ලෝකය දියුණු වෙනකොට, ලෝකය වෙනස් වෙනකොට, ඒ තාක්ෂණයත් එක්ක, ඒ වෙනස්වීමත් එක්ක නීති රාමු වෙනස්වීමේ තත්ත්වයක් අපි ලෝකය පුරාම දකිනවා. ඒ අනුව තමයි මේ නීතියටත් සංශෝධන ඉදිරිපත් කර තිබෙන්නේ. මේ ගැන මේ උත්තරීතර සභාව තුළ කරුණු කාරණා ගොඩක් සාකච්ඡා වුණා, කරුණු කාරණා මතු කළා.

இந்தச் சபையில் ஒரு விடயத்தைக் குறிப்பிட வேண்டும். நாட்டின் தேசிய பாதுகாப்பு ஆபத்தில் இருப்பதாகவும் நாட்டில் கொலைகள் நடைபெறுவதாகவும் கடந்த பல மாதங்களாக எதிர்தரப்பினர் அடிக்கடி கருத்துகளைச் சொல்லி வருகின்றார்கள். தேசிய மக்கள் சக்தி அரசாங்கம் ஒரு விடயத்தை மிகத் தெளிவாகக் குறிப்பிட்டு வருகின்றது. பாதாள உலகக் குழுவினருக்கும் போதைப்பொருள் வியாபாரிகளுக்கும் இடையில் மிக நெருக்கமான தொடர்பு கடந்த காலங்களில் இந்த நாட்டிலிருந்த அரசியல்வாதிகளுக்கு இருந்தது என்பதை யாராலும் மறுக்க முடியாது. இந்த நாட்டின் தேசிய பாதுகாப்பு ஆபத்தில் இருப்பதாக ஊடகங்களுக்குக் கருத்துத் தெரிவித்த முன்னாள் பாராளுமன்ற உறுப்பினர் ஒருவர், அண்மையில் கொழும்புப் பகுதியில் கண்டுபிடிக்கப் பட்ட ரீ-56 ரக துப்பாக்கி சம்பந்தமான குற்றச்சாட்டின் பேரில் கைதுசெய்யப்பட்டு இருக்கின்றார்.

கடந்த காலங்களில் இந்த நாட்டில் வன்முறையோடும், இந்த நாட்டை அழித்தொழிக்கின்ற போதைப்பொருளோடும், கொலையோடும் சம்பந்தப்பட்ட ஓர் அரசியல் கலாசாரம்தான் காணப்பட்டது. இவ்வாறான அரசியலைத்தான் அன்றைய அரசியல்வாதிகள் செய்து வந்தார்கள். அதனால்தான் அவர்கள்

[ගරු මුනීර් මුලෆ්ෆර් මහතා]

கடந்த சனாதிபதித் தேர்தல் பிரச்சார மேடைகளில்கூட, தேசிய மக்கள் சக்தி ஆட்சிக்கு வருமாகவிருந்தால் இந்த நாடு இரத்த ஆறாக மாறுமெனச் சொன்னார்கள். நாங்கள் மூன்று தேர்தல்களைச் சந்தித்து, அந்த மூன்று தேர்தல்களிலும் வெற்றியடைந்து இருக்கின்றோம். இந்த நாட்டில் சுதந்திரத்துக்குப் பின்னர் முதல் தடவையாக எந்தவிதமான வன்முறைச் செயற்பாடுகளும் இல்லாமல் தேர்தல் வெற்றியைக் கொண்டாடுகின்ற ஒரு புதிய கலாசாரத்தை தேசிய மக்கள் சக்தி உருவாக்கி இருக்கின்றது.

இதனைத் தாங்கிக்கொள்ள முடியாதவர்கள், மக்களை விற்று, மக்களின் சொத்துக்களைத் திருடி, கொள்ளையடித்து செய்த அரசியல் தன்னைவிட்டு அகன்றுவிடுமோ என்ற பயத்தின் காரணமாக இந்த அரசாங்கத்தை சூழ்ச்சிகள்மூலம் வீழ்த்துவதற்காக உண்மைக்குப் புறம்பான பல கருத்துகளைச் சொல்லி வருகின்றார்கள். இன்று பொலிஸ் தரப்பினரால் கைது செய்யப்படுபவர்களைப் பார்க்கும்போது, அவர்கள் எந்த அணியினருடன், யாருடன் இணைந்திருந்தார்கள் என்ற விடயம் மிகத் தெளிவாகத் தெரிகின்றது. எனவே, இந்த நாட்டில் வன்முறையற்ற, இனவாதமற்ற, பிரதேசவாதமற்ற ஓர் அரசியல் கலாசாரம் மிளிர வேண்டுமென்ற எதிர்பார்ப்புடன் செயற்படுகின்ற ஓர் அரசியல் கட்சி தேசிய மக்கள் சக்தி என்பதை நான் இங்கு சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මෙතැනදී විශේෂයෙන් මතක් කළ යුතු කාරණාවක් තිබෙනවා. පසුගිය දවස්වල එක්තරා ස්වාමීන් වහන්සේ නමක් මා පිළිබඳ අභූත චෝදනාවක් නගා තිබුණා; පට්ටපල් බොරුවක් සමාජයට කියා තිබුණා. අපි සාමාන්‍යයෙන් පිළිගන්නා දෙයක් තමයි එක් ජාතිවාදී කඳවුරක් තවත් ජාතිවාදී කඳවුරක් පෝෂණය කරනවාය කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ චෝදනාව පිළිබඳව කරුණු එකින් එකට පැහැදිලි කිරීමේ වගකීමක් මට තිබෙනවා. පළමුවෙනි කාරණාව, තිහාරිය ප්‍රදේශයේ තිබෙන එක්තරා අධ්‍යාපන ආයතනයක භාරකරුවකු ලෙස මම අදටත් කටයුතු කරනවා කියන චෝදනාව. මීට අවුරුදු 10කට කලින් මම තිහාරිය ප්‍රදේශයට පදිංචියට එන්න පෙර සිටම එම ආයතනය තිබුණා කියලායි මා හිතන්නේ. නමුත් එම ආයතනයේ සිටින අධ්‍යක්ෂවරුන් හෝ එහි කටයුතු කරන අය පිළිබඳව අද වනකල් මා දැනුවත්ව නැහැ. මම හිතනවා, උන්වහන්සේට තොරතුරු ලබා දෙන අය ලබා දෙන්නේ වැරැදි තොරතුරු කියලා. වැරැදි තොරතුරු හරහා පට්ටපල් බොරු සමාජගත කරලා ඒ හරහා ඕනෑම කෙනෙකුට ඕනෑම කෙනෙකු නැවත නැවතත් තුවාල කරන්න පුළුවන්. හැබැයි, කෙනෙක් සුවපත් කරන්න පුළුවන් වන්නේ හොඳ හෘදය සාක්ෂියක් තිබෙන, හොඳ හදවතක් තිබෙන, රටට ආදරය කරන, ජන සමාජයට ආදරය කරන අයට පමණයි. මේ රට අවුරුදු 30ක් තිස්සේ ලේ විලක් වෙලා තිබුණා. ඒකෙන් මේ රටේ ජනතාව දුක් වින්දා; පීඩා වින්දා. හැබැයි, තව තවත් ජාතිවාදය මත්තෙන්ම දේශපාලනය කිරීම සඳහා කොන්ත්‍රාත් කරන පිරිසට නම් ඕනෑ තරම් තුවාල සිදු කළ හැකියි. හැබැයි, තුවාල සුවපත් කළ හැක්කේ විශිෂ්ට මිනිස්සුන්ටයි කියන පණිවුඩය මා ලබා දෙන්න කැමතියි.

දෙවැනි කාරණාව මේකයි. උන්වහන්සේ සඳහන් කළා, අපි අන්තවාදය සමඟ, මූලධර්මවාදය සමඟ සම්බන්ධයි කියන කාරණය. මේ රටේ ආදරණීය බෞද්ධ ජනතාව, ආදරණීය හින්දු ජනතාව, ආදරණීය කතෝලික ජනතාව සමඟ වාගේම, ඒ සියලු ජන ප්‍රජාව නියෝජනය කරන ආගමික නායකයන් සමඟත් අපට ඉතාම සමීප සම්බන්ධකම් තිබෙනවා. එදා ඒ ස්වාමීන් වහන්සේ මට විරුද්ධව එම ප්‍රකාශය කළාම මම මුලින්ම කථා කළේ, අත්තනගල්ල රජමහා විහාරාධිපති අපේ පූජ්‍ය (ආචාර්ය) පන්නිල ශ්‍රී ආනන්ද නායක ස්වාමීන් වහන්සේට. අපි එවන් බැඳීමක් එක්ක කටයුතු කරන මිනිස්සු.

විශේෂයෙන් මතක් කර දිය යුතුයි, අපි අන්තවාදය වෙනුවෙන් කථා කරන අය නොවෙයි කියලා. අපි හැම දාමත් මේ රටේ සාමය වෙනුවෙන් කථා කරපු අය. මට ඒ චෝදනාව කරන අය මේ රට ගිනි තියන කොට, මේ රටේ ජාතිවාදය වපුරනකොට විශේෂයෙන් ජාතික ජන බලවේගය ලෙස, ජනතා විමුක්ති පෙරමුණ ලෙස අපි රට පුරාම -මාතරට, කොළඹට, නුවරට විතරක් නොව රටේ හැම තැනටම- ගිය ආකාරය මට මතකයි. අපි එහෙම ගිහිල්ලා අපේ ආදරණීය හැම කෙනාටම කියපු පණිවුඩය තමයි "අපි මිනිස්සු" කියන එක. අපි අදහන ආගම් තිබෙන්න පුළුවන්, අපි බැඳෙන සංස්කෘති තිබෙන්න පුළුවන්, අපට විවිධ මතවාද තිබෙන්න පුළුවන්. හැබැයි, ඒ සියල්ලට කලින් "අපි මනුෂ්‍යයන්" කියන හැඟීමත් එක්ක මේ රට ගොඩ දමමු කියන පණිවුඩය තමයි එදා අපි රට පුරාම අරගෙන ගියේ.

අපි දන්නවා, අද වන විට සෑම ජාතිවාදී කඳවුරක්ම බයට පත් වෙලා ඉන්නේ. ඒක මුස්ලිම් ජාතිවාදය වෙන්න පුළුවන්, එහෙම නැත්නම් වෙනත් ජාතිවාදයක් වෙන්නත් පුළුවන්. අද ඔවුන්ගේ පැවැත්ම නැති වෙලායි තිබෙන්නේ. පසුගිය මහ මැතිවරණය තුළින් මේ රටේ ජනතාව ඒ අයට උත්තරයක් දුන්නා. එහිදී තවත් චෝදනාවක් කර තිබුණා, ජාමියා නලීමියා කියන අධ්‍යාපන ආයතනය පිළිබඳව. මා හිතන විධියට ඒ උසස් අධ්‍යාපන ආයතනයෙන් අධ්‍යාපනය හදාරපු අය අපේ රටේ මැතිවරණ කොමසාරිස්වරු වෙලා හිටියා, අපේ රටේ අමාත්‍යාංශ ලේකම්වරු බවට පත් වෙලා හිටියා, තවත් උසස් නිලතලවල හිටියා. විශේෂයෙන් එම ආයතනය මේ රට තුළ ස්ථාපිත කිරීමේදී බේරුවල ප්‍රදේශයේ ඉන්න ප්‍රධාන දානපතියෙකුට අදහසක් තිබුණා. ඒ තමයි, කෙනෙකු පෝෂණය වෙන්න ඕනෑ ධර්මය පිළිබඳ දැනුමින් විතරක් නොවෙයි, තමන් ජීවත් වන සමාජය, රට පිළිබඳ දැනුමත් එක්කයි කියන කාරණාව.

එහෙම හැදෙන කොට තමයි රටේ තිබෙන සියලු සංස්කෘතීන්වලට ගරු කරමින්, සියලු සංස්කෘතීන් සමඟ බද්ධ වෙලා, එකතු වෙලා ඒ ගමන යන්න පුළුවන් වෙන්නේ කියන විශ්වාසය තුළ එම ආයතනය හැදුණා. පසුගිය කාලයේ ඒ උසස් අධ්‍යාපන ආයතනය රටේ විශ්වවිද්‍යාලයක් තරමට උසස් කරන්න තරම් යෝජනා පැමිණි බව මම මෙතැනදී මතක් කරන්න කැමැතියි. එහෙම නම් තොරතුරු නොදැන කථා නොකළ යුතුයි. ඒ සඳහන් කරන පරිදි එරාවූර් ප්‍රදේශය තුළ එවැනි පත්‍රිකාවක් බෙදලා තිබුණා නම්, ඒ පිළිබඳව සොයා බලා එ් පිළිබඳව කටයුතු කළ යුතුයි. සෑම ජාතිවාදයක්ම, සෑම අන්තවාදයක්ම, සෑම මූලධර්මවාදයක්ම අපි අනිවාර්යයෙන්ම පිටු දකිනවා. අපි කවදාවත් ඒක අනුමත කරන්නේ නැහැ.

ඔබතුමන්ලා දන්නවා, පාස්කු දින ප්‍රහාරය වෙලාවේ අද අපට චෝදනා කරන අය අපි ඉදිරියට ඇවිල්ලා කිව්වේ මොකක්ද කියලා. අපට අවශ්‍ය වුණේ මේ රට සුවපත් කරන්නයි. විශේෂයෙන් මේ රටේ හිටපු හමුදාපතිවරු දන්නවා අපි කොහොමද ක්‍රියා කළේ, අපි කොහොමද සහයෝගයෙන් කටයුතු කළේ කියන එක. ඒ පිළිබඳ කරුණු කාරණා ඒ අය දන්නවා.

සමහරු තමන්ගේ පැවැත්ම නැති වෙනකොට, අවලංගු කාසි බවට පත් වෙනකොට, වැලේ වැල් නැති වෙනකොට මොනයම් හෝ දෙයක් මතු කරලා, චෝදනා කරලා, ඒ පිළිබඳව කථා කරන්න උත්සාහ කරනවා. රටට ආදරය කරන මිනිස්සු ලෙස අපි හැම කෙනාටම විශේෂයෙන් අවශ්‍ය සාමයයි. අපි හැම කෙනාටම අවශ්‍යයි සහජීවනයෙන්, සහෝදරත්වයෙන් මේ රට ගොඩ දමන්න.

අද විපක්ෂයේ ඉන්න අයට මේ රටේ බලය හොබවන්න මීට පෙර අනන්ත අප්‍රමාණ වාරයක් මේ රටේ ජනතාව අවස්ථාව දුන්නා; රට ඉදිරියට අරගෙන යන්න අවස්ථාව දුන්නා. ඒ අය ඒ සෑම අවස්ථාවකදීම රට වළ පල්ලට තමයි ගෙනිහින් තිබුණේ. හැබැයි අද ජනාධිපතිවරයා, ඇමතිවරු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සියලු කැපකිරීම් කරලා, පරිත්‍යාග කිරීම් කරලා තමන්ගේ වරප්‍රසාද සියල්ල අහිමි කරගෙන මේ රට නිසි තැනකට ගෙන යා යුතුයි කියා හිතලා ඒ වෙනුවෙන් වෙර දරන විට, ඒ වෙනුවෙන් කටයුතු කරන විට විවිධ චෝදනා අරගෙන ඇවිල්ලා අකුල් හෙළන තත්ත්වයකට මෙතුමන්ලා පත් වෙලා ඉන්නවා.

මම හිතනවා, අපි හැම කෙනාටම විශාල වගකීමක් තිබෙනවා කියලා. ඒ වගකීම අපට -ආණ්ඩුවට- පමණක් නොවෙයි තිබෙන්නේ. මේ රටේ වෙසෙන සිංහල, දෙමළ, මුස්ලිම් කියන සියලු ජාතීන්ට, ආගම් වශයෙන් ගත්තත් බෞද්ධ, හින්දු, ඉස්ලාම්, කතෝලික කියන සියලු ආගමිකයන්ට ඒ වගකීම තිබෙනවා. මේ රටට සාමය උදා කිරීම වෙනුවෙන් වැඩ කිරීම ආයතනයක වගකීමක් විතරක් නොවෙයි. එය සෑම පුරවැසියෙකුගේම වගකීමක් ලෙසත් අපි දකිනවා.

පසු ගිය මැතිවරණ සමය තුළ අපි දැකපු දේ තමයි විපක්ෂය විවිධ අභූත චෝදනා නඟපු එක. විශේෂයෙන් මට නඟපු චෝදනාවලට නිහඬව ඉන්න තිබුණා. හැබැයි, ඔය වාගේ චෝදනා නැඟෙනහිර පළාතෙන් පාර්ලිමේන්තුවට පත් වෙලා ආපු සමහර අයට වාසනාවක් වුණාට, අපට වගකීමක් තිබෙනවා, සත්‍යය පැහැදිලි කර දීලා, ඇත්ත සමාජයට කියා දීලා අප මේ සමාජය තුළ වැඩ කරන විධිය පිළිබඳව සමාජයට තේරුම් කර දීමට. ඒ වගකීම අපට තිබෙනවා.

විශේෂයෙන් ඊයේ පාර්ලිමේන්තුවේ මතු වෙච්ච කාරණයක් තිබෙනවා. අපි උතුරට ගියත්, අපි නැඟෙනහිරට ගියත්, අපි කඳුකරයට ගියත්, අපි දකුණට ගියත් සියලුදෙනාටම කියන්න තිබෙන්නේ එකම පණිවුඩයයි. මම ඒ බව ආදරණීය ඔබතුමන්ලාට මතක් කරන්න කැමැතියි. මම ඇත්තටම සතුටට පත් වන එක්තරා දෙයක් තිබෙනවා. සමහර පක්ෂ හිතාගෙන ඉන්නවා ඒගොල්ලන්ගේ පක්ෂ සමඟිය පිළිබඳව කථා කරන පක්ෂ කියලා. එදා යහ පාලන ආණ්ඩුව වෙලාවේ මුස්ලිම් ජාතික කැබිනට් ඇමතිවරු 4දෙනෙක් හිටියා. ඒ ආණ්ඩුවේ කැබිනෙට්ටුවේ හිටපු ඒ ඇමතිවරු, ඒ නියෝජ්‍ය ඇමතිවරු එදා ඒ පැවැති ජාතිවාදයට මුහුණ දෙන්න බැරිව ඉල්ලා අස් වෙන කොට, "මේ අය අපේ පක්ෂය නියෝජනය කරන ඇමතිවරු නේද?" කියලා කනගාටුවට පත් වෙලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා තමන්ගේ සගයා බේරා ගන්න කථා කරන්න එතුමන්ලාට එදා බැරි වුණා. නමුත්, අද අපට එරෙහිව අවලාද නඟන කොට අද ජාතික ජන බලවේගය නියෝජනය කරන අපේ මන්ත්‍රීවරියන්, මන්ත්‍රීවරු ඒ ජාතිවාදයට එරෙහිව පෙරට ඒම පිළිබඳව ජාතික ජන බලවේගයේ සාමාජිකයෙකු ලෙස මා ඉතා සතුටට පත් වෙනවා.

අවසාන වශයෙන් මට මෙන්න මේ පණිවුඩය තමයි කියන්න තිබෙන්නේ. මගේ වචන උච්චාරණයේදී වැරදීමක් වුණොත් මට සමාවෙන්න කියලා මම බෞද්ධ ජනතාවගෙන් ඉල්ලා සිටිනවා. විශේෂයෙන් ධම්ම පදයේ මෙසේ සඳහන් වෙනවා:

"කායේන සංවරෝ සාධු
සාධු වාචාය සංවරෝ
මනසා සංවරෝ සාධු
සාධු සබ්බත්ථ සංවරෝ..."

මෙන්න මේක තමයි පණිවුඩය. තමන්ගේ සිත, තමන්ගේ කය, තමන්ගේ වචනය සංවර කරගෙන යන ගමන තමයි සැබෑ මනුෂ්‍ය ගමන කියා අපි විශ්වාස කරනවා.

මම මේ කාරණයත් විශේෂයෙන් කියන්න කැමතියි.

"වෛරයෙන්, වෛරය කවදාවත් නොසන්සිඳේ. අවෛරයෙන් වෛරය සන්සිඳේ."

එහෙම නම්, තවදුරටත් මේ රට තුළ සැකය, අවිශ්වාසය, වෛරය වපුරන්නේ නැතිව අපි හැම කෙනාම එකතු වෙලා මේ රට තුළ විශ්වාසය වපුරමු. ඒ විශ්වාසය වපුරන්න ඕනෑ නිසා තමයි, ඒ සහෝදරත්වය හදන්න ඕනෑ නිසා තමයි මුස්ලිම් පල්ලිවලට වෙනත් ආගමික නායකයන්ට යන්න බැහැ කියලා මතවාදයක් හැදිලා තිබුණු වෙලාවේත් "Welcome to my masjid"; "අපි එකතු වෙලා තේරුම් ගනිමු" කියන පණිවුඩය රැගෙන ආවේ.

සමහර අයගේ අවලාද, අභියෝග, විවේචන මැද්දේ වුණත් අපි යන මේ සහෝදරත්වයේ ගමන නතර කරන්නේ නැහැ. ආණ්ඩුවක් ලෙසත්, පුද්ගලයන් ලෙසත් අපි හැම විටම මේ රට තුළ ජාතිවාදය පරාජය කරමින් තමයි මේ රට ගොඩ නඟන්නේ කියන පණිවුඩය මම ලබා දෙනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.33]

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சுடன் தொடர்புடைய குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சியடைகின்றேன்.

நமது நாட்டைப் பொறுத்தவரையில், நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சானது மிக முக்கியமான ஓர் அமைச்சாகும். நமது நாட்டில் நீதியை நிலைநாட்டுவதுடன் மாத்திரம் நின்றுவிடாது, நாட்டில் சகல இன மக்களும் சமத்துவமாகவும் சமவுரிமையோடும் வாழ்வதற்கான சட்டமூலங்களை உருவாக்கக்கூடிய ஓர் அமைச்சாகவும் இது இருக்கின்றது. கௌரவ பிரதி அமைச்சர் அவர்கள் சொன்னதுபோன்று, அண்மையில் ஒன்றன் பின் ஒன்றாக நடந்து முடிந்த மூன்று தேர்தல்களிலும் பெரும்பாலான மக்கள் தேசிய மக்கள் சக்திமீது நம்பிக்கைவைத்து அக்கட்சிக்கு வாக்களித்து இருக்கின்றார்கள். அரசாங்கம் மக்களுக்கு அளித்த வாக்குறுதிகளை நிறைவேற்றுவதற்குரிய பணிகளைச் செய்யக்கூடிய ஓர் அமைச்சாகவும் நீதி அமைச்சு இருந்து கொண்டு இருக்கின்றது. இந்த நாட்டில் நடைமுறையிலுள்ள பயங்கரவாதத் தடைச் சட்டத்தை இல்லாமல் செய்வதாக நீங்கள் மக்களுக்கு வாக்குறுதி அளித்தீர்கள். எனவே, நீதி அமைச்சானது முதலில் பயங்கரவாதத் தடைச் சட்டத்தை நீக்குவதற்குரிய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். "பயங்கரவாதத் தடைச் சட்டத்தை நீக்குவோம்; எல்லா மக்களுக்கும் சம உரிமை வழங்குவோம்" என்று கூறி ஆட்சிக்கு வந்த நீங்கள் இன்னும் அதைச் செய்யாமல் இருக்கின்றீர்கள்.

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

கடந்த காலங்களில் அப்பாவி மக்களைக்கூட பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் கைதுசெய்த நிகழ்வுகள் இடம்பெற்று இருக்கின்றன. எதிர்காலத்தில் அவ்வாறு நடைபெறாமல் இருப்பதற்காகவும் இந்த நாட்டின் ஒற்றுமைக் காகவும் சகல மக்களும் சமாதானமாக வாழ்வதற்காகவும் இந்தப் பயங்கரவாதத் தடைச் சட்டத்தை நீக்க வேண்டுமென நான் கேட்டுக் கொள்கின்றேன். "நாங்கள் ஆட்சிக்கு வந்தால், புதிய அரசியலமைப்பை உருவாக்குவோம்" என்றும் நீங்கள் வாக்குறுதி அளித்தீர்கள். எனினும், இதுவரை அது சம்பந்தமான எந்தவிதமான நடவடிக்கையையும் எடுக்காமல் இருக்கின்றீர்கள். எனவே, கௌரவ நீதி அமைச்சர் உட்பட சம்பந்தப்பட்ட எல்லோரும் சேர்ந்து புதிய அரசியலமைப்பை உருவாக்குகின்ற செயற்பாடுகளில் ஈடுபட வேண்டுமென நான் கேட்டுக் கொள்கின்றேன்.

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சின்கீழ் இருக்கின்ற இன்னொரு மிக முக்கியமான விடயம்தான் இன ஒற்றுமையை ஏற்படுத்தக்கூடிய தேசிய ஒருமைப்பாடு! நான் நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் ஒரு முன்மொழிவை வைத்தேன். அது பற்றி நான் இந்தச் சபையில் சொல்ல வேண்டும். அதாவது, சமத்துவம், தேசிய ஒருமைப்பாடு இருக்க வேண்டும் என்பதற்காக Clean Sri Lanka வேலைத்திட்டம் தொடர்பில் அமைக்கப்பட்டுள்ள செயலணியில் எல்லா இன மக்களையும் பிரதிநிதித்துவப் படுத்தக்கூடிய வகையில் அங்கத்தவர்கள் இருக்க வேண்டுமெனச் சொன்னேன். அச்செயலணியில் ஒரே இனத்தைச் சேர்ந்த 18 பேர் இருக்கிறார்கள். அதனை Clean Sri Lanka என்று சொல்ல முடியாத அளவுக்கு எங்களுடைய மனம் வருத்தமடைந்திருக்கிறது. எனவேதான் இந்த நாட்டில் வாழ்கின்ற தேசிய இனங்களான சிங்களவர், தமிழர், முஸ்லிம்கள் என அனைவரும் அங்கம்வகிக்கக்கூடிய ஒரு செயலணியாக அது அமையக்கூடிய விதத்தில், தமிழ், முஸ்லிம் இனத்தைச் சேர்ந்தவர்களையும் அதில் உள்வாங்குமாறு நான் கௌரவ பிரதி அமைச்சரிடம் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ நீதி அமைச்சர் அவர்கள் சொன்னார், இது சம்பந்தமான பதிலை கௌரவ பிரதி அமைச்சர் அவர்கள் சொல்வார் என்று. கௌரவ பிரதி அமைச்சர் அவர்கள் அந்த ஆலோசனைக் குழுக் கூட்டத்தில், Clean Sri Lanka வேலைத்திட்டம் நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சின்கீழ் வருவதில்லை என்றும் சனாதிபதி அவர்களுக்குக்கீழ் வருகின்ற சனாதிபதி செயலகம்தான் அதனைச் செயற்படுத்துகின்றது என்றும் சொன்னார். சனாதிபதி அல்ல வேறு யாராக இருந்தாலும், இன சமத்துவமில்லாத செயற்பாடுகளை மேற்கொள்ளும்போது அதனை நிவர்த்தி செய்ய வேண்டியது நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சின் கடமை! இல்லாவிட்டால், இந்த நாட்டில் சமத்துவம், இன ஒற்றுமை என்பன பேச்சளவில் மாத்திரம்தான் இருக்கும். நாங்கள் இன்னும் அதனைச் செயற்பாட்டில் கொண்டுவராமல் இருக்கின்றோம். எனவே, கௌரவ அமைச்சர் அவர்கள் உடனடியாக Clean Sri Lanka வேலைத்திட்டம் தொடர்பில் அமைக்கப்பட்டுள்ள செயலணிக்கு தமிழ், முஸ்லிம் இனத்தைச் சேர்ந்தவர்களை நியமிக்க வேண்டுமென நான் கேட்டுக் கொள்கின்றேன். அவர்கள் உங்களுக்கு ஆதரவானவர்களாக இருந்தாலும் பரவாயில்லை!

அடுத்து, நீங்கள் இந்த அமைச்சின் செயற்பாடுகளைச் சிறந்த முறையில் செய்ய வேண்டுமென நான் எதிர்பார்க்கின்றேன். இந்த நாட்டிலுள்ள இனவாதிகள் கௌரவ பிரதி அமைச்சர் சம்பந்தமாகப் பேசுகின்ற விடயம் உண்மையிலேயே எங்களுக்குக் கவலையை அளிக்கின்றது. மதத் தலைவர்கள் ஒரு நாளும் இனவாதம் பேசக்கூடாது. அவ்வாறு இனவாதம் பேசுபவர்களை உடனடியாகக் கைதுசெய்து சட்டத்தின்முன் நிறுத்த வேண்டும். அது யாராக இருந்தாலும் சரியே! இந்த நாட்டில் இனவாதத்தை இல்லாமல் செய்வதாகக் கூறி ஆட்சிக்கு வந்த இந்த அரசாங்கம், தற்பொழுது நல்லதொரு நிலைமையை ஏற்படுத்தி இருக்கின்றது. அதை நாங்கள் ஏற்றுக்கொள்கின்றோம். அதேநேரம், இனவாதத்தை முற்றாக ஒழிக்க வேண்டுமென நான் கேட்டுக்கொள்கின்றேன். இந்த நாட்டில் ஐக்கியமாக வாழுகின்ற மக்கள் மத்தியில் இனவாதத்தைத் தூண்டுகின்ற வர்களை, அரசியலுக்காகப் பேரம்பேசுகின்றவர்களைக் கைதுசெய்வதற்காக நீதி அமைச்சு புதியதொரு சட்டமூலத்தைக் கொண்டுவர வேண்டும். அதாவது, இந்த நாட்டில் இனவாதத்தை இல்லாமல் செய்வதற்கான ஒரு சட்டமூலத்தை நீதி அமைச்சு கொண்டுவர வேண்டுமென கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, உள்ளூராட்சி மன்றத் தேர்தல் சம்பந்தமாக நான் பேச வேண்டும். உள்ளூராட்சி மன்றத் தேர்தல் சம்பந்தமான சட்டமூலத்தை இந்தச் சபையில் ஆளுங்கட்சியினர் கொண்டுவந்தபோது, எங்களுடைய ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் தலைவர் ரஊப் ஹகீம் அவர்களும் அதன் செயலாளர் நிசாம் காரியப்பர் அவர்களும், இத்தேர்தல் முறைமையில் நிறைய சிக்கல்கள் இருப்பதால் பாராளுமன்ற உறுப்பினர்கள் எல்லோரையும் இணைத்து ஓர் ஆலோசனை சபையை அமைத்து, அவற்றைத் தீர்த்த பிறகு இதனைக் கொண்டுவருமாறு சொன்னார்கள். அவ்வாறு செய்யத் தேவையில்லை என்றும் தாங்கள் தேர்தலை நடாத்துவதாகவும் அப்போது ஆளும் கட்சியினர் சொன்னார்கள்.

அண்மையில் வட்டார முறையில் நடந்த உள்ளூராட்சி மன்றத் தேர்தலின் முடிவுகளூடாக ஆளும் கட்சி மாத்திரமல்ல, இந்த நாட்டில் இருக்கின்ற அரசியல் கட்சிகள் அனைத்தும் சிறந்த பாடங்களைக் கற்று இருக்கின்றன. ஓர் உறுப்பினருக்கு 25 இலட்சம் ரூபாய் கொடுத்து ஆதரவைப் பெறவேண்டிய நிலையை இந்த உள்ளூராட்சி மன்றத் தேர்தல் முறைமை ஏற்படுத்தி இருக்கின்றது. அதுமாத்திரமல்ல, இது ஒரு குப்பைத் தேர்தல் முறைமையும்கூட. ஏனெனில், வட்டாரங்களை வென்று, ஆயிரக்கணக்கான வாக்குகளைப் பெறுகின்ற கட்சி தோல்வியடைகிறது. அதாவது, வெற்றிபெறுகின்ற கட்சி தோல்வியடைகின்ற நிலைமையும் தோல்வியடைகின்ற கட்சி வெற்றிபெறுகின்ற நிலைமையும் ஏற்பட்டிருக்கிறது.

கடந்த சனாதிபதித் தேர்தலிலும் பொதுத் தேர்தலிலும் தேசிய மக்கள் சக்திக்கு வடக்கு, கிழக்கு மாகாணங்களில் நிறைய வாக்குகள் கிடைத்தன. ஆனால், உள்ளூராட்சி மன்றத் தேர்தலில் தேசிய மக்கள் சக்திக்கு ஏற்பட்டிருக்கின்ற நிலைமையைப் பாருங்கள்! Jaffnaஇல் 20 சதவீதமும் மன்னாரில் 21 சதவீதமும் Batticaloaஇல் 17 சதவீதமும் அம்பாறையில் 32 சதவீதமும் Trincomaleeஇல் 31 சதவீதமும் என மிகக் குறைந்தளவான வாக்குகளே அதற்குக் கிடைத்திருக்கிறன. எனவே, உள்ளூராட்சி மன்றத் தேர்தல் சம்பந்தமாக வேறொரு முறைமையைக் கையாள்வதற்குரிய ஏற்பாட்டை நீங்கள் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரிடம் ஒரு விடயத்தைக் கேட்க விரும்புகின்றேன். அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற இறக்காமம் பிரதேச மக்களுக்கென தனியானதொரு நீதிமன்றத்தை அமைக்க நடவடிக்கை எடுக்க வேண்டும் அல்லது அப்பிரதேசத்தை அக்கரைப்பற்று நீதி நிருவாக வலயத்துடன் இணைக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். இறக்காமம் பிரதேசத்தில் சுமார் 18,000 மக்கள் வாழ்கின்றனர். அவர்களில் 94 சதவீதமானோர் அதாவது, 17,000க்கும் மேற்பட்டோர் தமிழ் மொழியைத் தாய்மொழியாகக் கொண்டுள்ளனர். பன்னிரண்டு கிராம சேவகர் பிரிவுகளை உள்ளடக்கியதான இறக்காமப் பிரதேச செயலாளர் பிரிவின் கீழுள்ள பிரதேசம் 2012ஆம் ஆண்டு வரை அக்கரைப்பற்று நீதி நிருவாக வலயத்தின் கீழேயே காணப்பட்டது. பின்னர் எவ்வித அறிவித்தலும் இல்லாமல் அதனை அம்பாறை நீதி நிருவாக வலயத்துக்கு மாற்றினார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක් ලබා දෙන්න.

சிங்கள மொழியை நீதிமன்ற மொழியாகக்கொண்ட அம்பாறை நீதி நிருவாக வலயத்துடன் தமிழ் மொழியைத் தாய்மொழியாகக் கொண்டுள்ள இறக்காமம் பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட பிரதேசத்தை இணைத்தமை யானது, அப்பிரதேசத்தில் வாழுகின்ற மக்களது அடிப்படை உரிமையை மீறுகின்ற ஒரு செயலாகும். அதுமாத்திரமன்றி, அப்பிரதேசத்தில் 94 சதவீதமாகவுள்ள தமிழ் பேசும் மக்கள் அம்பாறையிலுள்ள நீதிமன்றங்களில் வழக்கு நடவடிக்கைகளை தமக்குப் பரிச்சயமற்ற சிங்கள மொழியில் மேற்கொள்ள நிர்ப்பந்திக்கப்படுகின்றனர்.

மேலும், அவர்கள் வழக்கு நடவடிக்கைகளைக் கையாள்வதிலும் சிரமப்படுகின்றனர். நீதிமன்ற நடவடிக்கை களுக்காக ஆவணங்களைத் தமிழிலிருந்து சிங்களத்துக்கும் சிங்களத்திலிருந்து தமிழுக்கும் மொழிபெயர்ப்புச் செய்வதற்காக வழக்குச் செலவுக்கு மேலதிகமாக பெருந்தொகையான பணத்தைச் செலவிடவேண்டிய துர்ப்பாக்கிய நிலைமை ஏற்பட்டுள்ளது. அதுமாத்திரமன்றி, வழக்கு நடவடிக்கைகளின் போதும், சாட்சியங்களைப் பெறும்போதும் நீதிமன்றத்தின் பெறுமதியான நேரத்தை மொழிபெயர்ப்புக்காகச் செலவிட வேண்டிய துரதிருஷ்டவசமான நிலைமையும் ஏற்பட்டுள்ளது.

இறக்காமம் என்பது, புவியியல் ரீதியாகச் சிங்கள மொழியை நீதிமன்ற மொழியாகக்கொண்ட அம்பாறை நீதி நிருவாக வலயத்துக்கும் தமிழ் மொழியை நீதிமன்ற மொழியாகக்கொண்ட அக்கரைப்பற்று நீதி நிருவாக வலயத் துக்கும் இடையில் அமையப்பெற்றுள்ள ஒரு பிரதேசமாகும். சிங்கள மொழியிலான அம்பாறை நீதி நிருவாக வலயத்தினுள் இங்கினியாகல, உகன, தமன, மங்கலகம, மத்தியமுகாம், பக்கியல்ல மற்றும் அம்பாறை ஆகிய பொலிஸ் பிரிவுகள் அடங்குகின்றன. இதில் தமிழ் பேசுகின்ற மக்களைக்கொண்ட ஒரேயொரு பிரதேசமான இறக்காமம் பிரதேசம் பொருத்தமற்ற வகையில் இணைக்கப்பட்டுள்ளது. தமிழ் மொழியிலான அக்கரைப்பற்று நீதி நிருவாக வலயத்தினுள் அக்கரைப்பற்று மற்றும் திருக்கோவில் ஆகிய பொலிஸ் பிரிவுகள் மாத்திரமே உள்ளடங்குகின்றன. எனவேதான், தமிழ் பேசுகின்ற மக்களைக்கொண்ட இறக்காமம் பிரதேசத்தை தமிழ் மொழியை நீதிமன்ற மொழியாகக்கொண்ட அக்கரைப்பற்று நீதி நிருவாக வலயத்தின்கீழ் கொண்டுவர வேண்டும் அல்லது அந்தப் பிரதேசத்துக்கென தனியான நீதிமன்றம் ஒன்றை அமைப்பதற்கான ஏற்பாடுகளை நீதி அமைச்சு மேற்கொள்ள வேண்டுமென நான் கேட்கின்றேன். இது சம்பந்தமான கோரிக்கைக் கடிதங்களின் பிரதிகளை நான் இந்தச் சபையில் ***சமர்ப்பிக்கின்றேன்.**

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. අපට කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මට තව විනාඩියක් ලබා දෙන්න.

எங்களுடைய கிழக்கு மாகாணத்தில் ஆழ்கடல் மீன்பிடியில் ஈடுபடுகின்றவர்கள் பாரிய பிரச்சினையொன்றை எதிர்கொள்கின்றார்கள். திருகோணமலையில் இருந்து பொத்துவில் வரையான பிரதேசத்தில் இருக்கின்ற ஆயிரக் கணக்கான ஆழ்கடல் மீனவர்கள் மீன்பிடியில் ஈடுபடும்போது, சிறிய வள்ளங்களில் செல்கின்ற மட்டக்களப்பு மாவட்டத்தில் இருக்கின்ற கடல் திருடர்கள் அவர்களுடைய வலைகளை அறுத்துச் சேதமாக்கி, மீன்களை எடுத்துச் செல்கின்றார்கள். இதனால் ஆயிரக்கணக்கான ஆழ்கடல் மீனவர்கள் பாதிக்கப் பட்டு இருக்கின்றார்கள். குறிப்பாக, அம்பாறை மாவட்டத் திலுள்ள ஆழ்கடல் மீனவர்கள் பாதிக்கப்பட்டு இருக்கின் றார்கள். அம்பாறை, வாழைச்சேனை, கல்முனை, அக்கரைப்பற்று போன்ற பெரும் பிரதேசங்களிலுள்ள ஆயிரக்கணக்கான மீனவர்கள் ஒன்றுகூடி, இந்தக் கடல் திருடர்களைப் பிடித்தால்தான் தாங்கள் கடலுக்குச் செல்வதாக ஆர்ப்பாட்டம் செய்துகொண்டு இருக்கின்றார்கள்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஒரு வள்ளம் ஆழ்கடலில் மீன்பிடிக்கச் செல்வதற்கு நான்கு இலட்சம் ரூபாய் செலவாகின்றது. அவ்வாறு செலவுசெய்து அவர்கள் தங்களது தொழிலைச் செய்யும்போது, அவர்களது கடற்றொழில் உபகரணங்களையும் பிடிக்கப்படுகின்ற இலட்சக்கணக்கான மீன்களையும் இந்தக் கடல் திருடர்கள் கொள்ளையிடுகின்றனர். எனவே, நீதி அமைச்சும் மீன்பிடித்துறை அமைச்சும் இணைந்து நடவடிக்கை எடுத்து, அவர்களுடைய தொழிலில் பிரச்சினையை ஏற்படுத்துகின்ற அந்தக் கடல் திருடர்களைக் கைதுசெய்து, அவர்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුරෙරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[பி.ப. 3.44]

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீதியமைச்சினுடைய இன்றைய விவாதத்திலே தமிழ் மக்களுக்கான நீதி கிடைக்கவேண்டுமென்று கோருகின்றேன். கடந்த 18ஆம் திகதி முள்ளிவாய்க்காலில் பல ஆயிரக் கணக்கான மக்கள் தமிழினப் படுகொலையை - தங்களுடைய உறவுகளை - நினைவுகூர்ந்தார்கள். முள்ளிவாய்க்காலில் தமிழினப் படுகொலை இடம்பெற்று ஒன்றரை தசாப்த காலம் கடந்திருக்கின்றது; 16 வருடங்கள் பூர்த்தியாகிவிட்டது. இத்தகைய சூழலில், கடந்த 2009ஆம் ஆண்டு முள்ளிவாய்க்காலில் நிகழ்ந்த தமிழினப் படுகொலை என்னும் பேரவலத்தை, நெருப்பாற்றைக் கடந்து, இறுதிப் போரின் வடுக்களோடும் போரின் கொடுமையான நினைவுகளைச் சுமந்தும் அந்த இறுதிப் போரின் சாட்சியாக, தமிழினப் படுகொலையின் ஆதாரங்களாக எமது எஞ்சிய உறவுகள் அந்த மண்ணில் வாழ்ந்து வருகின்றனர்.

தமக்கு மேற்கொள்ளப்பட்ட அநீதி தொடர்பில் நீதி கிடைக்க வேண்டுமென்பதும், தமிழினப் படுகொலையை மேற்கொண்டவர்களுக்கும் துணை நின்றவர்களுக்கும் உரிய தண்டனைகள் வழங்கப்பட வேண்டுமென்பதுமே எமது உறவுகளின் எதிர்பார்ப்பாக உள்ளது. இருப்பினும், தமிழினப் படுகொலை இடம்பெற்று ஒன்றரை தசாப்த காலங்கள் கடந்துவிட்டபோதிலும் எமது மக்களுக்கு நீதி கிடைக்க வில்லை. எமது மக்களுக்கு அநீதி இழைத்தவர்கள் மற்றும் அநீதி இழைப்பதற்குத் துணை நின்றவர்களுக்குத் தண்டனை வழங்கப்படவில்லை. இந்த நிலையில், வருடந்தோறும் மே 18 அன்று எமது உறவுகள் தமிழினப் படுகொலையை நினைவு கூருகின்றனர். இதன்மூலம் தமிழினப் படுகொலைக்கான நீதியைக் கோருகின்றனர். அத்தோடு தமிழினப் படு கொலையை மேற்கொண்டவர்களுக்குத் தண்டனை வழங்கப் பட வேண்டுமெனவும் வலியுறுத்துகின்றனர். இவ்வாறாகக் கடந்த 16 ஆண்டுகளாக எம் உறவுகள் நீதியை எதிர்பார்த்துக் காத்துக்கொண்டிருக்கின்றனர்.

இத்தகைய சூழலில்தான் கனடா நாட்டின் பிரம்டன் நகரத்தில் Chinguacousy பூங்காவில் தமிழினப் படுகொலையை நினைவுகூரும் வகையிலான 'தமிழின அழிப்பு நினைவுத் தூபி' கடந்த 10ஆம் திகதி பிரம்டன் நகர மேயர் பற்றிக் பிறவுண் அவர்களால் திறந்து வைக்கப்பட்டது. தமிழ் இனப் படுகொலைக்கான நீதியைக் கோரி 16 ஆண்டுகளாகக் காத்துக்கொண்டிருக்கும் பாதிக்கப் பட்ட எமது உறவுகளுக்கு கனடாவின் இச்செயற்பாடு புதிய தெம்பைத் தருவதாக அமைந்துள்ளது. நீதி கிடைக்குமா என்று ஏங்கியிருக்கும் எமது உறவுகளுக்கு ஒரு நம்பிக்கையைத் தருவதாக உள்ளது. இந்நிலையில் தமிழ் இனப்படுகொலையின் 16ஆம் ஆண்டு நினைவேந்தலுக்கு கனேடியப் பிரதமர் மார்க் கார்னி அவர்கள் இரங்கல் தெரிவித்துள்ளார். தமிழ்ச் சமூகத்தின் உணர்வுகளைப் புரிந்துகொண்டு எமது துயரில் பங்கேற்று ஆறுதல் தெரிவித்த கனேடியப் பிரதமர் மார்க் கார்னி அவர்களுக்கு வலிசுமந்த மக்களின் பிரதிநிதியாக இந்த உயரிய சபையிலே தலைசாய்த்துக் கொள்கின்றேன்.

மேலும், தமிழ் இனப்படுகொலைக்குக் காரணமானவர் களைப் பொறுப்புக்கூறலுக்கு வழி செய்வதற்கும் உண்மை களை வெளிக்கொணர்ந்து நீதி கிடைப்பதற்குமான சர்வதேச அளவிலான முயற்சிகள் மற்றும் நடவடிக்கைகளுக்கும் கனடா தொடர்ந்தும் ஆதரவளிக்கும் என்று அவர் தெரிவித்த செய்தியானது, அவலத்திலிருந்து மீண்ட எமது மக்களைப் பேராறுதல் அடையச் செய்திருக்கின்றது. நாம் கனடாவின் ஆதரவுக் கரங்களை இறுகப் பற்றிக்கொள்கின்றோம். எமது மக்களுக்கான நீதியைப் பெற்றுத்தாருங்கள்! என இந்த உயரிய சபையில் இருந்து கனேடியப் பிரதமர் மார்க் கார்னி அவர்களிடம் எமது மக்கள் சார்பாகக் கோரிக்கை விடுக்கின்றேன். அந்த வகையில் பேரவலத்திலிருந்து மீண்டு, தமிழின அழிப்பின் சாட்சியமாக, ஆதாரமாக வலிசுமந்த மண்ணில் இருந்துகொண்டு, தமிழின அழிப்புக்கு நீதியை எதிர்பார்த்துக்கொண்டிருக்கும் மக்களின் பிரதிநிதியாக, கனடாவின் இச்செயற்பாட்டை வரவேற்கின்றேன். கனடா நாட்டின் பிரதமருக்கும், பிரம்டன் நகர மேயர் பற்றிக் பிரவுண் அவர்களுக்கும் எமது உறவுகளின் சார்பில் இதயபூர்வமான நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.49]

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ඉතාම වැදගත් කාරණා දෙකක් සම්බන්ධයෙන් අපි මේ ගරු සභාවේ කථා කරනවා. ඉන් එක් කාරණයක් තමයි, ලංකාවේ අධිකරණ ක්‍රියාවලියේදී තාක්ෂණය භාවිත කරමින් එහි කටයුතු කාර්යක්ෂම කිරීම. මා එහිදී දකින විශේෂ කාරණයක් මතු කරමින්, දෙවනුවට කථා කරන රාජ්‍ය ණය කළමනාකරණය ගැන කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

මේ රටේ සැලකිය යුතු සංඛ්‍යාවක් ආබාධිත ප්‍රජාව හැටියට ඉන්න බව අපි දන්නවා. මම දැඩි සේ විශ්වාස කරනවා, අධිකරණ ක්‍රියාවලිය තාක්ෂණය ඇසුරින් කාර්යක්ෂම කිරීමට යෑම තුළින් ශ්‍රවණාබාධිත සහ වෙනත් ආබාධ සහිත තැනැත්තන් වෙනුවෙන් සාධාරණයක් ඉෂ්ට කරන්න පුළුවන් වෙයි කියලා. ඒ නිසා මම සතුටු වෙනවා, මේ රටේ සෑම ජනතාවක් වෙනුවෙන්ම පෙනී සිටින රජයක් විධියට එවැනි ප්‍රජාව වෙනුවෙනුත් සහන සලසන්න පුළුවන් ක්‍රමවේදයක් මේ පනත තුළින් හඳුන්වා දෙන්න පුළුවන්වීම ගැන.

ඊළඟට අපි අද දවසේ අවධානය යොමු කරන විශේෂ කාරණය තමයි, රාජ්‍ය ණය කළමනාකරණ පනත. ඒ රාජ්‍ය ණය කළමනාකරණ පනත ගැන සුවිශේෂීව කථා කරන්න ඕනෑ හේතුවක් තිබෙනවා. 2022 වර්ෂය වන විට මේ රටේ ජනතාව රෝගී වූ විට අවශ්‍ය බෙහෙත් ටික තිබුණේ නැහැ, කඩේ ආහාර ටික තිබුණේ නැහැ, දරුවන්ට කිරිපිටි ටික තිබුණේ නැහැ, වාහනයකට ඉන්ධන ටික තිබුණේ නැහැ. මේ හේතු නිසා අපේ රටේ දැඩි සමාජ ආර්ථික අර්බුදයක් ගොඩනැඟුණා. ඒ නිසා තමයි මේ රටේ වෙනසක් ඇති කරන්න ඕනෑය කියලා මිනිස්සු හිතුවේ. මෙහි අක්මුල් තිබෙන්නේ මෙන්න මේ ණයවල. එ් නිසා වෙන්න ඇති, අද දවසේ සමහරුන් ණය ගැන කථා කරන්න භය. මේ ණය නිසා තමයි මහා බලසම්පන්න ආණ්ඩු අවුරුද්දෙන් හමාරෙන් ගෙදර යැව්වේ. විපක්ෂයේ සමහර කණ්ඩායම්, සදාකාලිකවම විපක්ෂයේ තියන්න අවශ්‍ය මහපැදුවේත් මේ ණයයි. නිදහස ලබා ගන්නකොට පිට රටට ණය නැති වෙච්ච අපේ රට, වැරදි ආර්ථික භාවිතයන් නිසා මේ රටේ නිෂ්පාදන ආර්ථිකය බිඳ වට්ටලා පිට

රටවලින් ණය අරගෙන ණය සහිත රටක් බවට පත් කළා. අපේ රටේ දෛනික ජීවිතයට අවශ්‍ය ආහාර, සෞඛ්‍යය, අධ්‍යාපනය, ප්‍රවාහනය, බලශක්තිය ආදී සෑම ක්ෂේත්‍රයක්ම පවත්වාගෙන යන්න අපි හැම වෙලාවේම පිට රට කෙරෙහි විශ්වාසය තැබුවා. අපි ඒ වෙනුවෙන් උපයන්නේ නැතිව, අපේ රටේ නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනඟන්නේ නැතිව, අපි ඒ වෙනුවෙන් ණය ගනිමින් ඉදිරියට ආවා. එහි අවසාන ප්‍රතිඵලය ලෙස තමයි අපි මේ වෙනකොට ඩොලර් බිලියන 100කට අධික ණය කන්දක, ණය උගුලක හිරවෙලා ඉන්නේ.

අපි දන්නවා, ලෝකයේ සෑම රටක්ම ණය අරගෙන තිබෙන බව. ලෝක ආර්ථික බලවතා කියන ඇමෙරිකා එක්සත් ජනපදයත්, ජපානය වාගේ රටවල් ගත්තත්, ලෝකයට විශාල වශයෙන් ණය තිබෙන රටවල්. නමුත්, ඒ රටවල් බංකොලොත් රටවල් නොවෙයි. ඒ ඇයි? ඔවුන් තමන්ගේ රටට ණය ගත්තා, රටේ සංවර්ධනය වෙනුවෙන් ඒ ණය කළමනාකරණයක් සහිතව ආයෝජනය කළා. ඒ නිසා ඔවුන්ට ගැටලුවක් නැහැ. අපිත් ඇමෙරිකානු ඩොලර් බිලියන ගණන්,රුපියල් ට්‍රිලියන ගණන් ණය අරගෙන තිබෙනවා. අපි ණය ගත්තේ හැම වෙලාවේම එක්කෝ, පරිභෝජනයට. එහෙම නැත්නම් ඇතැම් වෙලාවට සංවර්ධන යෝජනා පෙන්වා සංවර්ධනයටත් ඒ ණයවලින් යම් ප්‍රමාණයක් යොදවා තිබෙනවා. නමුත්, ඒ වැඩි ප්‍රමාණයක් වැය වුණේ පෞද්ගලික වුවමනා වෙනුවෙන්.

දකුණු පළාතේ සම්මන්ත්‍රණශාලාවක් තිබෙනවා. ඒකට වියදම් කරපු වටිනාකම තක්සේරුවේ නැහැ. එහෙමම තමයි ඒ පළාතේ තිබෙන ගුවන් තොටුපළටත් වියදම් කළේ. ඒ වාගේම තමයි, අධිවේගී මාර්ගවලටත් වියදම් කළේ. අපි ණය ගත්තා, හැබැයි ඒ ණයවලට වටිනා වත්කම් ගොඩනැඟුණේ නැහැ. ඒ විතරක් නොවෙයි. ඒ ණයවලින් අපි නැවත උත්පාදනයක් නැති දේවල් ගොඩනඟලා තිබෙනවා. දකුණු පළාතේ ඒ සම්මන්ත්‍රණශාලාව, ගුවන් තොටුපළ බලන්න කවුරු හරි trip එකක් ගියොත්, එහෙම නැත්නම් ඒ ගුවන් තොටුපළට ගුවන් යානයක් ආවොත් ඒක රටේ ප්‍රවෘත්තියක් බවට පත් වෙනවා. ඒ තරමට අපි ණයවලින් වැඩ අරගෙන තිබෙන බව කියන්න පුළුවන්.

විදේශීය ණය (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත හරහා අපි බලාපොරොත්තු වෙන්නේ, මෙතෙක් කල් මේ රටේ සිදු වෙච්ච ණය ගැනීමේ ක්‍රියාවලිය සහ ණය යෙදවීමේ ක්‍රියාවලිය විනිවිදභාවයෙන්, විධිමත්භාවයකින් යුතුව කරලා, මේ රට ගොඩනැඟීමට නිෂ්පාදන ආර්ථිකය කරා මේ රට ගෙනයන වැඩ පිළිවෙළ ඉටු කිරීමයි.

විගණකාධිපතිතුමාගේ වාර්තා අනුව කියනවා, මේ වෙනකොට මේ රටේ රුපියල් ට්‍රිලියන 20කට අධික ණය මුදල් ප්‍රමාණයක් නිසි ලෙස සටහන් වෙලා නැහැ, නිසි ලෙස වාර්තා වෙලා නැහැ කියලා. ඒකෙන් අපට පෙන්වන්නේ මොකක්ද? අපි ණය ගන්නවා, නමුත් ඒ ණය පිළිබඳව කිසිම කළමනාකරණයක් නැහැ, ඒවා ඒ ඒ අයට කැමැති විධියට යොදවා තිබෙනවා. ඒකේ ඉපැයීම් කොහොමද, දැන් තිබෙන්නේ කොතැනද, ඒකෙන් අදාළ කාරණය ඉෂ්ට වුණාද කියන ඒවා පිළිබඳව කිසි වගකීමක් තිබිලා නැහැ. අපි රටකට ණය ගන්න ඕනෑ. ඒ මොනවාටද? රටේ නිෂ්පාදන ආර්ථිකය ගොඩනඟා ගන්න. අපි ණය ගැනීම පාපයක් නොවෙයි. අපි ණය ගත්තොත්, ඒක විධිමත් විධියට ආයෝජනය කරලා, ඒකෙන් ප්‍රයෝජනයක් ලබනවා නම් ඒ තුළ රටේ සංවර්ධනය ගැබ් වෙනවා. 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත ගෙනාවාට පස්සේ, මේ රටේ රාජ්‍ය ණය කළමනාකරණය සඳහා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවූවා. ඒ තුළින් රාජ්‍ය ණය කළමනාකරණය, ඒ වාගේම රාජ්‍ය ණය සඳහා ඇපකර නිකුත් කිරීම, උප ණය දීම මෙහෙයුම් කළමනාකරණය විතරක් නොවෙයි, මෙතෙක් කල් හරියාකාරව සිද්ධ නොවුණු රාජ්‍ය ණය වාර්තාකරණය, ඒ වාගේම රාජ්‍ය ණය පිළිබඳව මේ පාර්ලිමේන්තුවට, මේ උත්තරීතර සභාවට වාර්තා කරන එක සිද්ධ වෙනවා.

මෙවැනි කරුණු තුළින් ණය කළමනාකරණය විධිමත් කිරීම මේ පනතින් තහවුරු වෙනවා. අපි දන්නවා, ශ්‍රී ලංකා මහ බැංකුව, මහා භාණ්ඩාගාරය, SriLankan Airlines ආදී රාජ්‍ය ආයතන මෙතෙක් කල් විවිධ ක්‍රමවලට ණය ගත් බව. ඒ නිසා තමයි මම ඉහතින් කියපු ණය වාර්තාකරණය සම්බන්ධ ගැටලු ඇති වෙලා තිබෙන්නේ. මේ පනත තුළින් ඒ සම්පූර්ණ වගකීම මුදල් අමාත්‍යාංශයට පැවරෙන නිසා අපට ඉදිරියේදී බාධාවකින් තොරව රටේ සංවර්ධනය උදෙසා ණය කළමනාකරණය හොඳින් කරන්න පුළුවන්කම ලැබෙනවා. මේ තුළින් රටේ ණයවල විනිවිදභාවය, විධිමත්භාවය ඇති කරලා රටේ ආර්ථික කළමනාකරණය නිසි මඟට ගෙනැත් මේ රටේ නිෂ්පාදන ආර්ථිකයට දිරි දීලා මේ රට පොහොසත් කරනවා කියලා අපි මේ රටේ ජනතාවට පොරොන්දු වුණා. විදේශීය ණය (ඉවත් කිරීමේ) පනතේ ප්‍රතිපාදනවලින් අන්න ඒ පොහොසත් රට ගොඩනඟන මාවතේ ඉදිරියට යන්න හැකි බව පෙන්වා දෙමින් මම නිහඬ වෙනවා.

අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි'

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

[3.59 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Hon. Presiding Member, today, I am addressing an important legislative Amendment brought to the Code of Criminal Procedure Act. The Minister is here. It is an important Amendment Bill. Sir, Clauses 2 and 4 empower the Magistrates and the High Court Judges to dispense with the personal attendance of suspects or accused persons under defined circumstances. This flexibility is timely and aligns with the global best practices, especially in managing the high security or high volume cases.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත කියන්නේ ඉතා වැදගත් සංශෝධනයක්. මේක දකිනකොට අපට මතක් වෙන්නේ ගනේමුල්ල සංජීවගේ ඝාතනය. ඒ චූදිතව අධිකරණයට ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව නීත්‍යානුකූල ප්‍රතිපාදනයක් මත වුණේ නැත්නම්, ඔහු එදා අධිකරණයට නොගෙනාවා නම් ඔය ප්‍රශ්නය මතු වෙන්නේ නැහැ. ඒ අවස්ථාවේදීත් ඒ සඳහා ප්‍රතිපාදන තිබුණා, නැත්තේ නැහැ. අපරාධ නඩු විධාන සංග්‍රහයේ ප්‍රතිපාදන තිබුණා, මහෙස්ත්‍රාත්තුමාට එතුමාගේ අභිමතානුසාරී බලය පාවිච්චි කරලා මේ විත්තිකරු ඉදිරිපත් නොකොට ඒ නඩුව ගන්න. නමුත් ලිඛිත ප්‍රතිපාදනයක් මේ සඳහා ගෙනැත් තිබෙන්නේ පළමුවැනි වතාවටයි. මේ පනත් කෙටුම්පතේ ඒ සම්බන්ධයෙන් අදාළ වන ප්‍රතිපාදන දාලා තිබෙනවා. මා හිතන විධියට, මේ වෙලාවේ හැටියට ඒක ඉතාම වැදගත් වනවා.

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

And also, Clause 5 introduces a deeper reform. It allows for remote testimony by contemporaneous audio-visual links, electronic submissions and admissibility of expert reports and direct engagement with the State sector experts via electronic communication. This modernization is laudable. It reflects an effort to digitalize our justice system down-and-out and expedite procedural delays. But, Sir, this reform faces very serious challenges. අපරාධ නඩු විධාන සංග්‍රහයට ගෙනැත් තිබෙන මේ සංශෝධනය ක්‍රියාත්මක කිරීමේදී සැහෙන අභියෝග ප්‍රමාණයක් තිබෙනවා. අපේ අධිකරණ ඇමතිතුමාත් ඒවා ගැන දන්නවා.

Now, start from the appointment of High Court Judges, for which there is a backlog. That the President has to make the appointments on the recommendation of the Judicial Services Commission. I think more than ten, if I am not mistaken, High Court Judges are to be appointed. They are very important for quicker disposal of the cases pending before the High Court. ඒ අනුව, මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවත් තිබෙනවා. මෙහිදී මම ඒකත් දකිනවා, එතැන තිබෙන අභියෝගයක් විධියට.

Then, there is insufficient technological infrastructure. ඊයේ වාණිජ මහාධිකරණය ඉදිරිපිට මා පෙනී සිටියදී එතැන සිටි Presiding Judges මට කිව්වා that they have issues. ඔවුන්ගේ equipment are outdated. And, they were all depending on the USAID. There was a capacity-building programme for their officers, which got cancelled due to the non-availability of USAID. I think we may have to look into these things because, නීතියේ තිබුණු පලියටම ඒවා ක්‍රියාත්මක කිරීමේදී, විශේෂයෙන් විද්‍යුත් තාක්ෂණය භාවිත කිරීමේදී විශාල අභියෝගයක් තිබෙනවා. ඊට අදාළ computers, ඊට අදාළ equipment update කරන processes ටික කළ යුතුව තිබෙනවා. ඊට අමතරව, ඒ ඒ නිලධාරින් ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා දැනුවත්භාවය ලබා ගැනීමත් අත්‍යවශ්‍යයි.

Then, I have also been talking about lack of supervisory institutions. මම හිතන විධියට, ජනාධිපතිතුමා යටතේ තිබෙන අමාත්‍යාංශ වේවා, අධිකරණ අමාත්‍යාංශය වේවා, මුදල් අමාත්‍යාංශය වේවා, Sri Lanka Customs එක වේවා, වෙන කුමන හෝ ආයතනයක් වේවා මේ technologies පාවිච්චි කරලා ඒ කටයුතු කිරීමේදී ඒ ඒ ආයතන සහ අමාත්‍යාංශවල තිබෙන අඩුපාඩු සහ ඒවායේ තිබෙන දුර්වලතා - updating the technology and capacity building of officers, වැනි දේවල් - පිළිබඳ කටයුතු කරන්න overall supervisory body එකක් ඕනෑ වෙනවා. I propose that they must have that put in place immediately and I think it should come under the President. When I was looking at the USAID, I saw that the Hon. Prime Minister had a meeting with the US Ambassador in Sri Lanka. She could have spoken about this particular problem we are facing because it needs only a small amount of money. අධිකරණ ඇමතිතුමනි, මේ සඳහා අනිවාර්යයෙන් වැය වෙන්නේ සුළු මුදලයි. Capacity building and updating the process is not a big deal; ඒක කර ගන්න තිබුණා.

Then, I want to bring up another important matter to your attention. මේ අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පතේ, සාක්ෂිකරුවන් කිහිප දෙනෙකුගෙන් එකවර - contemporaneous - සාක්ෂි සටහන් කර ගැනීම සඳහා විද්‍යුත් තාක්ෂණය උපයෝගී කර ගැනීමේ අවස්ථාව සිවිල් නඩු විධාන සංග්‍රහයේ නැහැ. So, I hope the Hon. Minister of Justice would take this fact into consideration. The Evidence Ordinance gives something else, but leading evidence through technology is not available in the Code of Civil Procedure. වාණිජ මහාධිකරණයේදී, එහෙම නැත්නම් දිස්ත්‍රික් අධිකරණවලදී විදේශගතව සිටින සාක්ෂිකරුවන්ගෙන් සාක්ෂි ලබා ගැනීමේදී විශාල ප්‍රශ්න මතු වෙනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

Basically, the Civil Procedure Code will also be dealt with in the process.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Exactly.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

It is being drafted.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Thank you very much. All what you have to say is that *mutatis mutandis* applies. එක වචනයකින් අවශ්‍ය සංශෝධන,- I am so thankful to the Hon. Minister of Justice and National Integration for bringing this to our attention. මෙකම මීට අදාළ ඉතා සුළු වෙනස් කිරීම් සහිතව සිවිල් නඩු විධාන සංග්‍රහය සඳහා ද ලබා ගැනීම අතිශයින්ම වැදගත්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Thank you, Sir. ඔබතුමා ගරු අධිකරණ ඇමතිතුමාට ලබා දුන්නේ මගේ කාලය නොවෙයි නේ? මගේ කාලය තිබෙනවා නේ?

වාණිජ මහාධිකරණයේ නඩු කටයුතුවලදී විදේශීය සාක්ෂිකරුවන් කැඳවීම විශාල කරදරයක්. නඩු දෙකක් මට පෞද්ගලිකවම withdraw කරන්න වුණා. මොකද, අපට ඉන්දියාවෙන් සාක්ෂි ගෙන්වා ගන්න බැරි වුණු නිසා මේ කාරණය බොහොම වැදගත්. I am so thankful to you for focusing your attention to that. Once again, let me congratulate you for doing it and for being very much aware of the need to address that in the Civil Procedure Code, too. I wish you all the best! We are all there to support any such amendments.

All what I say, once again, is that this law has to be implemented. For the purpose of implementation, we need to ensure that all relevant equipment are well

updated and the officers are provided with necessary capacity-building.

Hon. Presiding Member, thank you very much for the opportunity given to me.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නීතිඥ සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.07]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මම අසනීපයෙන් ඉන්න නිසා මගේ කටහඬ පොඩ්ඩක් වෙනස්. විශේෂයෙන් මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කරුණු, කාරණාවලට එළඹීමට ප්‍රථම විපක්ෂය මතු කරන ලද අදහස් කිහිපයක් අවධානයට ලක් කරන්න මම කැමැතියි. විශේෂයෙන්ම අපේ චාමර මන්ත්‍රීතුමාගේ කථාව තුළ වාදයට ලක් වුණේ පනත් කෙටුම්පත ගැන නොවෙයි, වෙනත් කරුණු, කාරණා කීපයක්. වෙනත් කාරණා එතුමා එළි දැක්වූවා. විශේෂයෙන්ම එතුමා කිව්වා, ඒ අයගේ වැඩිම ඡන්ද ප්‍රතිශතය මෙවර වාර්තා කළා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මැතිවරණය සන්සන්දනය කළ යුත්තේ 2018දී පවත්වපු මැතිවරණයත් එක්කයි. එදා මැතිවරණයේදී ඔවුන් ලබා ගත් මුළු මන්ත්‍රී ධුර ප්‍රමාණය 3,369යි. නමුත් 2025 වෙනකොට -මෙවර- ඔවුන් මන්ත්‍රී ධුර 742ක් දක්වා පල්ලම් බැහැලා තිබෙනවා. ඉතින් මොන පයිතගරස් න්‍යායද දන්නේ නැහැ, මන්ත්‍රී ධුර 742ක් ගත්තාම "උජෝ, උජෝ" කිය-කියා මෙතැන කෑ ගහන්නේ. ඕනෑ බොරුවක් කියලා මෙතැනින් වේගයෙන් දුවනවා, ආකිමිඩීස් වාගේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඕනෑම බොරුවක් මෙතැන කියනවා, පයිතගරස් න්‍යාය ගෙනැල්ලා. ඊට පස්සේ ආකිමිඩීස් වාගේ දුවනවා. මොකද, අපි කියන දේවල් අහගන්න එතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. ඊට පස්සේ තව වේලාවක කිව්වා, අපි මහජන ආරක්ෂක කමිටු පිහිටුවීමට අදාළ චක්‍රලේඛය දේශපාලනීකරණය කළාය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, චක්‍රලේඛයේ බොහොම පැහැදිලිව තිබෙන්නේ "ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිගෙන් විමසා ඊට අදාළ කටයුතු කිරීමට අදාළව" කියලා. රාජ්‍ය නිලධරයන් සහ සමාජයේ සිවිල් ප්‍රජාව සහභාගි කරගෙනයි මේ කටයුත්ත කරන්නේ. අද කියනවා, ඒක දේශපාලනීකරණය වෙලා ලූ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කාලයේ දේවාලයක කපුවෙක්වත් ඉතිරි කළේ නැහැ, ඔක්කොම දේශපාලනීකරණය කළා. දේවාලයේ කපුවාත් ගත්තා, දේශපාලනයට. එහෙම මිනිස්සු අද මෙතැනට ඇවිත් කියනවා, අපි දේශපාලනීකරණයට යනවා කියලා.

අපේ ගරු අජිත් පී.පෙරේරා මන්ත්‍රීතුමා යෝජනා කිහිපයක් ඉදිරිපත් කළා, අදාළ පනත් කෙටුම්පතේ අඩුපාඩුකම් පිළිබඳව. ඇත්තවශයෙන් මම නීතිපති දෙපාර්තමේන්තුවෙන් කරුණු විමසා බැලුවා, එහෙම අඩුපාඩුවක් මේ පනත් කෙටුම්පතේ තිබෙනවාද කියලා. එතුමා විශේෂයෙන් මතු කළේ විදේශයකදී සාක්ෂි දෙන අවස්ථාවක කුමන ප්‍රතිපාදනය අනුවද කටයුතු කරන්නේ කියන කාරණයයි. තානාපති කාර්යාලයට තමයි මේ සාක්ෂි මෙහෙයවීම කරන්න වෙන්නේ. ඔවුන් මට උත්තරයක් ලෙස එවලා තිබෙනවා, අදාළ පනතේ 273ආ. (4) වගන්තිය යටතේ ඊට අදාළ විධිමත් ප්‍රතිපාදන තිබෙන බව.

ඒ වාගේම ඔබතුමා මතු කළා, සාක්ෂිකරුවෙකු හෝ වින්දිතකරුවෙකු ඉල්ලා සිටින මොහොතක කොහොමද කටයුතු කරන්නේ කියලා. ඊට 273ජ. වගන්තියේ ප්‍රතිපාදන තිබෙන බව කියනවා. ඊළඟට, වියදම් පිළිබඳ කාරණාවකුත් ඔබතුමා මතු කළා. එයට 273ච. (1) වගන්තිය යටතේ ප්‍රතිපාදන තිබෙන බව නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුන් දක්වා තිබෙනවා. වැඩිදුරටත් දැන ගත යුතු කරුණු කාරණා තිබෙනවා නම් අපට සාකච්ඡා කර ගන්න හැකියාවක් තියේවි.

ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමාත්, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමාත් මේ ජන වරමේ අභිලාෂ පිළිබඳව ලොකු කථාවක් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජන වරමේ අභිලාෂය මොකක්ද? ජන වරමේ අභිලාෂය තමයි අපි මේ ඉෂ්ට කරමින් යන්නේ. දැන් ඇහුවා, "රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ කාලයේ තමයි මෙම පනත් සංශෝධනය draft කරලා තිබෙන්නේ; ඇයි, එතුමාට මේ සම්බන්ධව credit එකක් දෙන්නේ නැත්තේ?" කියලා. පනත් හැදුවාට වැඩක් නැහැ ඒවා පෙට්ටගමේ තිබෙනවා නම්. පෙට්ටගමේ තිබුණු අණ පනත් සැලකිය යුතු ප්‍රමාණයක් එළියට ගත්තේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුවෙන්. අපි මීට කලින් සම්මත කරපු, අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනතත් පෙට්ටගමේ තිබුණේ. අපි තමයි ඒක ඇදලා අරගෙන ගරු සභාවට ඉදිරිපත් කළේ. මේ සංශෝධනත් අපේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව තමයි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒක තමයි ජන වරමේ අභිලාෂය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ හැම එකක්ම කරන්නේ හොරු අල්ලන්න නේ. හොරු වර්ග දෙකයි නේ. වර්ග දෙකක හොරු ඉන්නවා. සුදු කරපටි හොරු ඉන්නවා. අනෙක් හොරු තමයි, කෙළින්ම ගිහින් හොරකම කරන අය. ඒ දෙවර්ගයම අල්ලන්න නේ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතට මේ හරයාත්මක සංශෝධන ගෙනෙන්නේ. දැනට සුදු කරපටි හොරු ඇල්ලීමට අදාළව සාමාන්‍ය දණ්ඩ නීති සංග්‍රහයේත්, අපරාධ නඩු විධාන සංග්‍රහයෙත් තිබෙන ප්‍රතිපාදන පිළිබඳව යළි සාකච්ඡා කළ යුතුයි. මොකද, ඒ තරම් කපටි ලෙස තමයි සුදු කරපටි හොරු ටික හොරකම් කරලා තිබෙන්නේ. ජනාධිපති අරමුදලේ තිබුණු සල්ලි ටික ඩැහැගෙන තිබෙන්නේ සුදු කරපටි හොරු. තමන්ගේ ශරීරය විකුණලා තිබෙනවා; ලෙඩ රෝග තිබෙනවාය කියලා බොරුවට වෛද්‍ය සහතික පෙන්වලා සුදු කරපටි හොරු ජනාධිපති අරමුදලේ සල්ලි අරගෙන තිබෙනවා. ඊළඟට, පසුගිය අරගළ සමයේ ගෙවල් පිච්චුවා යැයි කියමින් ඒ ගෙවල්වලට වැඩිපුර valuation එකක් අරගෙන තිබෙන්නේ කවුද? ඒ, සුදු කරපටි හොරු. ඒක නිසා සුදු කරපටි හොරු ඇල්ලීම සඳහා අලුත් ප්‍රතිපාදන අපේ නීතියට ගෙනෙන්නත් වෙයි, එහි අඩුපාඩුවක් තිබෙනවා නම්. අපේ ආණ්ඩුව, ජන වරමේ අභිලාෂයට අනුව කටයුතු කරමින් සිටින ආණ්ඩුවක් කියන එක අපි මේ වෙලාවේ කියන්න ඕනෑ.

දැන් මේ හොරු වර්ගීකරණය ඇතුළේ අලුත් හොරු වර්ගයකුත් බෝ වෙමින එනවා. වෙනදා නම් ටී-56, 9 mm Revolver එකෙන් වෙඩි තැබුවේ. අපි ඒවා හැඳින්වූයේ යකඩ හැටියට. දැන් තිබෙන්නේ මොනවාද? රත්තරන් ආලේපිත ගිනි අවි. රත්තරන් ආලේපිත ගිනි අවියක් සම්බන්ධව අද අත්අඩංගුවේ ඉන්නේ කවුද? හිටපු කැබිනට් අමාත්‍යවරයෙක්. දැන් ෆේස් බුක් එකේ ප්‍රචාරය වනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දුමින්දයි, මහින්දානන්දයි එක කුඩුවේ නම් තියන්න එපා කියලා. අපි දන්නේ නැහැ ඒ මොකද කියලා. දුමින්දයි, මහින්දානන්දයි එක කුඩුවේ නම් දාන්න එපා ලූ. ඒවා නම් ෆේස් බුක් එකේ තමයි

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

තිබෙන්නේ. ඔබතුමන්ලා විශ්වාස කරනවාද මෙවන් ජන වරමක අභිලාෂයක් නොවන්න, ඒ හිටපු අමාත්‍යවරු අද මේ වාගේ රිමාන්ඩ් බන්ධනාගාරගත වෙයි කියලා? ජීවිතේට වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒගොල්ලෝ, ඒ හොර කල්ලි ඒ මත යැපෙමින් කටයුතු කරපු යුගයක් තමයි පසුගිය කාලයේ තිබුණේ. ඉතින්, ඔන්න ඔය කියන චෝදනා ප්‍රමාණයට යටත්ව මෙම පනත ගැන යම් හරයාත්මක සංවාදයකට එළඹෙන්න අපි කැමැතියි.

මේ පනතේ මූලිකව කියන්නේ මොකක්ද? එහි මූලිකව කියනවා, අධිකරණයේ විමර්ශනය හෝ නඩු විභාගය අතරතුර සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සබැඳියාවන් මඟින් සාක්ෂිකරුවන්ගෙන් දුරස්ථ සාක්ෂි සටහන් කර ගැනීමට මහෙස්ත්‍රාත්වරයාට හෝ මහාධිකරණ විනිසුරුවරයාට බලය පැවරිය හැකියි කියලා. මෙය, සැලකිය යුතු සාධනීය තත්ත්වයක්. මේ ගරු සභාවේදී කියැවුණා, අධිකරණයේ වෙඩි තැබීමට අදාළ කාරණාවක් ගැන. ඒ සියලු කටයුතු වළක්වා ගැනීමට හැකියාවක් තිබෙනවා, මේ අලුත් ප්‍රතිපාදනය මත. ඒ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණය පදනම් කර ගෙන වියදම් ප්‍රශ්නය වාගේම කාලය කළමනාකරණය කිරීම සම්බන්ධ ගැටලුත් සැලකිය යුතු මට්ටමකට අපට අඩු කරගන්න පුළුවන්. ඒ වාගේම, පරිගණක සහ තොරතුරු තාක්ෂණය භාවිත කරමින් විද්‍යාත්මක සාක්ෂි රැස්කිරීම හා කඩිනමින් විශ්ලේෂණය කිරීම වැනි ක්‍රියාමාර්ගවලින් අපරාධ යුක්තිය පසිඳලීම වඩාත් කාර්යක්ෂම කළ හැකි බව මෙහි අරමුණක් හැටියට දක්වන්න කැමැතියි. ඒ සඳහා රජයේ කැපවීම මෙම පනත් සංශෝධනය මඟින් පෙන්නුම් කරන බවත් දක්වන්න කැමැතියි. විශේෂයෙන් තාක්ෂණික ක්‍රම භාවිත කරමින්, රටේ අපරාධ කරපු දූෂිතයන් ඉතා කඩිනමින් පෝලිමක් ලෙස බන්ධනාගාරයට යැවීමට මෙම පනත ඉදිරියේදී ඉවහල් වේවි. වර්තමානයේ ඇසෙන අඳෝනා සහ කෙඳිරිලි තවත් වැඩි වේවි, මේ හරහා යුක්තිය පසිඳලීමේ කාර්යයේදී.

ඒ වාගේම ලංකාවේ මේ වන විට ඉහළම ගණයේ සිටින -මේක තමයි විශේෂ, වැදගත් කාරණාව- විශේෂ සිරකරුවන් 94දෙනෙක් බූස්ස කඳවුරේ ඉන්නවා. මීට අමතරව ප්‍රවාහනයේදී විශේෂ ආරක්ෂාව දිය යුතු අපරාධකරුවන් 200කට ආසන්න ප්‍රමාණයක් බන්ධනාගාරවල ඉන්නවා. ඔවුන් වැලිකඩ ඇතුළු විවිධ පළාත්වල තිබෙන බන්ධනාගාර තුළ රඳවා තිබෙනවා. ඉතින් හරි පැහැදිලිව, මෙන්න මේ අරමුණු ටික සාක්ෂාත් කර ගන්න තමයි අපි අද මේ පනත යටතේ කරුණු දක්වන්නේ. ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා හැමදාම අඬනවා, "මම බදුල්ලේ ඉඳන් ආවේ, මම ආව එක අපරාදේ, අසවල් විධියට ඩීසල් ගියා, අසවල් වාහනවලට මෙච්චර ගියා, දැන් ලක්ෂ 10ටත් වැඩියි" කියලා. දැන් අඬන්න ඕනෑ නැහැ. දැන් එතුමාට එහේ ඉඳන්ම සාක්ෂි දීලා, නඩුව ඔප්පු වුණොත් හිරේ යන්නයි තිබෙන්නේ. ඇතැම් උදවිය කියනවා, අපරාදේ, මෙච්චර සල්ලි යනවා, ඒක හින්දා-*[බාධා කිරීමක්]* ඒක තමයි. එතුමාට විද්‍යුත් ක්‍රමය මඟින් පාර්ලිමේන්තුවත් බලලා එහේ ඉඳන් නඩුවට පෙනී ඉඳලා නඩුව ඔප්පු වුණොත් හිරේ යන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දකිනවා මෙන්න මෙහෙම තත්ත්වයක්. මේ කාරණය ගරු අධිකරණ අමාත්‍යතුමාත් පිළිගන්නවා ඇති. විශේෂයෙන් සංවිධානාත්මක අපරාධවලට අදාළව අපේ රටේ පවතින නීතිය -දණ්ඩ නීති සංග්‍රහයත්, අපරාධ නඩු විධාන සංග්‍රහයත් ඇතුළු අපරාධ අණ පනත්වල- සංවිධානාත්මක අපරාධ ක්‍රියාවලියේදී යම් අපොහොසත්කමක් දක්වනවා. අපි මේ කථා කරන්නේ, "බැද්දේගම" නව කථාවේ සිලිඳු හිරේ ගිය විධිය ගැන නොවෙයි. මේක ඉංග්‍රීසි නීතිය. "බැද්දේගම" නව කථාවේ සිලිඳු හිරේ ගිය විධිය අපි දන්නවා. නමුත්, එදා ඉඳන් මේ දක්වාම ඒ නීතියේ මහා ලොකු වර්ධනයක් වෙලා නැහැ. නමුත්, අපට යම්කිසි සංවිධානාත්මක අපරාධවලට අදාළව අපරාධ නීති ප්‍රවේශයක් අවශ්‍යයි. ඒ නිසා මහජන ආරක්ෂක අමාත්‍යාංශය ලෙස අපි එළිදක්වනවා, කැබිනට් පත්‍රිකාවක්. ඒ කුමක් සඳහාද? මේ සංවිධානාත්මක අපරාධවලට අදාළව කටයුතු කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සංවිධානාත්මක අපරාධ කටයුතුවලට අදාළව සැකකරුවෙකු අත්අඩංගුවට ගත්තොත්, අදට සාමාන්‍ය නීතිය අනුව ඔහු අත්අඩංගුවේ තියාගෙන ඉන්න පුළුවන් වෙන්නේ පැය 24ක් පමණයි. එතකොට ඊට එහා ප්‍රශ්න කිරීමක් කරගන්න අමාරු වෙනවා, විමර්ශන නිලධාරින්ට. සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයන් සැලකිය යුතු කාල වේලාවක් ඒ විමර්ශන නිලධාරින් ඉස්සරහා තබා ගත යුතු වෙනවා.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට දැන් දේශීයව සහ ජාත්‍යන්තරව විවේචනයක් එල්ල වෙලා තිබෙනවා. අපේ පක්ෂය හැටියටත් ඒ විවේචනය එහෙමම තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විවේචනය එහෙමම තිබියදී, විශේෂයෙන් අපරාධ නීතියට නව පනතක් අවශ්‍ය බව අප කාටත් වැටහෙනවා. ඒ නිසා විශේෂයෙන් මහජන ආරක්ෂක අමාත්‍යාංශය ලෙස අපි කැබිනට් පත්‍රිකාවක් යොමු කර තිබෙනවා, ඒ කැබිනට් පත්‍රිකාව හරහා විශේෂ කමිටුවකට යොමු කරන්න කියලා, ශ්‍රී ලංකාවේ සංවිධානාත්මක අපරාධ කණ්ඩායම් විසින් සිදු කරනු ලබන වෙඩි තබා මනුෂ්‍ය ඝාතන කිරීම් හා වෙඩි තබා තුවාල සිදු කිරීම් ඇතුළු අපරාධ වැළැක්වීම සඳහා නව පනතක් කෙටුම්පත් කර සම්මත කර ගැනීම අවශ්‍ය කරුණක් වෙලා තිබෙනවා කියලා.

මේ වෙලාවේ මම විශේෂයෙන්ම මේ රටේ ජනතාවට මතක් කරනවා, අපේ ආණ්ඩුව ජන වරමට වග කියන ආණ්ඩුවක් බව. ඒ නිසා තමයි පෙට්ටගමේ හංගලා තිබිච්ච අණ පනත් මේ සංවිධානාත්මක අපරාධවලට සාපේක්ෂව එළියට ගන්නේ. ඒ විතරක් නොවෙයි. අපේ නීතිය යම් යම් කටයුතුවලට අපොහොසත් නම්, ඒ අපොහොසත් වූ නීතිය පොහොසත් කරන්න අපි කටයුතු කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන වරම කියන්නේ ඕක නොවෙයිද? මේ රටේ හිටපු කැබිනට් ඇමතිවරුන් රොත්ත එකිනෙකා අද ඇතුළට යනවා අපි දකිනවා. අපේ පක්ෂයේ නායකයා මේ ඉස්සරහා ඉඳගෙන තමයි කිව්වේ, "මේ කැබිනට් මණ්ඩලයේ ඉන්න ඕනෑම කෙනෙක් නම් කරලා අහවල් හොරකමට සම්බන්ධයි කියන්න මට පුළුවන්" කියලා. අද අපි බලයට ඇවිල්ලා මාස හයක් ගත වෙලා තිබෙනවා. විපක්ෂයේ කාටද පුළුවන් ඇඟිල්ල දිගු කරලා කියන්න, අන්න අහවල් ඇමතිවරයා අහවල් දූෂණය කළා කියලා? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන වරම කියන්නේ ඕකට නොවෙයිද? ඒ මහජන වරම සංස්ථාපනය කළේ වෙන එක ආණ්ඩුවක්වත් නොවෙයි. මේ රටේ මහජන වරමට වග කිව්වේ අපේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විතරයි කියන එක මම මේ වෙලාවේ තමුන්නාන්සේලාට මතක් කරනවා. ඒ නිසා මේ වැදගත් සංශෝධන පනත් කෙටුම්පත සම්මත කර ගැනීම සඳහා තමුන්නාන්සේලාගේ සහයෝගය ලබා දෙන්න කියන ඉල්ලීම මම මේ වෙලාවේ කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Sir, I just need some clarification.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා එතුමාට අවසර ලබා දෙනවා ද?

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඔව්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාරණය කියන්න.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තත්පර 30යි ගන්නේ. වැඩි වෙලාවක් ගන්නේ නැහැ.

මේ පනත් කෙටුම්පතේ Clause 273R - 273ඩ - යටතේ තමයි ඇමතිතුමාට සිද්ධ වෙන්නේ, appropriate Regulation එකක් හදන්න. ඒක තානාපති කාර්යාලයට පමණක් සීමා නොකර වෙන වෙන රටවල ඒවා වෙනුවෙන් භාවිත කරන ස්ථාන, ඒ කියන්නේ ඒ තිබෙන judicial offices - court houses, chambers- හරහාත් කරන්න පුළුවන්. එතකොට ඒ නියෝගය at the appropriate time, the Minister in consultation with the Chief Justice, can do it. ඒ කියන්නේ ඒක prescribe වෙලා නැහැ, Embassies හරි High Commissions හරි කියලා. But, that needs to come under the Regulation. Hon. Deputy Minister, I just wanted to bring that to your attention.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
1981 අංක 4 දරන කොන්සල් කර්තව්‍ය පනතෙහි අර්ථ නිරූපණය මත තමයි "diplomatic officer" කියන එක අර්ථ නිරූපණය වෙලා තිබෙන්නේ. ඒ හරහා තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Clause 273R යටතේ එවැනි දේවලුත් ඇමතිතුමාට කරන්න පුළුවන්,-

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
හොඳයි, බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත. දෙවන වර කියවීම. සභාව එකඟද?

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' - [ගරු හර්ෂණ නානායක්කාර මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Harshana Nanayakkara.]*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාව සහ තෙවන වර කියවීම 2025 ජූනි මස 04වන බදාදා පැවැත්වීම පිණිස කල් තැබිය යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***කාරක සභාව 2025 ජූනි 04වන බදාදා පවත්වනු ලැබේ.***
*குழு 2025 யூன் 04, புதன்கிழமை நடைபெறும்*
*Committee Stage on Wednesday, 04th June, 2025.*

## විදේශීය ණය (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත
## வெளிநாட்டுக் கடன்கள் (நீக்குதல்) சட்டமூலம்
## FOREIGN LOANS (REPEAL) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' - [ගරු හර්ෂණ නානායක්කාර මහතා]***

*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Harshana Nanayakkara.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

***1 සිට 4 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 4ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 4 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported without Amendments.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**

(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)

(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරැදි කර ගැනීම සඳහා සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read the Third time, and passed.*

# කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**

(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)

(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

# කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
## ADJOURNMENT QUESTIONS

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

පළමුවන ප්‍රශ්නය, ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා.

**ගරු උපුල් කිත්සිරි මහතා**

(மாண்புமிகு உபுல் கித்சிறி)

(The Hon. Upul Kithsiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මෙම ප්‍රශ්නය යොමු කරන්නේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙතයි.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් 2022.06.22 දිනැතිව නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 14/2022 අනුව, ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධාරින්ට දේශීය/විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම යටතේ රාජ්‍ය නිලධාරින් විශාල සංඛ්‍යාවක් විදේශගත වී ඇති බවට දැන ගන්නට ලැබී ඇත. යම් නිලධාරියකු විදේශගත වීමට අදහස් කරන්නේ නම් ඊට මාස 3කට කලින් නිවාඩු ඉල්ලා සිටිය යුතු අතර, ඒ අනුව නිවාඩු ලබා ගත යුතු ය. එහෙත් විදේශ රැකියා සඳහා විදේශගත වීමේදී කඩිනමින් ඊට අදාළ දින ලැබෙන අතර, ඒ අනුව නියමිත කාලයේදී කඩිනමින් නිවාඩු ලබා ගැනීමට නොහැකි වී ඇති බවට වාර්තා වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 වර්ෂයේ ඇති වූ දැඩි මූල්‍ය අර්බුදය නිසා රාජ්‍ය සේවකයන් ඇතුළු බොහෝ දෙනෙකුට දෛනිකව ජීවත් වන්නට නොහැකි තත්ත්වයක් ඇති වුණා. ඒ නිසා බොහෝ දෙනා විදේශගත වීමට තීරණය කළ අතර, ඉහත චක්‍රලේඛය අනුව රාජ්‍ය නිලධාරින්ට ද ඒ සඳහා අවස්ථාව සලසා දෙන ලදී. නමුත් ඔවුන් විදේශගත වීමේදී නිවාඩු ලබා ගැනීමේ ක්‍රමවේදයේ පවතින යම් යම් දුර්වලතා නිසා විදේශගත වීමට ප්‍රථම ඔවුන්ට නිවාඩු ලබා ගැනීමට නොහැකි විය. ඒ අනුව පවතින ආර්ථික දුෂ්කරතාව නිසා විදේශ රැකියාව තෝරා ගත් අතර, ඔවුන්ට දේශීයව රැකියාව අහිමි කර ගැනීමට සිදු විය. ගරු ඇමතිතුමනි, ඒ අනුව පහත සඳහන් ප්‍රශ්න ඔබතුමාගෙන් අසන අතර, ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරමින් ඊට අදාළ පිළිතුරු ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරමි.

01. අදාළ චක්‍රලේඛය අනුව එවැනි රාජ්‍ය නිලධාරින් කොපමණ සංඛ්‍යාවක් දේශීයව නිවාඩු ලබා ගෙන තිබේ ද?

02. අදාළ චක්‍රලේයට අනුව මේ වනතෙක් කොපමණ රාජ්‍ය නිලධාරින් සංඛ්‍යාවක් විදේශ නිවාඩු අනුමත කර විදේශගත වී ඇත් ද?

03. මේ වන විට අදාළ චක්‍රලේඛයට අනුව නිවාඩු අනුමත කිරීමකින් තොරව කොපමණ සංඛ්‍යාවක් විදේශගත වී ඇත්ද?

    I. එසේ නම්, නිවාඩු අනුමත නොවීමට හේතු කවරේද?

    II. එම නිලධාරින් සම්බන්ධයෙන් දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?

04. මෙම චක්‍රලේඛයත් / ආයතන සංග්‍රහයත් වත්මන් නිවාඩු ලබා ගැනීමේ ක්‍රමය අතර යම් පරස්පරයක් ඇති බව ඔබ පිළිගන්නේද?

05. එසේ නම් ඒ මොනවාද?

06. පිළිනොගන්නේ නම් ඒ මන්ද?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**

(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)

(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

01. මේ වනවිට නිලධාරින් 3,766ක් දේශීය වශයෙන් නිවාඩු ලබාගෙන තිබෙනවා. ඊට අදාළ ඇමුණුම මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

---

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

02. මේ වන විට නිවාඩු අනුමත කරගෙන නිලධාරීන් 8,121ක් විදේශගත වී තිබෙනවා. ඊට අදාළ තොරතුරුත් ඇමුණුමෙහි අන්තර්ගත වෙනවා.

03. මෙම ප්‍රශ්නය හා එහි අනුප්‍රශ්න ද්විත්වය සඳහා පිළිතුරු පහත පරිදි දක්වන්න පුළුවන්.

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට අදාළව නිවාඩු අනුමත කර නොගෙන විදේශගත වූ නිලධරයන් සම්බන්ධ තොරතුරු වාර්තා වී නොමැති අතර, වෙනත් අමාත්‍යාංශවලට අදාළව නිවාඩු අනුමත කර නොගෙන විදේශගත වූ නිලධරයන් සම්බන්ධ තොරතුරු මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර නොමැත.

04. ඔව්. 2022.06.13 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණයක් මත ආයතන සංග්‍රහයේ දැනට පවතින විධිවිධානවලින් බැහැරව මෙම චක්‍රලේඛය නිකුත් කර ඇති අතර, ඒ බව 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022හි පළමු ඡේදයේම සඳහන් කර ඇත.

05. (I) 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විවිධිධාන අනුව දේශීයව හා විදේශීයව වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමට අවස්ථාව සලසා දී ඇත. ආයතන සංග්‍රහයේ Iවැනි කාණ්ඩයේ XIIවැනි පරිච්ඡේදයේ විධිවිධාන අනුව අධ්‍යයන කටයුතු සඳහා හැර, රැකියාවක් සඳහා දේශීයව නිවාඩු ලබා ගැනීමට විධිවිධාන සලසා නොමැති අතර, විදේශ අධ්‍යයන කටයුතු සහ/හෝ රැකියා සඳහා නිවාඩු ලබා දීමට විධිවිධාන සලසා ඇත.

(II) ආයතන සංග්‍රහයේ Iවැනි කාණ්ඩයේ XIIවැනි පරිච්ඡේදයේ 16වැනි වගන්තියේ විධිවිධාන අනුව විදේශ අධ්‍යයන කටයුතු සහ/හෝ රැකියා සඳහා නිවාඩු ලබා ගැනීමේදී, ලබා ගන්නා නිවාඩු කාලය මෙන් දෙගුණයක අනිවාර්යය සේවා කාලයකට හා එය සම්පූර්ණ කිරීමට අපොහොසත් වන්නේ නම්, දණ්ඩන මුදලකට යටත් කරමින් නිලධරයා ගිවිසුමකට එළැඹිය යුතු වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන අනුව දේශීයව හා විදේශීයව වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමේදී අනිවාර්යය සේවා කාලයකට හෝ දණ්ඩන මුදලක් ගෙවීමට ගිවිසුම්ගත වීමකින් තොරව රජයේ නිලධරයෙකුට නිවාඩු ලබා ගැනීමට අවස්ථාව ලබා දී ඇති අතර, එමඟින් මෙම චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිවාඩු ලබා ගැනීමට නිලධරයන් අභිප්‍රේරණය වේ.

(III) ආයතන සංග්‍රහයේ Iවැනි කාණ්ඩයේ XIIවැනි පරිච්ඡේදයේ 16වැනි වගන්තියේ විධිවිධාන අනුව විදේශ අධ්‍යයන කටයුතු සහ/හෝ රැකියා සඳහා නිවාඩු ලබා ගැනීමේදී විදේශ මුදල් මෙරටට ප්‍රේෂණය කිරීම අවශ්‍යතාවක් නොවන අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන අනුව විදේශීයව වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමේදී විදේශ මුදල් මෙරටට ප්‍රේෂණය කිරීම අනිවාර්ය චක්‍රලේඛ විධිවිධානයකි.

(IV) ආයතන සංග්‍රහයේ Iවැනි කාණ්ඩයේ XIIවැනි පරිච්ඡේදයේ 16වැනි වගන්තියේ විධිවිධාන අනුව විදේශ අධ්‍යයන කටයුතු සහ/හෝ රැකියා සඳහා නිවාඩු ලබා ගැනීමේදී එම නිවාඩු කාලය, ජ්‍යෙෂ්ඨතාවට හෝ විශ්‍රාම වැටුපට සක්‍රිය සේවා කාලයක් ලෙස සලකනු නොලබන අතර, අදාළ නිලධරයා ආපසු දිවයිනට පැමිණි විට, ඔහු එසේ විදේශයකට නොගියේ නම්, එළඹීමට හැකිව තිබුණා වූ වැටුප් පියවරෙහි පිහිටුවීම පමණක් සිදු කරනු ලබයි.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන අනුව දේශීය හෝ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමේදී ජ්‍යෙෂ්ඨතාවට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන ලෙස එම නිවාඩු ලබා ගැනීමට 2022.06.22 දින සිට 2023.07.10 දින තෙක් අවස්ථාව සලසා තිබුණි. 2023.07.11 වන දින සිට මෙම චක්‍රලේඛ විධිවිධාන අනුව නිවාඩු අනුමත කරනු ලබන නිලධරයන්ගේ වැටුප් රහිත නිවාඩු කාල සීමාව ජ්‍යෙෂ්ඨතාව සඳහා අදාළ කර නොගැනීමට 2023.07.10 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇති අතර, මේ වනවිට එම විධිවිධාන අනුව මෙම නිවාඩු විශ්‍රාම වැටුපට පමණක් අදාළ වන සේ ලබා ගැනීමට අවස්ථාව සලසා ඇත.

(V) ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ XII වැනි පරිච්ඡේදයේ 16වැනි වගන්තියේ විධිවිධාන අනුව විදේශ අධ්‍යයන කටයුතු සහ හෝ රැකියා සඳහා නිවාඩු ලබා ගැනීමේදී අනුමැතිය සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් අදාළ පරිපාලන බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන අනුව දේශීය හෝ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමේදී අනුමැතිය සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු අතර, මේ සඳහා ලේකම්වරයාට සහාය වීම සඳහා අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකුගේ සභාපතිත්වයෙන් සහ තවත් ජ්‍යෙෂ්ඨ නිලධරයන් තිදෙනෙකුගෙන් සමන්විත ස්ථාවර කමිටුවක් පත් කර එහි නිර්දේශ ලබා ගත යුතු වේ.

06. අදාළ නොවේ.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමා කැමති නම් මට ප්‍රශ්නයක් අහන්න අවස්ථාව දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නවලට අවස්ථාවක් නැහැ.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
ගරු ඇමතිතුමා ප්‍රශ්නය අහන එකට එකඟ නම් මට ඒකට අවස්ථාවක් දෙන්න.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
එකඟයි. එකඟයි

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ප්‍රශ්නය අහන්නද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කෙටියෙන් ප්‍රශ්නය අහන්න.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
ගරු ඇමතිතුමනි, අපි දන්නවා, පසුගිය කාලයේ ආර්ථික අර්බුදය නිසාම රාජ්‍ය සේවකයෝ විශාල සංඛ්‍යාවක් මේ රට අතහැර ගියා කියලා. ඔවුන් විධිමත් ලෙස නිවාඩු ගැනීමේදී ඒ ක්‍රමයේ යම් ගැටලු තත්ත්වයක් තිබෙනවා. මේ රට අතහැරලා විදේශගත වීමේදී තමන්ගේ රැකියාව නැවත ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් විදේශගත වෙච්ච අය ඉන්නවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, එවැනි කණ්ඩායම් විදේශගත වෙන්න කලින් නිවාඩු ලබාගන්න උත්සාහයක් දරලා තිබෙනවා නම්, දැන් ඔවුන් විදේශගත වෙලා නම් ඔවුන්ට යම් සහනයක් සලසන්න පුළුවන්ද සහ ඒ සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග තිබෙනවා නම් අරගෙන ඔවුන්ට ඒ අවස්ථාව ලබා දෙන්න කියාත් ඉල්ලා සිටිනවා. ඒ පිළිබඳව ඔබතුමාගේ අදහස දැනගන්න කැමැතියි, ගරු ඇමතිතුමනි.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමා ඒ කියන කාරණය නිවැරදියි. සමහර අවස්ථාවල ඒ නිලධාරින් නිවාඩු ඉල්ලුම් කරලා තිබෙනවා, විධිමත්ව. නමුත් නිවාඩු අනුමත කර දීමේදී කාල වේලාව සම්බන්ධ ප්‍රශ්නයක් නිසා හෝ ආයතනික වශයෙන් මතු වුණු යම් ප්‍රමාද දෝෂයක් නිසා විධිමත්ව නිවාඩු අනුමත කරදීමට අවස්ථාව ලැබිලා නැහැ. එහෙම අවස්ථාවල ඔවුන්ට කැඳවීමක් ලැබුණොත්, ඒ කැඳවීම පිළිගෙන ඔවුන් විදේශගත වෙලා තිබෙනවා. එකම කාරණය ඔවුන් විධිමත්ව නිවාඩු අනුමත කර නොගෙන විදේශගත වීමයි. නමුත් ඔවුන් නිවාඩු ඉල්ලුම් කර තිබියදී නිවාඩු ලබා ගැනීමකින් තොරව ඔවුන්ට විදේශගතවීමට සිද්ධ වුණේ අපේ ආයතනික ප්‍රමාදයක් නිසා හෝ කාලය පිළිබඳ ප්‍රශ්නයක් නිසා හෝ නම්, ඒ පිළිබඳව සානුකම්පිතව සලකා බලා යම් සහනයක් සලසවන්න පුළුවන්කම තිබෙනවා. අපි ඒ පිළිබඳව අමාත්‍යාංශ මට්ටමින් කටයුතු කරලා ඒ සහනය ලබාදීමට කටයුතු කරන බව දැනුම් දෙන්න කැමැතියි.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ දෙවැනි ප්‍රශ්නය, ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Thank you, Mr. Presiding Member.

நான் இந்த வினாவை கௌரவ பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரிடம் கேட்கின்றேன்.

1. மாகாண சபைத் தேர்தல் இந்த ஆண்டுக்குள் நடத்தப் படும் என ஜனாதிபதி அளித்த வாக்குறுதியின்படி அதற்கான சட்டமூலத்தைத் தயாரிக்க அமைச்சு ஏதாவது நடவடிக்கைகள் எடுத்துள்ளதா?

2. எடுத்திருந்தால், எவ்வாறான நடவடிக்கைகள் எடுக்கப்பட்டுள்ளன?

3. எடுக்கவில்லையென்றால், ஏன் எடுக்கப்படவில்லை?

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வடக்கு, கிழக்கு மாகாண சபைகள் மட்டுமல்ல, North Central, சப்பிரகமுவ சபைகள் 2017இலும், Central, North Western மாகாண சபைகள் 2018இலும், Western, South, Uva சபைகள் 2019இலும் காலாவதியாகிவிட்டன. ஏற்கனவே முன்னாள் பாராளுன்ற உறுப்பினர் எம்.ஏ. சுமந்திரன் அவர்கள் இது தொடர்பில் நகல் சட்டமூலமொன்றைக் கொண்டுவந்திருந்தார். ஆனால், அதை நிறைவேற்றிக்கொள்ள முடியவில்லை. இது முக்கியமான ஒரு விடயம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය කියවීමට පමණයි ඔබතුමාට අවස්ථාව තිබෙන්නේ.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Okay.

ஆகவே, இந்த வினாவை நான் கேட்கின்றேன்; இது சம்பந்தமான விளக்கத்தை நான் கௌரவ அமைச்சரிடம் எதிர்பார்க்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න අමාත්‍යතුමා.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

1. ඔව්.

2. පළාත් සභා මැතිවරණය පැවැත්වීම සඳහා අපි කවුරුත් දන්නා පරිදි යම් යම් නෛතික අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුව තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය මූලික කටයුතු මේ වනවිට අමාත්‍යාංශය විසින් ආරම්භ කර තිබෙනවා. පසුගිය කාල වකවානුව තුළ පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට ප්‍රමුඛතාව ලබා දීමට සිදු වූ බැවින් ඒ සඳහා යම් කාලයක් ගත වුවත්, මේ වනවිට මේ පිළිබඳව මූලික අවධානය යොමු කර අදාළ ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කරමින් ඉන්නවා.

3. අදාළ නොවේ.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙකයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, අතුරු ප්‍රශ්න අහනවාට ඔබතුමා එකඟද?

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
අතුරු ප්‍රශ්න අහන්න, I am entitled to under Standing Orders. - *[Interruption.]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමා එකඟද?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
එකඟයි.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
I am thankful to you, Hon. Minister. Actually, my first Supplementary Question is this. මගේ පළමුවැනි ප්‍රශ්නයට ඔබතුමා "ඔව්" කියලා පිළිතුරු ලබා දුන්නා. දෙවැනි ප්‍රශ්නය මම යොමු කළේ අදාළ පනත පිළිබඳව. ඒ කියන්නේ, පනත් කෙටුම්පතක් සැදීමට කටයුතු කර තිබේද යන්න සම්බන්ධයෙන් මීට වඩා පැහැදිලි කිරීමක් කරන ලෙස ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, මීට අදාළව ෆයිසර් මුස්තාපා මැතිතුමා විසිනුත් එක් අවස්ථාවකදී පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළ බව. ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට සුමන්තිරන් හිටපු මන්ත්‍රීතුමාත් මේ සම්බන්ධයෙන් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළා. ඒ සියල්ලත් අපි සැලකිල්ලට ගනිමින් ඉන්නවා. නමුත්, මේ කාර්යය අපි ආරම්භ කළාට පස්සේ මේක ටිකක් කල් ගත වන ක්‍රියාවලියක් විධියට තමයි අපට පෙනී යන්නේ. නමුත්, ඉතාම ඉක්මනින් ඒ කටයුතු සිදු කරනවා. මොකද, රජයක් හැටියට අපි මැතිවරණයක් කල් දැමීමට කිසිසේත්ම අපේක්ෂා කරන්නේ නැහැ. ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ආරක්ෂා කර දීම අපේ මූලික වගකීමක් හැටියට අපි සලකනවා. ඒ වාගේම අපේ රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් පළාත් සභා මැතිවරණය පැවැත්වීම සඳහා ප්‍රතිපත්තියක් හැටියට අපේ එකඟතාව පළ කර තිබෙන බව ඔබතුමා පැහැදිලිවම දන්නවා. ඇත්තටම අපි සඳහන් කරලා තිබෙනවා, ඉතාම විද්‍යාත්මක ක්‍රමවේදයක් ඔස්සේ බලය බෙදා හැරීමේ ක්‍රියාවලියකට යන්න ඕනෑය කියන එක. නමුත්, එතෙක් මේ පවතින පළාත් සභා ව්‍යුහයන් ක්‍රියාත්මක වීම අවශ්‍යයි කියා අපි පිළිගන්නවා. ඒ අනුව මැතිවරණය පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු ඉදිරියේදී අපි සිදු කරනවා. අපි හිතනවා, ඒ සම්බන්ධයෙන් විපක්ෂයේ සියලු පක්ෂවලත් සහයෝගය අපට ලැබෙයි කියලා.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
අනිවාර්යයෙන්ම. Thank you very much.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු ඇමතිතුමනි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 4.44ට, 2025 ජුනි 03වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி.ப. 4.44 மணிக்கு பாராளுமன்றம், 2025 யூன் 03, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 4.44 p.m. until 9.30 a.m. on Tuesday, 03rd June, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.